දහම්පියා අවුවා සන්න ගැටපදය.

දහම්පියා අටුවා සහිත ගැටපදය.

-- කොළඹ --

වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය

රත්නකාරවැවේ ශ්‍රී සද්ධම්මවංශාභිධාන

අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

විසින්

පාඨශෝධන පූර්වක වැ සම්පාදනය කරන ලදි.

ඉඳුරුවේ යාලේගම

ආර්. සී. රණසිංහ විසින්

මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරවන ලදි.

මුද්‍රණය

ඉඳුරුව මුද්‍රණ ශිල්පියෝ,

ඉඳුරුව.

2495

1952

ප්‍රකාශකාවේදනය.

මේ දහම්පියා අට්ඨකථාසහිත ගැටපදය ඉඩ ලැබෙන සැටියෙන් මුද්‍රණය කරවන ලෙස ඉඳුරුවේ ශ්‍රී විජයධර්ම පරිවෙණාධිපති වූ ද ශ්‍රී ලංකාරාමසුසුනිකායේ මහා ලෙඛකාධිකාරී වූ ද **විද්‍යාවිශාරද පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද මහාස්ථවිර** සවාමීන් වහන්සේ විසින් මට දන්වන ලදි. උන්වහන්සේගේ කැමැත්ත පරිදි මෙය වසී 1948 අගොස්තු මස 31 වන දින මුද්‍රණය කරවීම සඳහා භාර ගතිමි. මෙහි මුද්‍රණකාර්‍යය සඳහා විශාල වියදමක් දරන්ට සිදු විය. ග්‍රන්ථ සම්පාදක සවාමීන්ද්‍රයන් වහන්සේ ගේ හිතවතුන් දැක්වූ කරුණාගුණය නිසා එහි මුළු වියදම මා විසින් නො දරන ලදී. හිතවතුන්ගෙන් ලැබෙන උපකාරය ක්‍රමයෙන් උගැන්වියට ගිය බැවින් ද අනපෙක්ෂිත පරිදි මුද්‍රණ කඩදාසි පිළිබඳ අගය වැඩි වූ බැවින් ද මඳකාලක් මුද්‍රණ කාර්‍යය නතර විය. එහෙත් කෙසේ නමුත් මේ කාර්‍යය අවසන් කරන්නට මෙතෙහි කළ මම ළඟි ළඟියේ යළිත් එහි ව්‍යාපෘත වීමි. වගකියයුතු ශාසනික කාර්‍යයෙක්හි යෙදී සිටින පණ්ඩිත සවාමීන් වහන්සේට ඉඩපහසු ලබා ගැනීමට නො හැකිවීමෙන් මේ කටයුත්ත අතරමග යළිත් නතර විය. එහෙත් මෙයට වර්‍ෂයකට කලින් මේ ග්‍රන්ථය මුද්‍රණය කොට අවසන් කරන ලදී. මේ ග්‍රන්ථය සම්පාදනය කළ ශ්‍රී ධර්මෝදය පරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය **රත්නකාවේ ශ්‍රී සද්ධර්මවංශාභිධාන අනුනායක සවාමීන්ද්‍රයන් වහන්සේ** මෙහි ශොධ්‍යපත්‍රාවලෝකනය කරන අතරේ වසී 1951 ජූනි 26 වන දින අපවත් වූහ. එසින් තවත් කාර්‍යය බහුල වූ පණ්ඩිත සාමීන් වහන්සේ ඉතිරි කටයුතු කළට වේලාවට අවසන් කර නුදුන් බැවින් මේ ග්‍රන්ථය ප්‍රචාරයට පත්කිරීමට මෙතෙක් පමා විය. මහත් කරදර රැසකින් අවහිර වූ උන්වහන්සේ ඉතිරි කටයුතු මේ නොබෝදා අවසන් කර දුන්හ. එහෙයින් මේ අගනා ග්‍රන්ථය මෙතෙකින් ප්‍රචාරයට පත් කළ හැකිවීම සතුටට කරුණක් බව කියමි. මෙහි නැවත මුද්‍රණය වැල්ලවත්තේ **ශ්‍රී ධර්මෝදය පරිවෙණාධිපතීන් වහන්සේ ගේ** අවසරය පරිදි වියයුතු බව ද මෙහි ම සටහන් කරනු කැමැත්තෙමි.

මේවගට,

ආර්. සී. රණසිංහ.

ඉඳුරුව.
15 පෙබරවාරි 1952.

සංක්ෂේපනය.

ශ්‍රීමත් දෙන් බාරොන් ජයතිලක මැතිතුමාගේ ධම්පියා අටුවා ගැටපද ශොධනයට උදවුවක් වශයෙන් ඇති වූ පුස්කොළ පිටපතක් සපයා දුනිමු. එහෙයින් එතුමා ගේ ශොධනයෙන් මුද්‍රිත ධම්පියා අටුවා ගැටපදයෙන් පිටපතක් අප හට ද තුවු-පඬුරු වශයෙන් ලැබුණු බව ත් එය ඉගෙන ගැනීමේ අදහසින් දෙතුන් වරක් කියවන ලදබව ත් මෙහි ලා සඳහන් කළයුතු වැ තිබේ. එකලැ අප වෙත ඉගෙනීමට පැමිණි ගිහි පැවිදි කීප-දෙනෙකුන් හට ඒ ග්‍රන්ථය උගන්වන්නට පවන් ගතුම්හ. එහි ශොධනයට ත් ව්‍යාඛ්‍යාකරණයට ත් සිතනතු වූයේ මෙලෙසිනි. මේ **දහම්පියා අටුවා සන්‍ය ගැටපදය** එහි ප්‍රතිඵලයෙකි. හවුරුදු සතළොසක් මුළුල්ලෙහි කරන ලද පරිශීලනයන ප්‍රතිඵල මෙසේ ග්‍රන්ථයෙකින් හෙළි කිරීමට අදහස් කළ ඇපි මේ ව්‍යාඛ්‍යානය සම්පාදනය කළමිහ. එහෙත් මුද්‍රණකාර්‍යයියට යොමු කරන්නට නො හැකි වැ කලෙක් ගත විය. මේ අතර විද්‍යාවිශාරද පණ්ඩිත ඉදුරුවේ උත්තරානන්ද සථවිර නමට මෙය සකස් කොට ප්‍රසාදනාවක් ද ලියා හැකි නම් මුද්‍රණයෙන් ප්‍රචාරයට පත්කළ යුතු යැයි අපවසින් පවරන ලදි. ඒ සථවිරනම ගේ සංස්කරණයෙන් මේ ග්‍රන්ථයට මහත් එළියක් ලැබුණු බව ත් මුද්‍රණ කාර්‍යය මැනැවින් ඉටුකර ගන්නට හැකි වූ බව ත් නො මසුරු වැ පවසම්හ.

මෙහිවගට,
රත්නකාවැවේ ශ්‍රී සඛ්ඛවංශ.
අනුනායක ථෙර

ශ්‍රී ධම්මොදය පිරිවෙන.
වැල්ලවත්ත
15 මාර්තු 1951.

ප්‍රස්තාවනා

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුධස්ස.

ශ්‍රීමත් ශාක්‍යමුනීන්ද්‍රයන්වහන්සේ විසින් යම්කිසි කරුණක් එළඹ සිටි කල්හි ඒ ඒ තන්හි දී වදාළ ගාථා සාරසිය තෙවිසි සෙනෙකුන් සම්පිණ්ඩනය කොට ධර්මසංග්‍රාහකයන් විසින් සංගීත **ධම්ම පද පාළිය** කුදුගොත් සහියට ඇතුළත් කරන ලද්දේ වෙයි. ඒ ධම්මපදපාළියට **ග්‍රන්ථ තන්ත්‍රය** කථාවසානයෙහි විස්තරාර්ථ සඤ්ජනයෙන් සමපාදිත අර්ථකථාව **ධම්මපදට්ඨකථා** නාමයෙන් ප්‍රචලිත වූය.

අනුබුද්ධ මහාමහින්ද්‍ර මහාඝෝෂාශ්‍රවයන් වහන්සේ විසින් ලක්දිව ශාසනප්‍රතිෂ්ඨාපනයෙන් පසු ප්‍රථමවාර්ෂිකථා පූර්වාචාර්‍ය වරයන් විසින් හෙළබසට නඟන ලදහ. ඒ හෙළටුවා අතුරෙහි වූ දහම්පියා අටුවාව පෙළබසට නැඟීමෙන් විශුද්ධ බුද්ධිමත් බුඩඝෝෂ මාහිමියන් විසින් සපයන ලද දැනට අප හමුවෙහි පවත්නා **ධම්ම පදට්ඨකථාව** පහළ වූය. ඒ මේ ධම්මපදට්ඨකථායෙහි අර්ථ ව්‍යාඛ්‍යාන සවරූපයෙන් **අභාසලමෙවන්** **සඤ්ඤි** මහරජතුමන් විසින් හෙළබසින් ලියනලද විචිත්‍ර ග්‍රන්ථය **දහම්පියා අටුවා සන්නය** නම් වෙයි.

මේ ව්‍යාඛ්‍යාකරණයෙහි ලා තත් සම්පාදකයන් විසින් අනුගමනය කරනලද කරණප්‍රකාරය දෙස සුකුමාරමතීන් විසින් විමර්ශනඥානය හෙලිය යුතු ය. ග්‍රන්ථකරණයෙහි දී ඒ ඒ ආචාර්‍ය ප්‍රකාණ්ඩයන් විසින් පැරණි ගත්කතුවරයන් ගියමඟ ද බලනබව නො රහසෙකි. මෙකල මෙන් එකල පොදුජනයාගේ ප්‍රයෝජනය සඳහා භාෂාව ලිහිල් කොට ග්‍රන්ථකරණය කරන ලදැයි නො කියහැකි ය. ග්‍රන්ථකර්තෘවරයන් භාෂාවිෂයෙහි සවාධීනත්වය විඳහා පෑම එකල බෙහෙවින් කළබව කිය හැකි ය. භාෂාපොෂණය පිණිස ග්‍රන්ථයක් සැපයිය හැක්කේ භාෂා විෂයෙහි සවාධීනත්වය ඇතියකු විසිනි. භාෂා සවාධීනත්වය නම් ඡෙකප්‍රයොගයන් විමසා ආත්ම රුචිය පරිදි ශබ්ද නිර්වාචනය කෙරෙමින් නව නව ශබ්දප්‍රකෘතීන් ගෙන් භාෂාපොෂණයෙහි ඇති නිවහල් භාවය සි. මේ නිවහල් භාවය වැඩෙමින් පවත්නා බසකට භාෂාරූඪියක් වැනි වෙයි. වැඩී අවසන් වූ බසකට විප්ලවයක් වැනි වෙයි.

මේ ග්‍රන්ථයෙහි තත්ත්වය දෙස බලනවිට මේ ලක්ෂණ දෙක මැ පවත්නා බව කියයුතු ය. මෙවැනි තත්ත්වයක් මේග්‍රන්ථය සොරෙහි බලපෑමේ හේතුව සෙවීම නම් අතිදුෂ්කරකාර්‍යයෙකි. එහෙත් විමර්ශකයන් විසින් ප්‍රයත්න කළයුතු ය. සිංහල භාෂාව බ්‍රළුත් වැඩෙමින් පවත්නා භාෂාවෙකි. මේ බොහෝ දෙනාගේ පිළිගැනීම ය. මගේ හැඟීම් නම් මෙයට වෙනස් වෙයි. එකල පරිසරයේ හැටියට මේ ග්‍රන්ථකර්තෘවරයන්ගේ කාලය වනවිට සිංහල භාෂාව වැඩි අවසන් වූ පිරිහීමට පැමිණ තුබූ බව මගේ හැඟීමයි. මෙකල පරිසරයේ හැටියට සිංහල භාෂාව වැඩෙමින් පවත්නී වෙයි. භාෂාවක වැඩීම ගැන සැලකිය යුත්තේ පරිසරයේ හැටියට ය. පරිසරය විවිධප්‍රකාර නවීකරණයෙන් පොෂණය වන්නා හා මැ භාෂාව ද පොෂණය විය යුතු බවට පැමිණෙයි. අමුතු අමුතු ශබ්ද නිර්මාණය අවශ්‍ය වනුයේ එහෙයිනි.

දෙවන පැනිස් මහරජතුමන්ගේ කාලය වනවිට සිංහල භාෂාව වැඩෙමින් පැවැති බව පෙනේ. අනුබුදු මිහිඳුමාහිමියන් විසින් මෙහි ගෙනඑනලද පෙළ්ටුවා හෙළටුවා කරන්නට තරම් හෙළබස පොෂණය විය. එහෙත් පෙළ්ටුවා හෙළටුවා කිරීමෙන් පසු හෙළබස වැඩි අවසන් වූ බසක් තරමට පොෂණය විය. හෙළබසේ මේ ශක්තිය ක්‍රමයෙන් පිරිහී ගියබව සම්ථානය කළ හැකි කරුණු බොහෝ වෙති.

1. ද්‍රවිඩාක්‍රමණය,
2. දුර්නිෂ්ක්‍රමනීය
3. ද්‍රවිඩ භාෂා රාජ්‍යභාෂා වීම
4. යුඩ භීතිය
5. හෙළටුවා පාළියට පෙරැළීම

යන මේ කරුණු හෙළබස පිරිහීමට ප්‍රධාන හේතුහු වෙති. පස්ව න කස්සප් මහරජතුමන්ගේ කාලය වනවිට මේ කරුණු බල පැවැත්වීම නිසා හෙළබස බෙහෙවින් පිරිහී ගිය බව පිළිගත යුතු ය. එහෙයින් **දහම්පියා අටුවා සන්නය** සම්පාදනය වන කාල යෙහි සිංහලභාෂාව පිරිහී පැවැති බව මගේ හැඟීම යි. මේ පරිහානිය දුටු අභාසලමෙවන් කස්සප් මහරජහු යියබස නඟා සිටුවන අදහසින් මේ ග්‍රන්ථය සම්පාදනය කළහ යි හැඟේ. අමුතු අමුතු ශබ්දනිර්මාණය විචිත්‍රාකාරයෙන් කරන්නට ඔවුන් පෙළ්බුණේ එහෙයිනි.

පඨමජ්ඣාන > පඨම්ජ්ඣන් > පජ්ඣන් > ජ්ඣාන්
පත්තිඨා > පිඨිට් > පිට්ඨ් > පිට්ඨ

ව්‍යාඛ්‍යාන > වියඛ්‍යන් > වියක්ඛන් > වියකැන්
මිනාප > මිනවු > මැනැව් > මනා
භාජන > බජුන් > බජන් > බඳුන්
පයොග > පියොවු > පියොව් > පියෝ
ධම්ම > ධම් > දහම් > ජහම් > ධැම්

මෙසේ එසෙ ම මූල ශබ්දයෙන් නොයෙක් ශබ්ද ප්‍රකෘතීන් නිපද වාලූ බව පෙනේ. එක ම අර්ථයක් සඳහා එන ම ශබ්දයෙකින් නිපදවාගත් මේ නොයෙක් ශබ්දප්‍රකෘතීන් නිසා භාෂාපොෂණ යවූ බව පිළිගත යුතු ය. මෙසේ බලනවිට මේ දහම්පියා අටුවා සන්නය සියබසට කපරුකක් වැනි වෙයි. මෙහි දැක්වුණු ඇතැම් ශබ්දප්‍රකෘතීන් අද බැවහරයෙහි යෙදුවහොත් එය භාෂා විප්ලවයක් සේ බොහෝ උගතුන් සලකනු ඇත. සිංහල භාෂාව මෙකල පරිසරයේ හැටියට තවත් පොෂණය කළයුතු බැවින් අමුතු අමුතු ශබ්ද නිර්මාණය අවශ්‍ය වෙයි. **විද්වත් මුනි දුස කුමාරතුඩග** මහතුන් විසින් නිපදවනලද නොයෙක් ශබ්ද ප්‍රකෘතීන් හා ධාතුප්‍රකෘතීන් අද එදා පිළිකුල් කළ බොහෝ දෙනා යොදති. එදා භාෂාවිප්ලවයක් කරන සේ දුටු කුමාර තුඩගයන් අද භාෂා පොෂකයකු බොට සලකති. වැඩෙමින් පවත්නා බසකට කපරුකක් වැනි ලක්ෂණය ත්, වැඩි අවසන් වූ බසකට විප්ලවයක් වැනි ලක්ෂණය ත් යන දෙක මැ මේ ග්‍රන්ථයෙහි පහළවූයේ මෙලෙසිනි. මේ ග්‍රන්ථකර්තෘවරයාණන් විසින් මෙහි යොදන්නලද ඇතැම් ශබ්ද ප්‍රකෘතීන් පැරණියන් ගියමග යාමෙන් මෙයට ඇතුළත් කළබව ද සිතිය හැකි ය. ඇතැම් ශබ්ද ප්‍රකෘතීන් මෙන් විසින් ම නිපදවන ලද බව පෙනේ. දැනට සොයාගෙන තිබෙන ආදිම සිංහල ගද්‍ය ග්‍රන්ථය මේ දහම්පියා අටුවා සන්නය වන බැවින් මේ පිළිබඳ නත්ථුප්පත්තිවිවරණයක් කිරීම දුෂ්කර වෙයි. මෙයට ග්‍රන්ථකර්තෘන් විසින් මැ තබනලද නාමය **"දහම්පියා අටුවා සන්නය"** යනු බැවින් එය මැ සාධුකයෙන් පිළිගන්නා ලදි.

ශ්‍රී ලඞ්කාධිශ්වර පස්වන භාශ්‍යප නරදෙවයෝ මෙහි කර්තෘහු වෙති. **"දෙබිසෙවැජා අනාසලමෙවන් කසුබ් මහරජහු දහම්පියා අටුවාවට කළ සන්නයයි"** යන නිගමන වාක්‍යයෙන් මෙහි කර්තෘ නාමය හා ග්‍රන්ථනාමය හා

කර්තෘ කන්ඩය පැහැදිලි වෙයි. දෙවන **සේන** රජතුමන් ගේ ඔෟරස පුත්‍ර වූ මේ **කසුබ්** මහරජහු ප්‍රඥවිභූතියෙන් ප්‍රභූතිය ලත් කෙනෙකි. මෙතුමන්ගේ මැණි

යෝ වනාහි රොහණජනපදයිහවර කිතු අග්බෝ ආදිපාදයන් ගේ දුහිතා වූ **සඞ්ඝා** නම් කුමාරිකාවෝ ය. ඇය දෙවරක් අභිෂෙක ලත් හෙයින් '**වයාහිසෙඛා**' යන විශෙෂණ පදයෙකින් ප්‍රසිද්ධ වූ බව ඉතිහාසඥයන්ගේ පිළිගැනීම ය. ඇයගේ කුසෙහි උපන් මේ කසුබ් මහරජ හට "**වයාහිසෙඛා සකුජාතො**" යන විශෙෂණ පදය මහාවංශයෙහි යොදනලද බව ද ඉතිහාසඥයන්ගේ පිළිගැනීම ය. මේ විශෙෂණ පදය මහාවංශයෙහි යෙදීමට මුල්වූයේ කසුබ් මහරජතුමන් විසින් මැ අභයගිරි විහාරභූමියෙහි ප්‍රතිෂ්ඨාපිත වූ ශිලාලිපියෙහි "**දෙබිසෙවැජාසල මෙස්වන් අඛහස් මහරජ්සුතාදී**" යනාදි වැකියෙහි එන **දෙබි සෙවැජා**' යනු වියයුතු ය. එහෙත් මේ පදය ගැන විමසීමක් කළහොත් මෙහෙවැ සි හැඟේ. මෙහි ලා විමසිය යුතු ප්‍රශ්න තුනෙකි.

1. සඞ්ඝා කුමරිය දෙවරක් අභිෂෙක ලත් හෙයින් මේ නාමය යෙදිණි ද?
2. අභිෂෙකයට පත් දෙමාපියන් නිසා මේ නාමය යෙදිණි ද?
3. කසුබ් මහරජුන් දෙවරක් අභිෂෙක ලත් හෙයින් මේ නාමය යෙදිණි ද?

මේ ඒ ප්‍රශ්නත්‍රිතය සි. මෙහි පළමු වැන්නට තුඩුදී පවත්නේ පළමුවන සේන මහරජුන් සඞ්ඝා කුමරිය රැජන තන්හි තබා අභිෂෙක කිරීම ත් දෙවන සේන රජතුමන් පළමුවන සේන රාජයන්ගේ මරණයෙන් පසු ඇය යලිත් තමන්ගේ රැජන තන්හි තබා අභිෂෙක කිරීමත් ඉතිහාසයෙහි ප්‍රසිද්ධවීම ය. මෙසේ දෙවරක් අභිෂෙක ලත් හෙයින් සඞ්ඝා කුමරියට '**වයා හිසෙඛා**' යන විශෙෂණ පදය යෙදූහ සි කියනුලැබේ. මේ හැම්දෙනා විසින් ම පිළිගත් මතය සි. දෙවැන්නට තුඩුදී පවත්නේ දෙවන සේන රජතුමා මෙන් ම ඔහු මෙහෙයි සඞ්ඝා ව ද අභිෂෙකපදයට පැමිණීම ය. ඇතැම් රජවරු සිය මෙහෙසියන් අභිෂෙකප්‍රදානයෙන් රාජ්‍යයට හිමිකම් ඇතියන් නොකරති. මේ දෙදෙන ම අභිෂෙකපදයට පැමිණීමෙන් මවුපිය දෙපසින් ම නීත්‍යනුගත රාජ්‍යඋරුමය ඔවුන්ගේ දරුවනට ලැබෙයි එහෙයින් අභිෂෙකයට පත් මවුපිය දෙදෙනාගෙන් පහළ වූ යන අර්ථය ගෙන "**වයාහිසෙඛා**" යන විශෙෂණපදය යෙදූහ සි නකී කළහැකි ය. එහෙත් මේ මතය විමසිය යුත්තෙකි.

තුන්වැන්නට තුඩුදී පවත්නේ කසුබ් මහරජහු යුවරාජපදවි යෙහි හා මහාරාජපදවියෙහි යන අවස්ථා දෙක්හි ම අභිෂෙක ප්‍රාප්තවීම ය. ඇතැම් රජවරු යුවරජුන් අභිෂෙක ප්‍රදානයෙන් තුෂ්ට නො කොරෙති. කසුබ් මහරජහු යුවරාජපදයෙහි ද පළමු අභිෂෙක කළ බැවින් දෙවරක් අභිෂිඤ්ඤයහ. එහෙයින් "**මයා හිමෙසඤ්**" යහ විශෙෂණය යෙදූහ සි තෙවී කළ බැවි ය. මේ මත යද විමසිය යුත්තෙකි. මෙහි පසු වැ කී මත දෙක මැ සනාථ වන්නට ඉඩ තිබෙන්නේ පළමු මතය අනාථ වීමෙනි. එහෙයින් බොහෝ දෙනා පිළිගතුවද ඒ ගැන අප අදහස මෙහි ලා දක්වනු ලැබේ.

මෙහි '**මයාහිමෙසඤ්**' යන පාළි වචනයට මුල්වූයේ "**දෙබිමෙසවැ**" යන වචනය යි. මේ වචනය පළමුකොට මැ යෙදී තිබෙන්නේ මේ කසුබ් මහරජතුමන් විසින් මැ ප්‍රතිෂ්ඨාපිත අනුරාධපුර අභයගිරි ශිලාලිපියෙහි ය. ලක්දිවැ පැරැණි ලිය-විලි සහරාවෙහි එන:-

බුද්දස් සිරි සග්බඩ්ය අබහය් මහරජ්හවි ජා සග් බඩ්ය අප බිසෙව් රජ්නැණියන් කුස්හි හෙවැ දුනුසැණැහි මෙ යුවරජ් බිසෙව් සිරි පැමැණ යස තෙජ් හිඊසන්ද්නෙන් ලොව පහයය් ගිය විග්මෙන් සතුරන් මැඩැ පළ නිමල කිත් වතුරෙන් ලොවග් පතුල් දෙබිසෙවැජා සලෙමෙය් වන් අබහය්." (**1-1-4**)

මේ ශිලාලිපිඛණ්ඩයෙහි එන '**දෙබිසෙවැජා**' යනු විමසිය යුතු ය. මෙහි 'සග්බඩ්ය අපබිසෙව් රජ්නැණියන් කුස්හි හෙවැ' යන වාක්‍යාංශයෙන් කසුබ් මහරජතුමන් සඞ්ඝානම් රාජිනියගේ කුස්හි පිළිසිඳ ගත්බව පැහැදිලි වෙයි. "අබහය් මහ රජ්හවිජා" යන්නෙන් (දෙවන සේන) අභයමහරජාණන්හට දූ වූ බව පැහැදිලිවෙයි. "දෙබිසෙවැජා" යන්නෙන් සඞ්ඝාව ගෙන් උපන් බව යලිත් ගතිනොත් පුනරුක්තවෙයි. එහෙයින් මෙයට සුදුසු අර්ථය නම් චිතීයාභිෂෙකයෙහි උපන් යනු ය. පළමුවැ යුවරාජාභිෂෙකයෙන් අභිෂෙකක්ෂත්‍රිය පැමිණීබව "**දුනුසැණැහි මෙ යුවරජ් බිසෙව්සිරි පැමැණ**" යන්නෙන් පැහැදිලි වෙයි. දෙවනුවැ බිසෙව්සිරි ලද බව "**ලොවග් පතුල් දෙබිසෙවැජා**" යන්නෙන් පැහැදිලි වෙයි. මේ චිතීයාභිෂෙකයනම් ලොකානන්තර්‍යා ප්ත මහාරාජශ්‍රියට පැමිණීම යි. කාරණු මෙසේ හෙයින්

මේ කසුබ් මහරජතුමන් **'දඹිසෙවැජා'** වනුයේ දෙවරක් අභි ෂෙක ලත් සඛ්කාවගෙන් උපන් නිසා නොව තමා මෑ දෙවරක් අභිෂෙක ලත් බැවිනැයි හැඟේ.

මෙසේ බලනවිට පළමු මතයට වඩා දෙවන මතය හා තෙවන මතය සනාථ වියහැකි ය. එහෙත් දෙවන මතයට වඩා තෙවන මතය සනාථ වනබව මෙහි දක්වූ සෙල්ලිපි වැකි අනුසරින් හැඟෙයි.

ඇතැම් සෙල්ලිපිවල පෑනෙන **'දෙඹිසෙවිහුදු'** යනුද මේ අර්ථය මෑ සමර්ථනය කිරීමට ප්‍රබල වේ. මෙයින් අප අදහස් කෙළේ අමුතු මතයක් උපදවාලීමෙන් නිෂ්ඵාවට යාම නොව, විමර්ශනයනට ඉඩ තැබීම ය.

මහාවංශයෙහි දෙපනස් වන පරිවේඡදයෙහි සඳහන් පරිදි මෙතුමා ශ්‍රෙෂ්ඨනරචරියෙකි. බහුශ්‍රැතයෙකි. පණ්ඩිතප්‍රකාණ්ඩ යෙකි. දූතපතියෙකි. ත්‍රිපිටකධරයෙකි. පරමධාර්මිකයෙකි. ඒ කසුබ් මහරජතුමා ප්‍රථම මාගී ප්‍රාප්තයකු මෙන් අවල ශ්‍රද්ධාසම්ප න්නයෙකි. අභිඥලාභියකු මෙන් ප්‍රඥසම්පන්නයෙකි බ්‍රහස්පතිහු මෙන් සාපිකයෙකි. වෛශ්‍රවණයා මෙන් ත්‍යාග සම්පන්න යෙකි. ධර්ම දෙශකයෙකි. සර්ශිල්පයන්හි විශාරදයෙකි. යුක්ත්‍යයුක්ති විචාරණයෙහි දක්ෂයෙකි. නීතියෙහි දක්ෂයෙකි. ඉඳුඛිලයක් මෙන් අවල වැ බුද්ධශාසනයෙහි පිහිටියේ සබලපර වාද නමැති මාරුතයෙන් අකම්පාවූවෙකි. මායාසාඨෙය්‍යමානාදී පාපධර්මයනට ගොදුරු නොවූවෙකි. සම්‍රත්නයට සයුරමෙන් සිය ලුහුණට ආකරයෙකි. භූමිවඳු වූ ඒ නරශ්‍රෙෂ්ඨ තෙමේ සවවංශ යෙහි උපන් දප්පුල ඇපාණන්හට යුවරාජපදවිය පවරාදින දශරාජධර්මයෙන් හා සතර සංග්‍රහ වස්තුවෙන් රජය කරමින් ලොකයා සිය ඇස මෙන් පාලනය කෙළේය. දූහැම්කමින් සියලු බුදු සසුන් ශොධනය කරවා නවක මහණුන් ආවාසයන්හි වැස්වූ මේ මිහිපල්තුමා දුටුගැමුණු රජතුමන් විසින් කරවන ලද මිරිසවැටි නම් වූ නෂ්ටප්‍රාය විහාරය නොයෙක් ආවාසයන්ගෙන් සරසා සථවිර වංශිය භික්ෂූන්හට පිදීය.

යනාදී වශයෙන් මෙතුමාගේ අලාමක ගුණය මහාවංස යෙහි වර්ණිත වූයේ වෙයි. එහෙයින් කතෘත්වය ගැන අමුතු විවරණයක් කිරීම අනවශ්‍ය යි.

මෙහි කතෘවරයා මේ කසුබ් රජතුමා බවට සැකයක් නැත. එහෙත් **"දළනා පැවිජියෙමි දහම්පියට අවුවාසනය හවුරුදුයෙන් ලිමි."** යන ග්‍රන්ථාවසානයෙහි පැතෙන වැකිය දෙස බැලීමෙන් අමුතු අදහසක් උපදවන්නට ඉඩ තිබේ. මෙසින් පැවැසෙන **'දළනාපැවිජි'** කවරෙක් ද? යනු විමසියයුතු කරුණෙකි. මෙහි 'දළනා' යනු හැම පුස්කොළ පිටපත්වල මෙ **'දළඳ'** යනු වියින් පවත්නා බව ශ්‍රීමත් ජයතිලක මැතිතුමන්ගේ ප්‍රස්තාවනාවෙන් පැහැදිලි වෙයි. **'දළනා'** යැයි සඤ්ඤාරන්ත ලද්දේ ඔවුන් වියිනි. මේ සඤ්ඤා කිරීම මැනවැයි හැඟේ. මේ කසුබ්රජතුමා විසූ ශතවර්ෂයෙහි **දයානාග** නම් මහතෙරනමක් අභිධර්ම විද්‍යාලයෙකැ ඉගැන්වූ බව **විමතිවිනෝදනී සහිත ලඞ්කා ඉතිහාසයෙහි** "දයානාග මහතෙරණුවෝ එක් විද්‍යාලයක අභිධර්මය ඉගැන්වූහ" යන වැකියෙන් පැනෙයි. මේ විමතිවිනෝදනී නම් **'දළනාපැවිජි'** කවරෙක් ද? යනු නිගමනය වෙයි. එහෙයින් මෙ ජයතිලක මහතුන්ගේ සඤ්ඤා කිරීම ද මැනැවි. කසුබ් මහරජතුමා ආචාර්‍යපාදයන්ගේ සම්පයෙහි අභිධර්මව්‍යාඛ්‍යානය කළ බව මෙහි මූලින් දක්වූ සෙල්ලිපියෙහි මෙ:-

"අභිධම්ම දෙසුන් කසුන්පත් අරවය් මහපුරෙ කොට් සසුන් සිව්වම් යන සිත්දෙළුනෙන් ඇජරපයහමුයෙහි ඒ මෙ ධම්දෙසුන් වියක්හන් කළ.... ..."

යනාදි වැකියෙන් පැහැදිලි වෙයි. මෙසින් දක්වෙන රජුගේ ඇජරපා දළනාපැවිජි නම් මෙහි කතෘත්වය ගැන මහත් සැකයෙක් පහළ වෙයි. මේ කාරණය තවත් විමසිය යුත්තෙකි. විමසන්වා.

මේ ග්‍රන්ථකතෘවරයා ලක්දිව තරශ්‍රේෂ්ඨයකු වශ **කාලතත්ත්වය** යෙන් හවුරුදු දහයක් රජය කළ බව මහාවංශයෙන් ද සාවුරුද්දක් රජය කළ බව පූජාවළියෙන් හා රාජාවළියෙන් ද පැනෙයි. **ශ්‍රීමත් දෙන් බාරොන් ජයතිලක** මැතිතුමන්ගේ ධම්පියා අටුවා ගැටපද ප්‍රස්තාවනාවෙහි සඳහන් පරිදි මෙතුමාගේ රාජ්‍යසමය ක්‍රි: ව: 918 – 928 වන් අතරවෙයි * **'ධම්පියා අවුවාගැටපද පරිකථා'** ශීර්ෂයෙන් ලිපියක් සපයන **ඩී. ජී. හෙට්ටිආරච්චි** මහතාණන් දක්වන පරිදි ක්‍රි: ව: 908 – 918 වන් අතර වෙයි. චූළවංශ ඉංග්‍රීසිපරිවර්තනයෙහි සංඥපන යෙන් දක්වන පරිදි ක්‍රි: ව: 913 – 923 වන් අතරවෙයි. පූජාවළියෙහි එන රාජ්‍යවර්ෂසංකලනය කිරීමෙන් බලනවිට මෙතුමාගේ

---

* සිළුමිණ ශාසත්‍රීය ... අතිරෙකයේ 6 කෘ: 48 පත්‍රය බලනු.

රාජ්‍යසමය ක්‍රි: ව: 974 – 980 වත් අතර බව පැනෙයි. රාජාවළි යෙහි එන රාජ්‍යවර්ෂ එකතුකිරීමෙන් සලකනවිට ක්‍රි: ව: 1031 – 1037 වත් අතර බව පෙනෙයි.

මෙයින් කිනම් මතයක් පිළිගත යුතු දැයි ප්‍රශ්න කිරීම පහසු වුවත් අසුවල් මතය පිළිගත යුතුයැ යි තීරණය කිරීම අපහසු ය. බොහෝදෙනා පිළිගන්නා මතය ජයනිලඝ මතය යි. එනම්;– ක්‍රි: ව: 918 – 928 වත් අතර මෙතුමා රජය කළබව යි. මේ වනාහි ශ්‍රී බු: ව: 1462 – 1472 වත් අතර කාලය යි. නව්‍යතම මතය නම් ක්‍රි: ව: 908 – 918 වත් අතර කාලය බව යි. මේ වනාහි ශ්‍රී බු: ව: 1452 – 1462 වත් අතර කාලය යේ පැනෙයි. රාජාවළියෙහි එන වකවානු බෙහෙවින් පරස්පරවිරොධ වන බැවින් මේහිලා එය ප්‍රමාණ්‍යයෙන් නො සලකනු ලැබේ. පූජාවළිමතය ලෙහෙසියෙන් ඉවත ලිය නො හේ. ක්‍රි: ව: 974 – 980 වත් අතර මෙතුමාගේ රාජ්‍යසමය වූ බව පූජාවළියෙන් පැනෙන බව මෙහි මුලදී දක්වනලදි. පූජාවළියෙහි එන රාජ්‍යවර්ෂ ගණන් කිරීමෙන් ද ඒ වර්ෂ සංඛ්‍යාව ක්‍රිසතුවර්ෂයට නගාලීමෙන් ද මේ රාජ්‍යකාල පරිවේඡදය දැනගන්නා ලදි. ශ්‍රී මේඝවණ්ණාභරණය ගෙන් ඇරඹෙන මහාවංශයේ ද්විතීය කාණ්ඩයෙහි රාජ්‍යවර්ෂයන්හි අඩුපාඩු ඇතිබව ඉතිහාසඥයන් පිළිගන්නා බැවින්ද ඒ රාජ්‍ය වර්ෂයන්හි ඌනපූරණය බෙහෙවින් පූජාවළිය බලා කරගත්තබෙන බැවින් ද පූජාවළියෙහි එන වර්ෂප්‍රමාණය රාජකීය ලෙඛන මාර්ගයෙන් දක්වනලද බව සිතිය හැකි බැවින් ද පූජාවළිමතය පිළිගත හැකි බව පෙනේ. මේ අනුවැ මේ ග්‍රන්ථසම්පාදක පස්වන කස්සප මහරජතුමාගේ රාජ්‍යසමය ක්‍රි: ව: 974 – 980 වත් අතරේ වියැයි නිගමනය කළයුතුය. එනම් ශ්‍රී බු: ව: 1518 –1524 වත් අතරේ කාලය යි. මේ මතය බොහෝ දෙනකුත් නො පිළිගනිතත් ඔවුන්ගේ විමර්ශනයට ලක්කර තැබීම මගේ අදහස ය. මගේ විමසීම ද මෙයින් නො නැවතුණු බැවින් මේ අදහස පසුකලෙක වෙනස්විය හැකිය.

ශ්‍රී මේඝවණ්ණාභරණයාගේ පවත් සතරවන කාශ්‍යපනරෙන්ද්‍රයා නෙක් මහාවංශයෙහි හා පූජාවළියෙහි එන රාජ්‍යවර්ෂයන් සංසන්දනය කර බැලීමේ දී ලැබෙන පරතරය සුළුපටු නො වේ.

	වර්ෂ	මාස	දින
දුර්ජයභූති	—	6	6
කීර්තිශ්‍රීමේඝ	—	—	19

	වර්ෂ	මාස	දින
සඞ්ඝතිස්ස	...	...	...
අග්ගබෝධි iii (පළමුවර)	—	6	—
ජෙට්ඨතිස්ස iii	—	5	—
අග්ගබෝධි iii (දෙවනවර)	16	—	—
දුට්ඨොපතිස්ස i	12	—	—
දප්පුල i	3	7	—
මාණවම්ම	...	...	...
කස්සප iii	...	...	...
අග්ගබෝධි ix	3	—	—

1 මහාවංශයෙහි එන මේ රාජ්‍යවර්ෂයන් සංකලනය කළවිට වර්ෂ 35 මාස 6 දින 2 ක් ලැබෙයි.

දුපුළුසෙන් (දුට්ඨගාමණී)	—	6	—
කුඩනිස්සිරිමෙවන් (කිත්තිසිරිමේඝ)	19	—	—
ලමැණ්ඩිඝානා	9	—	—
සහතිස් (සඞ්ඝතිස්ස)	—	2	—
සිරිසඟබෝ (අග්ගබෝධි iii)	16	—	—
දෙවුනිස් (ජෙට්ඨතිස්ස)		5	—
ලමැණ්දළුපතිස් (දුට්ඨොපතිස්ස i)	12	—	—
දුපුළු (දප්පුල)	3	3	—
මහලැපාණ (මාණවම්ම)	35	—	—
කසුබු (කස්සප iii)	7	—	—
අක්බෝ (අග්ගබෝධි ix)	5	—	—

2 පූජාවළියෙහි එන මේ රාජ්‍යවර්ෂයන් එකතු කළවිට වර්ෂ 107 මාස 4 ක් ලැබෙයි. මෙහි දක්වනලද්දේ ග්‍රන්ථදෙක්හි එන විෂම රාජ්‍යවර්ෂයන් පමණ යි. මේ දෙකින් ලැබෙන පරතරය වර්ෂ 71 මාස 9 දින 2 කි. මෙතරම් පරතරයක් ඇතිවූයේ කෙසේද යි නිසි පරිදි පරීක්ෂණයක් නො කොට පස්වන කසුබ්මහරජතුමාගේ රාජ්‍යසමය ගැන නිගමනයක් කළ නොහැකිය මේ පරීක්ෂණය කිරීමෙහිදී පුස්කොළ පොත් කිපයක් සපයා මහාවංශ – පූජාවළි ග්‍රන්ථ දෙක ම ශෝධනය කළ යුතු වෙයි. එයට මේ තැන් නොවන බැවින් විමර්ශනයට ඉඩ තබා එතෙක් පූජාවළිමතය **පිළි** – ගත යුතු බව මගේ අදහස යි.

---

1. මහාවංශ 40 – 52 පරිච්ඡේද. 2 1919 මුද්‍රිත පූජාවළිය 686 – 687 පිටු.

කරුණු මෙසේ හෙයින් එතද්ග්‍රන්ථකාරක පස්වන කසුබ් මහරජතුමා ක්‍රි: ව: 974 – 980 ටත් අතරැ රජය කළ බව විමර්ශනයට ඉඩ තබා ගෙන ඉදිරිපත් කරමි. මේ කාලය තුළ **දහම්පියා අටුවා සහිත** කරන ලද බව මෙයින් සිතිය හැකිය. විමසත්වා.

භාෂා තත්ත්වය.

මෙහි භාෂාතත්ත්වය ගැන කිය යුතු කරුණු බොහෝ වෙති. මෙහි ලා ප්‍රධාන වශයෙන් අනුගමනය කරන ලද රීතිය කියයුතු වෙයි. සිංහලයෙහි ලැබෙන 'චතුර්විධ රීතීන් අතුරෙන් **අනුරාධපුර රීතිය** මෙහි ලා අනුගමනය කළ බව පෙනේ. මෙහි රචන ශෛලිය දීර්ඝසමාස විරහිත ය. අල්පසමාසපරිමිත ය. පෙළ බසින් පැමිණි තත්සම – තද්භව ශබ්ද බහුල ය. අල්පප්‍රාණාක්ෂර බහුල ය. මෘදුපදසංචලිත ය. ඇකාර ප්‍රයුක්ත ය. එහෙයින් මේ ග්‍රන්ථය අනුරාධපුරරීතියෙන් කරන ලදබව කිය යුතු ය. කොවින් කියතොත් සිංහලයෙහි මෙනම් රීතියක් ඇති බව නහා දැක්වීමට උපයෝගී කරගත යුතු දැනට පවත්නා ඉපැරැණි ගද්‍යග්‍රන්ථය ත් මෙය මැ සි.

"හිරුරස් පහරුන් මෙ මැවිපිඬි සත්තඩක් වැ පැළි හිරුරස් නො පහරුන් මෙ දියෙහි කුමුදුයෙන් මුදුන් නො පැළි. කිබිසිසඳ නැඟි හිරුරස් පහරුන් මෙ කුමට නො පැළි යැ? 'උගඟඤ්ඤෙන සුරියෙ එලතු'යි කාල නියම මකාට සාප දුන් බැවින් උගඟත සුරිය සැඳැ හිරුරස් පාළ ද නො පැළි."

(තිසසතෙර වත්ථු.)

මේ වාක්‍යප්‍රදෙශයෙහි දීර්ඝසමාස නැති බව ත් සමාස පද මද බව ත් මොළොක් පද ඇති බව ත් අල්පප්‍රාණාක්ෂර බහුල බව ත් පැනෙයි.

"විජානෙහි පඨා ජිලියෙමින් අවුජ් ඉඨපාඨමුන් රහත් එල සමඟ කෙළපත් බැවින් එකෙණෙහි මෙ බුදුහු 'ජලිනිඩි' නම් වෙති. නොහොත් බෝමඬ නැසමාමිහි ගඬඩමුල ඉඩිවිඩ සැණ වෙසෙසින් පැවැති බැවින් 'ජුදු ඉඩිවිඩ සැණ ඇතියහු විසින්' යනු වේ."

(චකඛුපාලතෙර වත්ථු.)

මේ වාක්‍ය ප්‍රදේශයෙහි දීඝීසමාස නැති බව ත් සම්සපද මද බව ත් තද්භව ශබ්ද බහුල බව ත් අල්පප්‍රාණාක්ෂර අධික බව ත් පැනෙ යි.

"චතුමධුර පුනිමුතන දෙජ එක් මෙ රොවට පිළියම් හොතුජ් චතුමධුර තබා පුතිමුතනයෙන් පිළියම් කල මහණහු මෙ වඩා අපිසේ යු බැවින් ධම්දෑයද සුන්හි මෙ බුන් ඉතිරි බන් බිජ්ෂ මහණුවම් කළහු වරය් නො බිජ්ෂ මහණුවම් ගෙලෙ වැඩියෑ සුසයින් විකල් වල දය් පෙහෙවුවහු වරා නො වළජ යෑ පෙහෙ වූ මෙ වැඩියෑයි දක්වනුව වස් කියුවෙන්."

(සාම්වතියා වත්.)

මේ වාක්‍ය ප්‍රදේශයෙහි යට කී ලක්ෂණ ත් සුදුසු තන්හි ඇසාරය ප්‍රයුක්ත කළ සැටි ත් පැනෙ යි. මෙසේ මෙහි අනුරාධපුර රීතිය ප්‍රයුක්ත බව පැහැදිලි වෙයි.

මේ ග්‍රන්ථයෙහි භාෂාතත්ත්වය ගැන වැඩි දුරට ත් සලකා බලන විට තනහි තන්හි පොළොන්නරු රීතියට බර වැ ගිය තැන් ද දක්නට ලැබේ.

"සඛාපියඅමපතතිගුණ හා පරාපුතිපතතිගුණ කියුහ. 'ලොභනනදස්ඝිනා ජලිතිඩිනා' යනුයෙන් සඛාඤ්ඤ සමපත්තිගුණ කියුහු. 'සදධමමපජෙජාතො ජාලිතො' යනුයෙන් පරාඤ්ඤුතිපත්තිගුණ කියුහු. දෙගුණින් බුදුන් පුණාමාරහ සේ දක්වා දුන් පුණාම කෙරෙහි."

(වක්ඛුපාළත්‍ථෙර වත්තු.)

යන වාක්‍ය ප්‍රදේශය ද,

"වජ්‍රකායතා නම් පරොපක්‍රමයෙන් නො බිඳෙන බැවැ. ජීවකයන් සැත්පහර පරොපක්‍රම නම් නො වෙයි. එයින් වජ්‍රකායතාවට හානි නැති යෙන්, එසේ හොත් තෙරුන්සැලි පහර හි ලේ තනින් කුමට සිලිය යත්:- විදුරෑ නො බිඳෙනුයු අවුවෙහි තුබු හුණු තවාහි විනසයින් උවකුම් හමියෙහි නො බිඳෙනුයු අනනත්වලන මාත්‍රයෙක් වේ."

(දෙවිදත් තෙරුන් වත්.)

ඝන වාක්‍යප්‍රදේශය ද එයට නිදසුන් වේ. මේකල භාෂාතත්ත්වයට වඩා මෙහි පැහැදෙන තවත් විශෙෂ ලක්ෂණයෙක් නම් ඇතැම් පාළි ශබ්දයන් තත්සමරූපයෙන් ද ඇතැම් තද්භවරූපයන් මහා ප්‍රාණලක්ෂණයෙන් ද යෙදීම ය.

මහාපවිපක්ඛ – ඉඩ්ඛිඛ – සඛ්ය – පදබ්‍යඤ්ජන – ඛරුණා – පිති – ඝිහළ – මඝඛ – විහාර – ඛථා – ඛය – වය – ඛාය – ඛන – රෙණු – සාම්‍යාලපන – ධම්මාසන – අබල – අංගුලි ඝාන – ඨණ – නියත – චවර – භය – අබ්භුත – සාමණෙර – ඉන්ද්‍රියඛද්ධ–ආඝ්ඝසමාචාරික-පාඝ – ආවජ්ජන – අධිට්ඨාන – වුට්ඨාන – සමාපජ්ජන – ධාතු – ඝරණ – පුරිම – අභියොග – පාඝඛ්හිය – අඩ්ඩාළ්හඛ – මහාඝණ – උද්දඝ – මහාමුනි අනුනාව;

මේ ආදි පාළි ශබ්දයන් සිංහලසවරූපය ගන්වා මේ ග්‍රන්ථයෙහි තත්සම වශයෙන් යොදා තිබෙන බව මෙතැනින් පැහැදිලි වෙයි.

විඝඩ්ඩන් – පූහා – සඛර – උඛ්ඛුනිඛම් – පිළිඝු – පිළිඛෙවු අනුභවු – භවුන් – සථර – අඛිඨන් – අඛියර – රුවාරූඛන් – ධම්පුරූ – සිඛ – විථර – පිළිසථර – විඛඹුන් – මනඛම් – මහාඝිනික්මන් – මෙවුන්ධම් – උවඨන් – සහව් – ඔහය් – නම්ඨන් – සිඝුතජඛන් – දීඛම් – ඇඛැනි – ඛැරූ – අඝිභවය් – ධාතූඛන් – අඝිරී – රැසිඨන් – අඛම් – ඇඛිමනි = අඛන් – ධම්සොඝුඛම් – විමොඛ – ධැම්කියා – ඝැලූ;

මේ ආදි තද්භව ශබ්දරූපයන් මේ ග්‍රන්ථයෙහි තන්හි තන්හි යොදා තිබෙන බව ද පැනෙයි. මේ ග්‍රන්ථය සංඝකෘත වචනයන් ගෙන් හා පාළිසංඝකෘත මිශ්‍ර වචනයන්ගෙන් පොහොණය ලබා තිබෙන බව මතු දැක්වෙන නිදර්ශනයන්ගෙන් පැහැදිලි වෙයි.

ධම්පද - සංවර්ණනා – නමස්කාර – මහාවිෂය – සඛාඩ්ඩ – පරාඩ්ඩ – ප්‍රතිපත්ති – නෛෂ්ක්‍රම්‍යික – එකාංශාඩ්ඩ – සුපර්ණ – අල්පාච්තර – ප්‍රතිග්‍රාහක = නෛරුක්තික – දෞශ්ශිල්‍යමල – අන්වෙෂණ – තදභිප්‍රාය – හෘදග්‍රය – ඝටික – ප්‍රත්‍යයොද්ධාර - ඒකත්වනය – ද්‍රව්‍යක්ෂය – විහාදූඩ්ඩ ග්‍රැතිරම්‍ය – විමර්දික්ෂම – ආග්‍රව – විශෙෂණ – ජීවග්‍රාහ – ලක්ෂණ – විෂයොපචාර – කෙලෂකාලුෂ්‍යාපගමන – විධවංසන – පක්ෂ – අන්‍යාපදෙශ – සකෂි – ප්‍රකාර – අඩ්ඩ;

යනාදි සංසකෘතවචනයන් සිංහලසවරූපය ගන්වා මෙහි තන්හි තන්හි යොදූ තිබෙන බව පැනෙ සි.

ප්‍රණාමාරහ – තයසහවර්ජිතදෙශකාල – පීතිපාමොජ්ජ ග්‍රහණ – ක්‍රීඩොපරිශුද්ධමඩ්ඡමංස – සරහසැඳඟිතසඛර – ලකඛණාත්මක – පරිසෙඛාපි – ආරම්මණශබ්ද –

යනාදි පාළි සංස්කෘත මිශ්‍ර වචනයන් සිංහලසවරූපය ගන්වා මෙහි ප්‍රයුක්ත බව පෙනෙසි. මෙහි භාෂාතන්ත්‍රය මැනැවින් පිරික්සන්නකු හට තවත් පෙනී යන කරුණක් නම් සිංහල ප්‍රාකෘතලක්ෂණයුක්තාශබ්දයන් ද තන්හි තන්හි පවත්නා බව සි.

අනගමි – විතර – තෙර – පිරිවජ – බිහ – බව – අඩවුලි – පවුඳු – ලවු – අවර – හුදි – උවනිස – තවකිස – මුනිදෙපි – කියව්ය – ජසි – ජෙනෙ – සුණහ – ජතුවහ;

යනාදි නිදර්‍ශනයන් ගෙන් ඒබව පැහැදිලි වෙසි. මෙහි **ජෙනෙ** යන තන්හි පැනෙන අන්ත ඒ කාරය සිංහල ප්‍රාකෘතයෙහි ලැබෙන ඒකාවචන ප්‍රථමා විභක්තිප්‍රත්‍යය සි **සුණහ – ජතුවහ** යන තන්හි පැනෙන **හ** කාරය සම්බන්ධවිභක්ති ප්‍රත්‍යය සි. මෙසේ මේ ග්‍රන්ථයෙහි සිංහලප්‍රාකෘත ලක්ෂණය ද දක්නට ලැබේ.

තවද මෙහි දක්නට ලැබෙන වාග්විද්‍යානුකූල ශබ්දධර්මයන් නිසා භාෂාතන්ත්‍රය පිරික්සන්නන්හට මේ ග්‍රන්ථය මහා නිධානයක් වැනි වෙසි. මෙහි පැනෙන අක්ෂරයන් ගේ සම්භරණය ද විභම්භරණය ද ස්වරභක්තිය ද අපිනිහිතිය ද සංහෘතිය ද අපවය ද ආදිසවරලොපය ද අන්තසවරලොපය ද ආදිසවරදීර්ඝය ද වර්ණොපජනනය ද සවරශෙෂය ද වාග්විද්‍යාඥයනට අතිශය ප්‍රයොජනවත් වෙසි. මාතෘභාෂිය වචනයෙක පැනෙන විෂම සවරය හෝ විෂම ව්‍යඤ්ජනය සියඛසට පැමිණි වචනයෙහිලා සමසොව යෙදීම **සම්භරණ** නම් වේ. හේ වනාහි පූර්ව – පර – පූර්වපර වසින් ත්‍රිවිධ වේ.

රූවි > රිසි; කිලෙස > කෙලෙස්; > පවිවෙඛ > පිළිවේ; පරිකඛාර > පිරිසර; කුමි > කිළි; ඔනු > දුනු; පරිවාර > පිරිවර;

යනාදි ශබ්දයෝ පූර්වසම්භරණයට නිදර්‍ශන වෙති. පර වැ සිටි සවරය පූර්වයෙහි සිටි සවරයට සම කොට යෙදී තිබෙන බැවිනි.

උප්පල > උපුල්; වුට්ඨාන > වුටුහන්; කුණ්ඩලි > කුඩුල්; උත්තර > උතුරු; උපඝම්පද > උපසපු;

යනාදි ශබ්දයෝ පරසම්කරණයට නිදර්ශන වෙති. පෙරටු වැ සිටි සවරය පර වැ සිටි සවරයට සම කොට යෙදී තිබෙන බැවිනි.

පරිසුද්ධ > පිරිසුදු; පාරිප්ලවඤ්ඤ > පිරිප්‍රහු; පරිනිබ්බුත > පිරිනිවි; කාදුණ > කුදුණු; තරුණ > තුරුණු; පලුට්ඨ > පුලුවු;

යනාදි ශබ්දයෝ පූර්වපරසම්කරණයට නිදර්ශන වෙති. පෙරටු වැ සිටියා වූ ද, පර වැ සිටියා වූ ද සවරයන්ගේ සම්කරණය පැතෙන බැවිනි. මේ සවරයන්ගේ සම්කරණයට නිදසුන් පැ සැටිය. මෙයට **සදෘශීකරණය** යනුද කියනු ලැබේ.

මාතෘභාෂිය ශබ්දයෙහි පවත්නා සවරය ඒ ශබ්දයෙහි නැති විෂමසවරයකට පමුණුවාලීම **විෂමීකරණ** නම් වේ.

ආරම්මණ > අරමුණ; ඉඤ්ඡොපත්ත > ඉදුනොවු; පදර > පුවර; ලක්ඛණ > ලකුණ; කාහාපණ > කහවුණ; මිග > මුව; මනුස්ස > මිනිස්; මඛඵල > මහුල්;

යනාදි ශබ්දයෝ මෙයට නිදසුන් වෙති. මූල ශබ්දයෙහි නැති විෂම ස්වරයක් පැතෙන බැවිනි. මෙයට **විසදෘශී කාරණ** යනුද බැවහර කරනු ලැබේ. මූල ශබ්දයෙහි පැතෙන සංයෝගාක්ෂර යෙහි අතරෙහි සවරයක් යෙදී ඒ සංයෝගාක්ෂරය බිඳියාම **සන්ධ්‍ය නක්ති** නම් වේ.

ලිඛ්ඛ > ලෙලහ; උදහ්ර > උදහුරු; මිත්‍ර > මිතුරු; පවිත්‍ර > පිවිතුරු; උපද්‍රව > උවදුරු; මන්ත්‍ර > මතුරු; ඉන්ද්‍රිය > ඉඳුරු; අර්ථ > අරුත්;

යනාදි ශබ්දයෝ මෙයට නිදසුන් වෙති. මෙහි සංයොගාක්ෂරය අත - රට සවරයක් . වැටීමෙන් ඒ සංයොගය බිඳුණු බැවිනි. යම්කිසි මූලශබ්දයෙක්හි පසු වැ සිටි සවරයක අපෙක්ෂාවෙන් මුලින් සිටි සවරයකට අන්‍ය සවරයක් වීම **අපිනිහිති** නම් වේ.

ඡවි > සැව; ජාති > ජෑති; අඞ්ගුලි > ඇඟිලි; අම්හි > ඇමි; අත්ථි > ඇති; නත්ථි > නැති; ආපත්ති > ඇවැත්; රාසි > රැස්;

යනාදි ශබ්දයෝ මෙයට නිදර්ශනයහ. මෙහි පසු වැ සිටි **ඉ** කාරයේ අපෙක්ෂාවෙන් මුලින් සිටි අවර්ණය ඇකාරඛවට පැමිණ තිබෙන බැවිනි.

යම්කිසි ශබ්දයෙක ව්‍යඤ්ජනාක්ෂර දෙකක් අතර පිහිටි සවරය නැසියාම **සංහෘති** නම් වේ.

සික්ඛිත > ශික්ත; යොජන > යොන්න; දෙමනස්ස > දෙමීනස; සොමනස්ස > සොමිනස; අනුසාසන > අනුසස්න; කම්මට්ඨාන > කම්ඨන්; පබ්බාජනීය > පැවැජ්නී;

යනාදි ශබ්දයෝ මෙයට නිදර්ශන වෙති. මෙහි මධ්‍යගත ස්වරය ලොප් වූ බැවිනි. යම්කිසි ශබ්දයෙහ සමාන අකුරු දෙකක් එක නැන සිටි විට ඉන් එකක් නො කියා හැරීම අපච්ඡ නම් වේ.

විපස්සනා > විවස්සනා > විවස්නා; නිස්සරණ > නිස්සරුණු > නිසරුණු; වණ්ඩපජ්ජොත > සැඬපජ්ජොව් > සැඬපජොව්; බජ්ජක > කජ්ජු > කජු; පඤ්චඝතක > පන්සියය > පන්සිය;

යනාදි ශබ්දයෝ ද;

පරිවයයෙන් = පරිවයෙන්; විෂ්‍යයෙකි=විෂයෙකි; සිඤ්ඤක සියුක්කෙකි = සියුක සියුක්කෙකි;

යනාදීහු ද මෙයට නිදර්ශන වෙති. මෙහි එන නැන සිටි සමානාක්ෂර දෙකින් එකක් නො කියා හැරි බව පෙනෙ සි.

අනන්න > අනත් > නත්; අරහන්න > අරහත් > රහත්; උත්තම > උතුම් > තුම්; අනොතත්ත > අනොතත් > අනුතත් > නුතත්; අපරාධ > අඛරද > වරද;

යනාදීහු ආදිස්වරලොපයට නිදර්ශනයහ. උච්චාරණයෙහි දී මුල් ස්වරයව උපඝාතය නො වැටීමෙන් මේ ලෝපය වූ බව සැලකිය යුතු ය.

හත්ථ > හත්; අත්ථ > අත්; වත්ථ > වත්; දුක්ඛ > දුක්; යක්ඛ > යක්; බුද්ධ > බුද්; චිත්ත > සිත්;

යනාදි නිදර්ශනයන් ගෙන් ශබ්දයන්ගේ අන්තස්වර ලොපය පැනෙ සි. ශබ්දයෙහ කෙළවරැ සිටි ස්වරය නො කියා හැරීම **අන්තස්වර ලොප** නම්. මේ අන්තස්වර ලොපය සිය ඔසෙහි බෙහෙවින් දක්නට ලැබේ. නො කියා හළ අකුරක් වෙනුවට පූර්ව්වස්වරය දීර්ඝවීම **ආදිස්වරදීර්ඝ** නම් වේ.

පුබ්බභාග > පුබ්බා > පූහා; කොප්ප > කොව් > කෝ; සොක > සොව් > සෝ; රොග > රොව් > රෝ; ලොක > ලොව් > ලෝ;

යනාදි නිදර්ශනයන්හි ආදිසවරදීඝීය පැනෙ යි. එහෙයින් මෙවුහු ආදිසවරදීඝීයට නිදසුන් වෙති. උච්චාරණ සෞඛ්‍යය සඳහා ශබ්දමධ්‍යයට ව්‍යඤ්ජනාක්ෂරයක් අමුතුවෙන් උපදවාලීම **වණ්ණොප ජනන** නම් වේ.

වානර > වනුරෑ > වදුරු; කිනනර > කිනුරෑ > කිදුරු; පණණකාර > පණුරෑ > පඬුරු; කම්මාර > කම්මුරෑ > කම්බුරු; තාමරස > තාමර > තමුරු > තම්බුරු;

යනාදී ශබ්දයෝ මෙයට නිදර්ශනයහ. මෙහි අමුතුවෙන් **'ද් - ඩ් - ඬ්'** යන ව්‍යඤ්ජනයන් වැටී තිබෙන බව ත් ශබ්දගත **න** කාරාදිය අඕනුනාසික වෑ ඒ ව්‍යඤ්ජනයන්හි බැඳී පවත්නා බව ත් පෙනේ.

ඔම්කිසි ශබ්දයෙහෑ උදුරාගත් අකුරෙහි පිහිටි ස්වරය ඉතිරිවීම **සවරශෙෂ** නම් වේ.

අජකත්තිඤ > අදදූනි > අදඇනි; සුඛඝන > සුදදන් > සුදඅත්; පණ්ඩුකම්බල > පඬුකැඹුල් > පඬුඇඹුල්;

යනාදි ශබ්දයන්හි සවරශෙෂය දක්නා ලැබෙයි. මෙහි මධ්‍යගත **ද්-ක්** යන ව්‍යඤ්ජනයන් උදුරාගත් කල්හි එනි වූ **ඇ-අ-** යන සවරයන් ඉතිරිවී තිබෙන බව පෙනේ. මෙසේ වාග්විඤ්ඤාපනට මැණික් වැනි අගනා ශබ්දධර්මිනීන් ද වණීධර්මිනීන් ද මෙහි භෂාතත්ත්වය පරිරක්ෂණය කරන්නවුනට සොයාගත හැකි බව පෙනේ. මේ ග්‍රන්ථයෙහි ඇතැම් පාළිපදයනට පාළියෙන් මැ අර්ථ කීමෙන් ග්‍රන්ථකර්තෘන්ගේ භින්නරුචිකත්වය මැනැවින් පැහැදිලි වෙයි. එය කර්තෘතත්ත්වය විමසීමට විනා භාෂාතත්ත්වය විමසීමට ඉවහල් නො වේ.

මේ ග්‍රන්ථය ශොධනය කිරීම අතිශය දුෂ්කර කාර්‍යයෙකි. ඒ දුෂ්කරකාර්‍යයට පළමු කොට මැ සිත තතු කරන ලද්දේ **ගෞරවාර්හ දෙඩම්පහළ සුමඟල මහා ශොධන තත්ත්වය සථවිරයන් වහන්සේ** විසිනි. මෙයට හවුරුදු සත්සාලිසකට පමණ පෙරැ උන්වහන්සේ විසින් කරන ලද ඒ ශොධනය එක් කාණ්ඩයකට පමණක් සීමිත විය. මේ මුළු ග්‍රන්ථය මැ ශොධනයට පත්කරන ලද්දේ **ශාස්ත්‍රාචාර්‍ය ඩී. බී. ජයතිලක මහතාණන්** විසිනි. වර්ෂ 1929 වැන්නෙහි අවසානභාගයෙහි මෙහි එක් කොටසක් ශොධනයෙන් පළකරවන ලද **ශ්‍රීමත් ජයතිලක මැතිතුමා** වර්ෂ 1933

වැන්න අවසන් වන්නට කලින් මුළු ග්‍රන්ථය ම ඈ ශොධනයෙන් ප්‍රකාශයට පමුණුවන ලදි. මෙසේ ජයතිලක මැතිතුමන්ගේ ශොධනයෙන් ප්‍රචාරයට පත් **ධම්පියාඅටුවාගැටපදය** ශ්‍රී ධර්මෝදය පරිවෙණාධිපති අස්මදුපාධ්‍යාය සුමංගලාභිධාන සංඝරාජයන් වහන්සේ ගේ ප්‍රසාදයට පාත්‍ර වූ සැටි ත් එහි ශොධනයට මූල පිරූ සැටි ත් උන්වහන්සේ ගේ ඉතා කෙටි සංඥප්තියෙන් හෙළිවෙයි. මෙහිලා **ශොධනතන්ත්‍රය** යන්නෙන් මා විසින් කරුණු දක්වනු ලබන්නේ මේ ශොධනය ගැන යි. එහෙත් ශ්‍රීමත් ජයතිලක මැතිතුමන් ගේ ශොධනය ගැන මෙහිලා යමක් කියයුතු මැයි.

ශ්‍රීමත් ජයතිලකශොධනය ඉතා මහන්සියෙන් කරන ලද්දක් බව එහි ප්‍රස්තාවනාවෙන් හා පුස්කොළ දහම්පියා අටුවා සන්නය මුද්‍රිත ජයතිලකශොධනයට සංසන්දනය කර බැලීමෙන් හා වැටහෙයි. ඒ ශොධනය නොයෙක් උපනාතිරික්ත දෙඅයන් ගෙන් යුතුවනු පුදුමයෙක් නො වේ. තමන්ගේ ශොධන තන්ත්‍රය ශ්‍රීමත් ජයතිලක ඉුරිහු මැ :-

> **"ශතවර්ෂගණනක් මුළුල්ලෙහි නෂ්ටප්‍රායව පැවැතුණු වෙවැනි ග්‍රන්ථයක් එසැවරම ශුද්ධකොට යථාස්ථානයට පැමිණවීම අතිශයින්ම දුෂ්කර කටයුත්තක් බැව් කවුරුත් දනිති. ඒ අැර අපට ඉතාම අනවකාශ කාලයෙක්හි මේ සංශොධන කර්ම්යෙහි = අපේ = අපේ සුතුහමකි.**

යන සවකීය ප්‍රසාදාවනා වාක්‍යයෙන් ගෙන හැරපාති මේ දහම්-පියා අටුවා සන්නය නැවත ප්‍රවිණයන් අතරට පැමිණියේ ජයතිලක මහතුන් ගේ මේ එළියෙනි. එහි මූලහත්ත්‍රය වටහාගත් කෙනෙකුන් හට මෙතුමන් ගේ ශුද්ධියෙහි ඇති අගය මැනවින් මැ වැටහෙයි. එහෙයින් මේ ජයතිලකශොධනයෙන් වූ උදුර ශාසනසංග්‍රහය ගැන හැම හෙළයන් විසින් මැ කෘතඥ විය යුතුය. යළිත් සම්පූර්ණ ශුද්ධියෙකින් සමුපලක්ෂිත කොට මේ ග්‍රන්ථය ප්‍රචාරයට පමුණුවාලන සත්පුරුෂයකු හට පහසුවන සේ ඇතැම් පාඨයන් ජයතිලක මහතුන් විසින් මැ සවකීය ශොධන යෙහි අඩොලිපිගත කොට තැබීම මහත් මැ ලාභයෙකි.

මෙසේ ශ්‍රීමත් ජයතිලක මහතුන් ගේ ශොධනයෙන් භූෂණය වූ **ධම්පියා අටුවාගැටපදය** පිරිවෙන්වල ගුරු ශිෂ්‍ය උභය පක්ෂය මැ පරිශීලනය කරන්නට පටන් ගත්හ. මේ ග්‍රන්ථය කෙරෙහි මහත් ළැදිකමක් දක් වූ **වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය**

පරිවෙණාධිපති අස්මදුපාධ්‍යාය සද්ධාතිස්සයන් වහන්සේ සබඳිය ශිෂ්‍යයනට පමණක් නොව අතිරෙක වැ ඉගෙනීමට පැමිණි ලඬකා විශ්වවිද්‍යාලයිය ශිෂ්‍යයනට ද මේ ග්‍රන්ථය කිපවරක් මැ ඉගැන්වූහ. මේ ග්‍රන්ථය වරින්වර ශොධනය කරන්නට උන්වහන්සේට සිදුවූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ඒ ශොධනය පන්සිය ගණනකින් අසිහ ශොධිතස්ථානයන් ගෙන් භූෂණය විය. මෙයට හවුරුදු සහස්‍රොසකට පෙර පටන් කරන ලද මේ ශොධනය අදවනතුරු ත් නිමාවට නො ගිය බව උන්වහන්සේ පවසති. එහෙත් ශොධිතප්‍රමාණයෙන් වත් පාඨකයන් අතට පමුණුවාලීමට උන්වහන්සේ කැමැත්ත දැක්වූ බැවින් පසුව ශතාධික ඒ ශොධිතස්ථානයෝ උන්වහන්සේ විසින් මැ සම්පාදනය කරන ලද මේ දනවිටියා අටුවා සනෑ ගැටපදයෙහි ඇතුළත් කරන ලදහ. ශ්‍රීමත් ජයතිලක මහතුන් ගේ ශොධිත ග්‍රන්ථය මැ ඇසිරි කොට ගෙන ග්‍රන්ථානතර පරිකර්මණයෙන් ද විමර්ශනඥානයෙන් ද උන්වහන්සේ විසින් ශොධනයට පමුණුවන ලද ස්ථානයෝ මෙහි මූලග්‍රන්ථය මත්තෙහි ශොධනය කරන්නකු හට අතිශයින් උපකාර වෙති. උන්වහන්සේ ගේ ප්‍රාර්ථනය ද එය මැයි. මේ ශොධනයට පුස්කොළ පොත් වලින් වැඩි පිහිටක් නො ලත් බැවින් විමර්ශනඥානය මැ පිහිට කොට ගෙන නිබේ. එසේ ශෝධනය කරන ලද ස්ථාන කතිපය පහතෙක් මෙහි වෙති.

1. **'විඤ්ඤෙහි පඨා' යනු 'පඬිත්හි' යි ශුද්ධ කෙරෙති. 'විඤ්ඤූන්' යනු මැ මැනව.** (විඤ්ඤූන් + එහි = විඤ්ඤෙහි; 'විඤ්ඤෙහි' යන පාඨය මැ මනාබව මෙයින් තේරුම් ගත යුතුය.) 5 – 6
2. **'ඇස් නට සේ යව වැ' යි පොත්හි තිබෙයි.....ඇස්නටසේයට දුක්පත් වැ' යි පාඨශොධනය කටයුතු.** 22 – 24
3. **'කම් නො කියු සෙයින්' යන නිරර්ථක පාඨයෙක් පොත්හි තිබෙයි. 'කම්කෘදහි කියු සෙයින්' යනු නිර්ඛයුතු පාඨ යි.** 44 – 42
4. **'තෙරුන් ප්‍රොත්සාහයෙන්' යනු 'තෙරුන් ප්‍රයෝග යෙන්' යි වුව මැනව.** 75 – 84
5. **'මනොක් කුමකට හෙනුයයි' යනු 'මේ කුමක් කට හෙනු යයි' යි ගන්නේ.** 87 – 103

6. **'උඑ බැජනුවට බඳුන් වන් කළ තැන්' යනු 'බඳුන් බැජනුවට උඳුන් කළ තැන්' යි ගන්නේ.** 90 – 107
7. **'අපපමාද නම් යි ප්‍රඛන් සතර කඳු' යනු 'අපපමාද නම් ඔ ප්‍රඛන් යතර කරුණ්' යි ගන්නේ.** 121 – 149
8. **'ගෙහෙයඩි තහමි' යනු 'හෙ හෙ යඩි තකමි' යි ගන්නේ.** 122 – 153
9. **'එබැවින් ඇයට නිම්මානයිය මුහුකළ මිහිණියට යන අගිප්‍රාඹි' යනු 'එබැවින් බහු දිහිණියට මුහුලුකු මේ ගම නිඹිය යන අගිප්‍රාඹි' යි ගන්නේ.** 127 – 160
10. **'දෙකන ගත් වෙලෙඩි කළල නො දක්වස් මැදින් නික්මෙන්' යනු 'දෙකනත් පලස් කැළල නො දක් වස් මැදින් නික්මෙන්' යි ගන්නේ.** 150 -204

මේවැනි සොඩිතඅඨානයන් සියගණනක් මෙහි ඇති බව සැලකිය යුතුය. මෙවැනි තැන් ශොධනය කිරීමට උන්වහන් සේ මහත් තැතක් ගන්නා ලදබව මෙහිලා කියයුතු නො වේ. විමර්ශකයන්ට එහි තත්ත්වය මැනවින් වැටහෙන බැවිනි, මෙහිලා විසෙෂයෙන් සඳහන් කළයුතු කරුණෙක් ද වෙයි. එනම් උන්-වහන්සේ විසින් කරන ලද හෙළටුවා පාඨශොධනය යි.

ජයතිලක ශොධනයෙහි එන :-

(1) "'අපපමාදම්හි පණ්ඩිතා හජෙථ' (79 පිටුව)

(2) 'යොගෙ සොහෙවදුනකි උපද්දව හිදම්' (79 පිටුව)

(3) 'පයත් හකුරුලන ඔප්හි; හෙළටුවායෙහි 'සාළින් තහක් කරන ලනක ඔපැයි යෙන්' (136 පිටුව)

(4) ලකුණ්ටකොවදුනි කිරස්ස නැම්' (148 පිටුව)

(5) 'රහදෙ වදුන කිද ආවාටහි නම්' (149 පිටුව)

යන මේ හෙළටුවා පාඨයෝ මෙහි මෙස් එති.

(1) 'අපපමාදම්හි පණ්ඩිත ජෙනහ,' කියා හෝ 'අපපමාහි පණ්ඩිතෙ ජෙනෙ' කියා හෝ – (110 පිටුව)

(2) 'යොගෙ සොහෙවදුනකි උපදුව හිදම්' (111 පිටුව)

(3) 'අත්හකුරුලන ඔප්හි;.....සාළින් තහක් කරලන ඔප්හි. (177 පිටුව)

(4) 'ලකුණටකොව දුනි කිරස්ස නාම්' (191 පිටුව)

(5) 'රහදෙ වදුන කිද ආවාදිහි නම්' (192 පිටුව)

තවද පැලියගොඩ විදුලංකාර පිරිවෙන්හි අධ්‍යක්ෂක **යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම ස්ථවිරපාදයන් වහන්සේ** මජ්ඣිම නිකාය ග්‍රන්ථයට ලියන ලද සමන්තපාසාදිකාවෙහි හෙළටුවාපාඨ කිහිපයක් ශෝධනය කොට දක්වති. ඒ ශෝධනය ද අතිශය විමර්ශනාත්මකයෙන් කරන ලද්දක් බව පෙනියහ බැවින් මෙහි ලා තුලනය කිරීමට දක්විය යුතු ම ය.

(1) 'අපපමාදති පණ්ඩිතාහ ජෙන' කියා හෝ 'අපපමාදහි පණ්ඩිතහ ජෙනෙ' කියා හෝ. (22 පිටුව)

(2) 'යොගෙ වදනකි, උපද්දවහි නම්' (22 පිටුව)

(3) 'යත් හකුරු ලන සිප්හි; 'යන්න හක්කරහ ලනහ සිප' (23 පිටුව)

(4) ලකුණවතො වදනකි, රසස නැම්' (23 පිටුව)

(5) 'රහදෙ වදනකි,ආවාටහි නම්' (23 පිටුව)

මේ ශෝධනයන් ගැන දීර්ඝවිවරණයෙක් යටකි සමන්තපාසාදිකාවෙහි එයි. විමර්ශකයන් විසින් මේ උභය ශෝධනයන් තුලනය කොට බැලිය යුතුය. පළමුවන හෙළටුවා පාඨයෙහි **අපපමාදකි'** යනු **'අඛාටඛාසකි'** යනු බලා වියහැකි ය. එහෙත් මෙහි එන **අපපමාදමිකි'** යනු **'යොගෙ'** යනු බලා පාළිසවරූපයෙන් මෑ හෙළටුවායෙහි එන්නට බැරිකමෙක් නැහ. එහෙයින් දෙපාඨය මෑ මැනැවැයි හැඟේ. **'පණ්ඩිතාහ'** යනු තවත් විමසිය යුතුය. එසේ මෑ **'ජෙනහ'** යනුත් විමසිය යුතුය. දෙවන හෙළටුවා පාඨයෙහි ශ්‍රී ප්‍රඥාරාමශෝධනය මැනැවැයි නො හැඟේ. **'යොනෙ'** යනු **'යොගෙ'** යනු මෑ යයි ගෙන අදර්ශනයට පමුණුවාලීම විමර්ශනාත්මකය ශිෂ්ටීකරණයට වැටීමෙකි. **''සොහෙවදනකි=** ශය්‍යාපනය- ඔසිදුපනය හෙතුකොට ගෙන වන '' (III පිටුව) යනු වෙන් කරනු ලබන අර්ථකථනය විමර්ශකයන්ගේ චිත්තාරාධනයට ඉවහල් වුවහොත් ශ්‍රී ප්‍රඥාරාමශෝධනයෙහි ඌනත්වය පැනෙයි. **උපද්දවහි නම්'** යන ශෝධනය ද **''උපද්දව = උපද්‍රවයන් නිදම් = ඡිඳනය කොට ලිමසි;''** (III පිටුව) යන අර්ථකථනය මැනවි නම් විමසිමට ලක්වෙයි. මේ අර්ථකථනය මනා බව **''හැම උවදුරෙන් සෙම්වූ යත් මැනැමෙ''** යන දහම්පියා අටුවාසන්නපාඨයෙන් මෑ පැහැදිලි වෙයි. **'සොහෙවදනකි'** යන පාඨය **'සෙහෙදුවනකි'** යනු විසින් ද විමසිය හැකිය. මෙහි **'වදන'** ශබ්දය වචනපර්‍යාය නො වේ. මේ නම් තවත්

විමසිය යුතු තැනෙකි. **'යන්හකුරුලන'** යන ශ්‍රීප්‍රඥරාමශෝ -ධනය කැටපොල්ලෙන් ගල්විදීමට වඩා අතින් ගල්විදීම විස්මයජනක ශිල්පයක් වනබව විමර්ශකයන් පිළිගත හොත් තවත් විමසිය යුතුවෙයි. **"යනන හක්කරක ලනක සිප"** යන ප්‍රඥරාමශෝධනය ද "සාළිකායො එකෙති පහරිත්වා පාතෙතීති සාළිඝක සිපපං" යන දහම්පියා අට්ඨවාසත්‍යයෙහි එන නිරුක්ති ය අනුව නො මැනවි. **'සාළින් තහක් කරලන සිද්ධි'** සි මෙහි එන ශොධනය මැනවි. අධොලිපිය අනුව **"යනන හක්කරක ලනක සිප"** සි ශොධනය කිරීම ද හෙළටුවාව ගැළපෙයි. එසින් හෙළටුවාවෙහි මේ ශිල්පය ගැන අදහස් දෙකක් පවසා තිබෙන බව වැටහෙයි. මේ අට්ඨවායෙහි කි සෙසින් 'සාළින් තහක් කරලන' ශිල්පය **'සාළිඝක සිපප = අන්හකුරුලන සිද්ධි'** යන්නෙන් පැවසෙයි. **'ඇහිලි අතුරෙන් අකුරුලන සිප'** යන්නෙන් ද පැවසුණේ මෙය මැසි. කැටපොල්ලෙන් ගල් විදීම **"යන්ත හක්කරක ලනක සිප'** යන්නෙන් ගනිතත් **'සාළින් තහක් කරලන'** යන කොටස අස් කිරීමට යුතුන- මෙක් නැත. හෙළටුවාහි කි අදහස ත් මේ අට්ඨවායෙහි කි අද -හස ත් එකක් මැ නොවන බව **"මේ අටුවායෙහි ඒ සිද්- ගන්නු අහසින් යන ලිහිණියන් පැහැරි මරණ තැන් ගැනැ 'සාළිඝක සිපප' සුතු"** යන්නෙන් පැහැදිලි වෙයි. කැට පොල්ලෙන් ගල් විද පක්ෂීන් මැරීමට වඩා අතින් ගල් විද මැරීම විස්මිය, ජනක බව කාහට වුවත් වැටහෙයි. හෙළටුවාෟයහි මේ ගල් විදීමේ ක්‍රමෟදන මැ **'සාළිඝකසිපප'** යන්නෙන් ගන්නා ලදි. මේ අදහස සැබෑ නම් උභය ශොධනය මැ සම්පූර්ණ වියයුතුබව පෙනේ. තවත් විමසිය යුතු ය.

ශ්‍රී ප්‍රඥරාමශොධනයෙහි **"ලකුණ්ටකො වදනකි,රසස නැමි"** යනු ද විමසිය යුතු තැනෙකි. මේ ශොධනය හෙළටුවා වට ගැළපෙන සේ කරන ලද නමුත් පෙළටුවායෙහි **'ලකුණ්ටක භද්දිය'** යන නාමය හෙළටුවායෙහි **ලකුණ්ටක** යන නාම යෙන් මැ බැවහර කළබවට මේ වාක්‍යය සාධකයෙකි. එහෙසින් මෙය හෙළටුවා පාඨයක් වන ලෙස ත් ලකුණටක ව්‍යවහාර විශෙෂය හෙළිවන ලෙස ත් ශොධනය වියයුතු ය. එහෙසින් **'ලකුණ්ටකොව දුනි කිරසස නාමි'** යන මෙහි එන ශොධනය මැනැවැයි හැඟේ. මෙහි අදහස මේ සත්‍ය ගැටපද- යෙහි 191 පිටුවෙහි සඳහන් වේ. ඒ අදහස ත් බලා කවරක් මැනැවිදැයි විමසියයුතු ය.

ශ්‍රී ප්‍රඥාරාම ඝොඩනයෙහි '**රහදෙවදූනකි ආවාටහි නම්**' යන ඝොඩනය ද විමසිය යුතු තැනෙකි. මෙහි '**කිද**' යන්නෙහි **ද** කාරය කපා දැමීමෙන් **රහඳු** යනු මෑ ආවාටයට නම් බව කියා පැහ. **රහඳු** යනුත් **වදූන** යනුත් **කිද** යනුත් ආවාටයට නම් වෙයි යන අදහස ගතිතොත් මෙහි ඝොඩනය අනවශ්‍ය යි. එහෙයින් මෙහි එය ඝොඩනය ඝොට ඝරන ලදී. අර්ථකථනය මෙහි 192 වන පිටුවෙහි එයි. යළිත් ඝොඩනය ඝරන විමර්ශනය යනට ඉන් වනදු ලැබෙයි. බොහෝ හෙළටුවා පාඨයන්හි එන '**වදූන**' ශබ්දය දුටුපමණින් එය වචන ශබ්දප්‍රයෝගය ඝොට ම ඝනා ගැනීමට නොහැකියුතු. '**වදූන**' 'යනු **වචන**' යන්නෙන් බැඳීමට වූවක් ද නොවේ. දකාරයට **ආ**කාරය අක්‍රමාගතයි. එහෙයින් '**අභිධාන > ඔධාන > බිදූන > විදූන > වදූන**' යනු විසින් ආනත ප්‍රකාරය සැලකියයුතු ය. මෙසේ ආ **වදූන** ශබ්දය නාම වාචක යි. අර්ථකථනයෙහි දී වචනය යනු ද කිය හැකි යි. ජලනිධි වාචක **වදූන** ශබ්දය ඝොසේ පැමිණියක්දැයි විමසිය යුතු ය. '**පාථොනිධි**' ශබ්දයෙන් පැමිණීමට ඉඩ ඇති බව පෙනේ. '**සොහෙවදූනකි**' යන තන්හි එන **වදූන** ශබ්දය '**සංසිදූපන**' යන තන්හි පැනෙන **දූපන** යන්නෙහි විකෘතියෙකැයි සැලකිය හැකිය. 'දූපන > දූවන > වදූන' යනු විසිනි. කරුණු මෙසේ හෙයින් මේ හෙළටුවා පාඨයන්හි ඝොඩනය විමර්ශකයන් ගේ අධිකතර විමර්ශනයට මතුත් ලක්විය යුතු බව කියමිහ.

අස්මදුවාසී අනුනායක සවාමීන්ද්‍රයන් වහන්සේ විසින් මේ ග්‍රන්ථයෙහි ඝොඩනය ඝරන ලද්දේ පන්සියඑක්තිස් තැනෙකි. මේ ඝොඩනයට බෙහෙවින් අසුවී තිබෙන්නේ අර්ථව්‍යාඛ්‍යානාව වසරයෙහි ලැබුණු වාඛ්‍යප්‍රදේශයන් බව පෙනේ. සම්පූර්ණ ග්‍රන්ථය ක්‍රමානුකූල වැ ඝොඩනය ඝරන කෙනකුන් හට උදවුවක් කිරීම උන්වහන්සේ ගේ අදහස වූ බැවිනි. එහෙයින් මේ **දහම්පියා අටුවා සන්නය** ඝොඩනය ඝරන පින්වතුන් විසින් සත්පුරුෂ ධර්මයෙහි පිහිටා මේ ග්‍රන්ථයෙහි එන ඝොදින සථාන යන් ගැන ද විමසීම හෙළිය යුතුබව හිතවත් ඝාමින් සිහි ඝරවමිහ.

ශ්‍රී ධර්මෝදය පරිවෙණාධිපති අසමදුවාසී අනුනායක සවාමීන්ද්‍රයන් වහන්සේ විසින් මේ **දහම්පියාඅටුවාසන්නය ගැටපදය** ලියන්නට ආරම්භ ඝරන ලද්දේ සිංහල සාහිත්‍යයට සේවයක් ඝරන අදහසිනි. තමන් වහන්සේ වෙත ඉගෙනීමට පැමිණි ශිෂ්‍යයනට දහම් පියා අටුවා සන්නයෙහි ගැඹුරු තැන් පැහැදිලි ඝොට ඝොටස් වශයෙන් ලියාදීමට පටන්ගත් උන්වහන්සේ

ව්‍යාඛ්‍යා කන්ඩය

මේ පිරිවෙන්හි සාලක් උපප්‍රධානාචාර්‍ය්‍ය ධුරය දරු **පණ්ඩිත පහතමුල්ලේ ශ්‍රියදර්ශී** සංඝරාජාදයන් වහන්සේගේ ආරාධනය පරිදි ග්‍රන්ථයක් වශයෙන් මේ ව්‍යාඛ්‍යානය සැපයූහ.

මේ ව්‍යාඛ්‍යාකරණයෙහි දී ඇතැම් තැනෙක ගැඹුරු ලිහිල්පද ගැන විශෙෂයක් නො දක්වා පිළිවෙළින් පදගතාර්ථය පැවසීම ද, ඇතැම් තැනෙක විරසාලඳුෂිත වාක්‍යප්‍රදෙශයන් සංශොධනය කොට අර්ථකථනය ද, ඇතැම් තැනෙක ගැඹුරු වචන පමණක් උපුටා ගෙන අර්ථප්‍රකාශනය ද, ඇතැම් තැනෙක අනිධෙයාර්ථය හා නිරුක්තාර්ථය මුල් කරගෙන අර්ථදීපනය ද, ඇතැම් තැනෙක ශබ්දනිෂ්පත්තිය හැරෙන සේ පයර්‍යායවචන කතිපයක් දැක්වීම ද කළබව පෙනේ. මේ කරුණු සම්පිණ්ඩනය කිරීමට ප්‍රමාණවත් නිදසුන් මේ ව්‍යාඛ්‍යානය මැනැවින් කියවන විට හමුවෙති.

මෙහි පරිකථා දැක්විය යුතු ඇතැම් ශබ්දයන්ගේ විවරණය ද ව්‍යාකරණලක්ෂණ හා නිරුක්තිලක්ෂණ පැයුතු ඇතැම් ශබ්දයන්ගේ ප්‍රපඤ්චය ද, ඇතැම් ධර්ම කාරණයන්ගේ නිර්දෙශය ද දක්වන ලදබව පෙනේ.

> "**මෙහි 'ඉත්' නම් වාක්‍යමහාවාක්‍ය රූපයෙන් සිටි ශබ්ද සඤ්ඥාව සි. හෙවත් වාක්‍යරචනාව සි.** (1 පිටුව) "**මිනි දුවැන්නියක් යන මෙහි 'මිනි' යනු කොඤ්ඤා සි. ජිවිතෙන්ද්‍රිය බහා නුබු කොපුව එනම් වන බැවින්..... කෙනෙක් මෙසේ කියත්.**" (49 පිටුව) "**වැලඳ නම් අත්පසෙකි. විනයෙහි ඒ ඒ කාර්‍යයනට සුදුසු සේ නියමිත දෙඅත්පසෙක් වෙයි. එසෙක් දෙපියන් විය හැකි. එසෙක් දෙලොස් රියනෙකි. හේ මේ ශබ්දයා ගේ..... .....නිරුස්ස වී.**" (71 පිටුව.)

යනාදිය පරිකථා දැක්විය යුතු ඇතැම් ශබ්දයන් විවරණය කළ බවට නිදර්‍ශන සි.

> '**නා + මනා + කම්**' යනු '**නාම්නාම්**' යන මෙහි පදච්ඡෙද සි. '**මනාපාමනාපකම්ම**' යනු පාළිවචන සි. '**මනාප – අමනාප**' යනු හෙළවට '**මනඹ – අමනඹ**' යි පැමිණෙයි. දෙශබ්දයන්ගේ මූ අනන්‍යලොපයෙන් ස්‍රුච්‍යට දිර්ඝ වූ '**මනා, අමනා**' යි සිටගන්නී. සඤ්ඥාවිමෙන්..... දිස්වේ. (15 පිටුව)

යනාදිය සමහර තැනෙක ව්‍යාකරණලක්ෂණ දක්වනලද බවට නිදර්ශන සි.

> "ඉරු බඹනව්ව මුහුදු මවරළස ඔට බලන්නා හා ම සමුද්‍රජලයෙහි සැහවී ගියහු මෙන් පැනෙඩි. මේ අර්ථය තැතු පොරණැදුරෝ සූයඩිඤංගමයට 'එජ්සිම' සි නම් කළහ. 'අජ් + නැසිම' යනු මෙහි පදවිභාග සි. ආපස්ගි – ජලයෙහි සැහවීම යන අර්ථ සි. 'අජ් – නැඹිම යනු නිරුක්තනයෙන් 'එජ්සිම' සි සිදුව විය. 'යෙජ්සිම' – ඇජ්සිම' ආදි නානා විකෘත රූපයෝ එයින්ම හට ගන්හ. (54 පිටුව)

> "ඕදුඛ > ඕද්හ > ඕදු > ඉදු" (24 පිටුව) "උපකාර > උවහාර > උවහාල් > වහාල් > වහල්" (52 පිටුව.)

යනාදිය ඇතැම් ශබ්දයන්ගේ නිරුක්තිලක්ෂණ පැබවට නිදර්ශන සි.

> "මෙහි අනුනය නම් මාහියෙන් පහ නො කළ හොළු සුන්ගේ ඔන්හි නො කඩ වැ පැවැත්ම සි. පරියුට්ඨාන නම් සුදුසු අරමුණක් ලත් කෙණෙහි අනුශයාවස්ථා යෙන් සිත මැඩගෙන නැඟී සිටීම සි. චිත්තකම්ම නම් ධර්මනියමය ඉක්මවා කාය චිකැසුන්ති වච්චිකැසුන්හින් ගේ පැවැත්ම සි. (4 පිටුව.)

යනාදිය ඇතැම් තන්හි ධර්මකාරණයන්ගේ නිර්දෙශය පැබවට නිදර්ශන සි. මේ ව්‍යාඛ්‍යානයෙහි තවත් පැනෙන විශෙෂයෙක් නම් පාළිපදයනට අර්ථ කීමෙහි දී ග්‍රන්ථබාහුල්‍යභීතියෙන් මූල වචනය නො දැක්වීම සි.

> "සඳ්ධමෙමා එව = සඳ්ධර්ම ම; පජෙජාතො=පහන්වූයේ; –සඳ්ධම්මපජෙජාත නම්." (4 පිටුව.)

යනාදි තන්හි මෙනි. මෙහි 'සද්ධම්මපජෙජාත නම්' යන්නට මුලින් 'සද්ධම්මපජජාතතා' යන මූලවචනය නො දක්වන ලද බව පෙනේ. එය – මෙසේ ඉරිසැල්ලකින් හඟවන ලදි. මේ ව්‍යාඛ්‍යානයෙහි මෙවැනි තැන් තවත් දක්නට ලැබෙන බව දතයුතු ය. සමහර තැනෙක කසුබ්බසින් මැ අර්ථ කියන ලද බව පෙනේ.

"තස්මිං = ඒ මහත් මොහඅඳුරුයෙන් වළඳනා ලදුයෙහි (වෙළන ලද ලොව්හි සු මස් සි;" (3 පිටුව) "සබ්බ සාසනෙයාවසෙන වා = සව්සෙවෙන් විසින් හෝ (16 පිටුව) "ඛීණාසව බැව්=ගුණු අසවුන් ඇතිබව ය (55 පිටුව) "සමිද්ධා සබ්බකාමා සි = සුමුඩු වූ හැම කාම යෝ කියා;" (147 පිටුව)

යනාදිය එයට නිදර්ශන සි. මේ ව්‍යාඛ්‍යානයෙහි මෙසේ කාශ්‍යප නරනාථයන් ගේ භාෂාවිලාසයෙන් අර්ථ කියන ලද්දේ ග්‍රන්ථ වෛවිත්‍ර්‍යය පිණිස ය. කසුබ් මහරජතුමන්ගේ දහම්පියා අටුවා සන්‍යය ඉගෙන ගන්නවුන් දෙස බලනවිට ඔවුනට මේ අර්ථ කථනයෙන් දුෂ්කරයෙක් නො වෙයි. සවහාෂායෙහි ප්‍රවිණත්වයට බෙහෙවින් පැමිණියන්ගේ භික්ෂාරුචිසම්පාදනයට රුකුල්දීම් ද මෙයින් සැපයෙයි කසුබ්බස ද මැනැවින් පරිවය වේ සි

මෙසේ සම්පාදනය කරන ලද මේ **දහම්පියාඅටුවා සන්‍යගැටපදය** මුද්‍රණයෙන් ප්‍රචාරයට පත්කිරීමට අපහසු වැ සලෙක් ගත විය. ග්‍රන්ථය ලියා අවසන් කොට හවුරුදු සතරක් ගත වූ නමුදු මුද්‍රණකාර්‍යයව ඉදිරියට කරන්නට නො හැකි වූ අසමදෘෂ්‍ය අනුනායක සවාමීන්‍ද්‍රයන් වහන්සේ හැකිනම් සුදුස් සෙකුට පවරා මෙය මුද්‍රණයෙන් ප්‍රචාරයට පත්කළ යුතු බව මා සමග පැවසූහ. තද්ගුරු වචනය ට අවනත වූ මම මේ ග්‍රන්ථය මුද්‍රණය කරවීමේ කාර්‍ය්‍ය ඉදුරුව මුද්‍රණාලයාධ්‍යක්ෂක ආර්. සී. රණසිංහ මහතා ට පැවරීමි. මේ මුද්‍රණකාර්‍යයෙහි දී අත්තොපි ලියාදුන් ලේල්වල අමරභිත්ති-තලම්මැහැර විජය - මිරිහැල්ලේ පෙම්ඳ යන සථවිර තෙනම ද, මුද්‍රණීයපත්‍ර බැලීමට උපකාර කළ ගැටමාන්නේ පුඤ්ඤරත්න-වීරඹුවේ විමලභාරති යන සථවිර දෙන ම හා මාපලගම සොම්සසර-බළංගොඩ ප්‍රඥාවංශ-වාද්දුවේ විජිත නන්ද යන භික්ෂුවරුන් ද, මුද්‍රණව්‍යය සඳහා අනුබලප්‍රදානය කළ අප භිතවත් ගිහිපැවිදි පින්වතුන් ද, කාශ්‍යපනරනාථයන් රජ මැදුරෙහි දී ආවාසීපාදයන් හමුවෙහි අභිධම්මව්‍යාඛ්‍යානය රන්පත්හි ලියාලනු පිණිස කළ මූලික සාකච්ඡාව විදහාපාන පිට කවරයේ චිත්‍රය සකස්කර දුන් පින්වතා ද, මුද්‍රණකාර්‍යය මැනැවින් කරදුන් ඉදුරුව මුද්‍රණාලයයේ අධ්‍යක්ෂ මහතා ප්‍රමුඛ කාර්‍යමණ්ඩලය ද, කෘතඥතා පූර්‍වක වැ අනුස්මරණය කරමි. මේ ග්‍රන්ථය මුද්‍රණය කොට හවුරුද්දකට වැඩි කාලෙක් ගත විය. ශුද්ධි

පත්‍රාවලොකනාදි තවත් කටයුතු කිපයක් පැමිණි බාධා කරුණු නිසා අත පසුවිය. එහෙත් අවශ්‍යයෙන් කළයුතු මේ කාර්‍ය සොතරම් බාධා කරුණු පැමිණිය ත් අප්‍රතිහත ධෛර්‍යයෙන් මෙසේ අවසන් කරන්නට ලැබීම ප්‍රීතියට කරුණක් බව සඳහන් කරමි.

කියේ මැනු :-

"යො ඝදවීං ප්‍රාවියතෙ – ඝදවීං ඝටතෙ'ව්‍ව,
අවශ්‍යං තදවාප්‍තොනාති – න වෙවප්‍රාතොනා නිවත්‍තතෙ."

ඉඳුරුවේ ඤාණරාමාදී ස්ථවිර.

ශ්‍රී ධර්මෝදය පිරිවෙන,
වැල්ලවත්ත,
කොළඹ.
25 ජූනි 1951

පටුන

යමකවග්ග අට්ඨකථා සන්නයෙහි:- 1 - 82

1. චක්ඛුපාලත්‍ථේර වත්ථු (1-30) 2. මච්ඡකුණ්ඩලිවත්ථු (30-37) 3. තිස්සත්‍ථේර වත්ථු (37 - 40) 4. කාළියඛදිනියා වත්ථු (40 - 44) 5. කොසම්බිවත්ථු (44 - 48) 6. මහාකාළ තෙරුන් වත්ථු (48- 52) 7. දෙවිදත්ත තෙරුන්වත්ථු (52 - 53) 8. අඟ සුවුවත්ථු (53 - 65) 9. නඳතෙරුන්වත්ථු (66 - 70) 10. චුන්දසූකරිකයාවත්ථු (70 - 72) 11. ධම්මිකා උපාසකයා වත්ථු (72 - 73) 12. දෙවිදත්ත තෙරුන් වත්ථු (73 - 80) 13. සුමනා දෙවියා වත්ථු (80) 14. දෙසහාතෙරුන් වත්ථු (80 - 82)

අප්පමාදවග්ග අට්ඨකථා සන්නයෙහි;- 83 - 131.

15. සාමාවතියා වත්ථු (83 - 111) 16. කුම්භඝෝසකයා වත්ථු (111 - 112) 17. සුළුපන්ථකතෙරුන් වත්ථු (112 - 120) 18. බල්ලසෙණවත්ථු (120) 19. මහසුප්පමහතෙරුන් වත්ථු (120-121) 20. දෙසබඳමහණුන් වත්ථු (121 - 122) 21. සක්වත්ථු (121 - 128) 22. අඤ්ඤතර මහණක්හු වත්ථු (128 - 130) 23. නියම්හම්නිස් තෙරුන්වත්ථු (130 - 131)

චිත්තවග්ග අට්ඨකථා සන්නයෙහි:- 131 - 143.

24. මෙඝියතෙරුන් වත්ථු (131 - 133) 25 අඤ්ඤතරමහණ හුවත්ථු (133 - 135) 26. උකකණ්ඨිත මහණුවත්ථු (135 -136) 27. සඞ්ඝරක්ඛිත බැණතෙරුන් වත්ථු (136 - 137) 28. චිත්ත හත්‍ථතෙරුන් වත්ථු (137 - 139) 29. අරඤ්ඤවාසු මහණු වත්ථු (139 - 140) 30. පූතිගත්තතිස්ස මහතෙරුන් වත්ථු (140 - 141) 31. නන්දගොපාලයා වත්ථු (141 - 142) 32. සොරෙය්‍ය සිට්ඨිපුත්ත වත්ථු (142 - 143)

පුප්ඵවග්ග අට්ඨකථා සන්නයෙහි;- 143 - 168.

33. පන්සියක් මහණුන් වත්ථු (143) 34. එණිපථමිවත්ථු (143 -144) 35. විඩූඩභයාගේ වත්ථු (145 - 151) 36. පතිපූජ්කාව වත්ථු (152 - 153) 37. මසුරුසිට්ඨු වත්ථු (153 - 155) 38. මාතිකා (පාඨිකා) ආජීවකයා වත්ථු (156 - 157) 39. ඡත්තපාණි උපාසකයා වත්ථු (157 - 159) 40. විසාඛා උපාසිකාවත්ථු (159 - 165) 41. අනඳ මහතෙරුන් පැනපුළුවුත්වත්ථු (165) 42. මහසුඛ මහතෙරුන් වත්ථු (165 - 166) 43. ගොඩිඛ මහ තෙරුන්වත්ථු (166 - 167) 44. ඉරහදිත්තයා වත්ථු (167- 168)

බාලවග්ග අට්ඨකථා සන්නය;- 168 – 183.

45. කොසොල්රජතුමන් වත් (168 – 169) 46. මහසුප් මහතෙරුන්වත් (170) 47. අනඳසිට්ටුතුමන් වත් (170 – 171) 48. ගණ්ඨිමහෙදනමෙසාරුන් වත් (171) 49. උදෙනරුන් වත් (171) 50. පාඨෙය්‍යක මහණුන් වත් (172) 51. සුපබුද්ධකුටිකී වත් (172) 52. කසසකයා වත් (173) 53. සුමනමාලාකාරයා වත් (173 – 174) 54. උපුල්වන් තෙරුන් වත් (174–175) 55. ජම්බුක තෙරුන් වත් (175 – 176) 56. අහිපෙතයා වත් (176 – 177) 57. සට්ඨිකුටපෙතයා වත් (177 – 178) 59. සුදම්තෙරුන් වත් (178 –180) 59. වනවාසික තිස් තෙරුන් වත් (180 – 183)

පණ්ඩිතවග්ග අට්ඨකථා සන්නය.;- 183 – 196.

60. රාධමහතෙරුන් වත් (183 – 184) 61. අසෘජිපුත්තබබසු දෙජෙනා වත් (184 – 185) 62. සන්මිහතෙරුන් වත් (185) 63. මහාකප්පින තෙරුන් වත් (185 – 188) 64. පණ්ඩිත සාමණෙරයන් වත් (188 – 191) 65. ලකුණ්ඩක භද්දිය තෙරුන් වත් (191 – 192) 66. කාණමාතාවත් (192 – 193) 67. පන්සියයක් මහණුන් වත් (193 – 194) 68. ධම්මික තෙරුන් වත් (194) 69. ධම්සවන්වත් (194) 70. පස් මහණිසියන් වත් (195 – 196)

අරහන්තවග්ග අට්ඨකථා සන්නය:- 196 – 205

71. ජීවකයන් වත් (196) 72. මහසුබ්තෙරුන් වත් (197) 73. බෙලට්ඨසීස මහතෙරුන්වත් (197 – 198) 74. අනුරුද්ධ මහතෙරුන් වත් (198 – 199) 75. මහකසසප් මහතෙරුන් වත් (199) 76. සැරියුත් මහතෙරුන් වත් (200 – 202) 77. තිස්තෙරුන්නහරණහු වත් (202) 78. සැරියුත් මහතෙරුන් වත් (202 – 203) 79. ඛදිරවනිය රෙවත තෙරුන් වත් (203 – 205) 80. අඤ්ඤතර ඉත්තියා වත්ථු (205)

සහස්සවග්ග අට්ඨකථා සන්නය;- 206 – 217

81. තම්බදාඨිකයා වත් (206) 82. දරුසිරිමහතෙරුන් වත් (206 – 208) 83. කුණ්ඩලකෙසි තෙරීන්වත් (208 – 209) 84. අනග්ඝපුවජක බ්‍රාහමණයා වත් (209 – 210) 85. මසිල් බමණවත් (210 – 211) 86. බැණබමණවත් (211) 87. සහායක බ්‍රාහමණයා වත් (211) 88. දීඝායු කුමරු වත්(211– 212)

89. සඞ්ඝිවව සාමණේරයන් වත් (213 – 214) 90. අනිමුත් තක සාමණේරයන් වත් (214) 91. බාහුඤ්ඤාණඩසඳු මහ තෙරුන් වත් (214 – 215) 92. සපපදාස මහතෙරුන් වත් (215) 93. පටාචාර තෙරින් වත් (215 – 216) 94. කිසා ගොතමීන් වත් (216) 95. බහුපුත්තනික තෙරින් වත් (216–217)

පාපවගු අවුවා සන්නය:- 217 – 221

96. චූළෙකසාටකබ්‍රහ්මණවත් (217) 97. සෙය්‍යසක තෙරුන් වත් (217) 98. ලජ්ජෙවිදූවත් (217 – 218) 99. අනේපිඩුමහ සිටාණන් වත් (218) 100. අසඳුඳුන පරිකඛාර මහණු වත් (219) 101 බිළාල සිටුහු වත් (219) 102. මහාධන වාණිජ යා වත් (219) 103. කුණ්ඩකුට්ඨිතාසස වත්ථු (219 – 220) 104. සුනඛලුද්දකසස වත්ථු (220) 105. මණිකාරකුලූපගකිස් තෙරුන්වත් (220 - 221) 106. තිණණං ජනානං වත්ථු (221) 107. සුපපබුද්ධිසක්කසස වත්ථු (221)

දණ්ඩවගු අවුවා සන්නය;- 222 – 227.

108. ඡබ්බග්ගියානං වත්ථු (222) 109. ඡබ්බග්ගියානං වත්ථු දුතියං (222) 110. සම්බහුලානං කුමාරානං වත්ථු (222) 111. කුණ්ඩධානතෙරුන් වත් (223) 112. උපොසථිකම්ම වත්ථු (223) 113. අජගර පේතයා වත් (223 – 224) 114. මහමුග ලුබ්ධකතෙරුන් වත් (224) 115. බහුභණ්ඩිකභික්ඛුසස වත්ථු (225) 116. සන්තති මහඇමතියා වත් (225 – 226) 117. පිලෝතික මහතෙරුන් වත් (226) 118. සුඛසාමණේරසස වත්ථු (227)

ජරාවගු අවුවා සන්නය:- 228 – 232.

119. විසාඛාය සහාසීකානං වත්ථු (228) 120. සිරිමාවත් (228) 121. උත්තරිතෙරියා වත්ථු (229) 122. අධිමානික භික්ඛුනං වත්ථු (229) 123. රූපනන්දතෙරියා වත් (229-230) 124. මල්ලිකා දෙවියා වත් (230) 125. ලාළුදායිතෙරසස වත්ථු (230 - 231) 126. උදානගාථා වත්ථු (231) 127. මහාධන සෙට්ඨිපුත්තසස වත්ථු (232)

අත්තවගු අවුවා සන්නය:— 232 – 236.

128. බොධිරාජකුමාරසස වත්ථු (232) 129. උපනන්දසක්‍ය පුත්තසස වත්ථු (233) 130. පධානිකතිස්සතෙරසස වත්ථු

(233) 131. කුමාරකස්සපත්තේරස්ස මාතුයා වත්ථු (233- 234) 132. මහාකාළඋපාසකස්ස වත්ථු (234 – 235) 133. දෙව දත්තස්ස වත්ථු (235) 134. සඞ්ඝභේද පරිසක්කන වත්ථු (235) 135. කාළත්තේරස්ස වත්ථු (235) 136. චූළකාළඋපා සකස්ස වත්ථු (235) 137. අත්තදත්තත්තේරස්ස වත්ථු (236)

ලෝකවග්ග අට්ඨකථා සත්තයෝ:— 236 - 239.

138. අඤ්ඤතරදහරභික්ඛුස්ස වත්ථු (236—237) 139. සුඛෝ දනස්ස වත්ථු (237) 140. පඤ්චසතභික්ඛූනංවත්ථු (237) 141 අභයරාජකුමාර වත්ථු (237) 142. සම්මුඤ්ජනිත්තේරස්ස වත්ථු (237) 143. අඞ්ගුලිමාලත්තේරස්ස වත්ථු (237 - 238) 144. පෙසකාරධීතුයා වත්ථු (238) 145. තිංසභික්ඛූනං වත්ථු (238) 146. විසඛමාණවිභාය වත්ථු (238—239) 147. අස දිසදූනවත්ථු (239) 148. අනාථපිණ්ඩිකපුත්තස්ස වත්ථු (239)

බුද්ධවග්ග අට්ඨකථා සත්තයෝ:— 239 -252

149. මාගන්දියවත්ථු (239–240) 150. යමකපාටිහීර වත්ථු (240 –247) 151. එරකපත්තනාගරාජස්ස වත්ථු (247 – 248) 152. ආනන්දත්තේරස්ස වත්ථු (248 – 249) 153. අනභිරත භික්ඛුස්ස වත්ථු (249) 154. අගතිදත්තත්තේරස්ස වත්ථු (249 – 251) 155. ආනන්දත්තේරස්ස වත්ථු (251) 156. සම්බහුලානං භික්ඛූනං වත්ථු (251 – 252)

සුඛවග්ග අට්ඨකථා සත්තයෝ:— 252 – 256.

157. සාකියභොළියානං වත්ථු (252 - 253) 158. මාරාවට්ටන වත්ථු (253) 159. කොසොල්රජහු වත් (253) 160. අඤ්ඤ තරකුලදූරිභාය වත්ථු (253 – 254) 161. අඤ්ඤතර උපාසක සස වත්ථු (254) 162. පසේනදි කොසොල් රජහු වත් (254 - 255) 163. අඤ්ඤතරස්ස භික්ඛුස්ස වත්ථු (255) 164. සක් දෙව්රජහු වත් (255—256)

පියවග්ග අට්ඨකථා සත්තයෝ:— 256 – 259

165. තිණ්ණං පබ්බජිතානං වත්ථු (256) 166. අඤ්ඤතර කුටුම්බිකස්ස වත්ථු (256 – 257) 167. විසාඛාය වත්ථු (257) 168. ලිච්ඡවීනං වත්ථු (257) 169. අනිත්තිඝඤ්ඤකුමාරස්ස වත්ථු (257) 170. අඤ්ඤතර බ්‍රාහ්මණස්ස වත්ථු (258) 171. දූරකානං වත්ථු (258) 172. අනාගාම්ත්තේරස්ස වත්ථු (258) 173. නන්දියස්ස වත්ථු (258 – 259)

කොධවග්ග අටුවා සන්නය;- 259 - 262.

174. රොහිණියා වත්තු (259) 175. අඤ්ඤතර භික්ඛුනෝ වත්තු (259) 176. උත්තරාය වත්තු (260 – 261) 177. මහා මොග්ගල්ලානත්තෙර වත්තු (261) 178. සාකෙතබ්‍රාහ්මණස්ස වත්තු (261) 179. පුණ්ණාය වත්තු (262) 180. අතුලස්ස වත්තු (262) 181. ඡබ්බග්ගියානං වත්තු (262)

මලවග්ග අටුවා සන්නය;— 263 — 268

182. ගොඝාතඝස්ස වත්තු (263) 183. අඤ්ඤතර බ්‍රාහ්මණස්ස වත්තු (263) 184. කිසාගෝතමිත්තෙරස්ස වත්තු (263) 185 ලාළුදායිත්තෙරස්ස වත්තු (263 – 264) 186. අඤ්ඤතරකුල පුත්තස්ස වත්තු (264) 187. චූලසාරිකස්ස වත්තු (264– 265) 188. පඤ්චසත උපාසකානං වත්තු (265) 189. තිස්සදහරස්ස වත්තු (265) 190. පඤ්චන්නං උපාසකානං වත්තු (265 – 266) 191. මෙණ්ඩකසෙට්ඨිස්ස වත්තු (266 – 267) 192. උජ්ඣාන සඤ්ඤිත්තෙරස්ස වත්තු (267 – 268) 193. සුභද්ද පරිබ්බාජකස්ස වත්තු (268)

සිවුරු පිඬුවා = චීවර හා පිණ්ඩපාතය; **අනුකුරුවැ උපන්** = අනුකාරී වැ උපන්නා වූ; **දරුවෝ** = දරකයෝ; **සංවිභාගයෙහි** = තමන් ලත් කොටසින් බෙදීමෙහි;

80. 'අදුසර' යනු 'ඇළුණේ' යි ගන්නේ.

තුම්ා වළඳනුයෙන් = තමන් වළඳන භොජනයෙන්; **බෙජනු** = භිහාජනය යි; **පිදිවහවි** = පරිවත්තනය කරවි – කියවි; (පරිවත්තන > පිරිවත් > පිරිවස් > පිරිවහ යනු වේ. පාඩම් කිරීම – පාඩම් කීම – බොහෝදෙන එක් වැ කීම පිරිවැකීම නම් වේ.) **පැවි යෝ** = පටන් ගත්හ; ("පඨාන – පඨති – පඨපෙසුං" යනාදි

තන්හි එන 'පඨ්' යනුයෙන් 'පැවි' යනු ඝිනා කොට ගෙන තිබේ. 'ප' පූජි ට – සිටුම්හියන ධාතු ගතයුතු.) **දහසක් සුදුවන් යුත්** = දහසක් සිඹිවයන් (අසුන්) යොදනලද; **රිය හයනා ල්හි** = (හයන + හල්හි) රථය අදනා හල්හි; **සුදු වෙති යෙන්** = සිඹිව වෙත් යැයි කියත්; **අස්හි** = ධම් ඇසුම්හි; (මේ මැ හෝ පාඨ සි.) **නො පිරියන්** = අපරියන්ත වූයේ – තාප්තියට නො-පැමිණියේ; **රිය දුරෙහි** = රථ ධුරයහි; **රිය හිසැ යූ සේ සි** = රථීසායෙහි යනු කී නියාසි. ('**රථීසා**' නම් රිය දඹුව සි, රියදුර සි.)

11. ධම්මිඤ උපාසකයා වත්.

විථරා = විසතරකොට; **හෙළවුවාහි** = සීහළ අටුවාවෙහි **මල රජ්ජුරුවන්ගේ** = මල්ල රජදරුවන්ගේ;—

81. 'ගම්සිම්හි' යන තන්හි 'සිම්හි' යනුවට **වඩා** අඩොලිපිහි එන '**ඔම්වහි**' යන පාඨය මැනැවි.

බොහොසු විසින් = භූයස් වශයෙන් – බොහෝ **සෙයින්**; **පිරියුණු සැපත් ඇතියේ** = පරිපූර්ණ සම්පත් ඇතියේ; **වට කෙළියෙන්** = ගුළ ක්‍රීඩායෙන්; ('වට' යනුද '**ගුළ**' යනුද පරියා) කාඤ්ඣ ක්‍රීඩායෙන් යූ සේ සි; **පියාලා** = පිදහනය කොට – වසා; **නුවර පිරිහා** = නගර පරිගාහිකා වූ – නුවර අයත් කොට ගෙන සිටින; **කොටැස් බත්** = බත් කොටස; **වැදුම්** = ප්‍රවේශයක්; **හිස් පෑ** = තුවජ්පාතිය – හිස් තලිය; **කුමට දැකිය දුන්වසි** = කුමක් පිණිස දක්නට දුන්නනුදැයි; **දෙව මුළට** = දෙවසමුදයයට දෙව සභාවට;—

82. නො වැදිය දෙන්හසි' යනු '**නො වැදිය දෙන්නාහසි**' යි ගන්නේ.

නො වැදිය දෙන්නාහසි = වැදිද ගනුවට නො දෙන්නාහසි **හිස් පෑ** = හිස් තලිය; **දික්කියැ දුන් දෙසින්** = දක්නට දුන් දෙසයෙන්; පැළෙනු = පැළෙන්නේය; **දිව සිවින්** = දිව්‍ය සුප යෙන් – දිව කැවුමෙන්; **පතැළ හිවි කැන් ගැන** = පැතිර හිටි **සථානය සඳහා**; **අනුව පතුළ** = අනුට ගොස් පහළේය; **පුතු හා** = පුත්‍රයා සමඟ; **ඉහි කෙළන** = ඉංගිතාකාර ක්‍රීඩනය කරන්නාවූ-හසනාදය මුඛ විකාරාදිය දැක්වීමය සි කියනලද ඉහි මරා සෙල්ලම් කරන්නාවූ; **සුළු වටාවා** = චූළ උපට්ඨායකයා – කුඩා කොලුවා;

කළ අහිනිහාරඇතියේ = කළ මුල් පැතුම් ඇත්තේය; **නැති බවක්** = නැතෙයි යන බවක්; **නොඡන්නට** = නො දැනීම පිණිස; **කළ පතුන් ඇතිය යූ සේ සි** = කළ ප්‍රාර්ථනා ඇත්තෙක යනු කී නියා සි; **බැහැ** = බාහලද; **ඉකිළියෙහි** = උකුඵළියෙහි–සැළියෙහි;—

83. 'රුවන් මිළි ඇති' යනු '**රියන් මිළි ඇති**' සි ගන්නේ. 'රියන් පමණ (මකුළයක්) පියුම් කැකුළක් ඇති' යන අර්ථ සි.

රියන් පමණ රුවන් බදනැ = රත්න භාජනයෙහි රියනක් පමණ උස ඇති; **පියුම් මුහුළක්** = පද්‍ම මකුළයක් – පියුම් කැකුළක්; **සහ බේ ඛඳුණෙන්** = සුළු වගැ සඞ්ඝභෙදකඛන්ධකයෙන්; **අන් නැති බවු** = අන්‍යතයක් නැති බව; **ඛමතුන්** = ඛමීන්‍ත යන්ගේ, **හසති** = ඇත් ය; **අශ්ව** = අස් ය; **රථ** = රියය; **පදුති**= පාබල සමූදායය යන; **සතර අඟ ඇති** = චතුරඞ්ග සමන්නාගත වූ; **අන් රජුන් විසා** = අන්‍ය රාජයන්හුගේ විෂයට – දෙශයට; **බැඳි**= භණ්ඩිකාව සි; **බැඳි පෙළි** = භාණ්ඩ පොට්ටලිකාව සි–බඳු පොදිය සි; **ඛ්‍යවසාඝාර්‍යෙහි** = නිශ්චයාර්‍යෙහි; **අප** = අස්මතුන්; **පැවැ–ජෙනුවට** = පැවිදි වීමට; **සනිවුහන් වූ බැවින යූ සේසි** = සත්‍සම්ප්‍රඡන්න වූ බැවින – නිශ්චය කරගත් බැවින යනු කී නියායෙසි; **දිවි වටනුවට** = දිවි පැවැත්වීමට; **එතෙක්** = ඒ ප්‍රමාණ ධනය; **හඛා** = සාම්ප්‍රත සි – සුදුසු සි – සැහෙසි; **උපාලි කපුවා හා සකුන්**= උපාලි නම් කපුවා හා ශාක්‍යයන්ගේ; **නවතුන් හා** = නිවත්තනය–ආපසු හැරීම හා; **ගමන් විසින්** = ඉදිරියට යාම් වශයෙන්; **කැකු ළෝ** = කකුඵළයෝ හ – කකීශයෝ වෙත්; **නිහරිඛා** = බැහැර කොට; **පාතීතානි** = නහනලදුවෝ නුසි; **නිජ්පාතිතා** = එ නම් වෙත්; **මරතුජ්** = මරන්නාහු ද වෙත්; **අඛ** = මම; **නො පවජ්නෙමි යූ සේසි** = පැව්දි නො වන්නෙමි දැසි කී නියායි; **පිඳිදරු** = පරිවාරකය – මෙහෙකරුය; **කැපිය යූ සේ සි** = කප්පඨය – කපුවා යනු කී නියායි; **නිමන කරන ලැබේ** = මානය නැත් කරනු ලැබේ; **හවුරුදු** = සංවච්ඡරය – හවජ්‍රය – අවුරුද්ද; **නො සපුරා මෙයැ යූ සේ සි**=සම්පූරණය නො කොට මැ යනු කී නියායි; **එ මෙ ඇතුඵ වස්හි** = ඒ වස් කාලය ඇතුළත මැ ය; **ඇතවස්** = අනෙතා වස්සය; **හුමම්පඵහි කරණ වචන** = ('තෙනෙවන්තරවසෙන' යනු) සප්තම්‍යර්‍ථයෙහි කරණ වචන සි; **තෙවිජ පැමිණෙනුවට** = ත්‍රිවිද්‍යාප්‍රාප්තියට; **අනතරවස්ස** = අතැ වස; **සාධඛතම කළා වෙත්** = අතිශය සාධඛයක් කළා වෙති; **දිවසක්** = දිබබවකඛුව; **පුඵේනිවස්** = පුබ්බේනිවාසය; **අසවුන් බය යනු** = ආශ්‍රවක්ඛය

යන; **තුන් විජ්ජ ඇතියේ** = ත්‍රි විද්‍ය ඇත්තේ; **අවර කල්හි** = අන්‍ය කාලයෙක්හි; **කුසලාහිසඤ්ඤ** = චතුර්ධ්‍යාන කුශල සම්ප්‍රයුක්ත විශිෂ්ටඥානය යනු; **යූ සේ සි** = කී නියායි; **මේ යප්වැල පලද නෙසින්** = මේ සප්පාවලී පිලිඹිනයෙන්; **උපලක්ඛිත වෑ** = යුක්ත වැ; **ඇඟ** = අඹකයෙහි; **පස්වටනෙමි** = සත්කාර කරනෙමි– පිවිසුපඬිනය කරනෙමි; = **සුගතොවාද දුන** = ("අප්පමාදෙන සික්ඛවෙ සම්පාදෙථ" යනාදි) දෙවසිඹ සුගතාවවාද දීමය; **සික්ඛාපද පසඤ්ඤපන ඇ** = සිඹපද පැනවීම් යනාදි වූ; **බුදුකිය කරනෙමි යන අභිප්‍රාය** = බුඩ කෘත්‍ය කරන්නෙමි යන අදහස යි; **බුදුසපුවහි** = බුඩ සම්පදයෙහි; **ලොබ සිත් එව්** = ලොභ සහගත චිත්තය හෝ සි; **අගාසින් එව්** = ආඝාත චිත්තය හෝ සි; **මෙ දෙජ්** = මේ දෙඹ මැ; **නීවරණාවස්ථා බැවින්** = නීවරණයන් ගෙන් යුත් වතාවන් හෙයින්; **ජුණුසේ** = ජීර්ණ වැ ගියේ; **විසැ අඟට** = වයස් අන්තයට – පශ්චිම වයසට; **පිළිපස** = පටිපාදනය කරව – පාවාදුන මැනව; **කෙළ ගලනු** = කෙළ ගලින්නවුන්; **පස්වටනු මිස** = පරිහරණය කිරීම හැර; **බික්සගහු පස්වට නුවට** = භික්ෂු සඬඝ පරිහරණය පිණිස; **තෝ නිස්සෙහි ද යන වාදනෙන්** = තෝ නිසි වෙහිද යන වාදයෙන්; **බෙලා අසහි බාදතිකි** = කෙළ ගලිනුසි; **බෙලාසිඤ්ඤො** = එ නම් වේ. **බෙලා සිඤ්ඤො සඬඝෙනා වාදෙ** = තෝ කෙළ ගලනු වෙහි සි පැවැති වාදය; **බෙල සිඤ්ඤවාදෙ** = එ නම් වේ; **තෙන** = එසින්; **දෙවිදන්** = දෙවදත්ත හෙමේ; **මසස්නෙහි** = මාගේ ශාසනයෙහි; **පුවස මහණ සි** = ප්‍රභාශයට පැමිණ වියයුතු ශ්‍රමණයෙහැසි; **පුවසන කම්** = ප්‍රභාශන කාමය; **කරණාපෙහි** = කරණ කාරකයා ගේ අර්ථයෙහි; **උපයොග වජන්** = විතීයා වචන සි; **තුමන් දන් තුජ්** = තමන් දන්නේ නමුදු; **පාපෙඡ්ඡතායෙන්** = තමන් කෙරේ නැති ගුණ පාළි කිරීමෙහි ලාමක තෘෂ්ණායෙන්; **අභිඤ්ඤවෑ** = මඩනා ලදු වැ;—

84. 'තෙරුන් ප්‍රොත්සාහයෙන්' යනු '**තෙරුන් ප්‍රයොග යෙන්**' සි වුවමැනව. 'තෙරුන්ගේ නියොගයෙන්' යන අර්ථ සි අනතුරු වැකියෙහි '**යෙජ්ඣ**' යනු හා සසඳනු මැනැවි.

ආණත්ති විසංඛෙතනයෙන් = අණ වසැකි කිරීමෙන් – අණ වරදවා වෙනස්කොට කිරීමෙන්; **පිපිජි නො විය යෙන්** = පාරාජිත නො වී යනු කියන්; **පිතරං හන්ත්වා රාජා හොති** = පියා මරා රජ වන්නාසි; **යෙජ්ඣ** = නියොග කළහ; **අති බැවින්** = මෙසේ බැවින්; **දුනුවාමන්** = ධන්වීන් – ධනුර්ධරයන්; **යොජා** =

ප්‍රයුක්තකොට; **මහ පියා** = මාඝීය හැර; **තුමන් ගෙ ගියකල්හි** = තම නිවාසයන් කරා ගියකල්හි;—

85. "වතරු මනුස සි' යනු **'වැනිරූ මැරෙනු සි'** සී ගන්නේ.

වැනිරූ = අවත්ථරණය කොට – යටකොට; **මැරෙනුසි** = මැරෙන්නේය සි; **මහත් සෙලක්** = මහත් ශෛලයක්; **විහිජ** = පෙරළා හැර; **ලේ සල්වනකම්** = ලේ කම්පනය කරවන (ආනත්තසී) කමිය; **තුමන්** = තමන් විසින්; **වුහුව් සෙලින්** = විසෘෂ්ට ශෛලයෙන් – හරනාලද ගලින්; **බිඳි** = භින්න වැ; **බුදුන් පිවිපස** = බුදුන්ගේ පිවිසිපාදයෙහි; **හුණු** = පතිත වූ; **සෙල්-ලෙන් මෙ** = සකලිකායෙන් මැ – ගල් පතුරෙන් මැ; ('සෙලි' යනු මෙහි ප්‍රකෘතිරූප සි.) **ලේ** = ලොහිතය; **තනින් සලා** = සථාන යෙන් සෙලවිණැ සි; **සැලි පහර නොතුසු** = සකලිකා ප්‍රහාරය වත් නමුත්; (**'සැලි පහරතුසු'** යනු ත් මතා පාඨයෙක. 'සැල් ලෙන් පහරදුන ද' යන අර්ථ සි.) **වජ්‍රකාය වන බැවින්** = වජ්‍රයක් සේ අභෙද්‍ය කය ඇතිවන බැවින්; **ජීවකයන්** = ජීවක යන්ගේ; **අත සැකින්** = හසත ශස්ත්‍රයෙන් – අතට ගත් ආයුධ යෙන්; **එසේ හොත්** = එසේ ඇති කල්හි; **තෙරුන් සැලි පහර හි**= දෙවිදත් තෙරුන්ගේ සකලිකා ප්‍රහාරය පතිත වැ; **ලේ** = ලොහි තය; **තනින්** = සථානයෙන්; **කුමට** = කවර කරුණෙකින්; **සිලිය යත්** = වලනය වී දැයි කියතොත්; **විදුරු** = වජ්‍රය තමා; **නො බිඳෙනුසු** = නො බිඳෙත් නමුත්; **අච්වෙහි තුබුව** = ආතප යෙහි සථාපනය කළහොත්; **හුණුතවාහි වන සෙසින්** = උණුවීම වනාහි වන පරිද්දෙන්; **උවකුම් හමයෙහි** = උපක්‍රම සමයෙහි; **අනනශ්වලන මාත්‍රයෙක්** = ඇතුළත සෙලවී යනු පමණක්; **සැඩ පසොවා** = වණඩ ප්‍රද්ෂෙත රජහු විසින්; **පඬුරු දුන්** = ප්‍රාභෘත වශයෙන් දෙනලද; **එලවන ලද** = වෙත පමුණුවනලද;—

86. 'වෘඩ දුම්ල අසින් පෙරෙනුජ්' යනු **'වෘඩ දුම්ල යන් අසින් තෙරෙනුජ්'** සී ගන්නේ. **වෘඩ දුම්ලයන්** = මහලුවන් හා දුඹුලන්; **අසින්** = ආධිකෘයෙන්; **තෙරෙනුජ්** = පෘථග්භූත වුවත් – තේරුණත්;—

87. 'අජ්පකං ගණනානුපගතං න හොති' යනු **'අපපකං ඌනමධිකං වා ගණනූපගං න හොති'** සී ගන්නේ.

අපපකං ඌනමධිකං වා = මදක් අඩුවූ හෝ වැඩිවූ හෝ දැය; **ගණනූපගං** = ගණනට පැමිණියේ; **න හොති** = නො වේ– ගණන් ගතවූයේ නො වේ; **සස් පිළිවේ** = සත්‍ය ප්‍රතිවෙධය; **සනවාහි** = සවන නිපාතයෙහි; **සුවන් කකුළු ජා** = සුවඳින් කකුළුවන ජාතකය; **නළගිරිහු වුහුව් හෙයින්** = නාළාගිරි හස්තියා විසෘටයි හෙයින් – හළ හෙයින්; **පාළවිද** = ප්‍රකාශ විද; **සෙල් පවයින් හෙයිනුදු** = සිලා පවෙධනය – ගල් පෙරැළීම හෙතු කොට ගෙන ද; **මුළු බත්** = පුට භක්තය; (මෙහි පාළි වචනය 'ථාලිපාක' යනු ය. පිසූ සැළින් මැ ගෙන ගොස් වර පුරුෂයනට දියයුතු බත් යනු එහි අදහස යි. 'මුළු බත්' යනු තත් පසීාය කොට මෙහි යෙදූහ.) **කොහොන් කැමින්** = කුහනා කම්යෙන් – කුහක කම්න්; **කුහණසස කමමං** = කුහකයාගේ කම්ය; **කොහසඤ්ඤං** = එ නම් වේ; **රූළු බැවිහි** = රූක්ෂ භාවය නිමිත්ත කොට ගෙන; **පහජනා ජනා** = පහදින ජනයා; **විනව විනවා** = යාචනය කෙරෙම්න්; **කාය විඤ්ඤතති හා විසි විඤ්ඤත්තින්** = කයින් කැරෙන හැහවිලි විශෙෂයෙන් හා වචන යෙන් කැරෙන හැහවිලි විශෙෂයෙන්; **තුමා** = තමන්; **වාස යෙහි** = සලේ පිළිවුවායෙහි – සලෙලඛ ප්‍රතිපදායෙහි; ('සලේ පිළිවුවායෙහි' යනු මැ හෝ පාඨ විය යුතු.) **අටි බැව්** = අර්ථිභාවය– ආශා ඇතියකු බව; ('වක්ඛුභෙදය' යනුවට මෙහි මෙකි අර්ථය "වක්ඛුභෙදයාති ආණාභෙදය" යන අටුවා හා නො යෙදෙයි.) **සසුන් රියෙහි** = ශාසන නමැති රථයෙහි; **සක් සුරුකු බැවින්** = චක්ක සරික්ඛකභාවයෙන් – චක්‍ර සමාන බැවින්; **බරි** = බර වෙයි; **කපපව්ඩිනිඝ ළෙලෙන්** = කපක් මුළුල්ලෙහි අපායයෙහි හිඳුවන විපාකයෙන්; **සඟහී වැ** = ගබ්සගිත වැ; ('අජවා පවිය' යන මෙහි 'වා' යනු අධික යැයි හැඟේ.) **අජ පවිය** = අද පටන්;

88. 'සව් ධමින් ඔසවන ආරෙන්' යනු '**සව් ධමින් ඔත වන ආරෙන්**' සි ගන්නේ.

සව් ධමින් = සපී සංසකෘත ධම්යන් හෙරෙන්; **ඔතවන ආරෙන්** = ඔතතපතාකාරයෙන් – බියවන ආකාරයෙන්; **අභිතයට වැටෙනුවා** = අවැඩ පිණිස පවත්නා දැය; **සුව කටැකියෝ** = සුවසේ කටහැකියෝ වෙත්; **කා දුසිරි ඇ නො සොදුරු කම්හු**= කාය දුශ්චරිතාදි අසුන්දර කම්යෝ; **තුමහට නො සුවයව** = තමහට දුක් පිණිස; '**අසාධුනී**' යි = 'අසාධුනී' කියා; **කරනාල්හි** = කරන්න කල්හි; **අමනුඤ්ඤ සේ** = අයහපත් පරිදි; **එල දෙනාල්හි**= එලදෙන කල්හි; **කැකුළු සේ** = කකීශ පරිදි; **ඉතා දුකව** = ඉතා

දූනසේ සටයුතු ය; **සංවේනෙන්** = සංවේගයෙන්; **ඉතිරි ගිය** = උත්තරණය වැ ගියාවූ; **සුව කට** = සුව සේ කටහැක්කේය; **හුදියක්හු විසින්** = සාධු ජනයකු විසින්; **ලමුවා විසින්** = ලාමකයකු විසින්; **උදින් විසින්** = සාධූන් විසින්; **රැසියෙත් ද** = රැවී කෙරෙද්ද; ලද රැස්වතුවත්. = ලබ්ධියට රැවිකරන්නවුන්ගේ; **පමණ දන්නාට හා** = ප්‍රමාණය දූන ගැනීම පිණිස හා; **තරඤරතුවට** = සීරකර ගැන්ම පිණිස;—

89. 'සලහඤ විවට කස කණණජප්පන විසින්' යනු **'ගුල්හඤ විවටඤ සඤණණ ජපපන විසින්'** සී ගන්නේ.

ගුල්හඤ – විවටඤ – සඤණණ ජපපන විසින් = ගුළ්හකය – විවටඤය – සඤණණ ජප්පනය යන මොවුන්ගේ වශයෙන්; (විසතර සහ බේ කාද අට්ඨවාහි පැහේ.) **ගන්වන** = ගාහාපනය කැරෙන; **ගුණ පතුඤඩ ඇ** = උණ පතුරු කැබෙලි ආදිය; **සලාඤා නම්** = ලහා නම් වේ; **වැජී රට වැසි** = වජ්ජිරට්ඨවාසි; **නව මහතුන් විසින්** = නවඤ ශ්‍රමණයන් විසින්; **දූහඟ** = තෙරස ධූතඞ්ගය; **ඵාසුහොත්** = පහසු වතොත්; **සමාදන්** = මූල මැද අග සමසේ ගැන්ම; **වීය සුතුය** = වන්නට සුදුසුය; **සුතන්ත පෙළෙහි** = සුත්තන්ත පාළියෙහි; **සමය** = සිඛාපනය වේ; **නිඤොවි පරිසුඛ** = අදිට්ඨ–අසුත – අපරිසංකිත යන තුන් කොනින් පිරිසිදූ වූ; **වණ පෙළෙහි** = විනය පාළියෙහි; **සමය** = සිඛාපනය වේ; **සස්වතට**= පසුව වසතුවට; **එවං තෙ මනෝ** = තාගේ සිත මෙසේ ය; **ඉතිපි තෙ මනෝ යන ආදි විසින්** = තාගේ සිත මෙසේ ත් වේ යැයි යනාදි වශයෙන්; **ඒ දක්වා** = ඒ ආදෙසනාපාටිහාරිය පෙන්වා; **අහස පලක් අවුළුවා ගිඳුනා ඇ** = ආකාශයෙහි පලලඞ්කයක් ආවුණනය කොට – අවුණා ගෙන හිඳීම ආදි වූ; **කොවැලි මහණු**= කොකාලිඤ මහණ තෙමේ ය; **අග් සැවිය යෙත්** = අග්‍ර ශ්‍රාවකයෑ සි කියත්; **නහම් විස්වසෙහි** = විශ්වාස නො කරන්නෑ; **ලමු ඉසයන්**= ලාමඤ ඉවජ්ඣාවන්ගේ;—

90. 'අසත් සහවුතෙහි' යනු **'අසත් සඞ්ඛවුතෙහි'** සී ගත මැනව. 'අසන්ත සම්භාවනයෙහි' යන අර්ථ සි. තමන් කෙරේ නැති ගුණ පාළ කිරීම අසන්ත සම්භාවන නම් වේ.

ඉස = ඉවජ්ඣාව – ආශාව; **උපන් සනනාපයෙන්** = උපන් දැඩි තැවිල්ලෙන්; **පිළි සථිරින්** = පටිසන්ථාරයෙන් – පිළිසඳර පැවැත් මෙන්; **වැටෙන සුලුවන** = පවත්නා සඞභාව ඇතිවන; **නෑ මුළින්**=

සඤ්ඤා සමුදයයා විසින්; **පියෙන ලදුවා** = හැර දමන ලද්දාවූ; **අනුරූ කිරියෙ** = අනුරූප ක්‍රියාව; **තුප කිරියෙ හා** = තොපගේ ක්‍රියාව හා; (**තුපපං** > තුප් > තෙප් > තොප්) **එක්වැනි කිරියෙ යැ සි සේසි**= එක සමාන ක්‍රියාවය යනු කී නියාසි; **පහන් මොණරකර සුදුසුවා**= ප්‍රසන්න මයුර ග්‍රීවයක් සදෘශ වූ (මාර්ජාරක > මොජර > මෝදර > මොණර යනු වේ. 'මෝඩර' සී ගැමි වහරි.) **ඔහු එක්වැනි කිස කරනුයේ** = ඔහු හා එස සමාන කටයුතු කරන්නා වූ; **වළඳනා ලදුයේ** = දවටන ළදුයේ; **හැම පසින්මෙ** = හැම පාර්ශ්වයෙන් මැ; **පිහිකරන ලදුයේ** = පිහිත කරන ලදුයේ – වසන ලදුයේ; **අරූ පඛම්නට** = එසසාදි අරූප ධර්මයන්ගේ; **ප්‍රමාණයක් ඇත්තෙන්** = ප්‍රමාණයක් ඇති හෙයින්; **සැවින් සැව නැති සෙසි** = සවියෙන් සවිය – සියල්ලෙන් සියල්ල නැති පරිදි; **කියවි තෙනෙක්** = කියනු කැමැති තෙනෙක්; **කැරුණු** = කරන ලද; **වඩයක් නැත හොතුපු**= වඩයක් නැති තමුදු; **තුමන් වඩයට පියෝ කල කැන් ගෙනැ** = තමන් විසින් වඩ පිණිස ප්‍රයොගයන් කළ බැව් ගෙන; **සන කැන් පටන්** = නිදර්ශිත ස්ථානයෙහි පටන්; **හුමමඤහි** = ආධාරාර්ථ යෙහි; **සම්පදන වචන** = සම්ප්‍රදාන විභක්තිය; **මේ දසසනාලාභ** = මේ දැක්මට නො ලැබීම;—

91. "පියවිහි නියුණු සෙසින් ආයාචිතබබ යාචනකම්හු පිය වියසි සේසි" යනු "**පියවි නියුණු සෙසි. ආයාචිතබබයාචන කම්හු පියවි යසි සේ සි**" සී ගන්නේ. **පියවි නියුණු** = ධර්මතා නියාමයෙහි; **සෙසි** = ආකාරය සි; **ආයාචිතබබයාචන කම්හු** = නො ඉල්විය යුත්තක් ඉල්වීම් කමයාගේ; **පියවි යසි සේ සි** = ප්‍රකෘතිය යනු කී නියාසි. (මෙහි 'පියවි නියුණු සෙසි' යනු උද්දෙසසි. සෙස්ස නිද්දෙස සි.)

බහසි = බිමට බා; **ඉගාපු ඇට පොවා** = බොළට ව්‍යාපනය කොට; **පුරිසදම් සැදියා** = දැමිය යුතු පුරුෂයනට රියැදුරු වූ; **සතපුසසතතො** = සිය ගණන් පිනින්; **නිබබත්තං ලක්ඛණං යස්ස** = උපන් ලකුණු ඇතිෘයේ යමක්හුගේ ද; **අනත් අපිරිසේ සක්වලහි** = අනන්ත පරිවේෂ්ද රහිත චක්‍රවාටයෙහි; **සතගුණ කොවින් කල** = සිය ගුණයක් කොට කරන ලද්දාවූ; **පිනින් නිවත්** = පුණ්‍යයෙන් නිබබත්ත වූ – උපන්නා වූ; **ලකුණු ඇති බැවින්** = ලක්ෂණාන්විත බැවින්; **අනුශ්‍රවාපිහි** = ශ්‍රැති සුවන යෙහි; **උපනිස** = උපනිස්සය – හෙතුව – ප්‍රත්‍යය; **අනුනු පිළිසු සැහැවි නැති** = අනුනය පටිස සවභාවයක් නැති; **තථාහි**

කොරෙහි = තථාගතයා කෙරෙහි; **කණ් සිළි පවා** = කණණ චුළිඨාව ව්‍යාපත්‍තය කොට – කන් හැකිල්ල ත් ඇතුළත් කොට;—

92. "මහල් කඳෙක්හි පරිණාසා පරිණා ඇති" යනු 'මහ තල්කඳෙක්හි පරිණාහ පරිමාණ ඇති' සි ගන්නේ.

මහතල්කඳෙක්හි = මහාතාලකඛන්ධයෙක්හි; **පරිණාහ පරිමාණ ඇති** = විසාලතා ප්‍රමාණය **ඇති** – පළල ඇති – වට තල් කඳක් පමණ ඇති; **කළවා** = කළදූය; **සිදුරු නහමනුවහට** = ඡිද්‍රනිසාමනය කරන්නා හට –සිදුරු සොයන්නා හට; **නොම අඩිය මෙනු** = ආරාධනය – පරිතොෂණය නොමැ කරන්නේය; **යට අඟැ බඳ** = යෂ්‍යග්‍රයෙහි බඳනා ලද්දේ; **ධජ** = ධවජනම් වේ; **කිසෙලි** = කෙහෙලි ? පතාකාවන්; **සරස ගැන්වූ** = යට හරහට ගැන්වූවා; **පටාකා** = ඒ නම් වා; **සැඬහි** = වණඩ වූ; **වසම් පියොවු ඇති බැවින්** = විෂම ප්‍රයොග ඇති බැවින්; **පරුස්හි** = පරුෂ වූ; **පිහු ඇස් ඇතියේ** = දුඹුරුපාට ඇස් ඇති; **පිළිසු සිත් සපිසුතු** = ප්‍රතිඝ චිත්තය හා සම්ප්‍රයුක්ත වූ; **දෙමිනස් වෙනෙන්** = දෙමනස් වෙදනායෙන්; **තැවෙනුයේ** = තප්තවනුයේ;—

12. දෙවිදත් තෙරුන් වත්.

රැසි අනුරු කිසයන් = රැවියට අනුගත සවරූප ඇති කෘත්‍යයන්; **ඝතපනුවට** = පිනවාලීම පිණිස; **මෙහෙසි** = කුදු මහත් කිස; **සඟැබැ** = බාලභාවිකය; **ආලාහනකිස** = හෝම් මේවරය; **දුක්පත්හි** = දුක්පත් වෙහි;

93. 'දුම්නසින් වුවූ සිත්' යනු **දුම්නසින් දුවූ සිත්** සි ගන්නේ.

දුම්නසින් = දෞර්මනස්‍යයෙන්; **දුවූ** = දුෂ්ටවූ; **සිත් ඇති යෙහි** = සිත් ඇතියේ වෙහි; **කඳුළු මොස** = අශ්‍රු මුක්ත වූ – කඳුළු වහුළ; **මොණ ඇතියෙහි** = මුහුණ ඇතියේ වෙහි; **අඤ්ඤ මුවෙ යසස** = කඳුළු මුහුණුහි යමක්හුගේද;—

13. සුමනා දෙවියා වත්.

ප්‍රධන්කිස = ප්‍රධාන කෘත්‍යය; **රහත් ඵල පවා** = අර්හත් ඵලය අභිවිධි කොට; **තැන් කරන්නේ සි** = උත්සාහ කරන්නේ සි; ('සත්ති > සැත් > තැත්' යනු වේ.); **සම වයම්හි යෙදෙනුයේ** =

සම්මා වායාමයෙහි යෙදෙන්නේ; **පිළිසැඹියා හා සමග** = පරිසමන්ති දුවන් හා සමඟ; **අන් ධම් නිරුත් පිළිහන්** = අළු ධම්ම නිරුත්ති පටිභාන යන; **මේ සතර තැන** = මේ සතර තන්හි; **ප්‍රහෙදයට ගිය** = වෙනසට පැමිණි; **සඳහණ සමග යැ සි සේ සි** = සඤ්ඤණය හා සම්හය යනු කී නියායි; **උදුනඤචරයෙන්** = අඤ්ඤරොත්පත්ති ස්ථානයන්ගේ උඹඛීනාගයෙහි නහනු ලබන සඤරයෙන්; **යොජා** = යුක්ත කොට; **කරණ අජ්ඣායන** = ක්‍රියමාණ අධ්‍යයනය – හැදෑරීම – කීම; **සරහසඳු නම යෙන්** = 'සරහසඳු' නමැයි කියත්;(සඤරයෙන් මියුරු කොට කීම සරහසඳු නම් යනු භාව සි.) **පදහාණ** = පදඤ්ඤම (වනාහි); **පෙදෙහි පෙදෙහි මෙ** = පදයන් පාසා මැ; **නැවැති** = නිවෘත්ත වූ; **සඤර ඇතිසේ සි** = හඬ ඇත්තේ ය; **සරහසඳු** = හඬින් මියුරු කොට කීම; **අනුකරණ වැ පැවැති** = ශබ්දානුකරණ වැ පැවැත්තා වූ; **සඤර ආ** = සවර ආදී වූ; **විශෙෂ ඇතිසේ සි** = වෙනස්කම් ඇත්තේය; (අටළොස් මහණ ගණයන්ට' යනු 'අඤ්ඣාරසන්නං මහාගණානං' යනුයෙහි අර්ථය සි. තදනුසාරයෙන් 'අටළෙඤස් මහගණයන්ට' සි විය යුතු සේ පෙනේ.) **සුළාක් කල්** = මද කලක්; **වියත්මි යන මනින්** = වියත්වෙමි යන මානයෙන්; **නො සිය සහනුසේ** = සහනය කරනු වට නො හැකි වනුයේ; **මහලු හොතුජ්** = මහල්ලඤ වුව ද; **පැන පිළිවිසැවි බැවින්** = පැන පිළිවිසීමෙහි ආශා ඇති බැවින්; **ගත ජන්න මහණු** = ග්‍රන්ථය – පොත උගත් භික්ෂුව; **පෘවජකයා කෙරෙන්** = පැන පිළිවිසින භික්ෂුව කෙරෙන්; **අවඤඤසයන් නැරඹූහු** = අවමානයෙන් බැලූහ; **හැම පෙළි බැරුවහට** = සියලු පඤිප්තිය දැරූ තැනැත්තා හට; **ප්‍රධන් හට** = ප්‍රධානයා හට; **පැසසිය මනුවක්** = ප්‍රශංසා මාත්‍රයක්; **බැළයට** = වැටුප් පිණිස; **ගෙදි** = ගොරෑපයන්; **කිර** = කිරිය; **දධි** = දිහිය; **තකක** = මොහොරුය; **නවනීත** = වෙඩරුය; **සප්පි** = නිතෙල; **උතුරු මිනිස් ධම් සුව** = ධ්‍යාන – විමොඤ්ඣ – සමාධි – සමාපත්ත්‍යාදි උත්තරි මනුෂ්‍ය ධම් සුඛය; **බුදුවජන් මෙ** = බුඩ වචනය මැ; **සඬහ තාපවන බැවින්** = සම්මාන සම්බන්ධියට පැමිණි අර්ථ ඇතිවන බැවින්; **පිණිස ගෙනැ** = පටිග්ගහණය කොට ගෙන – පිළිගෙන; **පුන පුනා කරනු** = නැවත නැවත කිරීම; **කොටැසි වෙසි** = කොටස් ඇතියේ වෙයි; **පිළිවා යන ලදුවන්ගේ** = පටිපාදනය කරනලද්දවුන්ගේ – පාවා දෙන ලද්දවුන්ගේ; **අනුසසුන් අනුසිවින්** = අනුශාසනයට යොග්‍ය පරිද්දෙන්; **පිරිහුන් සිල් ඇති යහු** = පරිපූණ් සිල් ඇත්තහුගේ; **ආගම බුහුසුවා** = ආගම බහුශ්‍රුතයාගේ; **සුළාක්** = මදක්; **ධම්මපද අධිකාරයෙන්** = ධම්මපද සම්බන්ධියෙන්; ('චතුපාරිසුඬි ඇසින් පූහා පිළිවුවා පානි' යි යොදනු.

'චතුපාරිසුධි' යනාදීන් පුඤ්ඤාභ ප්‍රතිපදාව දක්වති' යනු අර්ථ යි;) **ලොවුතුරා ධම්ම** = මහ – ඵල – නිවන් යන ලොකොත්තර ධර්මයට; **අනුරූ ධම්** = අනුගත සවභාවය ඇති ධර්මයෙහි; **සරනුයේ**= හැසිරෙන තැනැත්තේ; **පළමු පෙජෙහිඒ** = 'අජ්ජෙව අජ්ජෙව' යි පළමු පදයෙහි ත්; **අදහේයි** = අධ්‍යාහාර වශයෙන් ගන්නේ යි; **මෙය හා** = මේ දුකඛසත්‍යය හා; **එක ලක්ෂණ වන බැවින්** = සමාන ලක්ෂණ ඇති හෙයින්; **සවජිඝාතබබ නිවන් හාස්** = පසක් කටයුතු නිවන හා; **භාවෙතබබ මගුඒ** = වැඩිය යුතු මාර්ගය ත්; **කි වෙත්** = කිවෝ වෙත්; **පහාතබබ සුමුදු** = පහාතවයුතු සමුදය; **තදඟ** = තදඞ්ගය; **විඛම්බුන්** = විකඛම්භනය; **සුමුසෙයි** = සමුච්ඡේදය; **පිළිපසඳ** = පටිප්පස්සද්ධිය; **නිස රුණු විමුත්තීන් විසින්** = නිස්සරණ විමුක්තීන්ගේ වශයෙන්; **පුඤ පිළිවුවායෙහි තදඟ** = පුඤ්ඤාභ ප්‍රතිපදායෙහි තදඞ්ග විමුක්තිය හා; **විඛම්බුන්** විකඛම්භන විමුක්තිය ද; **මහෑ** = මාර්ගයෙහි; **සුමුසේ**= සමුච්ඡේද විමුක්තිය ද; **ඵලෙලෙහි** = සතර ඵලයෙහි; **පිළිපසඳ්** = පටිප්පස්සද්ධි විමුක්තිය ද; **මහ ඵල දෙ කෑෑ** = මාර්ග ඵල යන දෙතන්හි; **නිසරුණු විමුත්ති** = නිස්සරණ විමුක්තිය ද; **ඉඛ හුරං යන දෙඒ** = ඉඛ යැ හුරං යැ යන දෙක මැ; අධිඨාරණාවිහි= ආධාරාර්ථයෙහි; **පඨිවත්තහි** = ප්‍රථමාර්ථයෙහි; **ඵල නම් ඇති මහණ බැවුහ** = ඵල යන නාමය ඇති ශ්‍රමණ භාවයාගේ; **පස් අසෙසි ධම් කදහු ද** = පව අසෙඛ ධර්මස්කන්ධයන්ද; **රුවන් කෑණි මඬලෙකින්** = රත්නමය කර්ණිකා මණ්ඩලයෙකින්; **ගෙහෙකඛ**= ගෘහයෙක්හි; **කෑණිමඬුල ගන්වන්නක්හු සෙසින්** = කර්ණිකා මණ්ඩලය ග්‍රාහාපණය කරන්නකු මෙන්;

14. දෙසහා තෙරුන් වත්.

"**යමක වග අටුවා සන්‍ය නිමි**" යන මෙහි "**සන්‍ය**" යනු පැරණි ව්‍යවහාර යි. පාණිනීය කාශිකාදි සූත්‍රව්‍යාඛ්‍යාන ග්‍රන්ථ විශෙෂය '**න්‍යාස**' නමින් ප්‍රසිඛ ය. සංස්කෘතයෙහි මේ හා අර්ථයෙන් වෙනස් වුව ද ශබ්දයෙන් සමාන '**සංන්‍යාස**' ශබ්දයෙකුදු වෙයි. හෙළඋදුරෝ එයින් සවරූප ඇගන සාමාන්‍ය ව්‍යාඛ්‍යාන විශෙෂය '**සන්‍ය > සන්ඝ > සන්න**' යි ව්‍යවහාරයට ගත්හ යි හැඟේ.

යමක වග අටුවා සන්‍ය නිමි.

ගොසු සිටුහු කළ ඇරැම්හි = කොසඹ සිටාණන් කළ ආරාමයෙහි; **එතියසා** = 'එතිසසා' යනු; **මාගඳිසා** = මාගන්දියගේ යන අර්ථයි; **ඛ්‍යසනි කිපති සුඛනති** = සුඛය ගෙවා හරි-බැහැරලා නුසි; **ඛ්‍යසනං** = එනම් වේ; **මරණ විනැස්** = මරණ විනාශය; **අහිසේසත්** = අභිෂෙකයට ගනු ලබන ශ්වෙතච්ඡත්‍රය; **ලහා** = නහා; **දිරනුවා** = ජරාවට පැමිණෙන්නා වූ; **ගතනින්** = අන්න යෙන්; **පියයුතු තා වත්** = හළයුතු තාක් වසතුව; **පියූ** = ත්‍යක්ත කළා වූ; **එසඳ** = ත්‍යත් කාලය; **අනන නම්** = අන්නය නම් වේ;

94. 'පියයුතු වන්' යනු '**පියයුතුවත්**' යි ගන්නේ. **පියයුතු වත්** = හළයුතු වසතුව; **අනනයෙහි යූ බැවින්** = අන්නයෙහි කී බැවින්; **අනනම් නම්** = අන්නම නම් වේ.

95. 'දරුවන් හා ජා අත්බදට' යි පොත්හි තිබෙයි. මෙහි ම 'බ්‍රාහ්මණ පුත්‍ර' වසතු ආදියෙහි 'අත්බරුන් විසින් මුස්වූවාහු' යනාදිය ආයේය. එහෙයින් මෙහි මැදට වැටී තිබෙන '**ජා**' යනු අධික ය. '**දරුවන් හා අත්බරට**' යි ගන්නේ.

(ව) අත්බර නම් හාණ්ඩය යි. භීරු කාමිනී ආදි ශබ්දයෝ මාගධ සංසකෘත දෙක්හි මැ භාෂ්‍යාර්ථයෙහි ප්‍රසිද්ධයහ. 'සිය කිරිද' යන අර්ථයෙහි අත්බර වී යයි සලකමු; '**බර**' යනු 'භීරු' ශබ්දයට සමාන ය. මතුත් සැලකියයුතු.

පුත්තා ච = දරුවෝ ද; **දූරා ච** = දූරියෝ ද **පුත්තදූරං** = 'පුත්තදූරං'යනු වේ; **සසෑදියෝ** = මන්ත්‍රණය කළහ; **ගණසඟණී**= ගණ සඞ්ගණීභාව – තෙලෙස් ගණයා හා අන්‍යොන්‍යවාසික සබ්‍රහ්මචාරි කාදි ගණයා සමඟ ඇලී බැඳී වාසය කිරීම ගණ සැඟණීය යි; **මහන් අන් බැව් ඇති** = මහත් අනුභාව ඇත්තාවූ; **හේ කම්** = හේතුවූ කර්මය; **නෙඛැම්හි පටාය්** = නෙක්ඛම්මයෙහි පටන්; **තවුස් පැවැ ජයෙහි පටාය් යි සේ යි** = තාපස පබ්බජ්ජායෙහි පටන් යි කී නියාසි; **තවසිරිම්** = තපොචරියාව – තාපස බැවිහි හැසිරීම – පැවැත්ම;

96. "වන බුදුනුපාහි" යන මෙහි '**වන**' යනු අධික යි.

බුදුනුපාහි =(බුදු + අනුපාහි) අබුඩොතපාදයෙහි; **හැක්කත් වෙණසු** = හස්සිකන්න වීණාව ද; **හැක් කත් මතුරුජ්** = හස්සි කන්නමන්ත්‍රය ද; **හැක්නට** = හස්සීන්ට; **නො කල්** = අම නොඥවූ; **තත් හය් මතුරුජ්** = තන්ත්‍රීන් හා මන්ත්‍ර ද; **ඇත හොතුජ්** = ඇතිවුවත්; **කල්තතක් හා** = මතොඥ තන්ත්‍රියක් හා; **මතුරක් ඇති බැවින්** = මන්ත්‍රයක් විද්‍යමාන බැවින්;—

97. "එයින් නම්දිවි" යනාදි තන්හි 'නම්දිවි' යනු 'නම් දිවි වැ' යි ශුද්ධ පාඨය ගතයුතු සේ පෑනේ. **එයින්** = ඒ සල් තනින් හා සල්මදුරෙන්; **නම්දිවි වැ** = දක්නාලදු – ලබනලදු නම් ඇති වැ නොහොත් නාමය දක්නා ලදු වැ; **මුළුලු වෙණ හය මතුරු** = සියලුවිණාව හා මන්ත්‍රය; **හැන්මුළු පරිනා** = හසති සමූහයට නායක වූ;—

98. 'යෙන්. මේ එමේ අවි යි' යනු "**යෙන් මේ එ මේ අවි යි**' යි ගන්නේ. 'උපතෙනෙනා' යනු කොනෙක් 'උපනා මෙනෙනා' යි කියන්. අවි හේ මැසි.

ලැහෙනුවට = නැගීම පිණිස; **පලවනුයේ එව්** = පලවා හරින්නේ හෝ; **නවනැඟි කිරු** = අළුත නැඟි සූයියා; **සඳලු මඬු යෙහි ය යූ සේ සි** = චන්ද්‍රිකා මණ්ඩපයෙහි ය යනු කි නියායි; **ඇන් යිමුල්ලිණියෙක්** = ඇතුන් නහන ගිජ්ඣ සකුණියෙක්;

99. 'වව පහළ පියා' යනු '**වට යුවළ පියා** යි ගන්නේ.

වට = භාත්පස්හි; **යුවළ පියා** = යුගල පක්ෂ පත්‍රයන්; **විහිදූ** = විසඳජ්ජනය කොට – විදහා; **බිරි පියවි බැවින්** = සිරු සවභාවය ඇතිවන හෙයින්, **වතුළේ සි** = අවස්ථට වීය – වැතිර ගියේය–යට කොට ගියේය; **අධිච්චපපනෙනා** = අභිභවනය කොට පැමිණියේ; **අජ්ඣාපපනෙනා** = එන්ම් වේ;—

100. අසම්භාවයට පළමුවැ' යි මුද්‍රිතවී තිබේ. 'අසම්භවයට පළමුවැ' යි ශුද්ධ කෙරෙති. දෙපාඨයෙන් මෑ තැනට නිසි අරු තෙක් ඇත්තේ නො වෙයි. '**අහසට පළමු වැ**' යි ශුද්ධ වියයුතු යැ යි සලකමු. තවද සැලකියයුතු.

පළමු වැ = ප්‍රථම්කොට; **අහසට** = ආකාශයට; **ඝුණුඟසි** = (නැගුණු යසි?) උත්පතනය කෙළේ ය සි; **සි සේ සි** = කී බව සි; **පියන්නේ සි** = හැර දමන්නේ සි; **හඬය්** = ශබ්දයනය කොට – ශබ්ද කොට; **වෙළෙපැළය** = විටපාංශයෙක්හි;—

(වා) **විටප නම්** ශාඛා පල්ලව සමූදයය යි. මෙසේ අවි කිව ද '**වෙළෙපැළැයැ**' යනු නීසැක තැනෙක් නො වීය. අංශයෙක්හි ශාඛා පල්ලව ප්‍රස්තාරය යනු මෙහි භාවය සේ සැලකිමු. නොහොත් '**පැළැයැ**' යනු අධික පාඨ යි. එසේ හොත් '**වෙළෙපැ පතුල බැවින්** = ශාඛා පල්ලව සමූදය පැතිරීගිය හෙයින්' යි අරුත් ගතයුතු.

මස්රුවින් = භක්ෂණයට නිසි මෘග ගව මහිෂාදි මාංස රූපයන්; **අත්තල හඬ** = හස්තතලයන්ගෙන් නැඟි ශබ්දය – අප්පිඩි ශබ්දය; **කිරු ප්ප්සෙන කල්හි** = සූකීයා අසනඩගමනය කරන සමයෙහි; **කැමැජි වාහු** = කම්ජවාතයෝ;

101. 'කම්හු බුහුසි' යනු 'ගබ්හු බුසිහි' සී ගත්තේ. **ගබ්හු**= ගර්භයාගේ; **බුසිහි** = වාහ්‍ය වීමෙහි – බිහිවීමෙහි;

සිරුරුහි = ශරීරයෙහි; **රුහුන්න බැවින්** = රූපනය – සුඛභඤ්ඤය කරන බැවින්; **කම්මජඋච්චය උතුජ වාතයට** = කර්මජ ප්‍රත්‍යය කොට ගෙන සෘතු ගුණයෙන් උපන් වාතයට; **කම්මජ වාත සි හි වෙත්** = කර්මජ වාත යැයි කිවාහු වෙත්. **සුලුහු** = චලනය වී ගියහ; **සුවෙන්** = සැපසේ; **වටන ලැදියට** = උපස්ථාන කරන ලද්දියට – වර්ධනය කරන ලද්දියට; **ඵඩ–වෘඩෙ** = ඵඩ ධාතු වෘද්ධියෙහි වැටේ; **රැ අලුවනාල්හි** = රාත්‍රිය අලුවන කල්හි; **ගබවුවුහන්** = ගර්භවුක්‍රාන්තය – ගැබ නැඟීම; **ගබ්හු බුසිව්ය සි සේ සි** = භර්භ බිහිවිය යනු කී නියාසි; **වෙලෙහි උසු** = වලාහක යෙහි – මෙඝයෙහි සෘතු ගුණය ද; **පව්යෙහි උසු** = පර්ජන්‍යයෙහි සෘතු ගුණය ද;--

102. 'නව ළහිරු රස්හි උසු' යන මෙහි 'නව – ළ' දෙ ශබ්ද යොගය එකාර්ථදෙශ සම්භවයට හෙතු සි. අඩොලිපිහි එන 'නා බල් හිරු' යන පාඨය විචාරකයනට තුටු පඬුරෙකි. 'නාබල්' ශබ්දය ගැන මින් පෙර කථා කෙළෙමු. 'නාබාලිග' යන හින්දිය ශබ්දයාගේ ප්‍රතිලාභය මෙහි අර්ථ නිශ්චයට මහොපකාරී විය. මේහි ඉඩිය '**නවහිරු රස්හි – ළහිරු රස්හි – නාබුල් හිරු රස්හි**' යන තුන් ප්‍රකාරයෙන් මැ අනවද්‍ය බැවි සැලකිය යුතුය. 'තරුණ සූර්‍ය රශ්මියෙහි සෘතු ගුණයද' යනු අර්ථ සි.

උතුං = සෘතු ගුණය; **ආනොසි** = සි සේ සි; **අහහෙසිනි** = ගත් නු සි; **උදෙනෝ** = එ නම් වේ; ('උදෙනියං ජාතෝ නාම ජාතෝ, තසසිස්සරෝ = උදෙනෝ' සි අරුත් දැක්විය හැකි හෙයින් මේ අර්ථාඨනය විචිත්‍ර යැයි දනයුතු.) **කොමාලා** = කොච්චනය කොට; **මිනිසක්මි** = මිනිසක් වෙමි – මානුසියක් වෙමි; **දූ බිදු මෙන්** = ජාති සම්භෙදයෙන් – කුල මිශ්‍රවීමෙන්; **නො සම ජස් හස්** = අසමාන ජාති හා; **බුවිමෙන් එවි** = සම්භින්නාවීමෙන් – මිශ්‍ර වීමෙන් හෝ; (යන අර්ථ සි.)—

මුදුනා වා = මොලොක් වූ හෝ; **දුරුණෙන වා** = දරුණු වූ හෝ; **යෙන කෙනචි වණ්ණෙන** = යම්කිසි ගුණයෙකින්; **දිනං අනතානං** = බැගැපත් ආතමය; **උඛරෙ** = නඟා සිටුවන්නේ ය; **පව්‍රාධම්මං සමාචරෙ** = පසුවැ ධර්මයෙහි හැසිරෙන්නේ ය;

ඛැත්ත මායා = ක්ෂත්‍රියයන්ගේ රහස; **නහම් පහර** = සපථ නො කරන්න; **තුමා රක්ඛා තෙවෙහි** = තමන් රකින තපො ගුණයෙහි; **ඛැළල** = කාළකයක් හෝ කාලුෂ්‍යයක්; **පුවුසි සේ සි** = පොෂණය කෙළේය යනු කි නියාසි; **නො ව පුළෙසි වූ හැල්** = නො වපුළ කෙත්හි වූ ශාලි ධාන්‍යය;—

(වි) සංස්කෘතයෙහි අනෙකාර්ථවත් 'වප්‍ර' නාමය ක්ෂෙත්‍රාර්ථයෙහිදු දක්වා තිබේ. '**උප්‍යතෙ'නු**' යන නිරුක්ති හෙයිනි. මෙහි '**අනු**' යන ආධාරාර්ථය නො සලකා හළ '**වප්‍ර**' ශබ්දයෙන් '**වපුර–වැපිරීමෙහි**' යන ධාතුහුගේ නිෂ්පත්තිය ගතයුතු.

අස්වැසෙන මතුවක් = ආශ්වාසන මාත්‍රයක්; (භයට පැමිණියන්හු බිය දුරුවීමට නිසි ප්‍රිය වාක්‍යාදීන් නළවා ගැන්ම අස්වැසීම නම්) **වසඩක්** = ('**වංශ**' යනු පිට ඇටයට සංඥාභිධාන සි.) වංශාර්ථයක් – ශරීරයෙහි **එක්** පළුවක් යන අර්ථ සි; **නකත් හා ග්‍රහයන් යුත් සේ** = නක්ෂත්‍රයන් හා ග්‍රහයන්ගේ යෙදුණු ආකාරය; **නකත්** = තාරකාවන්; **ග්‍රහයන් විසින්** = රවිචන්ද්‍රාදීන් විසින්; **පෙළීම්** = පීඩනය; **මහත්ජානියෙක්** = මහත් පරිහානියෙක්; **මා අළ** = මා ගෙන ආයේ; **පිතු සහනඤං** = පියා සහ දූය; **ඉපත්තිකං** = එ නම් වේ; **මේ අරුත් දිවන** = මේ අවිදිපනය; **ඇත් හඬ** = හස්ති රාවයෙන්; **හැඩිය සි සේ සි** = හැඩිය යනු කී නියා සි; **යුජන සමර්ථ** = යොධනයට – යුද කිරීමට ශක්තිමත් වූ; **පුතන පරම්පරාය** = පුත්‍ර පරම්පරාවෙන්; **වළඳ්නඤ රජ්ජං** = වළඳ කරන රාජ්‍යය; **පවෙණී රජ්ජං** = එනම් වේ; **බිසෙසියෝ** = අභිෂෙක කළහ; **සාඤයඞි** = ඥාත සමූයෙහි; **මහ නිමන** = මාඝී නිමානය; **එරෝ** = ඒ රොගය තෙම; **යම් ගෙයකට වන**= යම් ගෙයකට වැද්දගත හොත්; **නික්මෙන් මෙ** = නිෂ්ක්‍රාන්ත වූයේ මැ; **දිවි ලැබෙයි යෙත්** = ජීවිතලාභය කෙරෙයි යි කියත්; **විෂ වාත හමුළු සැඳැ** = විෂ මිශ්‍ර වාතය වහනය වූ කල්හි; **සා දිකින්** = ක්ෂුධා දුඃඛයෙන්; **වහනුවහට** = ඉසිලිම පිණිස; **පජාපතිං** = 'පජාපතිං' යනු; **භරියං** = බිරිඳ යන අර්ථ සි; **ජෙනුවා මෙ**= ජීවත්වන්නහු මැ; **සාදිකිනුජ්ජ ඉතිහි** = ඥාත දුක්ඛයෙන් ද අතිශරෙක වූ – අධික වූ; **නො අවමැනිය යුතු** = අවමන් කරනුවට යුතු නොවේ;—

103. 'මිනොක් කුමඟට හෙනු යයි' යනු '**මේ කුමක් කුට හෙනු යයි**' සි ගන්නේ. 'මෙතෙම කවරකාර්‍යයක් කිරීමට හැකි දැයි' යන අර්‍ථ සි.

හොයුඵයක් = ගව රැළක්; '**ගෙදි මුළක්**' යනු ද එම් අර්‍ථ සි. **නව වැද දෙනඟ** = අළුත වැදූ ධෙනුවන පිළිබැඳි; **මහුල්** = මඞ්ගලය; **නො මද ගිතෙල් හස් සැමැහ** = බොහෝ ගිතෙල් හා සමඟ; (**ඝත තෙල** > ගිතෙල්. '**ඝී තෙල**' යනු භින්දිය ව්‍යවහාර සි.) **යතනකෙන** = යම් පමණෙකින්; **අඤ්ඤා** = ප්‍රයෝජන වේද; **තතනඞං** = ඒ පමණක්; **ඔහු දසට** = ඔහුගේ දිශාවට; **නතු කොටැ සි සේ සි** = නතිය – නැමීම කොටය යනු කිතියාසි; **මදඤ්ඣපිං පායාසං** = මද ගිතෙල් ඇති කිරිබත; **ලවු** = ආශ්වර්‍ය යෙකි; **පිනැත්තී** = පුණ්‍යවතියෙකි; **දනැ පෙලෙ** = දැතයෙහි ඵලය; **පරහු** = පරෙතයා – පරලෝ ගියහු – මළාහු; **එකම් අනු මෙමිය හොත්** = ඒ කාමය අනුමෝදන් වනුවට සම්‍පාදිවූව හොත්; **නො අනුමෙමිය** = අනුමෝදන් නො වූව හොත්; **වඳ මව නො යන්** = වඳ වෙ දැයි කිවහොත්; **දුවහට** = දුයකායාහට; **සුව** (සුගි?) **සැපත් අරන බැවින්** = සුඛ සම්‍පත්තිය ආහරණය කරන බැවින්; **දෙ යලක්** = දෙවාරයක්; **රැසින්මැ හා සවස** = අළුයම හා සවස්හි; **වග කරස් ඇ** = ව්‍යාඝ්‍ර තරච්ඡාදි; **වළ මුවන්** = වණ්ඩ මෘගයන්; **වළමුවන් පලනුවට** = වාළ මිගයන් පලවා හැරීමට; **ඔහු කරන හඬ** = ඔහු විසින් ක්‍රියමාණ ශබ්දය; **දක්වන** = දැක්වීම කරන; **අනුකාරණ** = සමාන ශබ්දයෙකි; **අවසර** = ඉඩක්; **පැක්සැ** = වැද්දගෙන; '**සකඤ්ඣිනි ශොඤ්ඤණයොඃ** = සකාඤ්ඣධාතු ගමනය වියළීමය යන අර්‍ථයන්හි වේ සි; **යන ධාතුසි** = නිදර්ශිත ධාතුව සි;—

104. 'පොසන තැන්හි' යනු '**පොඝන තැන්හි**' සි ගන්නේ.

ගස් හා බිම් පොඝන තැන්හි = ගස්වලට හා බිමට පොර්‍ථනය – පැහැරීම කරන තන්හි; **බුරා** = භුඞ්කාරය කොට; (**බුර** – බිරීමෙහි යන ධාතු සි.) **මුඛ ඛොවන ඇයි** = මුව සේදීම් ආදි; **සිරැරු සුළිඟ්ග්** = ශරීර පොෂණය; **මහ අවරස්** = මාගීාවරණය කොට; **සරස සිට** = තිරශ්චාත් සර්‍පිත වැ; **හන් සිවුරු සන** = අදනා සිවුරු කොන; **ගෙත්තම්හි** = ශිවන කර්‍මයෙහි – මැසීමෙහි; **ගඳ මහන් එවි අහිමුඛ වැ** = ගන්‍ධමාදන පර්‍වතාභිමුඛ වැ; **හති** = සවාමීනි; **හේ මුවහ** = හේ ව්‍යවහිතයෙකි – මුවාවෙකි; **දුප්පවෙ සය** = දුකසේ වැද්ද ගතයුතු තැනෙක යැ යනු; **යූ සේ සි** = කී

නියා සි; **මිනිස් ජැය නිවන් සත්හු** = මනුෂ්‍ය ජාතියෙහි උපන් සත්ත්වයෝ ය; **මිනිසුන් සිත්** = මනුෂ්‍යයන්ගේ සිත්හි; **විරුඋ පියොවු ඇති බැවින්** = විරුඬි ප්‍රයොග විද්‍යමාන හෙයින්; **තුදි**= නො ගැඹුරුය; **නො මුවහ** = ප්‍රකටයහ; (මෙහි 'තුදි' යනු පාළි 'උත්තානකං' යනුවට අරුත් පැවසූ සැටිය.'**උත්තානකං**' යනුයෙහි පැනෙන '**තනු**' – විහාරෙ යන ධාතුහුගේ විස්තරාර්ථය සලකා ඒ අර්ථයෙහි වැටෙන '**ථර**' ධාතු පසිාය නොට ගෙන **තර** – විහරහි යන ධාතුවෙන් මෙසේ යොදන ලදැයි හැඟේ. මත්තෙහි ත් සැල කියයුතු.) **පසුහු** = සිවුපාවෝ; **ඝියුපාඣය්හු සිත්** = චතුෂ්පාද ජාතීන්ගේ සිත්හි; **අදුරු කිරිය ඇති බැවින්** = ආජ්වක්‍රියාවන්– සෘජු ක්‍රියාවන් ඇති බැවින්; **ඉදිසිත් ඇති බැවින්** = උපුගත සිතැති බැවින්; **නො හැඳිසිත් ඇති බැවින්** = අනාවජ්ජිත – ඇද නො වූ සිතැති බැවින්; **ජේඳ්** = දෙස මැ; **පසේ බුදුන් සෙ රෙහි**= පච්චෙකා බුද්ධයන් විෂයෙහි; **ඉදිවැ පැවැති සිත් මෙ** = සෘජු වැ පැවැති සිත් මැ සි; **විවාදුන් කමිහු** = ප්‍රතිසන්ධි විපාකය දුන් කාමයා ගේ; **ඵල දෙන ශක්ති නො හුණ්ඳ** = ඵලදෙන ශක්තිය ගෙවී නො ගියත්; (**හා** – වාගෙ > **හෙ** – ගෙවීයාමෙහි යන ධාතු සි; හෙසි – පිරිහෙසි – හිණි – පිරිහිණි. යනාදිය සලකනු); **ආහිමෙන්**= ආයු ගෙවියාමෙන්; **ආ ඇතඣ** – ආයු ඇති කල්හි ත්; **ජනකම්හු ශක්ති හිමෙන්** = ප්‍රතිසන්ධි ජනක කාමයාගේ ශක්තිය ගෙවී යාමෙන්; **ආහාරකඛය කොවා දෙමරණින්** = ආහාරකඛය මරණය කොප මරණය යන මරණද්වයෙන්; **සමිහව වන උපක්‍රම මතු** = ලැබෙන උපක්‍රමය පමණක්; **අහර සඳ වැරැඣවිම් හා** = ආහාර කාල විරාධනය හා; **එක් සෙනක් මතු**.= එක් චෙතනාවක් පමණක්; **නො නිපැඣන බැවින්** = නූපදනා බැවින්; **එක් වැ උපන්** = එක් වැ උපන්නා වූ; **අවර අවිරි සෙසින්** = අපරා පරිය චෙතනා වන්; **වෙන් කිවෙත්** = වෙන් කොට කිහු වෙත්; **එක්ඛ ම** = සමඟ මැ;

105. 'නොයෙක් දහස් සෙනෙක්' යනු 'නොයෙක් දහස් සෙනක්' සි ගන්නේ. – අනෙක සහස්‍ර චෙතනා රැසක් යන අර්ථ සි.

නිපඣැන බැවින් = උපදනා බැවින්; **එසේ කියත්** = එසේ කි කල්හි; **අනන් මන** = අන්‍යොන්‍යයනට; උවඨඹ වුවද= උපඨම්භ වුවද – රුකුල් වුව ද; **දෙටඣ** = ආයු ඇතිතාක් සිටීමය – මතු මතු ඉපැදීම ය යන දෙකට මැ; **හේ දුක් වූ වෙත්** = හේතු දුක්වූවාහු වෙත්; **කිවා විපරි විසින්** = කියන ලද්දට විපරීත

වශයෙන් 'බහුං පුඤ්ඤකම්මං' යනුවට විපර්‍යාස වශයෙන්; **පුරැතු පින්** = පරිත්ත පිනක් – මද පිනක්; **මහත් කොටාරක්** = මහත් කොට්ඨාගාරයක්; **දැක්විසවි වැ** = දක්වනු කැමැති වැ; **පිළි සඳ ළුතු** = ප්‍රතිසන්ධි දෘනය කළා වූ; **පුරැතු පින්** = පරිත්ත පුණ්‍යය; **මහත් කොටැ ලූ** = මහත් කොෂ්ඨයෙක්හි ප්‍රක්ෂිප්ත; **අතතරා ළඟි මෙ** = අතරෙහි මැ; **ආයි** = පසුව – නැවතත්; **එසඳට** = ඒ කාලයට;

106. 'අපරසඳහි සිහි නො කිරිමෙන්' යනු '**අහරසඳ සිහි නොකිරීමෙන්**' යි ගන්නේ.

අහර සඳ = ආහාර ගතයුතු කාලය; **ගිණියක** = ගණි කාවක ගේ; **දූ පුත් දෙජනහට** = දුහිතෘ පුත්‍ර දෙදෙනා හට; **සාමාන්‍ය පුංසවන බැවින්**= සමාන පුල්ලිඟු වහර ඇතිවන හෙයින්; **නිපුස් එක් වජන් වී** = ('කිං එතං' යි) නපුංසක එක වචන විය; **ආලපනු** = ආමන්ත්‍රණය යි; **නට ද** = නෂ්ට වුවත්; **නො පිරිහිණක්** = අපරිහාණියක්; – නො අඩුවක්; **වක් හා** = පැළවිය ආදි තිපි ද; **කරණ හා** = අමෘතාදි කරණ ද; **නකක්ඛෝ** = නක්ඛත්ත යොගය ද; **ගෙහි මඹුව** = ගෘහයෙහි මහාම්බකාව; **ගොවු දෙන්** = ගොවජයෙන්; **ගැලිදෙවු** = ගැල්ලන්ගේ – ශාකටික යන්ගේ ජ්‍යෙෂ්ඨ තැනැත්තේ; **ලවි** = ඛෙදයෙකි; **කම් බැරි** = කර්මය බැරෑරුම් ය; **නොහොත්** = නැතහොත්; **සොවල් හු** = අසවලාගේ; **ගැල් සකිනි** = රථ චක්‍රයෙන්; **දරියෙක් මෙළේ සි ඝන** = දරුවෙක් මළේය යන; **කිසැයෙක්** – කෘත්‍යයෙක්; **සක්**= චක්‍රයෙන්; **පහරනා ලදුයේ සි** = ප්‍රහත විය; **සලනුවට** = චලනය කරනු පිණිස; **සොර පවසිනල් පව්වට** = (සොර පවසින් + ගල්) චොර පපාතන ගල් පර්‍වතයට – සොරුන් පෙරළා හරින ගල් පර්‍වත යට; **සොරුන් හෙළන** = චෞරයන් නිපාතනය කරන; **පවසින් ඇති** = ප්‍රපාතයන් ඇති; (ප්‍රපාතනම් පවු ඇළිය); **සැපෙනුයේ** = ප්‍රපතය වනුයේ – හැප්පෙනුයේ; (ප්‍රාකෘත '**ජිප්ප ඉ**' යනු පාළි 'ප්‍රපති' යනුවට සමාන ය. 'සැප' යනු එදෙකට මැ සම වේ;) **හුණු ළැහැබෙක්** = හුණ පදුරක්; **කිරිඳුළැහැබෙක්** = හුණිද පදුරක්; **කොදෙක්හි මෙන්** = කොජවයෙක්හි – කොදු පලසෙක්හි මෙන්; **හුණු කරවුවර** = වෙණු බලිය;

(වි) කරවුවර නම් රජයට දියයුතු අය බදු ය. කුලු පත් තකු විසින් හුණ පතු කර්‍මාන්ත විශෙෂයන් ගෙන් රජයට දිය යුතු බදු වෙසෙසෙක් 'වෙණුබලි' නමැ යි සලකමු. '**එදවස් එක් නළ කාරයෙක් පුත්‍රයකු හා එක්ව හුණදිඬු කපන්ට ගියේ**" යනු සද්ධම්ම රත්නාවලි පාඨ යි.

ඇසෑ හුණු = ඇස්හි වැටුණු; **කසළක් සේ** = කසිකසළක්–රජසක් මෙන්;—

107. 'උළු බැජනුවට බදුන්වන් කළ තැන්' යනු 'බදුන් බැජනුවට උදුන් කළ තැන්' සි ගන්නේ.

බදුන් බැජනුවට = භාජන භජ්ජනය පිණිස – **වළන් පිලිස්** සිම පිණිස; **උදුන් කළ තැන්** = ළිප කළ ස්ථානය; (ආවාප නම් වේ,) **සුළායෙන්** = ආවාප නම් සුළාව යැ සි කියත්; (සුළා නමුත් උදුන මැසි. "අථොද්ධනඤ්ච චුල්ලිඤ්චී" යනු අභිධානප්පදීපිකා සි.) **නො සමජ්ජ** = අසම්මජ්ජනිය වූ; **දිතෙක්** = පුතෙක්; **හැතය රැවැනි** = සත්‍යකාරයක් – අත්තිභාරයක් වැන්න; **බඹු ගණන බව කැමැතියා** = බඩුගන්න බවට කැමැතියකු වියසින්; **අත්ථබ්‍රූ**= හස්ත ප්‍රාභෘතය; **කරනු සොබ** = කිරිම පිණිස; **වම සොළි** = පන්දු සොළිම – බෝල සෙල්ලම; **බොහොලක්** = බොහෝ වූ ඉලන කයන්; **ජුනුහු** = (මා පරදවා) ජය ගත්හ; **ඉළි ජැණෑ** = ආපසු දිනා; **ඔවුන් ජුනුතා වට** = ඔවුන් දිනුහාක් බෝලයන්; **වළා ජනාන් සේසි** = නැවත දිනා යනු කි නියා ය; ('වැළි – වැළින්, බළන් – බළ – වළා–යළි–යළින්–යළ්' යන මොවිනු පසිඳියයෝ සි) **බොහොහා පරජුයෙමි** = බොහෝ සොට පරදවන ලදුයෙමි;—

108. 'නිබඳ කියු – නො සොට නො මිස්සහ හෙසි' යන මෙහි 'නිබඳ' යනු 'නිබන්ධි' යනුයෙහි අර්ථ සි; එහෙසින් උහු සෙරෙන් වාක්‍යවෙජ්දය වුව මැනැව, 'කියු නො සොට නොමිස්ස හෙසි' යනු එහි නිදේශ පාඨ සි, 'නොමිස්සහ හෙසි' යන මෙහි 'හ' කාර අධිඝා සි. '**නිබඳ – කියු නො සොබ නොමිස්ස හෙසි, වෙලෙවෑ කියූ සි සේ සි**' සී විසඳ සොට ගන්නේ.

නිබඳ = නිබන්ධනය සෙලේය; **කියු නො සොබ** = කියන ලද්ද නො සොට; **නොමිස්ස හෙසි**= මිදෙනු නො හැකි වෙහි ය සි; **වෙලෙ වෑ** = වෙනිත වැ; **කියු සි සේ සි** = කිසේය යනු කි නියා සි; **විඝාදුපි හි** = අසහනාර්ථයෙහි; **තුමා පුන්හු මරණෑ** = තම පුතාගේ මරණයෙහි; **විඝාද හා** = ඛෙදය – අසහනය – නො ඉවසිල්ල හා; **අගරූ** = අගෞරවය; **හුම්ම වචනයට** = සපාමී විහක්තියට; **අලුක් සොබ** = ලොපය නො සොට;—

109. 'පැතිරෙන ලදුයේ' යනු '**වැතිරෙන ලදුයේ**' සී ගන්නේ. අවස්ථරණය කරන ලදුයේ–යට කරන ලදුයේ යන අර්ථ සි;

දූහැව්යෙක් = කොප කළ තැනැත්තෙක්; ('ඛාහ–වෛර–ඛාහනා – වෛර කරනා – ඛාහී – ක්‍රොධී' යනාදි නිඝණ්ඩු වචනයන් හා සමකොට බලනු.) **නො මද දෙමිනසක්** = අමඳ දෞර්මනස්‍ය යක්; **වළඳසි ද** = විඳිද; **මෙසින්** = මේ සිවු තෙමේ ත්; **මෙත් අසි මහඟන්නට** = මෛත්‍ර්‍යාධික මහා සත්ත්වයන්ට; **දූහැවැ** = ක්‍රොධ කොට; **සපරාහි** = සම්පරායෙහි – පරලෝකයි; **දෙමිනස් වැළඳූ කල** = දෞර්මනස්‍යය විඳුනය කළ; **තාඩන ඇ** = තැළීමා දිය සි; **පරිභාෂණ ඇ** = තර්ජනාදිය සි; **සර්ව්ඛහරණ ඇ** = සියලු ධනය පැහැර ගැනීමාදිය සි; **දඬට** = දණ්ඩනයට; **නො නිස්සන් කෙරෙහි** = අයොග්‍යයන් කෙරෙහි; **නො දූහැව්යවුන් කෙරෙහි** = නො කිපිය යුත්තන් කෙරෙහි; **දස පිලා කරුණන් අතුරෙන්** = දශවිධ පීඩා කාරණයන් අතුරෙන්; **පුරිස්වෙසින්** = පරුෂ වෙදනාවකට; **බලි දුක්වෙසින්** = බලවත් දුක් වෙදනාවකට; **හානි** = ප්‍රණ්‍යාදි විනාශයකට; **හසකවෙජ්ද ඇ** = අත් සිදලීම් ආදී වූ; **ශරීර භෙද** = සිරුරු බිඳුමකට; **බිලි රෝ** = බලවත් රොගයකට; **ඔත් විබෙවු** = උම්තුවකට; **ප්‍රවාසය** = වාසයෙන් පහවීම ය; **සර්ව්ඛ හරණ ඇ** = සියලු ධනය පැහැර ගැනීමය යනාදී වූ; **උවදුරු** = උපද්‍රවයකට; **ජාති කුල සර්ව්ඛන ඇ** = දූ ගැටුම් කුල ගැටුම් යනාදී වූ; **දරුණු හැවුම්** = දරුණ ආක්‍රොශය කට; **විඳුනා පැල** = විඳ්‍යමාන පීඩාවන්; **ද්වෙෂ ජීම්හ නො වූ** = ද්වේෂයෙන් ඇද වැ නො ගිය; **සිතින් බලනුවහට සි සේ සි** = සිතින් යුක්ත වැ බැලීම පිණිස යැ සි කී නියා සි; **යුත් කැමිහා** = ආයුත්තකයා පුරුෂයාගේ – අය වැය පාලනයෙහි යුත් පුරුෂයා ගේ; **කටයුතු සඟරාක්** = කරනට තිසි සඬ්ග්‍රහයක්; **දහඤනෑ** = දහවලු කොන්හි–වයස්ත්‍රානතයෙහි; **අකුරු පිළිවෙය** = අක්ෂර පටිවේධය –අක්ෂර සමාම්නාය; **පාතො අසිතබබං** = උදෑසන කැවයුතු දෑය; **පාතරාසං** = එනම් වේ; **මෙහෙකර දූසක්** = පෙසනකාරී දූසියකා; **අවුණට** = ආපණයට – සල් පිළට; **මෙහෙයූයෙන්** = පෙසනයෙන් – මෙහෙයීමෙන්; **මෙහෙයිම්** = පෙසනය–පණිධිඛය; **සනා** = සෙනහය; **ඇට මුල** = අස්ථිමජ්ජාවට – ඇට මිදුලට; **පැහැර** = ඇන ගෙන – වැද්ද ගෙන; **පෙම් සිතින් උපන්** = ප්‍රේම සහගත චිත්තයෙන් උපන්නා වූ; **රූ** = විඤ්ඤත්ති ආදි රූපයන්; **පෙම් මෙ** = ප්‍රේමය මැ; **අයුහෙවෙහි පරිචයෙන්** = අතීත භවයෙහි පුරුද්දෙන්; **වත් මනු හෙවෙහි කල හියෙන්** = වර්තමාන භවයෙහි කල හිතයෙන්; **එසින්** = ඒ හෙතුවෙන්; **පෙම්** = ප්‍රේමය; **වට හසි** = උපඛ්‍රිත වෙයි – උපද්දී; **දියෙහි** = ජලයෙහි; **මහනෙල්** = මහානීල පද්මය; **භවිද** = සම්ඵුඨිත වේද – හටගනී ද; **පිරිමිනි රක වලින්** = පුරෙගාමීන් යොදවා කැරෙන රක්ෂාවරණයෙන්;

පිම්ල්ලතු = පාද මූලිකයකු – මෙහෙකරුවන්හු යයි සේ යි: **නිස්සේදුර** = ඉද්දරෙහි – ශිෂ්‍යපාඝාතියෙහි; **අයකැමියා** = ආයකාර්මිකයා; **උපභොග පරිභොග බඳුන්** = උපභොග පරිභොග භාණ්ඩයන්හේ; **පිදිසෙයි** = පරිවේෂ්ටයෙක් – සීමාවෙක්; **භොජන පාන සරාව ආ** = භොජන සරාව පාන සරාව ආදිය සි, (ආහාර බුදින තැලි – තැටි ආදිය භොජන සරාව සි. පාන භාජන පාන සරාව සි.); **දිපදා** = දිපදයෝ නම්; **දුසිදුසා** = දැසි දස්හුය; **චතුප්පදා** = චතුප්පදයෝ නම්; **ගොමහිසාදයො** = ගෙරි සරක් ආදිහු සි, **යානානි** = යානයෝ නම්; **රථ සිවිකාදිනි** = රිය සිවිගෙය ආදිය සි; **වාහනානි** = වාහනයෝ නම්; **හත්ථි අස්සාදිනි** = ඇත් අස් ආදීහු සි.

110. 'නිසිරි බෝලව්' යනු "අලක්ඛිතා වත මහාති වත්වා" යනු අට්ඨවා හෙයින් '**නිසිරිමෝ ලව්**' සි ගන්නේ. **ලව්** = අල්පෝම ය; **නිසිරිමෝ** = ඇපි නිශ්‍රීකයෝ වෙමු;

ළැම්ඩියෙහි = හෘදය මධ්‍යයෙහි; **පිතීතො ආගතං** = පියා කෙරෙන් ආයේ; **පෙතතිකං** = එනම් වේ; **දෙමි පිළිණ කරන ලද්** = දෙමැයි ගිවිස ගන්නා ලදි – අභ්‍යුපගමය කරන ලදැයි සේ සි; **තනතුරු** = ඍතනන්තරය; = **හම්මන්නට** = සඤ්ඣාපනය කරනු වට – උසුලන්නට – දරන්නට; **සවිසියෙන්** = සර්ෂපයෙන්; **පිරිහෙළි** = දිරා ගියේය – අපතේ ගියේය; **හැසි** = ඇද දැම්මේ ය; (**හය** – හැයිමෙහි යන ධාතු සි.) **කිසෙයෙන් නිස වුහු** = කවර හෙතුවෙකින් නිශ්‍රය (පිහිට) වූවා වෙහිද; **අද කවණ ඇනට** = අඩ කපණාදීන්ට; (කපණ නම් දුග්ගතයෝ ය. 'කිච්ණ' යනු ප්‍රාකෘත පාඨ සි.) **දන්හි විසවුළු** = දැනයෙහි ව්‍යාවට වූයේ – දැන සංවිධානයෙහි කාසී භාරයෙන් යෙදුණේ; **නුදුවු විරි සබඳ** = පෙර නො දුටු යහළුවෙක; **විය ගලන්** = වයොඝටිතයන් – වයඃ ප්‍රදේශයන්; **සොසකසෙව්ඩිං පත්‍ථෙනතා** = 'සොසකසෙටඨිංපත්‍ථෙනතා' යනු; **ජීවනත්‍ථාය** = දිවෙල් පිණිස; **තණ්හකතතා** = තණ්හාන්නි යන අර්ථ සි; **මිනියගින්** = මේ නීහාරයෙන් – නීයාමෙන් – ක්‍රමයෙන්;—

(වු) විජාත මාතුයාපි, ලුහුවුහු මවටජ' යනු මෙහි පැනෙ සි විඛ්‍යඛභයාගේ වත්හි "යමසෙ ප්‍රතෙන විජාසි – නිමුල් දරුවන් ලුහු වූ" සී එසි. '**ලුහුවුහු**' යන මෙහි අන්ත 'හු' කාරය එතරම් උපයොගී නො වේ. '**ලුහුවූ**' යන තන්හි අන්ත 'ඌ' කාරය ස්ත්‍රී අර්ථයෙහි යෙදෙන අතීත කාලික ප්‍රත්‍යයයෙකි. මෙහි එහා 'ලුහුවු'

යනුද 'ලුහුවූ' යි යෙදුන මැනව, මෙහි නිෂ්පත්තිය නිශ්චය වශ යෙන් කිව නොහැක්ක. **ලුහුවූ මවටජ** = වැදූ මැණියන්ට ද යන අර්ථ යි.

විවෙතින් = විපත්තියෙන්; **සැපැත් විවෙතිනැයි සේ යි** = සම්පත්ති විපත්තියෙන් යනු කී නියා යි; ('කිහිප කොටසක්' යනු වෙහි **කිනිප** යනු 'කතිපය' යන පාළි ශබ්දයෙන් ආයේ ය;) **සැඬල යා** = චණ්ඩාලිය යන්නැ; **අඩයවි පහරක් සෙයින්** = අර්ධ යෂ්ටි ප්‍රහාරයක් මෙන් – කිරිච්චි පහරක් මෙන්; **වෙණෙහි** = වණ යෙහි; **කරදිය ඉස්මක් මෙන්** = ඛාරොදක සිඤ්චනයක් මෙන් – කාරම් දිය ඉසිමක් මෙන්; **පිරිවෙවු කොට** = වට කොට; **අලොළ** = ආලොඩනයක් – කැලඹීමක්; **සැණ** = උත්සවය; **ගුහණ ලද්** = ඝොෂණය කරන ලදි; **හි කවුළු දෙර** = සිංහ කවාටද්වාරයෙහි; සිංහරූපයුත් පළු ඇති දෙර සමීපයෙහි; **හස්ස කරවා** = මුද්‍රිත කරවා; **බිසෙසැ** = අභිසිඤ්චනය කොට; **සැඬපජොවා** = චණ්ඩ ප්‍රද්‍යොත යාගේ; **මේ සනිටුහන්** = මේ නිශ්චය යි; **කටැතක්හු** = කාෂ්ඨ මය හසනියකු; **කුටමුවා** = කාෂ්ඨයෙන් නිර්මිත වූ; **යතුරු කැමින්** = යන්ත්‍ර කර්මයෙන්; **ඇවිඳුනා** = ආවජ්ජනය කරන්නා වූ; **ඇන්වන් කොටැ** = ඇතකු වැනි කොට; **කැනූ බැවින්** = නිෂ්පාදිත හෙයින්; **එබව එබවට** = ඔබින් ඔබට;—

(වූ) 'එ' ශබ්දයා කොරෙන් ආධාරාර්‍ථයෙහි 'බව' ප්‍රත්‍යය යැයි ගන්නේ. ඔබ – කොබ – කොහිබ – කොසිබ යනාදි තන්හි කි සෙයින් 'බ' ප්‍රත්‍යය වේ. 'එබවට' යනු මැ 'ඔබ්බට' යි ද වහරු යෙදේ. 'කව–කඟිංහි, යනාදී භාෂාන්තර ප්‍රයොග සමකොට බලනු.

සැක්මෙත් = චඞ්ක්‍රමණය කෙරෙත්; **අපරතො අපරං** = ඔබ්බෙන් ඔබ්බට යන අර්‍ථයෙහි; **අපරාපරං** = 'අපරාපරං' යනු වේ; **මහ තෙරහු** = බුදුගොස් මහතෙරුන් වහන්සේ; **කසසින් සම් දිට්හැ සුතත්** = කාව්‍යාය සම්මා දිට්ඨි සූත්‍රාන්තය; **විය බැන් කෙරෙමින්** = ව්‍යාඛ්‍යාන කෙරෙමින්; **සැඬ පජ්ජොත** = චණ්ඩප්ප ජ්ජොත රජතෙම; **උදෙනා ගන්මි** = උදෙනී රජහු ගනිමැ යි; **මහනෙල් ඕවි** = මහනෙල් පත්‍රා සෙවෙලි කරන ලද; **කටතැක් දක්වය්** = කාෂ්ඨමය හසනියකු දක්වා; **ගතැයි** = ගත්තේ යැ යි;—

111. 'කුමට කියුහ පිළියත්' යනු '**කුමට කියුහ යත්**' යි – ගන්නේ. **ඒ ඇදුරොලෙහි** = ඒ ආචාර්‍යාන්වයෙහි;

112. 'කී මහ කියනු කොටැ' යනු 'මහ කියනු කොටැ' සි ගන්නේ.

මහ බුමු කොටැ = මාඝීන්‍රමයකු කොට ('මහ බුමු' නම් මාඝීයෙහි බමන්නාය. වැඩි වශයෙන් ඒ ඒ මාඝීයන්හි ඇවිදුනේ ය.) **පවත් දන්නාව** = ප්‍රවෘත්ති දැනගැනීම පිණිස; **පියෙජී** = ප්‍රයුක්ත කෙළේ ය; **සඤ්ඤාබන්ධනයෙන්** = ගැල් රැසක් වටා සිටුවන පරිද්දෙන්; **නුහුබද්** = අනුබන්ධනය කෙළේ ය; **උදෙනා අරුණු ඇත්හු වරා** = උදේනී රජහු ආරූඪ වූ හස්තියාට වඩා; **ජව ඇති කොටැ** = වෙගාන්විත කොට;--

113. 'පලන තතු ඇතක්හු සෙයින්' යනු **'පලන තුතු ඇතක්හු සෙයින්'** සි ගන්නේ. 'පලායන තුදින හස්තියකු මෙන් යන අර්ථ සි. ඇතුන්ගේ කන බුල විදින කුත්තු තෝලයට **'කුතනං'** යනු මාගධාභිධාන සි. තුතුයෙන් අනින්නලද ඇත් = තුතු ඇත් නම්, සංස්කෘතයෙන් 'තොත්‍ර' සි කියත්.

ජීවග්‍රාහයෙන් ගැනැ = නො මරා - පණපිටින් අල්ලා ගෙන; **සතුරු රජහු විසිඝට ගිය බවු** = සතුරු රාජයාගේ වශයට-ඝටනට ගිය බව; **සොර කෙකෙක්හි** = සිර ගෙයෙක්හි; **ජහ කරුවන්** = විරොධකාරී සත්ත්වයන්; (ජහ + කරු' යනු පදවෙන්ද සි; **දහ** - දැඟීමෙහි යන ධාතු සි. දැඟීම නම් විරොධ කරණය-ආරාවුල් කිරීමය - කොලහල කිරීමය - බන්ධනය යන අර්ථ සි. "දඛ්ඛා" යන ඛිණ්ඩිය වචනයෙහි කොඹාගත අර්ථවිවරණය බලනු.) **හුන්** = නිමණණ වූ; **ජයලදුවන්** = ජය ලද්දවුන් විසින්; **පියයුතු** = පාතව්‍ය වූ; **පතු** = පානය සි; **පානවිශෙෂයෙක්** = විශෙෂ පාන යෙකැයි - සාමාන්‍ය පාන වර්ගයෙන් වෙනස් වූ පානයෙකැයි යුසේ සි; **සෙක්** = කියත්; **සක්හු** = සක් දෙව්රජහු; **අසුරන් දිනැ** = අසුරයන් පරදවා; **ජයපාන බොන සැදූ** = ජයපානය බොන කල්හි; **පෙළෙවැ හුණු** = පොළොවෙහි වැටුණු; **අරථ ඊක්** = ඉර්තාකී වෘක්ෂයෙක්; **හැවිය යෙක්** = සම්භවිසින වී යැයි කියත්; **හැන්හත් මතුරු සඳහාය්** = හස්තිකාන්ත මන්ත්‍රය සඳහා; **ගණන උවසරින්** = ග්‍රහණොපචාරයෙන්; (මේහි උපචාර නම් මන්ත්‍ර ප්‍රයොගය සි.) **රජක්හු** = රාජයකු විසින්; **නිගහයුතුවක්හට** = නිග්‍රහ - දඬුවම් කටයුත්තකු හට; **වැජැරිය යුතු** = අවධාරණය කටයුතු - විධාන කටයුතු; **නිගා** = පීඩා සි; **පිළිසෙවා** = පීඨ සප්පියෙක් - පිළෙක්; **ශෝභන කුඤ්ච ඇතියේ යැ** = සුදු කුඤ්ච

රොගය – කිලාස නම් කුටරෝ ඇත්තෙක්ය; **සඤ්ඤ කරණ බ්‍යඤන්** = නාම සඤ්ඤය කිරීමෙහි හිතියෙන්; **සඤ්ඤ කරණ බ්‍යඤන** = නාමසංඤ්ඤීය කිරීමේ කියෙන් යනු; **අලෙ කුද** = ඵොළ කුදිය; **තී මුඛ** = තීගේ මුඛය; **ඉතා ඔබාල් ඔට හා** = ඉතා **ඝන** තොල් හා; **ඝපොල්** ඇතියෙකැ = කපාලාන්විතයෙකි – හොඳ ඇත්තෙකැ; **ඔට මස් ඝපොල් බොලින්** = ඔෂට මාංසයාගේ හා කපොලයන්ගේ ගනකම හෙතුකොට ගෙන; **මුඛ**= මුඛය; **ඝණ පිරිවැටෙයි** = පරිවර්තනය කළ නො හැකි වෙයි – කිව නො හෙයි යන; **අභිප්‍රායි** = අදහස යි; (‘**නො පිරිවැහෙයි**’ යනුදු මනා පාඨ යෙක. ‘කිව නො හැකි වෙයි’ යනු මෑ අර්ථ යි.) **ඝඩතරා ඝන්** = තිරඵොන; (‘**ඝුඩුතිරෙ**’ යනු ද්‍රවිඩ වචන යි.)

114. ‘සිප් නම් මේ මතුරෙහි සහවා වෙණ වැයීම්’ යනුදු අර්ථයක් නො ගත හැකි සේ දූෂිත වැ ගිය තැනෙකි. **පාඨය ත්** නො නසා අර්ථ ලෙඝයකුත් ගතයුතු සේ ‘**සිප් ගැනුම් නම් මතුරෙහි සෙහෙ වැ වෙණ වැයීම්**’ යි ඵොඩනය කටයුතු බැව් අපට **හැඟිණ.** ‘ශිල්පොද්ග්‍රහණය නම් මන්ත්‍ර විෂයෙහි ඡෙක වැ – දක්ෂ වැ **වීණා** වාදනය යි’ යනු එහි අර්ථ යි **සෙළෙක් මතු** = චූළක මත්තාවක්– සවල්ප මාත්‍රයක්; **උච්චර වස්** = මන්ත්‍ර ප්‍රයොගය පිණිස;—

115. ‘අධිකාරාර්ථහි’ යනුවට වඩා අඩොළුවෙහි එන ‘**අධි කාරණනරහි**’ යනු මැනැවි. මෙහි ‘අධිකාර’ නම් ප්‍රකරණය හෙවත් ප්‍රස්තාවය යි. එක් ප්‍රකරණයක් ගතඵොට අන්‍ය ප්‍රකරණයක් පටන් ගැන්මේහි–උක්ත විපරිතාර්ථ කථනයෙහි ‘අඤ්ඤ’ ශබ්ද වැටේ. එහෙයින් **අඤ්ඤාරණනරහි** = අන්‍ය ප්‍රකරණයෙත්හි (වැටේ) යි අර්ථ ගත මැනැවි.

සිප් ගහණ අධියරු නිමි බැවින් = ශිල්පග්‍රහණාධිකාරය නිම් හෙයින්; **මතුයෙහි කළ වචනක්** = මත්තෙහි කරනුවට සුදුසු දෑයක්; **කිය යූ සේයි** = කියන්නැ යනු කි නියා යි; **අත්ථිය කළෝ යි** = හස්තගත කළහ; **පුණ්ණිස්වාණ්** = පරිච්ඡාපනය කරවා– ගිවිස්වා; **තුබුනූ** = ව්‍යවස්ථිත කළහ; **අවුඵවන ලද බැවින්** = ආවර්ථනය කළ බැවින් – වටනලද බැවින්; **තුමා අභිමුඛ ඵොවා** = තමහට ඉදිරිපත් ඵොව; **වටන ලද බැවින්** = පෙරළනලද හෙයින් නොහොත් දවටන ලද හෙයින් නොහොත් කරකවා ගත් හෙයින්; **තුමා විසිහි** = තමන් වශයෙහි;—

116. ‘වනලද බැවින්’ යනු ‘වටනලද බැවින්’ යි ගන්නේ. ‘පවත්වනලද හෙයින්’ යන අර්ථ යි. **ආවර්ථන ඵොරෙසි යන්** = අවුළුවා ගනීදැයි කිවහොත් **තොලඟරහු සෙයින්** = පිඹුරකු සෙයින්;—

(වෙ) 'තොලඟර' යනු මහා සජී යන අර්ථ යි. ප්‍රාකෘතයෙහි 'ථොර' යනු තරය, සථූලය යන අර්ථයෙහි තිබෙයි. 'ඟර' යනු ද 'අජ ඟර' 'අලඟර්ද' යනුවෙකින් ගෙනැ සාමාන්‍ය සජීවීයෙහි නිපා තිත යැ. තර – තුල් – තොල යන මොවුහු 'ථොර' ශබ්දය හා පර්‍යායයෝ යි. මාහස–අජඟර – මහාසප්ප–මහාවාළ ඔන නාමයෝ පාළියෙහි පිඹුරා හෝරේ ප්‍රසිඛයහ. 'පිඹුරු' යනුත් මහාසජී යන අර්ථ යි. දෙමළ බසින් 'පාම්බු' යනු සාමාන්‍ය සජීවීයෙහි ප්‍රසිඛය. 'උරෙ' යනු මහත් ශබ්දවීයෙහි වේ. පාම්බුරි > පිඹුරා යනු වේ.

වෙරැ බුමුසි ඔත් = ශරීරයෙහි අධිමුර්ච්ඡනය හෝරේ යයි කියත්; **නො බිසැ මැ** = අධිමුර්ච්ඡනය නො කොට මැ; **අවස්මර සෙසින්** = අපස්මාරය මෙන්; **විකිරිය කැරැ ඔත්** = වික්‍රියා හෙරේ යයි කියත්; **සිත් සැති** = චිත්තසන්තතිය; **පෙරළා** = විපර්‍යාස කොට; **තුමා ඇවි ඇවියෙහි** = තමන් කැමැති කැමැති දෑයෙහි; **වත්වා ඔත්** = පවත්වා යයි කියත්; **ඝථදෙවිපසින්** = දෙවූ පරිදි පාත්‍රයෙන් යුක්ත වැ; **සිස් පසිනැයි සේ යි** = හිස් පාත්‍ර යෙන් යුක්ත වැ යනු කී නියා යි; **බිමිසැ** = අධිමුර්ච්ඡනය හොට–ආවෙශ වැ; **පිරිසුණු වේ ඇතිසේ** = පරිපූර්ණ වෙග ඇත්තේ; **බුමන් ඝත්හූ** = (බූමන් පත්හු?) බහුමාන ග්‍රහණය කළ (බහුමාන ප්‍රාප්ත) තැනැත්තහු; **පූරණාපිඛි සාම්වචන** = 'හොජ්‍යාසස' යනු පූරණාපීයෙහි ෂෂ්ඨී වචන යි; **පස පිඛිවියෙන්** = පළාඛ ප්‍රතිෂ්ඨායෙන්; **බිජීඝයුතු කල්** = හොක්තව්‍ය කාලය; **ගළවතු වට** = ගිළිහී යාමට; **පැමිණෙනුවට අසන්** = පැමිණීමට ආසන්නය; **ලොවුතුරා ධම්ඛ** = ලොකොත්තර ධර්‍මයාගේ; **ඉස් නාලදු** = කැමැති වන ලද්දක්; **ඉජිවා** = සමෘඩ වේවා;—

117. 'හැම මනා කප්හු' යනු '**හැම මනා සඝප්හු**' යි ගන්නේ. සියලු යඛපත් සඬකල්පයෝ – අභිලාසයෝ යන අර්ථ යි.

පණු රැසි සඳ සෙසින් = පණ්ණරසී චන්ද්‍රයා මෙන්–පසළොස් වකැ සඳ මෙන්; **ජොතිරස් නම් ඇති මිණි සෙසින්** = 'ජොතිරස්' ඔන නම් ඇති රත්නයක් මෙන්; **ජොතියො** = රශ්මිහු; **එකස්මා**= මොහු කෙරෙන්; **රසනති** = යි සේ යි; **විසරනති ඉති** = විහිද යෙත් නුයි; **ජොති රසො** = එ නම් වේ; **රස්කලඛින්** = රශ්මි සමූහයෙන්; **පිරිසුණු ද** = පරිපූර්ණ වීද; **සව්කම්දු** = සියලු කැමැති දෑය දෙන්නා වූ; **කැමැති තා** = කැමැති පමණක්; **සම්පිඛිවාවන්**= වම්මපසිබබකයන් – සම්පයි; **කහවුණු** = කහාපණ යි; **ඇතවුරු රක්නාහු** = අන්තඃපුර පාලකයෝ; **හළ ඳුර** = හැර තුබූ චාර

යෙහි; **කැමියෝ** = පාලන කර්මයෙහි යෙදුණේ; **හවුලා ගෙන** = උව්විණ්ණය කොට ගෙන; (**හවුල** – හැවිළීමෙහි යන ධාතු සි. 'ආවුණන' යනුයෙන් හින්න සි.) **දෙවඟරන් හා** = දිව්‍ය අප්සරාවන් හා; **එකතුලස්** = සමාන කොටස් ඇති – එක්වැනි වූ **රොජා** = තණ්හාය කොට; **බැවිය යුතු සේ සි** = බිය ගන්වා යනු කි නියායි; **බිහි නියම් ගම්හි** = නියම් ගමින් පිටත්හි; **අඟ හොතුරු සරන තැන්** = අග්නි හොත්‍රය – ගිනි දෙවියා පිදීම කරන සථානය; **සිවුහි සොළ පත්** = රූපයෙහි කොටිප්‍රාප්ත වූ; **සිලි** = චලිතවිය – කැලඹිණි; **කමන් පියා** = කර්මාන්තය හැර දමා; **එළි පෙරහර** = බැහැර පරිහාරය (පරිහාර නම් සත්කාර විධිය සි); **බලනුවට** = බැලීම පිණිස; **නික්කන් සි සේ සි** = නිෂ්ක්‍රාන්ත විය යනු කි නියායි; **බුම්නිය යුතු බැවින්** = බහුමාන කටයුතු බැවින්; **පදමේ** = පාදය මැ; **වෙරඹු වා** = වෙරඹ වාතයෝ; **හමන වය යෙන්** = හමන සුළඟැසි කියත්; (හම – හැමීමෙහි යන ධාතු සි. '**හවා**' යනු සුළඟට නමැසි නිඳිය කොඟයන්හි තිබේ.)

118. 'සලක්ඛණ මන්ත්‍රයන් හා සමඟ' යනු **ලක්ඛණ මන්ත්‍රයන් හා සමඟ**' සි ගන්නේ.

රා අඩිහු පිය = රාගාධිකයාගේ පදය; **පියවර** = පද වාරය; **සුළාක්** = මදක්; **පිය ඇඟින්** = පාදාග්‍රයෙන්; **හැසි වේ**= හංසිත මේ – පීඩිත වේ – ගැවේ; **දෙස් සිරිහු** = වෙඹ චරිතයාගේ; **පෙරටට** = ඉදිරියට;

119. පොත්හි එන 'පෙරට වැ' යනුවට වඩා අධොලිපි ගත '**පෙරටට**' යන පාඨය මැනැවි.

පල්වා ඔබා = පාදාග්‍රයන් අවපීඩනය කොට; (පල්වා නම් පාදසෙඵාට සි–ඇඟිලි කිහිපර සි – ඇඟිලි අග පොළ සි.) **ඇක් මෙන ඔවින්** = පාගන බැවින්; **පිය** = පාදය; **පෙරට වැ** = ඉදිරියෙහි; **හැසි** = ගැවී; **පිය ඇඟින්** = පාදාග්‍රයෙන්; **එබී** = (පොළෝ තෙලෙහි) තද වැ ගෙන; **පැනෙයි සේ සි** = පැනේ යනු කි නියායි. **මොහ සිරිහු පිය** = මොහ චරිතයාගේ පාදය;—

120. 'නිමිත් හුණු.....තෙ ධා දිස්නා' යනුත් අවි කාහ්‍රියක් නැති වාක්‍ය ප්‍රදේශයෙකි. "සහස්සාරං සනෙමිකං සනාභිකං සබ්බාකාර පරිපූරං" සි පෙළෙහි එන සක් ලකුණු මෙනෙහි කරන විට '**නිමි පුණු**' (නිම්වළලුයෙන් පරිපූර්ණ වූ) සි ගතයුතු සේ

පෑනේ. **'තෙඛා දිස්නා'** යනුවට 'තුන් ලොකයෙහි බබළන්නා වූ' යි අරුත් කිණියහැකි, හේ මේ සථානයට වඩා යොගය නො වේ. මතුත් විමසියයුතු.

දියපැසි = උදක පානියෙහි – දිය තලියෙහි; **කිඹුලන් දක්නාහු** = කිඹුලන් දක්නවුන් ද; **ගෙමැද** = ගෘහ මධ්‍යයෙහි; **සොරුන් සතප්නා දක්නාහු** = සොරුන්ගේ විශ්‍රාමය දක්නවුන් ද; **එක් ඥපක හෙතුවක්** = යටගිය දූයක් අහවා ලන කරුණක්; **කුමාරිකා පලොභන** = මාර දුහිතෘන්ගේ පොළඹවා ලීම;--

121. 'නො වළඳන බවට කපක් කොටැ' යනු **'නො වළඳන බව පසක් කොටැ'** යි ගත මැනව. **'කුමාරිකා වණ්ණාදිහි'** යනාදී තන්හි පැනෙන **වණ්ණ** ශබ්දයෙන් සණ්ඨානාවය ගතයුතු.

කරන ලද නැළවීම් = කරනලද ප්‍රලොභනය – පොළඹවා ලීම –අනුකූලී කරණය; **තණ්හා අරතී රගා යන** = තණ්හාය අරතිය රගාය යන; **තුනු අප්සරසුන්** = ත්‍රිවිධ අප්සරස්හු; **මෙවුන් ධම්හි** = මෛථුන ධම් සෙවනයෙහි; **සද මතුයෙකිපු** = ඡන්දෙ මාත්‍රයෙකුදු – ආශා සවල්පයෙකුදු;—

122. 'මෙ කිරිසවුළු' යනු **'මෙ මුත් කිරිසවුළු'** යි ගන්නේ. මූත්‍ර කරීෂයෙන් පිරිගත් මේ දෘශ්‍යමාන ශරීරය යන අර්ථ යි. 'මුත්‍ත කරීස පූණණං යනු මුත්කරිස පුණු > මුත් කරිස වුණු > මුත් කරිසවුළු' යි සිඩ යි.

මෙවුනෙහි = මෛථුනයෙහි; **සද චේද** = ඡන්දයෙක් – ආශාවෙක් වේ ද; **අප් කොටැස්හි එසන්** = ආපො කොට්ඨාස යෙහි ඔසරණය වත – ඇතුළත් වත; **පළවි කොටැස්හි එසන්** = පඨවි කොට්ඨාසයෙහි ඔසරණය වත; **නං** = නං යනු; **කළෙ බදං** = ශරීරය යන අර්ථ යි; **මානඳි කුලෙසි** = මාගන්දි කුලය යි; **පහලකුල** = ප්‍රකට කුලය යි; **'අනඨං මෙ අචරි' යන** = මට අනර්ථයක් කෙළේය යන; **අඝා** = ආඝාතය යි – වෛරය යි; **පුණුස්වා** = පිළිගන්වා; **යෙළ දහසක් නළුවරන්** = එක්දහස් පන්සියයක් නාටිකා සත්‍රීන්; ('වර' යනු 'ඊරු' ශබ්ද පර්‍යාය සත්‍රී වාචක ශබ්දයෙකි. 'අත්බර' යනු ද සිතා බලනු මැනැවි. **(අසන් වසෙළබ්මෙහි** = ආසන්නවූ වස්සූපනායිකායෙහි – ආසන්නවස් එළඹෙන සමයෙහි; **වසන් කියා** = වස්සානය කියයි; **අකාර** = 'වස්ස රත්ත' යන තන්හි සකාරසථ අකාරය; **වෙළිජි** = වළදෙහි–

ශබ්දව්‍යවහාරයෙහි (මෙහි අරුත් තව ද විමසියයුතු); **දික්වූ** = 'වස්සා' යි දීඝී විය; **වසන් යූ සේ සි** = වස්සාරත්ත නම් වස්සානය යනු කී නියා සි; **හිමත් හිමන් අටමස්හි** = උදුවප් දුරුතු නවම් මැදින් බක් වෙසක් පොසොන් ඇසළ යන හෙමන්ත හිම්ඛාන අටමාසයෙහි; **අරණ ආනෙහි** = අරණ්‍යායතනයෙහි; **අරණ මෙ** = අරණ්‍යය මැ; **තරු හුල්මාදින්ම** = රුක් පඳුරු ආදියව;—

123. 'සංජාති සදෙස වන බැවින්' යනු '**සංජාති දෙස වන බැවින්**' යි ගන්නේ. 'උත්පත්තියට ප්‍රදේශවන බැවින්' යන අර්ථ සි.

"සංජාති දෙසෙ හෙතුම්හි - වාසට්ඨානාකරෙසුච
සමොසරණඨානෙ වා - යතනං පදපූරණෙ"

යනු අනෙකාර්ථ වගී සි.

අලුප් පමණ ඇනියක් = අල්ප ප්‍රමාණ ඇතියක්; **මහෙ සක්ඛිණ** = 'මහෙසක්ඛින' යනු; **මහානුභාවෙන** = මහත් අනු බවු ඇති යන අර්ථ සි; **සාධුවතස්ස** = 'සාධුවතස්ස' යනු; **සුන්දරං වත සියා** = එකාන්තයෙන් යහපත් වන්නේය යන අර්ථ සි; **නැළියක් ස ඩෙළෙහි** = නැළියක් පමණ තණ්ඩුලයෙහි-සාලෙහි; **මියෙහි ලැහි අමිස්** = මුඛයෙහි ඇලිහිය ආමිසය; (**ලඟ** - ඇලී මෙහි යන ධාතු සි. 'ලඟ - සඞ්ඝ' පාළි සි); **පියවනුව වස්** = පහ කරනු පිණිස; මුව **විසල්වා** = මුඛ ශිඤ්ඤාලනය කොට - කට සෝදා; **සප්පි** = ගිතෙල; **නවනීත** = වෙඩරු; **මධු** = මී; **සක්කරා** = ශර්කරාය (යන මොහු වතු මධුර නම් වෙති.); **ද්වත්තිංසාකාර පාළි** = කෙසාදි දෙතිස් කුණු කොටස් පහළ වන දෙසනා පාළිය; **උපොසථ නියමෙන** = පෙහෙවස් වත වශයෙන්; **සමාදානබබසිලානි** = මුල් මැද අග සමසේ ගතුයුතු සීලයන්; **අඛ පෙහෙ සම්** = අඛණ්ඩ පෞෂ්ඨ සම්‍යක්; **දිවාභාගයෙන්** = දවල් කොට සින්; **පෙහෙවිසා නො වේ** = උපොසථිත වූයේ නො වේ; **සිල් රැකියා මතුව වේ යෙති** = සිල් රැකියේ පමණක් වෙයි යනු කියත්; **හේ නො යෙදේ** = හේ යුතු නො වේ;—

124. "උපොසථ සම් හා ගෙනැ රැවූ බැවින් උපොසථ කම්ම නො දුරුවත් උපොසථ නාමයෙන් ගත් සිලිදු නො රැවන බැවින්" යනු "**උපොසථ සම් හා ගෙනැ රැවූ බැවින් උපොසථ කම්ම නො වත් උපොසථ නාමයෙන් ගත් සිලිදු**" යි ගෙන "**පොහොයහ විසින් රැකෙන සෙයින්**" යන මතු වාක්‍යය හා ගළපා අරුත් ගතයුතු. මෙහි ආශය මෙසේය:— පෙහෙවි නම් පාපයෙන් වෙන් වැ සියලු භොගයන් දුරු කොට කිසියම්

ද්‍රව්‍යයක් සඳහා පේළිම කි. එසේ පෙහෙවීම මෙහි සැට පැයක් සමඛ්‍ධ කොට සලකනු ලැබේ. 'උපොසථඞ්ගවසෙන සමාදියිස්සාමි' යි සමාදන් වූ හිලය රැවූ නිසා 'උපොසථ කම්ම' නො වූ වත් ඒ නාමයෙන් ගත් නිසා උපොසථ සීලයම වේ යනු කි. යට දක්වන නිදර්ශනයන්ගෙන් අර්ථය පැහැදිලි වේ.

ඔසදන හා = සුගන්ධ විලෙපනයන් හා; (විලෙපන නම් ඇඟ ගල්වන සඳුන් කල්කාදිය කි. මෙහි 'අදන' ශබ්දය 'විලෙපන' ශබ්දය හා සමරූත් වේ. **අද** – තැවරීමෙහි යන ධාතු කි. පාළියෙහි 'අසද්ද – මක්ඛනෙ' යන ධාතුයෙන් ආයේ ය. ඔසු මුවා අඳන ඔසදන යැයි සලකමු. ඉන්ධානන්තරයෙහි 'ඔසද මුත්තු' යනු ගාන්ධික යාට – සුවඳ වෙළෙන්දාට නම්. එහි බලන් ඔසු + ගද = ඔසද, ඔස දින් වැටෙනුයේ – දිවි පවත් වනුයේ = ඔසද වටු යැයි හැඟේ. මේ දෙ තැන ම තවද චින්‍ත්‍ය කි.)

සමාදන් වනුවහට = සමාදානය කරන්නා හට; **මාලාදි ධරනි සිඛ්ජ්** = මාලා ධාරණාදියෙන් වෙන්වීමට හේතු වූ ශික්ෂා පදය ත්; **වතු මධුර මූනි මුත්‍රා දෙපෙ** = සිව් මියුරු ය, ගෝ මූත්‍රය යන දෙක; **එක් මෙ රොවට** = එක මැ රොගයකට; **පිළිගම් හොතුඃ** = ප්‍රතිකම් වුවත්; **වතු මධුර තඛා** = සිව් මියුරුව හැර; **මූතිමුත්‍රතයෙන් පිළියම් කළ මහණහු මෙ** = ගෝ මූත්‍රයෙන් ප්‍රතික්‍රියා කළ ශ්‍රමණ පෙමේ මැ; **වඩා අපිසේ යූ බැවින්** = වැනි යෙන් අල්පෙච්ඡ යයි කි බැවින්; **ධම් දූශද සුතන්හි මෙ** = ධම්ම දූයාද සූත්‍රාන්තයෙහි මැ; **බුන් ඉතිරි බත් බිජු** = භුක්තාවශේෂ භක්තය හොජනය කොට – කෑ ඉතිරි බත් කා; **මහණුවම් කළහු වරස්** = මහණකම් කළ මහණ හට වඩා; **මහණුවම් කෙළෙ මෙ** = මහණකම් කළ මහණ පෙමේ මැ; **වැඩිය යූ සෙසින්** = අග්‍ර යයි වදුළ පරිද්දෙන්; **විකල් වළඳසි** = විකාලයෙහි වළඳ; **පෙහෙ වූවහු වරා** = උපොසථිත වූවහුට වඩා; **නො වළඳය්** = නො වළඳ; **ඝට පෙළෙ** = හෙළා පවලයෙහි – යටි වහලෙහි; **වහල් නැති බැවින්** = (ඉති ඉති යට පෙරළෙනුවට) පිහිටක් නැති බැවින්; **රැහැනක් උඩ බැඳ** = උද්වාහිණියක් මත්තේ බැඳ – යොතක් උඩ බැඳ; ('රොහනා' යනු බ්‍රහ්මනාථවාචි හින්දිය ශබ්දයෙකි. 'රැහැන යනු ඒට සමාන ය.) **පිදිවැවේ** = පරිවර්ථනය කෙරේ–පෙරළේ; **දඬු වැවින්** = දණ්ඩදිප්‍රභාවන් ගෙන් යුක්ත වැ; **පෙහෙ ධම්** = පෞෂධ ධර්මය; **උකට කොට** = උත්ක්‍රෂ්ට කොට; **රක්නහු පිළිවත්** = රක්නහුගේ ප්‍රතිපත්තිය; **ශාසන සමය** = ශාසන සිද්ධාන්තය; **ජීවිතෙන්ද්‍රිය පියූ සිරුරු** = ජීවිතෙන්ද්‍රිය හළ ශරීරය; **වන ගද පියූ**=

වර්ණ ගඤ්ඡයන් පරිභාෂක්ත සළ; **මිලි සාසළ මෙ වැනි බැවින්**= මාලා සාවවරයක් මැ – මල් රොඩ්ඩක් මැ වැනි හෙයින්; **බුදුහු මමෙ යන** = බුදුහු මාගේ මැය යන; **ගහණ ඇතියේ සි** = ගැනුම් ඇත්තේසි; **බුදු ගෑඹුරෙන්** = බුඩ ගෞරවයෙන්; **ඇඳිලි හුවා**= දෙහොත ඔසවා; **අගිනිහරු** = අභිනිහාරය; **ඒ ජයෑ** = ඒ ජාති යෙහි; **පදිවඹ්ඡං සාඤා** = **පාථෙය්‍ය සඤ්ඡං සාඤා** = මාඝෝප කරණ යුතු සොට; **පාඝෙය්‍ය පිළි යෙල සොට යූ සේ සි** = මහ නිම සදු ලීම සොට ය යනු කි නියායි; **ඉධයෙන් නිවත්** = ඉඩියෙන් නිබබත්ත වූ; **අවඡාදන සදහා** = ඇදීම පිණිස; **විවිත් සෙනඡ් නෙගි** = විවික්ත ශයනාසනයෙහි; **ඉඤ්ඡි පුරිසාදිසම්බාධ නැති** = සත්‍රී පුරුෂාදීන්ගේ පීඩනයක් නැති; **සුඤ්ඤාගාරගි අගිරමන බ්ච** = ජන හිස් ගෙහි සිත් අලවා වසන බැව්; **ජන්න ලදී** = දන්නා ලදී; **සුඤ්ඤාගාර පිලිඝංසුතු** = සුඤ්ඤාගාර වාසය හා එසඩ යෙදුණු; **බැම් කියා** = ධාර්මික කථා;

125. 'සපයනු යෙහි' යනු '**ඝතපනුයෙහි**' සි ගන්නේ. 'ආහාරයෙන් පිනවාලීමෙහි – වැළඳවීමෙහි' යන අර්ථ සි;

අනුමෙවුනි බණ = අනුමොදනා ධර්මය; **තුස්නේ** = නොඅණය; **ඇතපි ගෙහි** = වැළඳූ ගෙයෙහි; **බණ ඇසියවින්** = බණ අසනු කැමැතියන් විසින්; **බණ කියනෙ සි** = ධර්මය දෙශනා සාළ මැනවැසි; **පා ගහණ සරනු** = පාත්‍ර ග්‍රහණ සරණය; **බුදු සැලි වළඡෙන බැවින්** = බුඩ කාලයෙහි වූ වළඤ්ජනයක් (වාරිත්‍ර යක්) වන හෙයින්; **ආගම බහුසුවන් සෙරෙහි** = ආගම බහුශ්‍රැත යන් සෙරෙන්; **සොවු සිත් නො සොට** = සොප චිත්තයක් ගනා සොට; **සොවු පියෝ** = සොප ප්‍රයොගයක් – සොපය හෙතු සොට ගෙන සසින් වවසින් සෑරෙන ප්‍රයොගයක්; **උදුළු ඇස් ඇති සවුඳවන්** = උඩුකුරු ඇස් ඇති වාතපානයන්; (උදු + තු යනු පදවඡ්ද සි. **ත** සාරයට **ළ** සාරවේ.) **උඩග්ගානි** = උඩුකුරු අග් ඇති; **අච්ඡිකි** = ඇස් ඇතියාහු; **යෙසු වාතපානෙසු** = යම් කවුළුවන්හි ද; **සානි** = එවිහු **උඩච්ඡිනි** = එ නම් වෙති; **මෙ හෙයෙන්** = අණ ලැබ සරන කුදු මහත් සාය්‍යයෙන්; **ජීවි වටන් නාහු** = දිවි පවත්වන්නෝ; **දස අකොස් වතින්** = දශවිධ ආක්‍රොශ වස්තූන්ගෙන්; ('ඔම්සවාද' සිසපද විහඩහය බලනු.) **සෙසු අසභ්‍ය කෙපුලෙන්** = ඉන් ඉතිරි ග්‍රාම්‍ය වචනයෙන්; **ඔවිහි** = ඔටුවෙහි; **ගඩබුයෙහි** = ගදුහ වෙහි; **අඩිසරණ්‍යතො** = යි සේසි; **වූප සමනියතො** = සන් හිඳුවා ලිය යුතු වන බැවින්; **අඩිසරණං** = එ නම් වේ; **තුමහට යම් සවර කිසයක්** = නමහට පැමිණි

විවාදාදි කිසියම් කාරියක්; **අධිකරණීය වන බැවින්** = සප්ත ශමථය හා සම්බන්ධ කටයුතු වන බැවින්; **අධිකරණ නම්** = එ නම් වේ; **මෙ තැන** = මේ සථානයෙහි; **අක්කොසන පරිභාසන** = ආක්‍රොශ තර්ජන (ගතයුතු); **අව** = මම්; **සැහැමිහි** = සඞ්ගාමයෙහි – යුදයෙහි; **ගුළු හි** = ගළිත වාණය – වැටුණු ඊය; (විශිඛ > සිහි > හිහි > හි > ඊ යනු වේ.); **දුනින් මුකත වැ** = දුන් නෙන් මිදී; **තුමා සිරුරැ ඉනුණු හි** = තම ශරීරයෙහි පතිත වූ හිය සි; **උපාත්ත විෂය පඤ්චමි** = 'චාපාතො' යනු 'මුච්චිතබා' යන අඛ්‍යාහාර කටයුතු පුථ් ක්‍රියාව විෂය කොට ගෙන සිඞ පඤ්චමී විභක්ති සි; **ඉක්ම පැවැති** = ලොකාචාරය ඉක්ම පැවැත්තා වූ; **අට අනරිය වොහාර විසින්** = අඛාතරිය වොහාර වශයෙන්; ('මුසාවාද' සිකපද විභඞ්ගය බලනු.) **සහනෙමි** = ඉවසන්නෙමි; **ඉනුණුතා කඞ සෙහෙද** = පතිත වූ තාක් කාණ්ඩයන්–ඊතල ඉවසාද; **ඉක්ම පැවැති තාක් තෙපුල්** = ලොකාචාරය ඉක්ම පැවැති පමණක් වචනයන්; **සමුදයාථිසි** = භාවාථිය වේ; **යස්මා බහුජ්ජනො දුස්සිලො** = යම් හෙයකින් බොහෝ ජනතෙම දුශ්ශීල වේද; **තස්මා තං අසඤ්ඤතුපෙක්ඛා** = එ හෙයින් ඒ බහුජ්ජනයාට කරුණු නො හඟවා (කිසිවක් නො කියා); **තස්ස අනිවාක්‍යමෙව**= ඔහුගේ අනාදීය වචනය පමණක්; **නිතිකඛිස්සාමි** = ඉවසන්නෙමි; **නියෙන්** = පමුණුවත්; **අරසි** = ආරොහණය කෙරෙසි; **අජිමගින්**= ආජී මාගීයෙන්; **දමා** = දමනය කොට – හික්මවා ගෙන; **කෙලෙස් පොපි** = කෙලෙශ සම්පිතයන් – කෙලෙසුන් නිසා හටගත් දැහැලිලි; **සුනුයෙක් මැ** = ඡින්න කළ ඝණාශ්‍රවයෙක් මැ; **වෙළඹ කුසැ** = වළවාවකාගේ කුසෙහි; **ගඩබුවාට ජායේ** = ගද්‍රභයාට ජාත වූයේ; **අශ්වතර නම්** = එ නම් වේ; (කොටක – බලුඔක යනු පාළියෙන් අශ්වතරයාට අභිධාන සි.) **ඔකිඔව රටෙහි ජා** = එනම් රටෙහි උපන්; **අස් දම් සැරිහු** = අශ්වදම්‍ය සාරථිහු – අස්නාඹුන් දමනය කරන රථාචාර්‍යයෝ;

126. 'යම් කාරක්' යනු **'යම් කාරණාවක්'** සි ගන්නේ. කාරණා නම් කම්කටුලු සි. **"කාරණාතු ච යාතනා"** යනු නිඝණ්ඩු සි;

දමන ලද අස්තරාදින් වරාදී = නිපොපි කළ අශ්ව තරාදීන්ට ත් වඩා; **තුමහ මෙ දමනලද** = තෙමේ ම දමනය කරන ලද; **රාන් මෙ** = අහිත් මහණ තෙමේ මැ; **විවසුන් මහ ඵල** = විදර්‍ශනා මාගී ඵලයන්; **තුමා පියොවින් වූ බැවින්** = සවකීය ප්‍රයොගයෙන් සම්භූත බැවින්; **අවුඵ** = උත්තරිභඞ්ගය;

(වේ) වුවමනා තාක් ප්‍රකෘති ආහාරයක් ගෙන ඊ මත් තෙහි බිදියයුතු රස මුසු කැවුම් උත්තරිභඞ්ග නම්. එයට 'අවුළු'යි කියන ලදී. 'මිශ්‍රිතම්' යන සංස්කෘත නාමය ව්‍යඤ්ජනාඛ්‍යයෙහි හෙළා තිබෙයි. බත හා මුසුකොට ගැනෙනුයෙන් එසේ කියත්. 'අවුළු' යනුයෙහි දු අවයවාර්ථ හේ මැයි. 'සංසෘෂ්ට > සංසට්ඨ > සසුට්ඨ > හහුට්ඨ > හවුළු > අවුළු' යනු විසින් ආ හෙයින් සම්මූඪයාර්ථ විසිත් උත්තරිභඞ්ගයෙහි වැටේ.

ගද නම් = 'ගද' යන නම් ඇතියේ; **විෂ** = සර්පාදි විෂය සි; **එයට ප්‍රතිවක් බැවින්** = ඊට ප්‍රතිපක්ෂ හෙයින්; **ඔසු** = ඖෂධය තෙම; **අහද නම්** = එ නම් වී; **ඔසු දියෙන්** = ඖෂධ පරිභාවිත ජලයෙන්; **ඇසූ විදි සේ** = පෙර අසන ලද බව; (**පොක්ඛර** > පොකුර නමුත්; **විණා දෙණී** > වෙණ දෙණී නමුත් වීණා ඔරුවයි. "පොක්ඛරං පදුමෙ දෙහෙ, වජ්ජහණ්ඩමුඛෙපිච" යනු අභිධානප්පදීපිකාගත යැ.) **මල් වටෙකින්** = මල් ගුලියකින්; **ඵෙණෙයි** = 'ඵෙසෙ' යනු; **පිදහි** = වැසිය යන අර්ථ සි; **හිස් දෙර** = හිස සමීපයෙහි – ඉදිරිපස; **සුස්මන්නේ** = සඝනය (ශ්‍රවණය) කරන්නේ – සුසුම් ලන්නේ; (සඝන > සුසුන් > සුසුම් යනු වේ. **සුස්ම** – සුසුම් ලීමෙහි යන ධාතුසි. ("අහ" **සුව** = ඛෙදයෙකැයි කීවාය; **නො හික්ඛාහු** = අශික්ෂිත වූවාහු; **හතීෘහට** = සැමියා හට; **විනයට** = ආචාරයෙහි; **නො පවතුවහු** = නො පැවැත්තාහු; **පවු හඇර ඇතියව්හු** = පාපාචාර ඇතියෝ වෙත්; **හිවඝලෝ**= පෙරළා එවා පුහ; (මෙහි නිෂ්පත්ති සොයනු මැනැවි) **ඉදුහෑ(හු) නක් බඳු** = දිලිහී ගිය එකකු මෙන්; **ශරයක්** = හියක්; **ජියෙහි** = ජ්‍යායෙහි – දුනු ලනුවෙහි; **බැඳ** = බඳ කොට; **දුනු මිට ගෙන** = දුනු මිරින් අල්වා ගෙන;--

127. 'සඬ පහා' යනු '**සඬ හා**' සී ගන්නේ.

සඬ හා = ඊය සමඟ; **මදක් නැඟුව** = මඳක් උද්ගත කළ කල්හි; **බිමින් මුත ද** = = භූමියෙන් මුක්ත වූයේද; **හම්මන දුනු** = දරා සිටින්නා වූ – තද කොට ගෙන සිටින්නා වූ දුන්න; **එඵහගැ** = එබඳ ශබ්දයෙහි; **ශන්ත්‍ර කොජා** = යතුරු සවිකොට; **කළ දුනු** = කරන ලද දුන්න සි; **වස දියෙන්** = විෂ ජලයෙන්; **බොහා ලදුවා** = පානය කරන ලද්දාවූ – විෂ දිය පෙවන ලද්දා වූ; **දුනු දිය හා** = දුනු ලනුව සමඟ; **ගළස් යූ සේසි** = ඝටනය කොට යනු කි නියාසි; **පෙරමෙහි කොට** = ඉදිරියෙහි කොට; **හව් පසින්** = සපී පාශ්වයෙන්; **සමනන කො** = හාත්පසින්; **මුස්හාමි**=

මූළාවෙමි යනු 'සම්මුය්හාමි' යනු වේ; **හමුයෙහි** = ප්‍රමුඛයෙහි; **පමුඛෙ මුය්හාමි** = ප්‍රමුඛයෙහි මූළා වෙමි යනු 'පමුය්හාමි' යනු වේ; **නව් දෙසෙ** = සකල දිශාව; **නො වටහයි** = උපථ්‍යානය නොවෙයි – වැටහී නොයෙයි;

128. 'භිය නහනුව' යනු අඩොලිවිහි එන සේ 'නහනුව'යි ගන්නේ. 'නසන්නේය' යන අර්ථ යි.

තුමා වරජ = තමාගේ විරොධය – අපරාධය – වරද; **ඇති සිතින්** = යථා චිත්තයෙන්–සත්‍ය චිත්තයෙන්–හැබෑ සිතින්; **ඉස්නාක්** = කැමැති දෑයක්; **මනන** – ඤානභාසනෙ = මනන ධාතු රහස් බිණීමෙහි වැටේ; **පස්මන් උතුරු සළි ඔයෙන්** = පන් සියයක් පමණ උතුරු සළුවෙන්; **එකං වත්තං යසසා** = එක් වතක් ඇතියේ යමකුගේ ද; **සා එකවත්ථා** = ඕ එකවස්ත්‍රා නම් වා; **මස් පුටුවෙහි** = මසුවයෙහි හා පියයෙහි; **අතුරුණු** = ඇතිරිළි; **පසතරණ නම්** = පව්වත්ථරණ නම් වේ; **බුම් ඔවි රක්නාට** = භූමිවස්ත්‍රු රක්ෂණය පිණිස; **අතුරණු** = ආසාරණය කරනු ලබනුයේ; **බුම තරණ නම්** = භූමත්ථරණ නම් වේ; **දහස් බැවින්**= සහස්‍ර භාගයෙන් – දහස් කොටසින්; **සුවහසක් යැල්** = ලක්ෂ වාරයක්; **පසිළි අඟ** = පාංශුකූලිකාඞ්ගය; **ඉව් හොත් සි** = ඉටා හුන් බව යයි; **දන්නේ** = දතයුතු ය; **පාසාද ශ්‍රේද දසන** = පහා සිදුරු දැකීම ය; **කුක්කුට පෙසන** = කුකුළන් පෙරළා එවීම ය; **සප්ප මොවන** = සප්හු මුදු හැරීම ය යන මෙතෙක් දැය; **සඳහා** = පිණිස; **සෙළෙසි ගුණට** = සෙළෙහි ගුණයට; **සිළි පියහට** = චූළ ජනකයා හට; **පිළි කොටාර** = පට කොඩියාගාරය; **බුසි නොවී හැකි සෙයි** = වාහ්‍ය නෝ විය හැකි පරිද්දෙන්; **තෙල් පිළින්** = තෙල් පෙවූ වස්ත්‍රයෙන්; **වැසූ තා ටඹහි** = වැසූ තාක් වැම්හි; **ගිනි අවුළුවමින්** = අග්නි ජ්වාලනය කෙරෙමින් ('අ ඌ ලනා' යන ප්‍රාකෘතානුගත භිඳි වචනය හා සසඳ බලනු. අවුලු–දැල්වීමෙහි යන ධාතු යි.) **තුමා හම්යෙහි වූ** = තමාගේ සම්මුඛයෙහි වූ; **සොහණක්නට** = සොහකුන් හට; **ඔවා දුන් තන් ගෙනෑ** = අවවාද දුන් බව ගැන; **හැම දෙන හට ඔවා දුන යන්**= සැම දෙනහට අවවාද දුන්නී යයි කියනොත්; **වරද වෙයි** = විරොධ වෙයි; **නො පිරිසුන් වූ** = අපරිවිජිත්ත වූ – කොටස් නො කරන ලද; **සෙල ඇතිශයහි** = අග්‍රය ඇත්හා වූ; **අනු අනු** = නැවත නැවත; **'අමත්තං'** = යි සේ යි; **අපරිවජිත්තනං** = නො පිරි සිදින ලද; **අඟඟං යම්ප** = අග ඇතියේ යම් තැනෙක්හි ද;–

129. "සසර නියරෙ සයන් ගිනින් දම් අත් බැවුජ් කියත්" යි පොත්හි තිබෙයි. "සසර නියර සවන් සඳුණින් තො දත් බැවින්" යි ශුද්ධ පත්‍රයෙහි තිබෙයි. මැනැමැයැ. එහෙත් "අම්හාකං අනමතග්ගෙ සංසාරෙ විවරන්තීනං එවමෙවං අග්ගිනා ඛාමන්තනාවාතං" යි අටුවාහි ආ සැටි විතාරත් මෙ "සසර නිරයෙ ගිනින් දම් අත් බැවුජ් කියත්" යි ගතයුතු සේ පෙනේ. 'සංසාර යෙහි නිරයාග්නියෙන් දග්ධ ආත්මභාවයන් ද කියත්' යන අර්ථ යි. මෙහි "සසර නිරයෙ ගිනින් දම් අත් බැව්" යනු "සංසාර අග්ගිනා ඛාමන්තනාවානං" යනු හා නො සැසඳේද?

වෙසින් සිදිගා සම් ඵන් = වෙදනා පරිඤ්ඤ කම්ම ඨානය – වෙදනා ලක්ඛණ පිරික්සෙන කම්ටහන; (හෙමේ කියත්:–) තුමනට උපජන දුක් වෙසින් = තමා හට උපදනා දුක්ඛ වෙදනාව අනින් දුක් අනන් විසින් = අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන්; සිමිජින = සම්මසනය කරන – සිතින් විමසා බලන; (සිමිජ– සිමිදිමෙහි යන ධාතු යි)

(වෙ) සිමිදිම නම් නකීඝත–විතකීඝත කොට බැලීම යි; මේ අර්ථය ගෙන 'සම්මද්ද' යනුයෙන් 'සිමිජ' යි බිඳ ගත් බව හැඟේ. නොහොත් 'කෙල්සිනි' යනු 'කෙල්ජිනි කෙල් (ල) දිනි' යි සැලකිය යුතු බවට පැමිණ තිබේ. 'අවුජ්ඛඩ්ඩ' යනු 'අවුස් ඛඩ්ඩ' යි සැලකිය යුතු තැනට පැමිණ තිබේ. මෙයින් සකාර ජකාර යන්ගේ හුවමාරුවෙක් පැනෙයි. එහෙයින් මෙහිදු 'සම්මස > සිමිස > සිමිජ' යි විය යි සලකන්ත් ශබ්දනයානුගත මැ යි.

ගි කවර = ගති නොමෝ කවරිද; පස්ගිසින් = දෙව–මනුස්ස – තිරච්ඡාන – නිරය – පෙතතිවිසය යන පඤ්චගතීන් අතු රෙන්; කවරගිහි = කතර ගතියෙක්හි; උපන්න = උපන්නා හුද; පරලෙව් = පරලොකයෙහි; කවර තරම් = කතර තත්ත්ව යක් ඇති; ('තරම්' යනු 'තිරම්' යන ද්‍රවිඩ වචනය හා සසඳ බලනු) පිරිගා = (පොත්හි 'පිරිය' –තවද විමසනු) පරිග්‍රහයකට– අයතියකව; වන්න = පැමිණියෝද; ලොවුතුරා ඵල = ලොකොත්තර විපාක; නො නැතියෝ = නැතියෝ නො වෙත්; මොහබාන් ඇතිය = මොහ බැඳුන ඇත්තා වූ; නොහොත් = එ සේ නො වේ නම්; මොහ සඛඳ = මොහය හා සම්බන්ධ වූ; භව්‍ය බඳු වැ = නිස්සකු වැනි වැ;

130. "කතීඝව හො කතීඝව ඇයට නුසි බඳුව" යනු කතීඝව හො කම්මව ඇයට නුසි බඳුව' යි ගන්නේ.

කත්තබ්බ හෝ = ('**රාජා ගච්ඡති**' යනාදියෙහි මෙන්) කර්තෘ භාවයට හෝ; **කම්මත්ථ ඇතට** = ('**පඤ්ච රාජානං**' යනාදියෙහි මෙන්) කර්ම භාවාදියකට; **නුසි බඳුව** = සුදුස්සකු වැනි වැ; **වටමහසි** = උපමිත වෙයි; **කෙලෙස් උපමින්** = ක්ලේශ සංඛ්‍යාත උපධියෙන්; **ඝණසම වැ** = වඳු සූර්‍යාදි සහස්වත වස්තුවක් සමාන වැ; **එසෙසින් මෙ** = එ පරිද්දෙන් මැ; **කඨවුරු බඳු වැ** = සපිර වස්තුවක් වැනි වැ; **වටහසි සේ සි** = උපමිත වෙයි යනු කීයා සි; **ඝන භිදැ බල නුවහට** = ඝන මිනිහොගය කොට බලන්නා හුට; (මෙහි 'ඝන' නම් එක් ගොඩක් සේ පෙනී යන මහා භූත පිණ්ඩය සි. භිදැ බැලීම නම් සතර ධාතුවෙන් වෙන් කොට බැලීම සි– චතු. ධාතු ව්‍යවස්ථානය සි.) **ද්‍රව්‍ය බඳුයෙක්** = පෘථිවි ජලාදි වස්තු වැනිවූවෙක්; **සඝන සෙමෙක්** = සහස්වත සමයෙක්; **සැඟ වටනුයෙහි** = සඞ්ඛ්‍යාවට්ඨානයෙහි – සැඟය පැවැත්මට මුල් වැ සිටි කරුණෙහි යූ සේ සි; **අසක් බහිලියෙම්** = ආශඞ්කා බහුල කොට ඇති මම; **ආදිමතා සඞ්කිතං** = ආදියෙහි සැඟ කරන ලද්දේ; **ආඝඞ්කිතං** = එනම් වේ; **පරිතෝ සඞ්කිතං** = හාත් පසින් සැඟ කරන ලද්දේ; **පරිඝඞ්කිතං** = එනම් වේ; ('ඇහිලි' නම් රොටී ආදිය බදනා භාබල සි. 'අයොථාලකං' යනු 'ඇහිලි' ම් යැ සි හඟිමු.) **පසා** = පවත්‍නය කරවා; ('හජ්ජාපෙක්ඛා' යන මූලපදයට 'පසා' යනු අර්ථ කි සැටිය. අර්ථ පදයට මුල් වූ ධාතුව '**පව**–පාකෙ' යනුය. මුල් පදය වණ්ණනා කරනු මිස අර්ථපදයෙහි ධාතු දැක්වීම අසඞ්ගත යැ. 'හජ්ජ – පාකෙ' සී ගත මැනව.) '**එසු**' **යන්** = එසු සී කියතොත්; '**අසු**' **යන්** = 'අසු' සී කියතොත්; **විසි වෙතු කාමා** = **සිතං අපනෙතු කාමා** = සිත පහකරනු කැමැතියෝ; **දරරැසක් ජලවසි** = දර රැසක් ගිනි දල්වා; **දවම්හ යන**= දවමු සි කියන; **තැන් නැතියා වැ** = උත්සාහ රහිත වැ; **එ මෙ කම්හු** = ඒ කර්මයාගේ මැ; **විපාසෙස්නෙන** = ශෙෂව සිටි විපාකයෙන් ය; **අවසිටි** = ශෙෂ වූ; **පවත් විපානෙනි යූ සේ සි** = ප්‍රවෘත්ති විපාකයෙන් යැ යනු කී නියාසි; **මෙහෙකැරි** = පෙසන කාරිකාවක්; **සුළාක් කුදු සැහැවි** = මඳක් කුදු සවභාව ඇත්තියකා; **රජවනන** = රාජයා හට උපස්ථාන කරන; **මාගම්** = මාතුගාම යෙකි; **ආසන පඤ්ඤපන** = අසුන් පැණවීම ය; **විජනාදි විසින්**= පවන් සැලීමය යනාදි වශයෙන්; **වෑමනියක්** = උපස්ථාන කරන්නියක්; **රන්මලාවක්** = සුවර්ණ ශරාවයක් – රන් තැටියක්; **ඒ කම්හු විවෙසින්** = ඒ කර්මයාගේ විපාකවශයන්; **අටමත් දළ වලසින්**= අටක් පමණ ඇත් දළින් කළ වළයයන්; **තවුකැලි නො තවු කැලි බවු ජැනියවි අභිප්‍රායයෙන්** = තාවකාලික අතාවකාලික භාවය දැනගනු කැමැති අදහසින්; **හිමවුයෙහි** = හිමවත්හි; **නඳ**

මූලඛ නම් පවු බෙයදට = නන්ද මූලඛ නම් පණිත නිතම්බයට;—

(වෝ) "නිතම්බසන්නිභං, බෙයදන් බඳු" යනු මහාබොධි වංස ගැටපද සි. පණිත පාඨීවය 'නිතම්බ' සිද 'කටඩ' සිද කියනු ලැබේ. 'පණිත හෙද්‍ය' යන අර්ථයෙහි 'පවුබෙයද' සි ඒ යයි ඇති සලකමු.

නො නට්ඩුහු මෙ = අවිනෂ්ට වූවාහු මැ සි; **ඒ දලවලා දුන් කම්හු** = දළමුවා වළලු දුන් ඒ කම්යාගේ; **පැන පුවහමා සොටැ** = ප්‍රඥ පූර්ඛගම වැ කළාවූ; **කල කම්හු පෙලෙන්** = කල කම්යාගේ ඵලයෙන්; **මහා පැන වූ** = මහත් නුවණැත්තියක් වූවාය; **පාදිචඩියානුත්තරිය වන බැවින්** = ෂඩනුත්තර්ය ධර්මයන් අනුරෙන් 'පාරිවරියානුත්තරිය' නම් වන හෙයින්; **වඩන සේ යෙහි** = වඩමන් සේයෙහි; **සවස්හි** = සායං දිවසයෙහි; **ඝංසඟහ වාසනා** = කුලයා සෝරේ ඇලී විසීමෙහි පුරුද්ද; **ඉනා පුහුන් බැවින්** = අප්පහීන භාවයෙන්; **පහසින් පෙළි** = පසාධන පෙළි කාව – අබරණ පෙට්ටිය; **සකියන තෙලැ** = ප්‍රක්වපිත තෙල යෙහි; **අපපමාද ලඤඣණ** = අප්‍රමාදයෙහි සවභාවය; **අපපමා දපපච්චය** = අප්‍රමාද ගුණය උත්පත්ති හෙතුය; **අපපමාද පවි පදැ** = අප්‍රමාද පිළිවෙතය; **අපපමාද ඵල** = අප්‍රමාදයෙහි ප්‍රයෝජනය; **අපපමාද පවිපඤඣාදි** = අප්‍රමාදයට විරුඬ දූය යනාදිය; **සඳූසන විසින්** = දූක්වීම් වශයෙන්; **අපපමාද පදයට මෙ** = 'අප්පමාද' යන පදයට මැ; **එරෙසි** = ඔතරණය වෙයි–බැසගනී; **ජඬඝමානං පාණීනං** = **පාදතලචාරීනං සත්තානං** = පා තෙලින් ඇවිදින සත්ත්වයන්ගේ; **සමොධාන වෙන්** = ඇතුළත් වෙත්; **අනෙනාගධහාව** = අනාගතභාවය සි; **සඨමපඨහි** = 'සඨං' ශබ්දයාගේ අර්ථයෙහි; **ඇගියැ යනු** = අග්‍රවෙයි යනු; **කිසෙසින් වෙයි යූ සේ සි** = සාවර පරිද්දෙකින් වෙයි ද යනු කී නියාසි; **මහනතනෙනන** = **මහනතභාවෙන** = මහත් බැවින්; **සම් වැජ්ජිය** = කාමාවචර වූ; **යම් සවර කුසල් ධම්හ** = යම් කවර නමුත් කුශල ධර්මයෝය; **සමාධි පැන්** = සමාධිය හා ප්‍රඥව; **හැවුව වවිසි ඝන ඇ** = භාවනය කරනට සුදුසුය යනාදී වූ; **උපදෙස් පිළි පජ්නවුන්** = උපදෙශයට – හිත කථනයට පිළිපදිනවුන් විසින්; **පිළිවෙන් පිළිපනුවන්** = ප්‍රතිපත් ප්‍රතිපන්නයන් විසින්; **විඳුනා සුව සිසරන විසින්** = විඳිනු ලබන සුඛය සිහිකිරීම් වශයෙන්; **හෙතු ඵලාදි රූපයෙන්** = හෙතු ඵල ආදි සවභාවයෙන්; **අපමාහි මෙ** = අප්පමාදයෙහි මැ; **එසෙරෙනුවෝ** = ඔසරණය වන්නාහ ඔවුන් = ඒ කුශල ධර්මයන්; **අපමා අධිසොව ඇති බැවින්** =

අප්‍රමාදය ප්‍රධාන කොට ඇති හෙයින්; **කරණීයාකරණීය සික්ඛා කරන** = කටයුතු නො කටයුතු සිහිකරන; **සියා** = සතිය යි; **නො විගෝවු බැව්** = අවියෝගී භාවය; **මොට සියැයි** = මුළු සච්චය – මුළා සිතිය යි; **බැවැහැර පත්** = ව්‍යවහාරයට පැමිණි;—

131. 'මුඵ සච්ච' නම් සී පිළිවක් වැ උපන් සතරඟන්' යනු **'මුඵ සච්ච නම් සී පිළිවක් වැ උපන් සතර කරුණ'**යි ගන්නේ. 'මුඵ සච්ච නම් සිහියට ප්‍රතිපක්ෂ වැ උපන් සතර කාරණය යන අර්ථ යි.

සී විකිඤ්ඡන = සිහිය දුරලීමට; **වොස්සජ්ජති එතෙනාති**= මේ කරණ කොට ගෙන දුරලානුයි; **වොස්සග්ගෙහා** = එ නම් වේ; **වොස්සජ්ජනං** = දුරුලීම; **වොස්සග්ගෙහා** = එ නම් වේ.

132. 'දෙසෙනිජ් සී පිළිවක් සන් මේ' යනු **දෙසෙනිජ් සී පිළිවක් සතර කරුණ මේ**' යි හන්නේ. 'දෙයාකාරයෙන් මැ සිහියට ප්‍රතිපක්ෂ වූ සතර කාරණය ම ගැනේ' යනු අර්ථ යි.

(ජ) මෙහි එන සී පිළිවක් සතර කරුණ මෙසේ යැ;—

"චතූහි භික්ඛවෙ ඨානෙහි අප්පමාදෙ කරණීයො. කත මෙහි චතූහි, කාය දුච්චරිතං භික්ඛවෙ පජහථ කායසුචරිතං භාවෙථ තත්‍ථ ච මා පමාදත්‍ථ, වචී දුච්චරිතං භික්ඛවෙ පජහථ වචී සුචරිතං භාවෙථ තත්‍ථ ච මා පමාදත්‍ථ, මනො දුච්චරිතං භික්ඛවෙ පජහථ මනො සුචරිතං භාවෙථ තත්‍ථ ච මා පමාදත්‍ථ, මිච්ඡාදිට්ඨිං භික්ඛවෙ පජහථ සම්මාදිට්ඨිං භාවෙථ තත්‍ථ ච මා පමාදත්‍ථ." (අඞ්ගුත්තර – චතුක්ක – කොසියවග්ග.)

මෙයින් වදළ කායදුච්චරිත–වචී දුච්චරිත – මනො දුච්චරිත–මිච්ඡාදිට්ඨි යන සතර සී පිළිවක් සතර කරුණ ය යි ගන්නේ.

සී මුළැසි = සිහි මුළාව ගිය තැනැත්තේ; **ජැසි උක්මෙනු වට** = ජාතිය ඉක්මවාලීම පිණිස; **නිසි පිළිවුවා මේ** = යොග්‍ය ප්‍රතිපදාව මැ; **නො සී කරන බැවින්** = සමෘති විෂයෂ නො කරන බැවින්; **ජැසි නො ඉක්මේ** = ජාතිය නොසික්මවයි; **සසර පිරිසිඳුනා කම්** = සංසාරය පරිච්ඡින්න කරන – සීමාසහිත කරන කමීයන්;

133. 'සසර එක්තෂ හෙයින්' යනු **'සසර එතනඨ හෙයින්'** යි ගන්නේ. **සසර** = සංසාරය; **එතනඨ හෙයින්** = ඉයත්තා පරිවෙජද වශයෙන් – මෙ සම්‍මණ ඇත්තේය යන වශයෙන්;

134. 'පර නැති සි' යනු **'පිරිසේ නැතිසි'** සී ගන්නේ. **පිරිසේ නැති සි** = පරිවෙජද රහිත හෙයින්;—

නො පිරිසුනු = අපරිච්ඡින්න වූ; **අපපමාදමෙව** = අප්‍රමාදය මැ; **ලකඛියති** = පහළ වේ යයි; **ගතජ්** = ගතහොත්; **අපපමාද** = අප්‍රමාදය මැ; **ලකඛණ නම්** = ලක්ෂණය නම් වේ; **'ලකඛියති එතෙනාති' ගතජ්** = මේ කරණ කොට ගෙන පහළ වේ, හැඳින් වේ සි ගතහොත්; **නො පමා පුතුලා සහා වන බැවින්** = අප්‍රමත්ත පුද්ගලයා සඬ්ගහ වන බැවින්; **අපපමාද ලකඛණ මෙ නම්** = අප්‍රමාද ලක්ෂණය මැ නම් වේ; **උපදිසෙස් මරණයෙහි පමස්** = උපාදිශෙෂ මරණයෙහි පටන්; **ලොවුතුරා මහහි පහරවා** = ලොකොත්තර මාර්ගයෙහි හපා – දක්වා; **තුමා සතනැ උපඅන විසින්** = ආත්මීය සන්තානයෙහි උත්පාදනය කිරීම් වශයෙන්; **පඤක් ඛොට** = ප්‍රත්‍යක්ෂ ඛොට;

135. 'නො උපජනම ලබහුජ් පුනා ලක් නො මියෙත්' සි පොත්හි තිබෙයි. මෙහි ආ ලෙස 'අනුප්පාද' යන නාමය ලබන්නාහු මැ නැවත කලෙක නො මියෙත්' යන අර්ථය ගතයුතු සේ පෙනේ. හේ බළත් පුනරුක්තාදී දූෂිත යැ. 'තස්මා තෙ ජීවන්තාපි මතාපි නමියන්නි යෙව නාම" යනාදී අටුවා නය බලතකල **'නො උපජන ම නො ලබහුජ් පුනා ලක් නො මියෙත්'** සී ශුද්ධ කටයුතු සේ හැඟේ. **නො උපජන ම නො ලබහුජ්** = අනුප්පාද නාමය නො ලබන්නාහු මැ; **පුනා ලක්** = (පුන + කලක්) පසු කාල යෙහි; **නො මියෙත්** = අමරයෝ වෙති;—

136. "පමාද මෙ අවොයුනුව වැටෙන" ය්නු **'පමාද මෙ අපිරිසුනු වැ වැටෙන'** සී ගන්නේ. **පමාද මෙ** = ප්‍රමාදය මැ; **අපිරිසුනු වැ** = අපරිච්ඡින්නා වැ; **වැටෙන මරණ** = පවත්නා මරණාට; **උව බැවින්** = උපාය බැවින්; **පමාද මරණ නම්** = ප්‍රමාද මරණය නම් වේ; **මරණ වන සේ** = මරණය වන පරිදි;—

137. 'පමත්තයනට 'දුරුකඛඤදිසා' නාදී ධම් නැත්තෝ' යනු **'පමත්තයනට දුරුකඛඤ සදිසතාදි ධම් නැත් නො'** සී ගන්නේ.

පමත්තයනට = පමාවූවන් හට; **දුරුකඛඤ සදිසතාදි ධම්** = දර රැසක් හා සමාන බවය යනාදි සඥාවය; **නැත් නො** = නැත්තේ නො වේ දැයි; **ඉතුවනට** = කියනවුනට; (මෙහිදු උක්ත වක්ෂ්‍යමාණ අන් තන්හි දු **'නො'** යනු ප්‍රශ්නාර්ථයෙහි නිපාත සි.

'නා – නො' ශබ්දයන් විතර්කී ප්‍රශ්නකාරණ යන අර්ථයන්හි වැටෙන බව **'රූවන්මල'** කියයි. 'එ මත්න – නැත් නො' යි හ්‍රස්ව ව ද යෙදේ.

138. 'බොහෝතුජ්' යනු **'බොහෝ හොතුජ්'** යි ගන්නේ.

කිඹි ඕත් පවත් = ඇතැම් විතත ප්‍රවෘත්ති කෙනකුන්; **බොහෝ හොතුජ්** = බොහෝ වුවත්; **මේ තොරතුරු** = මේ විශෙෂ විභාගය – තීරණාන්තරය;—

139. "අප්පමාදම්හි පණ්ඩිතා හජෙථ" යනු හෙළටුවා පාඨයෙකැයි කියනලදී. මෙය පාළි පාඨයක් ලෙස පෙනී ගියත් දූෂිත වැ ගිය හෙළ පාඨයෙකැයි හඟිමු. මෙහි හජෙථ' යනු වඩාත් දූෂිත සථානය යි. මෙහි ගුඩිය **'අපපමාදම්හි පණ්ඩිත ජෙනහ'** කියා හෝ 'අප්පමාහි පණ්ඩිතෙ ජනෙ' කියා හෝ විය යුතුයැයි හැඟේ. තවත් විමසනු. 'නො පමා බැවුහි දක්ෂවූ ජනයෝ 'හෝ නොපමා බැවුහි දක්ෂ වූ ජන තෙමේ' හෝ යන අර්ථ යි.

අපපමාදම්හි පණ්ඩිතා = අප්‍රමාදයෙහි දක්ෂ වූ; **අපමා බැව්හි** = අප්‍රමාද භාවයෙහි; **සේ වූ** = ඡේක වූ – දක්ෂ වූ; **ජෙනෙ යූ ඉස් යි** = ජන තෙමේ යනු කිනියා යි; **ඒ අරුත් නො නහස් යෙනු** = ඒ අර්ථය නො නසා කිම පිණිස; (මෙහි 'යෙනු' යනු **'යෙනුව'** යි වත්හොත් මැනවි. මේ පාඨය නැත ද අර්ථයට හානියෙක් නැති) **අනතරයෙන්** = මැදින්–සමීපයෙන් යි සේසි;—

(ජා) මෙහි ආසය මෙසේ යි. 'අප්පමාදම්හි පණ්ඩිතා – යෙ පණ්ඩිතා මෙධාවිනො සප්පඤඤු' යනු පෙළ හා අට්ඨවා යි. 'අප්පමාදම්හි පණ්ඩිතා මෙධාවිනො යෙ සප්පඤඤු තෙ පණ්ඩිතා අප්පමාදම්හි එතං විසෙසතො ඤත්වා' යි සම්පමයෙහි කී 'අප්පමා දම්හි' යනු මෙතැනටත් ගෙන 'අප්පමාදම්හි පණ්ඩිතා, පණ්ඩිතා අප්පමාදම්හි එතං විසෙසතො ඤත්වා' යි යොදා ගත යුතු බව යි. අප්‍රමාදයෙහි දක්ෂ වූ පණ්ඩිතයෝ ප්‍රමත්තයා හට සසරින් නිසරු ණෙක් ඇත්තේ නො වෙයි, අප්‍රමත්තයා හට ඇත' යන මේ විශෙෂය දැන' යි අරුත ගත යුතු.

හඹයි = සාම්ප්‍රතයි – පමණි; **පඨවි කිසුණු ආ අරමුණු** = පඨවි කසිණාදි ආරම්මණය; **නැරඹීම** = බැලීම යි. **සඛර ලකුණු** = සංඛාර ලක්ෂණයන්; **හිනික්මන්හි වළඳ** = අභිනිෂ්ක්‍රමණයෙහි පවන්; ('පඨාය > පටය් > වටය් > වළය්' යනු වේ.) **සසුන ජනවූ**

තන්හි පටන් = ශාසනය ඉපැද වූ තන්හි පටන්; **සතතං පවත්තත විදියං** = නිළුතුරු පැවැති වැර; **සතතං** = එ නම් වේ; **තෂ්ඨ නියුතතා** = එහි නියුතුවෝ; **සාතතිකා** = එනම් වෙන්; **රුකුළු මාත්‍රා වැර** = පටන් ගත් පමණ වීර්‍ය යි; **කම් සාධන වැර** = කමියන් සිදු කොට ලන වීර්‍ය යි; **කම් සාධා** = කම් සාධනය කොට; **මතු පෑ** = මසනකප්‍රාප්ත කළ; **වැර** = වීර්‍ය යි; **කරුවා කැමැත්ත** = කතෘහුගේ අභිලාශය; **කම්හි යොජන** = කමියෙහි යොජනය කරනු ලබන; **පිළිවතුන් සහන වැර** = ප්‍රතිපක්‍ෂයන් මැඩ ලන වීර්‍ය යි; **නවත්ත යූ සේ යි** = නවතා තැබීම යනු කි නියායි; **නො ඔසැකැ** = ඔසකකනය නො කොට-නො පසු බැස; **දළෙහන** = **ථිරෙන** = සථිරවූ; **ගලත් ද** = ගිල් වත් ද; **බෙම වූ** = නිහීය වූ; **'යොගෙ සොහෙව දුනකි උපද්දව හිදම්-යොගෙ** = සිවු යොගයෙහි; **සොහෙවදුනකි** = ශයා පනය - ඔසිදුපනය - කැළඹීම හෙතු කොට ගෙන වන; **උපද්දව**= උපද්‍රවයන්; **හිදම්** = ඡිඳනය කොට ලීම යි; **සෙම් වූ ඝන්** = සෙම වූ යි කියුවත්; **හඬයි** = ප්‍රමාණ වෙයි;--

15. සාමවතියා වත්.

නැඟි කෙස් මස් ඇති කල්හි = වැඩී ගිය කෙසමසු ඇති කාල යෙහි; **පරුල්හානි** = වැඩිගිය; **කෙසමසූනි** = කෙස් හා රැවුළු; **යස්මිං කාලෙ** = යම් කලෙක්හි ද;

140. "බැළ පුවන්" යනු "**බැළ පුමන්**" යි ගන්නේ.

බැළ පුමන් වසන = හතක පුරුෂයන් වාසය කරන; **වෙයට** = වීථියට; **නිදනුවන්** = නිද්‍රොපගතයන්; **පොබයන**= ප්‍රබොධනය කරන්නාවූ ද; **සොයන** = අසුවල් අසුවල් කමට අසුවල්හු අසුවල්හු යෙත්ව යි චොදනය - මෙහෙයීම කරන්නාවූ ද; **කම්** = කාමය යි;

141. 'පුබුදු වන කම්හි නො ජෙයි කුමට හිදුවයි සොයන කම්හි' යනු '**පුබුදුවන් කම්හි නො ෂෙජේය් කුමට හිදුවයි සොයන කම්**' යි ගන්නේ.

පුබුදුවන් = ප්‍රබුඛයන් - අවදිවූවන්; **කම්හි නො ෂෙජේය්**= කාමියන්හි නො යෙදී; **කුමට හිදුවයි** = කුමක් පිණිස හිඳිනහු දැයි; **සොයන කම්** = චොදනය කරන කාමය යි; **නයබඳු පිළිවෙළ** = න්‍යාය බඳු - නීතියට අනුගත ක්‍රමය; **කරවයි සේයි** =

(තොපි) කරවු යනු කී නියාසි; **වාසසාදින්** = කපුටු ආදීන්ගේ; **'හඬජනි සුව'** = හඬ දන්නේ යයි කිවහුය; **ගැල්** = ශකටයන්හි; **ගොන් යොජව යන හඬ** = වෘෂභයන් යොදවී යන ශබ්දය; **නැඟුව** = උද්ගත කළහු; (මේ 'හඬ' යනුවට පර විශෙෂණ සි.) **අසයි** = අසා; **මහ ධනවතක්හු හඬයන** = මහා ධනවන්තයක් හුගේ ශබ්දය යන්න; **කිමසින් ජැනිය යත්** = කවර ප්‍රකාර යෙකින් දැනගත්තේදැයි කිවහොත්; **නිරුන් පිළි සැඹියා ලද් දන්** = නිරුක්ති ප්‍රතිසංවිද් ලදුවන් විසින්; **නිරුන්හි මෙ** = ව්‍යවහාර විෂයෙහි මැ; **ප්‍රභෙද ජන්න සෙසින්** = වෙනස්කම් දන්න සෙයින්; **හව්රුවු ජන්නක් හට** = සකල රාවයන් දන්නකු හට; **ප්‍රභෙදතා** = ඇතිතාක් ප්‍රභෙදයන්; **ජැනෙයි** = ජානනය වෙයි; **ඒ කරුණෙන්** = ඒ කාරණයෙන්; **දත යනු** = දන්නේ යයි කියන්නේ ය; **නිබැඳ** = නිබන්ධනය කොට; **තුමා ලවා** = තමා යොදවා; **නො පිසැවා නො නවත්නා සෙසින්** = නොපිසවා නොනවතින පරිද්දෙන්; **පෙළයි යූ සේයි** = පීඩා කොට යනු කී නියාසි; **හැදවිරොදු** = ඇඳ වියාපු රැහැන්- වරපට; **උදස්** = උප්ඣායනය කොට – ලාමක සේ බලා; **සසඟ** = ඇලීම; **හුස්** = නැන්දැ; **ඉණෙ නම්** = ණය වනාහි; **අලෙ** = කොළ; **අවිනිත යෙනි** = නොහික්මුණු තැනැත්තෙනි; **ඉපිලෙන ආරක්** = ඉපිල පවත්නා ආකාරයක්; **අවයන මන් මතුවක්** = මම යන මාන මාත්‍රාවක්; **ධන පිරිහුනු කල්හි** = ධන පරිහාණියට පැමිණිකලී; **නිසිද් හඬ** = සිදුරක් නැත්තා හට; **සැහැවුන්නට** = (සැහැවුනු + අට) සංඝනයා හට – සංයමනයෙන් යුක්තයා හට; (සංයමන නම් ඉන්ද්‍රිය නිග්‍රහය සි); **තල කුළු ඇසින්** = තුලා කුටාදියෙන්; **තල දඬු** = තරාදි දඬුව; **යසුනු එවැ** = යහුනු දමා; **මානකුට** = මිනීමෙන් වංචා කිරීමය – කුළු මනනු; **සංසකුට** = කුළු මිල; **කුලන් හසුන්** = කුලයන්ගේ පණිවුඩයන්; **ඉනි ඉනියට** = ඔබ්නොබට; **නියනු** = නියනය කිරීම;--

16. කුම්භසොසකයා වත්.

ධන නිසස් = ධනය නිසා; **සිවුතන් ලදුවෝ** = සිටු තන්තුර ලද්දෝ; **අන්සර** = අතින් මැ ගෙන යා යුතු සාර ධනය; **පළමු වල් දෙසින්** = පළමු කොට විවටචාරයෙන් – හළ දෙරින්; (විවටමුඛ > විවළ මුව > විළමුව යනු වේ.) **ගබවුටුවන්** = ගබ්හවුඩානය; **ගොරෙන්** = ගබ්බරින්; **මිස්ම යූ සේයි** = මුසාවනය විම යනු කී නියාසි; **ගෙ වළජ** = ගෘහොපකරණයන්; **සඟවය්** = සඞ්ඛාපනය කොට;--

142. 'සිළි' යනු 'සිළිවි' යි ගන්නේ. 'චූළපිතා' යන අර්ථ යි.

මැහැවි = මහාපිය තෙම; **මුත්තා** = මුත්තා; **මුත්තූ** = මුතුතනී තොමෝ; **තැස පසු කම් ඵන්** = තව පසුවන කම්මඵානය **පබුජ්වයි** = පැවිදි කරවා; **රැසික්මෙ** = උදැසන්හි; ('රැසිම්ම' යනු යෙහි මූල පාඨය මෙහි පැනේ.) **සුරගිගඬිවූයේ** = මනා ගඳ ඇතියේ;--

143. 'යම් සෙයින් නො කඩවූ ගඳ ඇතියේ වනුජ්' යනු **'යම් සෙයින් නො කඩවූ ගඳ ඇතියේ වනුජ්'** යි ගන්නේ. 'යම් හෙයකින් නො පහවූ ගඳ ඇතියේ වන්නේද' යනු අර්ථ යි.

රස්සදඬෙන් = රශ්මි කදම්බයෙන්; **වොරජනහු** = විරාජනය වන්නාවූ – බබළන්නාවූ; **ගඳ සහ පියුමක් සෙයින්** = සුගඬි සහිත පද්මයක් මෙන්; **අනන් අපිරිසේ ගුණ ගඳින්**= අනන්තාපරිච්ඡින්න ගුණ ගඬියෙන්; **දිලියෙනුවූ** = බබළන්නා වූ; **එහු** = ඒ අඬ්හිරසයා; **දකු** = බලන්න; **බුදුනුසි කම්ඵන්** = බුඩානුස්සති කම්මඵානය; **සහ උපමාන කොට** = උපමා සහිත කොට; **බුදුන් පෑහ** = බුදුන් ප්‍රකාශ කළහ; **ගුණෙන් අවටවා**= ගුණයෙන් ආවර්ථනය කොට – අවුළුවා – පෙරළා; **බුදුන් දැකිය සුතු සේ** = බුඩයන් දකිනුවට සුදුසු බව; **දද මහණක්හු** = ඥන මාන්ද්‍යයෙන් යුතු ශ්‍රමණයක්හු; **උදෙස් ගහණයෙහි** = පෙළ ඉගෙන ගැනීමෙහි; **නො සල්හුවක්හු සූ සේ සි** = අශිඤ්ඤ වූවකු යනු කී නියාය. (මේ බළත් 'දඩි – මන්දියෙ' යන ධාත්වර්ථ සිත තබා අරුත් බිඳුණු සැටිය.) **පෙළ** = පාළිය; **හදුරණකල්හි ය සූ සේ සි** = සඤ්ඣාරණය කරන කාලයෙහි ය යනු කී නියායි. **උද්දිසි ඝතිති** = සවරූපයෙන් නොහොත් සැහෙවින් – ආදියෙහි හෝ කියනු ලැබේනුයි; **උද්දෙසො** = උදෙස් නම් වේ; **පාළි** = පෙළ යි; **තඝ්ඝ ගහණං** = ඒ පෙළ ගැනුම්; **උද්දෙස ගහණං** = එනම් වේ; **තඝ්ඝ** = ඒ උදෙස ගහණයාගේ; **කාලෙ** = කාලයෙහි යන අර්ථයෙහි; **'උද්දෙස ගහණ කාලෙ'** යනු වේ; **තත්ථ** = එහි; **ගරහ සිනා කෙළි** = නින්ද වශයෙන් සිනාවීම යයි කියන ලද ක්‍රීඩාව; **පරිහවිත්වා හසනං** = අවඥ කොට සිනාවීම; **පරිහාසො** = එනම් වේ; **සො එව** = ඒ පරිහාසය මැ; **කිලාඩිපායෙන කතත්තා**= කෙළි අදහසින් කළ හෙයින්; **පරිහාස කෙළි** = එනම් වේ; **සොමනස් සහගියා වූ අකුසල් සිතින්** = සොමනස්ස සහගත අකුසල චිත්තයෙන්; **ගත් උදෙස්** = ඉගෙන ගත් පෙළ; **හදුරනු**= පාඩම් කිම යි; **සිවිනාට** = සිටිනුවට; **නො නිසියෙහි** = නුසුදුස්

සෙහි; **මහ භවුන්** = මාගේ භාවනා සි; **ජීවි වෙද** = ජීවක වෛද්‍ය තෙම; **කුමාරන හතෝ** = රජ කුමරහු විසින් පුස්තා ලදුවේ; **කුමාර හතෝ** = එනම් වේ; **සෝ එව** = ඒ කුමාරහත ම්; **සොමාර හවිචෝ** = එනම් වේ; **වාසඛුණණ** = සුවද සුත්‍රය; **ධූප ඈ** = සුවද දුම් ආදිය; **හැනූ ඔසද කල්ක** = මිශ්‍රණය කල ඖෂධ කල්කය; **විලෙප නම්** = විලවුන් නම්; **බුඩෝ පමුඛෝ එතයං** = බුදුරජ ප්‍රධානවූයේ මොවුනට නුසි; ('බුඩපමුඛෝ; යනු වේ.) **නෝ වඩනා සහව් ඇතියේයි** = නො වැඩෙන සුභාව ඇත්තේය; **විරූහනං** = වැඩීම; **විරූල්හි** = එ නම් වේ; **මහ ඵල පවා** = මාගේ ඵලයන් ඇතුළත් නොට; **විරූල්හි ධමෙමා** = වැඩීම සුභාව වූයේ; **යසස සෝ** = යමක්හුගේ ද හෙතෙම; **විරූල්හි ධමෙමා** = එ නම් වේ; **නිමනුණු** = අප ගෙහි බිසා ගත මැනැවැ යන නිමන්ත්‍රණය – කැඳවීම; **පෙරළෙනුවට** = ගිහි බවට පෙරැළීම පිණිස; **සැඟැකිය තල ඇති අතින්** = චක්‍රාඞ්කිත තල හස්තයෙන් – සක් ලකුණෙන් විභූතිත තල ඇති අතින්; **චකක ලකකණෙන** = සක් ලකුණෙන්; **අඞ්කිතං තලං යසස** = සලකුණු කරන ලද තල ඇතියේ යමක්හුගේ ද; **ගඳෙළ පොමෝ** **යෙහි** = ගන්ධකුටි පමුඛයෙහි; **අගවිට** = අග්‍රවාටය සි – අග්‍රස්ථාන යැයි සේ සි; (**ගන්ධකුටි > ගඳ උළි > ගඳ ඔළි > ගඳෙළි > ගඳෙළ** යනු වේ. **ගඳෙළි, ගඳැළි, ගඳ කිළි** සිත් ව්‍යවහාරයෙහි යෙදී තිබේ. පමුඛ > පමුඛ > පමොය > පොමොය යනු වේ.) **පැදුම් දෙස මිණිය** = ප්‍රාචීන දිශාවට ලූ මුහුණු ඇතියේ; ('මූ' සිද 'මුඛඛ' සි ද මුහුණට නමැයි භික්ෂු මහාකොෂයෝ කියත්. 'මුහුණ' යනු එ දෙසට මැ සම කොට බැලිය හැකි ය. මෙහි 'මිණිය' වි තිබෙන්නේ 'මුහුණ' යනුය. මුහුණ > මිහිණි > මිණි සි ආයුහු පිළිවෙළය. 'මිණි' යනු එහි මැ වෛභාෂික රූපයෙකි.) **පුරත්ථිමාය දිසාය** = පෙරදිගට ලූ; **මුඛං යසස සෝ** = මුහුණ ඇතියේ යමක්හුගේ ද, හෙ තෙම; **මේ පියලිය** = මේ පිලොහිකාව – මේ රෙදිකඩ; **රජ කාය කරනු රජ කාය කරනු සි** = රජස් පහ කිරීමය රජස් පහ කිරීමය සි; **සිත් උපනිබඳන සඳහාය්** = චිත්ත උපනිබන්ධනය පිණිස – සිත තරයේ බැඳලීම පිණිස; **වාග්හෙද කැරැ** = වාග්භෙදය කොට–තෙපුල් මුවින් නිකුත් කොට – කියා; **ඉජිය** = සෘජු වැ – කෙළින් මැ; **අසෝඛ කම්මඨාන්දුන** = අශුභ කර්මස්ථානය දුනහොත්; **සිත් කලමවයි** = සිත ගිලන් හෙරෙයි – කලඹවයි; (**කලම** – ගිලන් බැවීහි යන ධාතු සි. 'කිලමු – ගෙලඇසඳ යනු පාළි සි.) **අසුභ කම්ඨාන් නුදුන** = අශුභ කර්මස්ථානය නුදුන හොත්; **රාගිරි තෙරුන්ට** = රාග චරිත ස්ථවිරයන්ගේ; **ලෙහි** = චිත්තයෙහි; **රා නො සන් හිඳි** = රාගය සන්නිසිඳුන නො වේ; **ඉනි බැවින්** = මෙසේ හෙයින්; **විසුද් පියලියෙන්** = විසුඛ පිලොහිකාවෙන්; **හඬස්** =

කම්ස්ථාන භාවනාවට සුදුසු කොට ගෙන නොහොත් ආමිශීනය කොට ගෙන; **අසුඛ කම් ඵන් එරබියැවි වැ** = අශුභ කම්ස්ථාන යට බස්වනු කැමැති වැ; **කල් ගෙණූ කල්හි** = කාල සොඹණය කළ කල්හි; **හිරු ලැහෙන දස බලා** = නැහෙනහිරි දිසාව බලා; **හිරු රැස් හුණු** = අව් රැස් වැටුණු; **සිුදු දියෙන්** = වලිත (ඔහ) දියෙන්; **මෙ තඤා මෙ** = මෙය සලකා මැ; **හිඳුවනු** = හිඳුවාලීම විය; **ලච්** = අල්පමය; **සඛරහ** = සංසකාරයෝ; **අනිස්හු** = අනිත්‍ය යෝහ; **ඔහස්** = ආලොකයක්; **විඝිජැ** = විසඡ්ජනය කොට; **තෙරුන්** = සුළු පතු තෙරුන් විසින්; **තුමන් දක්න සෙයින්** = තමන්වහන්සේ දක්නා පරිදි; **දිලු** = ආලොකයක්; **පතුරුවස්** = පතුරුවා; **විවසුන් ඔවස්** = විදර්ශීනාලොකය; **විවසුව හට මෙ** = විපසසකයා හට මැ; **බුදු ඔහස්** = බුඩොහාසය-බුඩාලොකය; **සමක්හු තඤා වුහුට** = යමකු සලකා හරනා ලද්දේ නම්; **ඔව්හට මෙ** = ඕහට පමණක්; **පැනෙසිල** = පැනේලු; **ඔහස්ගි ඇතුළුවූ තා** = ආලොකයෙහි ඇතුළත් වූ තාක් දුය;--

144. 'බුදුහු මෙ සිතට වටහත්ල' යනු '**බුදුහු සිතට මෙ වටහන් ල**' සී ගන්නේ.

බුදු ඔහස් හස් බුදුහු = බුඩාලොකය හා බුඩයන් වහන්සේ; **සිතට මෙ** = විත්තයට මැ; **වහන්ල** = උපසථිත වෙත්ලු; **එයක්** = මේ සාවූවා; **බුදුන් ඉඛය** = බුදුහුගේ සෘඩිය සි – බුදුහුගේ සෘඩිය මෙතෘම් යැ යූ සේසි;

145. 'ඉජිවුවා' යනු '**ජිවුවා**' සී ගන්නේ. **ජිවුවා** = ජීවක යාගේ යන අර්ථ සි.

ඔන් අඟැ හිඳ = හකනාග්‍රයෙහි හිඳ; **තෙරුන් පෙරට හුනුවක්හු සෙයින්** = තෙරුන්ගේ ඉදිරියෙහි හුන්නකු මෙන්; **පැනෙන** = පෙනියාම; **බුදු ආඛිපත්‍යය යෙන්** = බුදුහුගේ ඉසුරු බවය සි – ඊශත්‍වය සි කියන්; **රා මෙ** = රාගය මැ; **රජය වී යෙසි** = රජසැ වූයේයැ සි කියයි; **රෙණූ** = දුහුවිල්ල; **රජය නො වී යෙසි** = දුහුවිලි වියැයි නො කියයි; **රජය යන මේ නිරුත්** = රජයැයි කියැවෙන මේ ව්‍යවහාරය; **නිරුත්හි පථ** = ඒ ඒ අර්ථ විෂයෙහි සුදුසු ශබ්දයන් යොදා බැවහර කිරීම්; **දක්වමින්** = පෙන්වමින්; **කියූහ** = කථනය කළහ; (අන්‍ය අභිධාන අර්ථයෙක්හි ඒ ඒ ශබ්දයන් යොදා බැවහර කිරීම නිරුත්හි නමැයි ද ඒ ඒ ප්‍රධානාර්ථ විෂයෙහි ඒ ඒ ශබ්දයන් යොදා ලීම නිරුත්හිපථ නමැති ද මෙහි ආසය දතයුතු. මෙහි 'රජෝ' යනු නිරුත්හි සි. 'රාගෝ' යනු

නිරුත්ති පථ සි.) **සාසවූ කොලෙස් රජ ඇති සථරහ** = පහ වැ ගිය කොලෙස් රජස් ඇති ශාස්තෘහුගේ; **කොලෙස් රජය ගිහවම් යන අභිප්‍රාණන්** = කෙලෙස් නමැති දුහුවිල්ල ගෙවා හරිම් යනඅදහසින්; **විවස්නෙහි** = විදර්‍ශනායෙහි; **සැහැත් වැ** = උස්සාහිත් වැ; **කම් කොට** = මහණුවම් කොට; **උදෙස් පිදිපුස් විසින්** = උද්දෙස පරිපුච්ඡා වශයෙන්; **ගතුවක්හට සෙයින්** = උගහිතයකු හට මෙන්; **පිළි සැහැඹියා හා සමග** = ප්‍රතිසංවිදුන් හා එක් වැ; **පෙළ ගියාවුහු** = තුන් පිටකයෝ ආහ; **සළු කනින් නළල් පිසෑ** = සළු කොනින් නළල පිස දමා; **අනිච්චසඤ්ඤා පිළි ලද කරුණෙන්** = අනිත්‍ය සංඥාව ප්‍රතිලබ්ධ කාරණයෙන්; **දැකිණි දිය** = දක්ෂිණොදකය; **දන් පිළි ගාවා අත්හි** = දාන ප්‍රතිග්‍රාහකයාගේ හස්තයෙහි; **දන් පුහාණෙහි** = දානයාගේ පූජාභාගයෙහි; **දුවා** = දායක්‍යා විසින්; **සිය අතින් හෙළන** = සවකිය හස්තයෙන් නිපාත්තය කරන; **දිය** = ජලය සි; **කම්මකරාලපන** = කම්කරුවනට ආමන්ත්‍රණ සි; **සාම්‍යා ලපන** = සවාමීන්ට ආමාන්ත්‍රණ සි;

(ඒ) **දහසක් කොට**;— මේ බළුත් 'සහස්සකක්ඛත්තුං' යනු වට අර්‍ථ කී සැටිය. මෙයින් '**අඩතෙලෙස් සල්**' යනාදි තන්හි එන වාරාර්‍ථවාචී 'යල්' ශබ්දයාගේ නිශ්චිත ප්‍රභවස්ථානය ඝෝෂයා ගැනීමට මාර්‍ගයෙක් පැහැදිලි වෙයි. වෛයාකරණයන් විසින් ප්‍රත්‍යයලෙශයෙන් ගෙන තිබෙන ශබ්දයනම අටුවාවන්හි බොහෝ තැන් ශබ්දර්‍ථය මෑ දක්වා තිබෙයි. මෙ ද එබදු තැනෙකි. 'කක්ඛත්තුං' යනු වාරාර්‍ථවාචී නිපාතයෙකි. එහෙත් පෙළ වියරණඥයෝ 'සක්ඛස්සකක්ඛත්තුං' සී වාරාර්‍ථයෙහි ප්‍රත්‍යයක් කළහ. එහෙත් එහි ශබ්දර්‍ථය 'කොට' යනුවෙන් මෙහි දක්වෙයි. මේ 'කොට' යනු 'කොව් – කව් – කට' යන රූපයන්ගෙන් ද ලැබෙන වේ. එහි 'කව්' යන රූපය 'යල්' සී විභාෂියට පැමිණ තිබේ. "කල් – වර – වෙලා – වට – සිමා = යල්' යන ශබ්දයෝ සාමාන්‍ය කාලාර්‍ථයෙහි පවතිත්. මෙහි කාල විශෙෂ වූ වාරාර්‍ථය මෑ අභිමත සි.

ප්‍රාසාදිකායෙහි 'යල්' ආදී ඇතැම් පද නිෂ්ප්‍රත්ති මෙයම වෙනස් ලෙස දක්වා තිබෙයි. ඒ බළුත් එසමයෙහි වැමහි ගිය සැටි ය. මෙහි එනුයේ එයට වඩා සුපරීක්ෂිතස්ථානයෑ සි දතයුතු.

මුව දහසක් = මුඛ සහස්‍රයෙක්; **තෙප්ලි** = භාෂණය කෙළේය; **මුඛාග්‍රය තෙපුල් මෙ** = මුව ඇසිරි කොට පැවැති වචනය මෑ; **මුඛ නම් වේ** = ආශ්‍රයොපචාර වශයෙන් මුඛ නම් වේ; **ඉඛ පත්හු** = සෘඩි ප්‍රාප්ත තෙරුන් විසින්; **දුසිහු අා සැදෑ** =

දූතයන් පැමිණි කල්හි; **ඉධපත්ථු කාලතා කිරිය** = සෘඩි ප්‍රාප්තයා විසින්. කාල තෘක් ක්‍රියාවන්; **නො ඉච්ඡාම** = අධිෂ්ඨාන නො කළත්; **ඔහු තෙජ්ඨුව** = ඒ සෘඩි ප්‍රාප්තයා නෙපලූ කල්හි; **බුදුන් පෑ සෙයින්** = බුඩයන් වහන්සේ ප්‍රඥාශෂකළු පිරිදෙන්; **තෙ වේළෙයින්** = ත්‍රිපිටකයෙන්; **තමන් කරන අනුමෙවුනි** ඔණට= තමන් විසින් කරනු ලබන අනුමෝදනා ධර්මයට; **නිසිකැන්** = යෝග්‍යසථාන; **හවුලා ගෙන** = උච්චිත්තය කොට ගෙන; **විස්ම යෙන්** = ආශ්චර්‍යයෙන්; **පිරිය සලයි** = පිරිස කම්පිත කොට; **මණ්ඩල මාළඟට** = වටහලට – චිත්තාකාරයෙන් නිර්මිත එක් කුලෙන් සුත් පහයට; **පා සිවුරු ගහණ ඇ** = පාත්‍ර චීවර ග්‍රහණාදි; **ගඳෙල පොම දක්වයි** = ගන්ධකුටි ප්‍රමුඛය දක්වා; **පිරිවැරිගිය** = පරිවාරිත වූ; **ඇවිදිනිත** = අවිජහිත වූ – අත් නො හළ; **සුගත් ඔවා** = සුගතොවාදය; **මනොඥ ගඳ වසින්** = යහ පත් ගන්ධය සි කියන් ලද වාසයෙන්; (**ගඳ** නමුත් **වාස** නමුත් ගන්ධය මැයි.) **වසන ලද** = වාසය කරන ලද = සුවඳ කවන ලද; **වාසෙනිනි** = සුවඳ කවා නුයි; **වාසො** = එනම් වේ; **ගන්ධො එව වාසො** = ගන්ධය මැ වාස නම් වූයේ; **ගන්ධවාසො** = එනම් වේ; **සුරහි ව සො** = ඉෂ්ට ගන්ධ වූයේත් හේ මැය; **ගන්ධවාසො ච්** = ගන්ධ වාස වූයේ ත් හේ ම නුයි; **සුරහිගන්ධවාසො** = එනම් වේ; **තෙන**= ඒ සුරභි ගන්ධවාසයෙන්; **සුරහි මූ ගඳ හා** = ඉෂ්ට ගන්ධය හා; **වසින්**= වූණියෙන්; **වසනලද** = පරිභාමින වූ; **උසඳ ඇ** = සුගන්ධ කල්කාදි යයි. (‘**උසඳනා**’ යනුන් මනා පාඨයෙකැ.) **වස් සුනු දුම් ඇයි** = වාස චූර්ණ ධූමාදිය සි. **රත්කමීබල් සෙණුවක්** = රත්‍ත කම්බල සාණියක් – රත් ඉලස් තිරයක්; **පරිකම්පනෙනා විය** = ‘**පරිකම්පනෙනා විය**’ යනු; **සමනතතො** = ශාන්ත්‍යසින්; **පාසාරෙනතා විය** = මිදශන්නාක් මෙන් යන අර්ථ සි; **රත් පහුල් පෙරව්** = රක්තාවණී පාංශුකූලයන් පාරුපන්‍ය කොට; **ධම්මාසන අවට** = ධර්මාසනාවර්ථයෙහි – ධර්මාසනය වටේට; **රත් පලස් සෙණුවක්**= රක්ත කම්බල සාණියක්; **පහරණ බඳුවෝ** = ප්‍රහාරණය කිරීම මැනි වූවෝ; **විවට අදහස්** = නිමන් කෙරේ පිහිටි අදහස; **අනු තුරු බැමිගි** = අතිශයින් උතුම් ධර්මයෙහි; **හිමිරජ බැවින්** = සවාමී වූ රාජයා බැවින්; **දිව සෝඛසින්** = දිබ්බ සොත ධාතුවෙන්; **රත් දෙපට සිවුර** = රඳනා ලද සහළු සිවුර; **සරහා හැඳැ** = සසස් කොට නිවාසනය කොට; **මතැන්න හස් සිහන් ගමන් බඳු** = මත්ත හසතීන්ගේ හා සිංහයන්ගේ ගමන් වැනි; **ගමනිනැ යූ සේයි** = ගමනයෙන් ය යනු කී නියායි; **මත්ත වරවාරණා ව** = මත් වූ උතුම් හසතීනු ද; **සිහා ච** = සිංහයෝ ද; **මත්තවරවාරණ**

සිහා = එතම් වෙත්; **තෙසං** = ඔවුන්ගේ; **විකසනතං** = සි සේසි; **ගමනං** = ගමනය; **තස්ස** = ඒ මතත වර වාරණ සීහ විකසනතයාගේ; **විලාසො** = සි සේසි; **ලීලා** = ලීලාව; **තෙන**= එයින්; **අන් නැති** = අනතයක් නැත්තා වූ; බුඛ **ලීලායෙන්** = බුත් ලෙලහයෙන්;

146. 'සම බිම පියෙහි පියෙහි ළැහෙන පියුම් විසිරන රස් ප්‍රභාතවිය් – නො තප්න හිරු විරෙන මල්රොන් ඇ' යනු **'සම බිම පියෙහි පියෙහි ළැහෙන පියුම්, විසිරෙන ප්‍රභා නො තප්න හිරු, විරෙන මල් රොන් ඇ'** සි ගන්නේ.

සමබිම = සමවහිය භූමියෙහි; **පියෙහි පියෙහි** = පද යෙක්හි පදයෙක්හි; **ළැහෙන පියුම්** = උද්ගත වන්තා වූ පද්ම යෝය; **විසිරෙන** = විකිරණය වන; **ප්‍රභා** = රශ්මියෙන්; **නො තප්න** = තාපතය නො කරන; **හිරු** = සූයීය; **විරෙන** = විකිරණය වන; **මල් රොන් ඇ** = පුෂ්ප රෙණුය යනාදී වූ; **නො එක් සුවෙන්** = අනෙඤ ඝත (ආඝවයීී) යෙන්; **උවෙළුවා** = ආවෙය්න කැරවා – වෙළා – පවලවා; **ගමන්** = ප්‍රයාණය කිරීම; **බුත් ලෙළහ නම්** = බුඛ ලීල්ඛය නම් වේ; **අත්පාහි** = හසත පාදයන්හි; **නො සඤඤම** = අසංයත භාවය – අයොග්‍ය ක්‍රියා කරණය සි; **කුක්කුච්ච නම්** = කුක්කුච්චය නම්; **නො සඤඤම**= අසාරුප්‍ය කරණය සි; **කඞ කිච්ඡි එච්** = උකකාසිතයක් හෝ ඤුවිතයක් හෝ– කැරීමක් හෝ කිච්සීමක් හෝ; **බුදු අනු බැවින්**= බුඛානුභාවයෙන්; **තෙජෙන ලදුවෝ** = තැති ගන්වන ලද්දාහු; **මේ සුගෙහි** = මේ ආයුෂ්කාලපයෙහි; **වැටෙන වා සිය** = පවත්නා හවුරුදු සියය; **ආයු කප්ප නම්** = පරමායුසය නම් වේ; **කථා සමුටුහන වත් නම්** = කථා සමුට්ඨාපන වහ වනාහි – කථාවක් ඉපැදූවිමෙහි සිරිත නම්; **'කායනුපස්ස'** යනු **ඇසින් පැවැති** = 'කායනුපස්ස' යනාදීන් පැවැත්තා වූ; **බුදුන් පුසු වෙසි** = බුදුහුගේ ප්‍රශ්නය වෙසි;

147. 'මජ්ඣ බිඳු කමනියාදි' යනු 'මජ්ඣ බිඳු සවණීයාදි' සි ගන්නේ. **මජ්ඣ බිඳු සවණීයාදි** = මජ්ඣයැ බිඳුයැ සවණීයයැ යනාදි; (මජ්ඣ නම් සිත රඳවන බව සි. බින්දු නම් ඝනබව සි. සවණීය නම් ඇසීමට සුදුසු බව සි.) **අට ගුණෙන් සමන්විත හඬ** = අෂ්ට ගුණ යෙන් යුකත වූ ශබදය;

(ජී) අෂ්ට ගුණයෙන් යුක්ත වූ ශබ්දය නම් විස්සට්ඨ යැ මඤ්ජු යැ විඤ්ඤේය්‍ය යැ සවණීය යැ අවිසාරි යැ බින්දු යැ ගම්භීර යැ නින්නාදි යැ යන අෂ්ටාඞ්ගයෙන් සමන්විත සවරය සි.

"විස්සට්ඨ මඤ්ජු විඤ්ඤේය්‍යා – සවණීයාවිසාරිනෝ
බින්දු ගම්භීර නින්නාදි – සෙව මට්ඨඞ්ගිකෝ සරෝ"
යනු අභිධානප්පදීපිකා සි.

විප්පඝතා = 'විප්පඝතා' යනු; **අපරිඝොසිතා** = සම්පත්ත නො කරන ලද්දී – අඩාළ කරන ලද්දී යන අර්ථ සි; **මා ආයෙන්** = මා ර්ම හෙතු කොට ගෙන; **ලොවි සැපත් හ** = ලෞකික සම්පත්තිය ගේ; **හව් දසට** = සකල දිශාවට; **ප්‍රධන් ඇජරහ සි සේ සි** = ප්‍රධාන ආවාර්‍යයාගේ යනු කී නියා සි; **ධන නොදී** = ධනයක් නො දී; **මෙහෙසින්** = පාරිචර්‍යායෙන්; **අදියැ** = ආරාධනය කොට – පරිතොෂ කොට; **සිප් උගන්නේසි** = ශිල්පොද්ග්‍රහණය කරනුයේ සි; **උවාරට කරන උවාර** = උපකාරයට කැරෙන උපකාරය; **කියවය්** = පිරිවහා; **මහ පිරිව** = මඟහ පරිබ්බය – මාඟෝපකරණ; **මහ නිමය යූ සේ සි** = මාඟී නිමානය යනු කී නියාසි; **අනා පාළ වෙසෙකින්** = අප්‍රකට වෙශයෙකින්;

148. 'ඉතිරි බලි දඩ කරවුවර ඇසින්. ආදි ගහණින් සිස භාපණ ගන්නේ' යනු '**දඬකර වුවර ඇසින් ආදි ගහණින් සිස භාපණ ඇ ඉතිරි බලි ගන්නේ**' සි ගත මැනව. දඬ නම් නිග්‍රහය සි. බලි නම් දෙවතා හොග රාජභොගාදිය සි. **කර** නම් රාජදෑය සි. **කරවුළු – කරවුවර – සුංවත්** යනු පර්‍යාය සි. '**කරමර**' යනු බලාත් කාරයෙන් ගෙනා දෑසාදීන්ට නම්. හෙ මැ කරාර්‍ථයෙහි ආරොපිත යසි ඇපි සලකමු. **සිස භාපණ නම්** හිස් ගණ්නට ගැනෙන බලි විශෙෂ සි.

පුනප්පුන ගටහි = නැවත නැවත ගටනෙහි ය; **පැහැරැ පැහැරැ** = ගට ගටා; **ඔහාරහට** = වෙඟරයා හට; **ඒ වියන බඳුය** = එය කියන්නාක් වැනි ය; **නැවියා** = නහාපිතයා – කප්‍රුවා; **මසසු ලෙඛනං** = රැවුල් ලියන කම්; ('මසසු කම්ම නම් වේ' යනු ශෙෂ සි.) **කොටු බඳු** = කුණ්ඨාකාරය – බොටය; **පහස්හි පහස්හි** = ගට නෙහි ගටනෙහි යසි; **නැවිය හට්** = නහාපිතයා හට; **ඒ කියන බඳුය** = එය කියන්නාක් මෙනි; **එකනවාසෙහි** = එකන නිපාත යෙහි; **සුළු සිටු ජායේ** = චූළ සෙට්ඨි ජාතකයෙහි; **මද වූ බඩු මුද ලෙකින්** = මඳ වූ ද භාණ්ඩ මූලයෙකින්; ('මුග්දල්' යනු පුරාතන

ව්‍යවහාර සි.) **ප්‍රඥාති** මෙඩා ඇතිසේසි = සවභාවයෙන් මැ නුවණැත්තේය; **ගනු** දෙනුවට = ගැනීමට හා දීමට – කිය විකි යට; **දෙස් හස්** = සුදුසු දෙශය හා; **කල් හය්** = සුදුසු කාලය හා; **ජන්න විසකුණු** = දන්න විවක්‍ෂණ තෙමේ; **අසුරු තැනට** = එශවශ්‍යසථානයට; **නහා** = ආරොපණය කොරේ; **පුම්නාක්කු සෙයින්** = පුමන්‍යය කරන්නකු මෙන් – පිඹලන්නකු මෙන්; **යූ තන්** = කී බව සි; **වැර නො විහිද** = විසීය වජ්‍රනය නො කොට; **සා පිළිසැඹියා** = ප්‍රතිසංවිද් සහිත වූ; **රාක්ඛි** = අහිත්ත්‍රියෙහි; **රැකුළු වැර ඇතිසේ** = ආරබ්ධ වීය්‍ය ඇතියේ; **අවියෝ කිරිය**= වියොග නො කිරීම; **විවසුන්** = විදශීනා තොමෝ; **සඳණ්හි** = සඳුණයන් විෂයෙහි; **ඔජවන බැවින්** = ඔජය – දීප්තිය – තෙජස– ප්‍රතාපය වන හෙයින්; **කාමඔඝ** = කාම තෘෂ්ණා නමැති ප්‍රවාහය; **භව ඔඝ** = රූපාරූප භවයන් පිළිබැඳි තෘෂ්ණා නමැති ප්‍රවාහය; **දිට්ඨිඔඝ** = මිථ්‍යාදෘෂ්ටි නමැති ප්‍රවාහය; **අවිජ්ජාඔඝ** = වෘත්තමූලක අවිද්‍යා නමැති ප්‍රවාහය; **සුළුපතු තෙරුන්** = චූළ පන්ථක සථවිර යන්ගේ;

17. සුළුපතු තෙරුන් වත්.

බල් සැණ = බාලයන්ගේ සැණ කෙළියක්; **ගොහන ලදු**= ඝොෂිත විය; **ජනමුළට** = ජන සමූදයයට; **නො නිසි තෙපුල්** = නුසුදුසු වචනයන්; **සහං අරහතිනි** = සහාවට සුදුසු නු සි; **සඞ්හං** එ නම් වේ; **න සඞ්හං** = සභ්‍ය නුවූයේ; **අසඞ්හං** = එ නම් වේ; **එ සතියෑ** = ඒ සප්තාහයෙහි; **ඒ බල් ජනා මුළ** = ඒ බාලජන සමූදයයෙහි; **නො සිනියසුතු සිතන** ඇ = සිතනුවට නුසුදුසු දෑය සිතීමය යනාදී වූ; **බල් බැවින්** = බාල භාවයෙන්; **ධැමිහි කා** = සියලු කුශල ධර්මයන්හි; **ඔජ වැ සිවි** = ප්‍රතාප වැ සිටගත්; **සක්**= ශක්‍රය; **සලය** = ශිලාය;

18. බල් සැණ වත්.

පුලිලගොහෙහි = පුලිලගසක් සමීපගුහායෙහි – ලෙන්හි; **කිසිණු අලු** = කසිණාලෝකය; **කුසල් කම්හි පැමසුවන්** = කුශල කර්ම විෂයෙහි ප්‍රමත්තයන්; **සිසු හා උවැන්** = චුතිය හා උත්පත්තිය; (**'අසබැඳ යූ සේසි'** යනු විනන්‍ය සි.) **අනත් බැවින්**= අන්තයක් නැති බැවින්; **නො පිරිසුනු** = අපරිශුද්ධ වූ; **පිරිසිදු දිවසක් සඳණ** = පරිශුද්ධ දිව්‍ය චක්‍ෂුර්ඥානය; **තිවි අවින්** = උද්වේග තාපයෙන්; **කිසුණු අළු පතුරුවයි** = කසිණාලෝකය පතුරුවා;

සියුතඤ්ඤාන් = චතුත්‍ථඤ්ඣානයට; **සමවැදෑ** = සමාපජ්ජනය කොට – පැමිණ; **නැගී** = (එයින්) නැඟ සිට; **ඝනු** = කියන ලදුයේ; **එයට නිසි** = ඒට යොග්‍ය වූ; **පිළිවුවා නම්** = ප්‍රතිපදා නම් වේ; **අනැඟැමි මගින් පුහුන්** = අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණ වූ; **සොඬසල්ල ඇති වන බැවින්** = ශොක නමැති උල් ඇති හෙයින්; **ඝනුයෙහි** = කියන ලද්දෙහි; **විකල්පයෙන්** = වා ශබ්දයාගේ අනේකාන්තිකාර්‍ථයෙන්;—

19. මහසුප් මහ තෙරුන් වන්.

අරණවූ = අරණ්‍යයෙහි වූ; **වෙහෙරෙක්** = විහාරයෙක්; **අරඤ්ඤ හවෝ** = රන්හි වූයේ; **ආරඤ්ඤකෝ** = එනම් වේ; **සෝ ච සෝ** = හෙ ද හෙතෙමේ මැය; **විහාරෝ** = විහාරවූයේ ත් හේ ම නුයි ('ආරඤ්ඤ විහාරෝ'යනු වේ.)**කල් නො උකුම්වා මෙ**= කාලාතික්‍රමණය නො කොට මැ; **හෝනාගේ සුරුකුවෝ** = සයනී ඝර සරිකඛඤයෝ ය – නිදන ගෙය සමානයෝ ය; **වල දෙදියහසි සේ සි** = විවටඛාරය යනු කී නියාසි – හළ දොර ඇත්තේය යි සේසි; **සැලයෙන්** = සාඛෙය්‍යයෙන්; **නැති ගුණ පාල කිරිමි** = අවිද්‍යමාන ගුණ ප්‍රකාශය; **වජන් නො සහනුයේ** = වචන නො ඉවසනුයේ; **නො පටවය්** = පට්ඨාපනය – පටන් ගැන්ම නො කොට; **ලස්කුසි තෙරහුජ්** = අලස කුසීත තෙරහු ත්; **ප්‍රධන් කැමියා** = කෙලෙස් නහන වීර්‍යයෙන් භාවනාකාමියෙහි යෙදුණු තෙරණුවන්ගේ; **මහමැළිය** = මහා කුසීත ය; **කුසි මහණ්** = කුසීත මහණතෙම; **විවසුන් ධුර** = විපස්සනා ධුරය; **රහත් පත්දසි** = අර්හත්ත්වයට පැමිණියේදැයි;—

149. 'අප්පමාද නම් සි ප්‍රධන් සතරඬදු' යනු '**අප්පමාද නම් සි ප්‍රධන් සතර කරුණ්**' සි ගන්නේ.

අප්පමාද නම් = අප්‍රමාදය නම්; **සි ප්‍රධන්** = සම්‍යක්අවි ප්‍රවාසයට ප්‍රධාන වූ; **සතර කරුණ්** = ත්‍රිවිධ සුචරිතය හා සම්‍යක් දෘෂ්ටිය යන සතර කාරණ සි; **අඟුරු කඬල් සජ්ඣුවට** = අඩහාර කපලල සජ්ජනයට; **නො පත් කල්** = අයුක්තකාලය සි; **ඒ** = ඒ මහණ තෙම; **ඇරජ** = සියලු කල්හි; **එහි** = ඒ ප්‍රාප්තකාලයෙහි; **ආදර නො කොට** = සැලකිලි නො කොට; **සජය යූ සේසි** = සජීත කෙරෙයි යනු කී නියාසි;—

150. 'සැපියුතුසි' යනු '**සැපියුතු සි**' සි ගන්නේ.

රහස්ඵල සැපියුතු සි = අතීත් ඵලය හා සම්ප්‍රයුක්ත සමෘතිය යි; **සි විහිඤ්ඤෙහි** = සමෘති වර්ජනයෙහි;--

151. 'සි පිළිවක් සතරයාන්' යනු '**සි පිළිවක් සතර කරුණ්** සී ගන්නේ. මේ යට ව්‍යාඛ්‍යාත මැ සි.

සි ජගුරු = සිහි නමැති ජාගරය - නිදි වැරීම; **පමානිදි ගැනුම්** = ප්‍රමාද නමැති නිද්‍රොපගමනය; **සති මෙ** = සිහිය මැ; **සති ජාගරිය නම්** = සති නමැති ජාගරිය නම් වේ; **කොටපය්**= කොටපය;

152. 'ජවං, සුණු දිවයූ සේයි' යනු 'ජවං = **ගුණුදිය**; **සුනු දවයූ සේයි**' යි ගන්නේ. **ගුණුදිය** = ක්ෂීණ වැ ගිය ජවඇති; සුනු දව යූ සේයි = ඡින්නජවය යනු කී නියාසි.

20. දෙසබඳ මහණුන් වත්.

153. 'ගෙහෙයයි තකම්' යනු '**හෙ හෙ යයි තකම්**' යී ගන්නේ. මෙහි පළමු 'හෙ' යන්නෙන් බුදුන් දුටු ශක්‍රයා කියයි. දෙවන '**හෙ**' යන්නෙන් මහාලි ලිවිඡවි තමා වීතැකූ ශක්‍රයා කියයි. **තුමාවිතැකුවහු** = තමන් විසින් සලකන ලද ශක්‍රයා; **සක් නොවනුය** = ශක්‍ර නො වන්නේය;-

154. 'ජන්නා තැන් ගැන සඳහා කියත්' යන මෙහි '**ගැන**' යනු හෝ '**සඳහා**' යනු හෝ අධිකසි.

මුහුතෙතන = මොහොතෙකින්; **විනතිතා** = සිතන ලද; **සහසසං අසුා යෙන** = දහසක් අරුත් ඇතියේ යමකු විසින්ද; **සො** = හෙතෙම; **සහසසසුා** = එනම් වේ; **අථ සහස් වැට හෙන** = අථ සහස්‍රයන් උපස්ථිත වන; **අනුන්** = අන්‍යයන්; **තුමා අනුවත්වන බැව්** = තමහට අනුකූල සේ පවත්වන බව සි; **එවු නට** = ඒ අන්‍යයනට; **හිමි බැව්** = සාමි බව සි; **මේ දෙ** = මේ ඉසුරු බැව් හා අධිපති බැව් යන දෙකා; **යම් රජයෙක්හි** = යම් රාජ්‍යයෙක්හි; **මොනොට** = මනා කොට; **පුස්නා වනෙම්** = පොෂණය කරන්නෙක් වන්නෙම්වා; **මාතු මත්තා පිතු මත්තාදිනට** = මව් පමණ පිය පමණ වන මහලුකාදීන්ට; **පියඛ තෙපුල්** = ප්‍රගල්භවචනයන් - පෙහෙසුන් බස්; **වුහුටු** = යාචකයන් හෙරෙහි හරනා ලද; **තැග ඇතියෙමි** = පරිත්‍යාග ඇති වෙම්වා; **වුහුටු වක්හි** = දුන් වසතු විෂයෙහි; **පයතො** = සි සේයි; **ඩොතො පාණී යසස** = දෙවි අත් ඇතියේ යමක්හුගේ ද; **පිතමෙහි** = පරිත්‍යාගයෙහි;

155. 'අත්තනි යස්ස' යනු 'අත්තනියස්ස' යි එකපද කොට ගන්නේ.

වොස්සජ්ජනං' = යි සේයි **අත්තනියස්ස වස්තුස්ස** = තමා අයත් වස්තුවක්; **පරෙසං පරිච්චජනං** = තෙ තමනට – මෙරමා හට දීම; **තත්ථ රතෝ** = එහි ඇලුණේ; 'වොස්සග්ගරතෝ' යනු වේ. **යදි** = යාචකයනට; **වත්** = වස්තුව; (නොහොත්) **යදිවත්**= යාචිත වස්තුවක්; **දී ධම්** = දෙය ධම්ය – දියයුතු දෑයක්; **පරහට දෙනු** = අන්‍යයා හට දීම යි; **ඇති වත්** = විද්‍යමාන වස්තුව; **නො නහයි** = නො සඟවා; **නැති වත්** = අවිද්‍යමාන වස්තුව; **නො අරවයි** = ආහරණය නො කොට–තිබෙන සේ ගෙනහැර නො දක්වා; **බණනු හා** = බිණීම හා; **දෙමි කෙරෙමි කල පිළින** = දෙමි කෙරෙමැයි කළ ප්‍රතිඥව – පොරොන්දුව; **වසකි නො කරනු** = විසඳෙකත නො කිරීම යි –නො වැසැංහීම යි; **පියනෙම්**= දුරු කරන්නෙමි; **දුනු පිය හා** = ජනක පියාණන් හා; **වැළු මව්**= වැදූ මව ය; **අනනපානාදි දුන හා** = අහර පැන් ආදී දීම හා; **නහාපන සම්බාහනාදි** = නැහැවීම් අත් හැඹීම් ආදී වූ; **පාදි වයහි** = මෙහෙ කිරීම යි; **තුමා දුනු කුල** = තමන් ජනිත කුල ය යි; **උපඨාන** = එළඹ සිටීම ය; **ආසන දුන ඇයි** = අසුන් දීමා දීය යි; **අලුක් සමාස වෑ** = විභක්ති ලොපයට නො පැමිණ; **තෙ**= ඒ කුලදෙටුවන්; **අපචායිතුං** = පුදනට; **සිලං** = සඟහාව ඇතියේ; **යසඤ** = යම් සොහකුන්ටද; **තෙ** = ඔවුහු; **කුලෙ ජෙට්ඨාපචායිනෝ**= එනම් වෙත්; **තං** = ඔහු; **මට තෙපුල් ඇතියවූ** = සිලුටු බස් ඇත්තා වූ; **සබ්බලා සම්භාසා** = සිලුටු තෙපුල් ඇතියේ; **යස්ස සෝ** = යමකුහට ද, හෙතෙම; **සබ්බ සම්භාසෝ** = එනම් වේ; **තං** = ඔහු; **පිසුණු තෙපුල්** = පෙසුණ වචනයන්; **පහනුවා** = දුරු කරන්නා වූ; 'පියං සුඤ්ඤං කරොති' **ති පිසුණෝ** = ප්‍රිය බව ශූන්‍ය කෙරේනුයි පිසුණ නම් වේ; **තස්ස කම්මං පෙසුණෙය්‍යං** = ඔහුගේ ක්‍රියාව පෙසුණෙය්‍ය නම්; **තං පජහිතුං සිලං යස්ස සෝ** = ඒ දුරලීම සඟහාව කොට ඇත්තේ යමක්හුගේ ද හෙතෙම; **සබ්බ තෙපුල් ඇතියහු** = සද්භාව වචනයන් ඇත්තහු; **කෝ අභිහබනුවා** = ක්‍රොධය මැඩ ලන්නහු; **ගම් ලදු** = ගම් ලද්දු – ගම්මූලාදුනියා; **අසුඤ්ඤ තබබං කම්මං** = නො යෙදියයුතු කම්ය; **අයොගෝ** = එනම් වේ; **යස්මිං අයොගෙ** = ඒ අයොග යෙහි; **පොළොව කොටන** = පොළොව කෙරීම ය; **දින් දන ඇ**= ගොයම් කැපීම ය යනාදී වූ; **නන් නිසරණ කමන්** = නානා ප්‍රකාරයෙහි වූ කම්නුතයන්; **කලාවලින්** = කටසාරයෙන් ('කළාර යනු 'කළාල්' වේ.) **සග් ගිය මග් වේ** = සවර්ගයට හිත මාර්ගය වේ

මෙහි පෙළන් = මේ කුසලයෙහි විපාකයන්; **සග්ගේ පැහැර සිවි බැවින්** = සවර්ගය හාක් සිටි බැවින්; **හේ මේ** = ඒ මේ දෑය; **පිළි යෙළ කරනුවම්හ.** = යුතු කරනුවෝ වම්හ; **මඝභසමඞ්කරණඤ්ච** = මඝ සම් කිරීම ය; **පානීය පඨපන** = පැන් එළවා තැබීම ය; **මච්ඡ මංසාහරණ** = මත්ස්‍ය මාංසයන් ගෙන ඒම ය; **සුරාපාන ඈ** = රඟබීම ය යනාදි වූ; **මූඛ්‍ය ඵල** = ප්‍රධාන විපාකය; **දෙව්ලෙව් හි ය** = දිව්‍යලොකයෙහි වේ; **ඵල සදහස් වැඩූ සිඟැ** = ඵල ලබා ගැනීම පිණිස වඩිනය කළ වෘක්ෂයාගේ; **සේ පරිභොවක් සෙ සින්** = ඡායා පරිභොගයක් මෙන්; **මෙ අනුසස් එලෙසි** = මේ අමුඛ්‍ය ආනිසංස ඵලය වෙයි; **යන අභිප්‍රාඞි** = නිදර්ශිත අභිප්‍රා ය යි; **චතුන්නං මහාපථානං සන්නි පාතට්ඨානං** = සතර මහාපථ කෙනකුන්ගේ එක් රැස්වූ තැන; **චාතුම්මහාපථෝ** = එනම් වේ; **තත්ථ** = එහි; **සතජ්ජන හලක්** = විශ්‍රාම ශාලාවක්; **රුක්ඛලෝ** = ආරඞ්ඛ කළහ;

156. 'පින්කව' යනු 'පෙන් සට' යි ගන්නේ. **පෙන්කට නුදුන්හ** = හිමි කරනට (ඉඩක්) නුදුන්හ.

157. 'හෙරිකරා නම්' යි පොත්හි නිඛෙයි. ජාතක අට්ඨ ගැටපදයෙහි මේ පාඨය ඛලනු මැනැවි "පත්තිකා හුඬා, ඔහු හා කැවි වැ බඩු ගන්නා පරිද්දෙන් නැවට හිමිවැ ගෙනැ – හෙරි වැ ගෙනැය යනුයි. පත්තිං, ඒ අත්තිකාරම් තිබූ තැනැත්තවුගේ නැවට හිමි බව – එරි බව යනුයි." (චූළ සෙට්ඨි ජා.) මෙයින් මෙහි ශුඛ පාඨය "**හෙඩි**" යයි සැලකිය යුතු. මේ පාඨයන් ගෙන් '**හෙඩි**' යනු සවාමියා ය අසිතිකාරයා ය යන අර්ථයෙහි වැටෙන බව පැහැ දිලි වේ. මේ අනුසාරයෙන් සලකා බලන් 'එරි' යනු 'පාළි' 'අඩිර' ශබ්දසන්න බැව් හැඟෙයි. '**සාමිකෝ පනි අසිරෙසු**' යනු නිඝණ්ඩු යි. **හෙඩිකරා නම්** = හිමි කරන්නහු නම් යන අර්ථ යි.

දෙර පැනවස් = මිදුලෙහි පිහිටුවා තබා; (පනව–පැනවීමෙහි යන ධාතු යි. ප්‍රඥප්තිය–සහුටු කිරීම–තැබීම් යනාදිය පැනවීම නම් වේ. මෙහි තැබීම ගතයුතු.) **සඞ්ඛතා ගැන්වූහු** = සන් ගැන් වූහ – හසන විකාරාදීන්. හැඟවූහ; **පාද ධොවන තෙල මක්ඛන ඈ** = පා දෙවීම තෙල් ගැල්වීම යනාදිය; **පාද පරිකම්ම නම්** = පා පිරියම් නම් වේ; **සම්බාහන ඇයි** = හැඹිම් – මැඩලීම් ආදිය; **පිට්ඨි පරිකම්ම නම්** = පිටු පිරියම් නම් වේ; **පිට්ඨ ඔඡ්ජන ඈ** = පිටි කැවුම් ආදිය; **ඛාදනීය නම්** = කඳු නම් වේ; **භත්තපායා සාදි** = බත් කිරිබත් ආදිය; **භෝජනීය නම්** = බොජුන් නම් වේ; **මඤ්ච කටසාරාදි** = ඇඳන් කලාල් ආදිය; **සයන නම්** =

සයන නම් වේ; **එවුන්** = එ උන් විසින්; **අතළ පුවරට** = අඳට පදරයට-කළාලාදිය අතුරා තැබූ ඵලකාසනයට; **නැහැම් ඝන්** = නහිනු කැමැතියන්; **පිටට නහන විසින්** = පිටට නහා ගැනීම් වශයෙන් ද;--

158. 'නො නැඟියනව' යනු 'නො නැඟිටියනට' සි ගන්නේ.

නො නැඟිටියනට = නො නහිනු කැමැතියනට; **මහ පානා විසින්** = මාඝීය ප්‍රකාශ කිරීම් වශයෙන් ද; **ගැනැ** = ගෙන; **කොඛළල රුකක්** = කොවිදුර වෘක්ෂයක් **පුප්ඵ ගහණ කාලෙ** = මල් ගන්නා සමයෙහි; **පුප්ඵං උපගච්ඡතිති** = මල් වෙත පැමිණෙනුයි; **පුප්ඵූපගො** = එනම් වේ; **ඵලගහණ කාලෙ** = පල ගන්නා සමයෙහි; **ඵලං උපගච්ඡතිති** = ඵලය කරා පැමිණේ නු සි; **ඵලූපගො** = එනම් වේ; **පුප්ඵත්ථාය උපගන්තබ්බා** = මල් පිණිස එළැඹිය යුත්තේ; **පුප්ඵූපගො** = එනම් වේ; **ඵලත්ථාය උපගන්තබ්බා** = ඵල පිණිස එළැඹිය යුත්තේ; **ඵලූපගො** = එනම් වේ; **දිවපන්නක්** = දිව්‍ය පානයක්; ('දිවපනු' යනු ප්‍රකෘතිරූප සි.) **උපන්වන** = උත්පන්න වන්නා වූ; **සුරා විශෙෂයෙක යෙන්** = ප්‍රකෘති සුරාවෙන් වෙනස් සුරාවෙකැයි කියත්; **අවංඩිරො** = යටට ලූ හිස් ඇතියේ; **යෙසං** = යම් මෙනකුන්ගේ ද; **තෙ අවංඩිරා** = ඔහු අවංසිරයෝ නම් වෙති; **ඡින් පඵල් නම්** = චිත්‍ර පාටලී නම් වූ; **සැහැම්භි** = සඬ්ග්‍රාම යෙහි; **රහ සුන් සද** = සුරාමතය සිදීගිය කල්හි; **අසුරෝ** = අසුරයෝ; **නො තුමන් තන් බවු දැනැ** = තමන්ගේ ස්ථානය නො වන බව දැන; නොහොත් මේරමා තැනක් බව දැන; **තුමන් තන් මෙ ගන්මහසි** = තමන්ගේ ස්ථානය මෑ ගනිමුයි; **සකු හා රණ කළහ** = ශක්‍රයා හා යුද්ධ කළහ; **මමජේල් ගමැ** = මවල් ග්‍රාමයෙහි; **කල හලැ** = කරන ලද ශාලාවෙහි; **නිඃශ්‍රෙයසයෙන්** = අප්‍රධාන විපාකයෙන්; **ආඝ්‍රිත ඵල** = ආශ්‍රිත වූ විපාකය; **ආශ්‍රයෙහි එබැ** = ආශ්‍රයෙහි බහා; ('සාලාය' යනුවෙන් මෙහි ගැනෙනුයේ ශාලාව නොව එය කිරීමෙන් ලත් පින සි. එහෙයින් පින ආශ්‍රය නම් වේ. ඉන් ජනිත විපාකය ආශ්‍රිත නම් වේ. 'සාලාවේ විපාකයෙනැ' සි කී කල විපාකයට ආශ්‍රය වූ ශාලාව කළ පින ගැනෙයි යන ආශය සි) **ගෞණ ඵල** = ගෞණ විපාක සි-අප්‍රධාන විපාකය සි; **විජයන් පහා** = වෛජයන්ත ප්‍රාසාද ලාභය; **සාලා ඵලෙ** = හල්කළ කුශල විපාකයාගේ; **නිඃශ්‍රෙස නම් වී** = අමුඛ්‍ය විපාක නම් වූයේය; **ලා රෙසෙහි** = ලාඤ්ඡාරසයෙහි - ලතු දියෙහි ලා; **රඵූ** = රජනය කරන ලද; **පුලුන් පෙද** = පිවුල පටලය සි;

(පෝ) සංස්කෘතයෙහි 'තුලිනි' යනු ඉඹුල් ගසට නමි. පාළියෙහි පුලිනින් සළ අතුරුණු ආදිය ඒ නමින් මෑ කියවේ. පුලුන් ගහ' යි ගැමි වහරහි දු එයි. මෙසෙයින් 'තුලුන්' යනු 'පුලුන්' වියයි ඇපි සලකමු. පිවුල > පිසුල් > පුසුල් > පුළුල් > පුළුන් යි ද ආ හැකිය. එනල ළ කාර මූර්ධන්‍ය විය යුතු ය.

සලතෙලෙක් = සිලාතලයෙකි; **සිරිර සමහරක්** = ශරීරාබාධයක්; **අකුසල් විපාකයෙන්** = අකුසල විපාකයෙන්; **සඟ්ගි පිළිසැඳ නො වන බැවින්** = සඟීයෙහි ප්‍රතිසන්ධියක් නො වන හෙයින්; **අවවින්** = ආවට්ටයෙන් – හාත්පසින්; **හැම කුඹු මැදෙහි** = සියලු කුම්භයන්ගේ මධ්‍යයෙහි; **රසු දැල්** = රස්නාජාලය; (රස්නා නම් රහුගෙඩි ය.) **ආතත** = සමින් වෙළන ලද එක් මුහුණෙකින් යුත් බෙරය; **විතත** = එසේ ම දෙමුහුණෙකින් යුත් බෙරය; **විතතා තත** = මුළුල්ල වෙළන ලද බෙරය; **ඝන** = කුළු තාලම් ය; **සුසිර**= නළාය යි; **ඝන** = නිදර්ශිත වූ; **පඤ්ච තූරිය හඬ මුසු** = පඤ්චඟික තූර්‍ය ශබ්දයෙන් මිශ්‍ර වූ; **දිවඟදැවි හඬ බඳු** = දිව්‍ය ගන්ධර්ව නාදයක් වැනි – දිව්‍ය සඞ්ගීත ශබ්දයක් වැනි; **නැටුම් සමජ්** = නර්ථනය යි කියන ලද සමජ්ජය; (නැටුම් – සමජ් යනු පර්යා.) **නච්ච සඞ්ඛාතො සමජ්ජෝ** = නර්ථනයයි කියන ලද සමජ්ජය; **නච්ච සමජ්ජෝ** = එනම් වේ; **නළු සමජ්** = නළුවන්ගේ නෘත්‍ය ය යි. **මහත් ඉසිර** = මහත් ඉසුරු බව යි; **දෙවු ලොව** = දිව්‍ය ලොකයෙහි; **නැති තැන් ගැන්ම** = නස්සිත්තනය සඳහා – නැති බැව් සඳහා; **දෙ පවම්** = කාලපක්ෂ ශුක්ල පක්ෂයන්හි පඤ්චමී දෙනය; (සෙස්සෙහි දු මෙ මැ නය යි.) **මාස දිවස ගණන** = මාස හා දින ගණන් ගැනීම; **මිනිසුන් අසින්** = මනුෂ්‍යායුෂයෙන්; **ගණන්** = සඞ්ඛ්‍යානය කෙරෙත්; **මාලා මිලායනති** = මාලාවෝ මැළ වැ යෙති; **වත්ථානි කිලිස්සනති** = වස්ත්‍රයෝ කිලිටි වැ යෙති; **කචෙජකි ඉසද මුච්චනති** = දෙ කිසිල්ලෙන් සෝදිය හිඳෙයි; **කායෙ වෙවණ්ණියං ඔක්කමති** = කායෙහි විවර්ණබව බැස ගනී; **දෙවො දෙවායනෙ නාභිරමති** = දෙවි තෙම දිව අසුන්හි නො ඇලෙයි; **මරණ බිය** = මරණය නිසා උපන් බිය; **සිහනා කොට දී** = සිහි කරනුවට නො දී; **මොහ උපගතුවෝ** = මුළාව උපද වන්නාහු; **බෙහෙක් ළිඟිණියක්** = බස සකුණිකාවක් – කත කොකක්; (බිසකණ්ඩිකා > බිසක් > බෙසෙක් > බෙහෙක් යනු වේ.) **පරිහාස විස්මයෙහි** = නිඳුයෙහි හා ආශ්චර්‍යයෙහි වැටේ.

159. 'පෙළවය' යනු 'වෙළවය්' යි ගන්නේ. නින්දා කොට යන අර්ථ යි.

තුමහ මෙ මළ මඡුන් = ඉබේ මැ මළ මත්සයයන්; **ගොදුරු වියොවින් සේය්** = ගොවර වියොගයෙන් සොෂිත වැ–වියළී; **තො කවරහි** = තෝ කවරක් වෙහි ද; **සිල් රක්නියක්හු** = සිල් රකින්නියක් වෙහි ද; (මෙහි 'රක්නියක්හු' යනු සත්‍රී ව්‍යවහාර විසින් දැක්වීම සි.) **නො හැරිය හැකි කොටැ** = තැනින් තැනට ගෙන යනුවට නො හැකි කොට; **දෙව් දැති ධන** = දෙව දත්තිය ධනය – දෙවියන් විසින් දෙන ලද ධනය; **මිනිස්නට** = මනුෂ්‍ය යනට; **වැළදෙනු කොටැ** = ප්‍රයොජන ගැනීම පිණිස; **දෙවියන් දුනු** = දෙවියන් විසින් දෙන ලද්ද; **රැස්වසි** = කැමැති කරවා ගනියි; **තිට රැස්නාක් හට දෙසි** = තිට රුචිකරන්නකු හට දෙන් නෙහිය සි; **මහජෙට අසුර රූවක්** = අතිශයින් වෘඩ අසුර රූප යක්; **අඤ්ඤෙස්ලි** = ආක්‍රොශනය; **අනතුරු ජැඟැ** = අතනන්තර ජාතියෙහි; **ඇඟ දුටු විදි දිවින්** = ඇය පෙර දුටු රූපයෙන්; **පුබ්බ සන්නිවාස හඳුන්වනුවට** = පෙර එක් වැ සළ වාසය හැඳින් වීම පිණිස; **අනුන් ගොවුන් වෙස් වරාජ්** = අන්‍යයන්ගේ ගෙඟවන වෙශයට ත් වඩා; **ඇයට කල් ඉස්** = ඇයට කාන්ත පරිදි; **භහවනුවට එව්** = සංඥපනය කරනු පිණිස හෝ; **මහ ජෙට වෙස්** = මහත් වෘඩ වෙශය; **සුජය** = සුජාවගේ: **ඇස් ගනුන් භඛසි** = නෙත්‍ර ග්‍රහණයට යොග්‍ය වෙයි; **ගොවුන් වෙස් කිවැනිඟ හොසි** = ගෙඟවන වෙශය සොඛඳ හෝ වේදැයි; **තුමන් දිවිහි** = තමන්ගේ රූපයෙහි; **වවසෙස්** = උත්කර්ෂය; **සැහැ විඇවි වැ එව්** = භහවනු කැමැති වැ හෝ; **මහජෙට** = මහත් වෘඩ රූපය; **මැවුහසි ගන්ඬේ සි** = නිර්මාණය කළහයි ගතයුතු; **පුවේ පරිවයෙන්** = පෙර පුරුද්දෙන්; **'සහ නිවාසො සන්නිවාසෝ' සි ගත** = එක්වැ විසීම සන්නිවාස සි ගත හොත්; **සමහ විසිමෙනි යනු වේ** = සමඟ විසීම හෙතු කොට ගෙන යන අර්ථය වේ; **'සමං නිවාසො සන්නිවාසෝ' සි ගත** = සමසේ විසීම සන්නිවාසය යි ගතහොත්; **කල් වාසයෙහ් යනු වේ** = ප්‍රිය වාසය හෙතු කොට ගෙන යන අර්ථය වේ; **හැමසෙනිජ්ජ** = සම්ප්‍රකාරයෙන් මැ; **වත්මන් හෙවෙහි** = වර්තමාන භවයෙහි; **ප්‍රෙමොත්පත්තියට** = පෙම් උපතට; **අසුහෙවෙහි හැවි** = අතීත භවයෙහි සමුටයිත වූ; **වැරිය** = වළක්වාලනුවට; **නො හැකි වෙයි ඇති බැවින්** = නො ඟැකි වෙඟ ඇති බැවින්;—

160. එබැවින් ඇයට නිම්මානසිය මුහුකුළ මිගිණියට යන අභිප්‍රායි' යනු **එබැවින් ඔහු දිගිණියට මුහුදුකු මේ මෙ නිසිය යන අභිප්‍රායි'** යි ගන්නේ.

එබැවින් = මුත්තඟට දු මහලුවන බැවින්; **ඔහු දිගිණියට**= ඔහුගේ දුහිතෘවට; **මුහුදුකු මේ මේ** = මහලුකඟ වූ මේ තෙමේ මැ;

නිසිය යන = යොග්‍ය වෙයි යන; **අභිප්‍රායි** = අදහස් කරයි; (මූනු කුළ = මෝරාගිය; යි කිව ද වරද නැති.)

161. 'පෙළතුවෝ' යනු '**වෙළතුවෝ**' යි ගන්නේ.

තුමන් එයට ගිය සෙයට = තමන් එහි ගිය බවට; **වෙළතුවෝ** = වීළිත වන්නාහු; **නළවන ලදුවෝ** = වඤ්චිත වූවෝ වෙමු; **නුහුබඳහු** = අනුබන්ධනය කළහ; **යෙළ සියක් යොජනි** = දියඬිස සත යොජනයක් ඇති – එක්සිය පනස් යොදුනක් උසැති; **විජයක් රිය සි ඳු** = වෛජයන්ත රථය ද; (මේහි එක් ස කාරයෙක් අධිකයැ යි හැඟේ.) **මෙ සිමිවහි** = මේ සමීප යෙහි; **වෙසි ගැනැ** = වෙග ග්‍රහණ කොට; **දුවන රියෙන්** = ධාවමාන රථයෙන්; **සුනු බවට නොමහසි** = චූණී භාවයට පමුණු වම්හ යි; **හිඹුල් වන මිරිකා** = සිම්බලී වනය මර්දනය කොට; (මදර්දික > මිරික – මිරිකීමෙහි.) **රියෙහි යුත්** = රථයෙහි නියුක්ත; **සුදු දහසනට** = සෙක්ඛ සඟස්සයන්ට; **කැහැවි සන්** = කැහැටින් කළයුතු සඞ්ඛතය; **වහලෙක්** = උපකාරයෙක්; ('අඩුතුන් වනු වනට' යි ද 'අසර කෙළතට' යි ද ඒ ඒ පදයනට වෙන වෙන අර්ථ කී සැටිය. 'අඩුතුන් කෙළක් අසරනට' යනු එකට ගළපා කී සැටිය. 'දෙකෝටි පනස් ලක්ෂයක් දිව්‍ය ස්ත්‍රීන්ට' යි අදහස ගතයුතු.) **වර ජ්ජ්‍සායාමි** = වර ධාතු කැමැත්තෙහි වැවේ; **වරිතබබතනා** = පැතිය යුතු බැවින්; **ඉවජිතබබතනා** = කැමති විය යුතු බැවින්; **වරං** = වර නම් වේ; **ඇද්දියෙහි** = අන්‍යෝ ජලයෙහි; **වජිරු ඇවි ගත්** = වජ්‍රායුධ ගත්තා වූ; **දහසක් මත් සක් රු** = දහසක් පමණ ශක්‍ර රූපයන්; **භුඤ්ජියතීති භොගා** = වළඳ කරනු ලැබේ නු යි භොග නම් වේ; **සමපන්නි** = එනම් සැප ත යි. **නත්ථි භොගෙ එතස්ස** = මෝ හට භෝග නැත් නු යි; '**දුභොගෙ**' යනු වේ. **තස්ස භාවෙ** = ඒ 'දුභග' ශබ්දයාගේ ප්‍රවෘත්ති නිමිත්ත; **දෙහගහං** = එනම් වේ; **මනුසෙසු දෙහගහං** = මිනිසුන් විෂයෙහි දිළිඳු බව; **මනුස්ස දෙහගහං** = එනම් වේ;—

21. සක් වත්.

162. 'අඤ්ඤතතරෙ භික්ඛු' යනු '**අඤ්ඤතතරං භික්ඛුං**' යි ගන්නේ.

නො පහල මහණක්හු = අප්‍රභාශ භික්ෂුවක්හු; **භවුන් විති** = භාවනා ප්‍රකාරයන්; **චඞ්කමන නිසජ්ජාදි ඉසින්** = සක්මන්

කිරීම ය හිදීම ය යනාදි වශයෙන්; පියොව් කරනුයේ = ප්‍රයොග කරන්නේ;--

163. 'අකුසල් වාසන ඇ විසින්' යනු '**අකුසල් පහාන ඇ විසින්**' සී ගන්නේ.

අකුසල් පහාන ඇ විසින් = අකුසල් ගෙවා හැරීම් ආදි වශයෙන්; **සම් වයම් පවත්වනුයේ** = සම්මා වායාමය පවත් වන්නේ; **මවසෙසසි** = වෙනස් කොට නොහොත් අධික කොට **පෙරහත්** = පූජියෙහි ගන්නාලද; **නිසරුවට වඩස්** = ප්‍රකාර යට වඩා; (නීහාර > නිහර > නිසර > නිසරු යනු වේ. මෙහි නිසරු සද නීහාරාථී සි.) **ළැව්ගිනි** = දවාග්නිය;--

164. 'සතුන් නැඟියයුතු' යනු '**සතුන් නැඟියයුතු**' සී ගන්නේ.

ඒ පියෙස් = ඒ ප්‍රදෙශයෙහි; **සතුන්** = සත්ත්වයන්ගේ; **නැඟියයුතු** = නඟවීමට යොග්‍ය වූ; **සාධාරණ අකුසල් කැමින්**= පොදු අකුශල කම්යෙන්; **පසයන්** = ප්‍රත්‍යයයන්-දර;--

165. 'පව්වයෙහි ලහති මාරො ආරම්මණං' යන තැන සේ සි' යනු '**ආරම්මණ ශබ්ද පව්වයෙහි 'ලහති මාරො ආරම්මණං' යන කැන සේ සි**' සී ගන්නේ.

ආරම්මණ ශබ්ද = 'ආරම්මණං ලභිත්වා' යන මෙහි එන ආරම්මණ ශබ්දය; **පව්වයෙහි** = ප්‍රත්‍යය යන අර්ථයෙහි වැටේ; (සොහි මෙන් ද යත්?) '**ලහති මාරො ආරම්මණං' යන තැන සේ සි** = 'ලහති මාරො ආරම්මණං යන තැන මෙහි; **භවුන් මතු පැමිණෙනුවට** = භාවනා මසතක ප්‍රාප්තිය සඳහා; **පස පිළිල දුසි සේ සි** = ප්‍රත්‍යය ලබන ලද්දේය යනු කී නියාසි; **අඩො භාගිය** = කාම ධාතුව භජනය කරන්නා වූ; **පස් සංයොජුන්** = සක්කාය දිටසි - විචිකිච්ඡා - සීලබ්බත පරාමාස - කාමරාග - පටිඝ යන පඤ්චවිධ සංයොජනයන්; **උඩම්භාගිය** = රූපාරූප ධාතූන් භජනය කරන; **පස් සංයොජුන්** = රූප රාග - අරූපරාග - මාන -උඩ්ච්ච - අවිජ්ජා යන පඤ්ච සංයොජනයන්; **බුදු ඔහස් විකිජ්ජ** = බුඩොභාසයක් විසජ්ජනය කොට; **හම්යෙහි සිවියක්හු සෙයින්**= සම්මුඛයෙහි සිටියකු පරිද්දෙන්; **අලු අතුරන්** = ආලොකාන්තර යෙන් - එළිය මැඳින්; **පැනෙනු සේසි** = පැනෙනුයේ යනු කී

නියායි; ඔහස් පුළුඩොව = ආලොකය පෙරට කොට; **දෙසූ ගා** = දේසිත භාථා තොමෝ; **ගලනුයෙහි** = හිල්වාලිමෙහි;—

22. අසඤ්ඤතර මහණක්හු වත්.

නි ඉසි = අනිවඡ වූ – ආශා රහිත වූ; **පසයෙහි** = චීවරාදි ප්‍රත්‍යයෙහි; **හිඳ් නැතියේ** = ගෙඩයක් – ඇල්මක් නැත්තා වූ;—

166. ජුණු පිණි පසයෙහි' යනු '**හුණු පිණි පසයෙහි**' යි ගන්නේ.

හුණු පිණි පසයෙහි = හීන ප්‍රණීත ප්‍රත්‍යයෙහි; (හීන > හිණ > හිණු > හුණු යනු වේ. හිණ යනු ප්‍රාකෘත රූපයි.) **එක් සෙයින් මෙ** = එකාකාරයෙන් මැ; **තුස්නේ** = සතුටු වනුයේ; **කා සිත් පව්වෙසින්** = කාය චිත්ත පවිවෙකයෙන් – කය සිත පිළි බැඳි උත්තම විවෙකයෙන්; **අරඳු විදි** = ආරබ්ධවීර්‍ය ඇත්තේ; ('අරද් විදි' යනුදු මනා පාඨයෙකි.) **උඩිහස්** = නැඟී සිට; **සමුවි හස්** = බලවත් සේ නැඟී සිට;

167. 'සියාහමෙ පැවැති' යනු '**සියහ මෙ පැවැති**' යි ගන්නේ.

සියහ මෙ = සතතයෙන් මැ; **පැවැති වැරැ** = ප්‍රවෘත්ත වීර්‍ය; **දිනි** = ජනිත කෙළේය; **නැඟන් හා සඟවි** = සූතීන් හා ඇලීම – මිශ්‍රවීම; **ගෙහ සිත පෙමයෙන්** = කාමාශ්‍රිත ප්‍රේමයෙන්; **හැනුණේ ය යි සේ සි** = මිශ්‍ර විය යනු කි නියායි;

168. රැකුළක් එවි' යනු '**රැලක් එවු**' යි ගන්නේ. රූඪ ප්‍රත්‍යයක් හෝ යන අර්ථ සි;

හුණුවක් එවි සූ සේයි = හීන වූවක් හෝ යනු කී නියායි; **කණාජඝ ඇ සි** = කුබු සහිත බත් ආදිය සි; නොහොත් ගම්මිරිස් අසමෝදගත් ආදිය සි; **මා පරපුරු** = මාගේ පරම්පරාව සි; **අන් නන් රැකට** = වෙන වෙන ගසකට; **ඒ දිඝ** = ඒ වෘක්ෂයාගේ; **අඹුරු පත් ආදීන්** = අඹ්කුර පත්‍රාදියෙන්; **ඝපෙන බැවින්** = දිවි පවත්වන බැවින්; **කිසෙසින්** = කවර ප්‍රවෘත්තියෙකින් – ප්‍රකාරයෙකින්; **කපි ඝන්** = කම්පිත වී ද ඝත්; **ආශ්‍රය කම්පායෙන්** = පිහිට වූ මෙරගල් සෙලවීමෙන්; **කපි යෙන් ම ය** = කම්පිත වෙයයි කියත් ම ය; **ආධිපත්‍යමාත්‍රයෙන්** = ගුණයාගේ අධිපති බැවි පමණෙකින්; **සහ පොළොවි මෙරගල්** = පොළොව සහිත මෙරු

පවීතය; **අසිස් ගුණෙන් කපුත්** = අලෙවිය ගුණය කරණ කොට ගෙන කම්පිත වන කල්හි; **භ්‍රමණ සඤ්** = භ්‍රමත් වක්‍රයෙහි-හක පෝරුවෙහි; **තදුත්‍රිත** = ඒ මෙරගල ඇසිරි කොට පැවැති; **සක් විමන් කප්පෙන් සි** = ශක්‍ර විමානය සෙලවෙන්නේ ය යනු; **අයො ද්‍රව්‍ය සන්නිධානයෙහි** = ලොහ ද්‍රව්‍යයන්ගේ සමීපයෙහි; **අඅසකාඅන කප්ප සෙසින්** = කාඅන ලොහය (ඌසි කාන්දම) කම්පිත වන පරිදිදෙන්; **ආශ්‍රය සල නැති වැ මැ** = ආශ්‍රයාගේ සෙලවීමක් නැති ව මැ; **සක් විමන් කප්පේ සි යන** = ශක්‍ර විමානය කම්පිත වන්නේ ය යනු; **අසිස් ගුණෙහි තර නොතර** = අලෙවිය ගුණයෙහි සථිර අසථිර බව; **පිරික්සනුවට** = පරීක්ෂා කිරීම පිණිස; **සික්වි** = සුකඛාපනය කෙළේය – වියළුවී; **සිද් අවසිද් වූයේ** = ඡිද්දවඡිද්ද වූයේ– කුදු මහත් සිදුරු ඇතියේ; **උඩින් යමින් හැවි** = උඩින් හා යටින් හටගත්; **විවෙත් හමුවූ මිත්‍රයන්** = විපත්තියට සමවුඛ වූ (පැමිණි) මිතුරන්; **නො පිමෙහි ගුණය යූසේසි** = අත් නොහැරීමෙහි සද්ගුණය යනු කී නියාසි; **අමා පිලි** = අමෘත ඵලය; **මිසුරු පිලිය යන** = මධුර ඵලය යන; **අහිප්‍රායි** = අද හස සි; **නො එක් වන්** = නානා වණ් වූ; **එල ඇතිහෝ** = ඵල ඇත්තා වූ; **නො එක් වන සේ** = අනෙක ප්‍රකාර වන බව;

169. 'අතු විළුයෙසින්' යනු '**අතු වියළියෙන්**' සි හන්නේ.

අතු වියළියෙන් = අතු වියළී ගිය හෙයින්; **හොළ වූයෙහි** = කොළාප වූයෙහි – කොවුල් බැස්සා වූ යන අදහස සි;—

23. නියම්ගම් නිස්තෙරුන් වත්.

දෙවන අප්පමාදවග අටුවා සහිත නිමි.

කම් බ්‍යාපාද විහිංසා යන = කාම ව්‍යාපාද විහිංසාය සි නිදර්ශිත; **තුන් විතැකින්** = ත්‍රිවිධ විතර්කයෙන්; **වළඳනා ලද බැවින්** = වෙළන ලද බැවින්;

170. 'ආදි ගහණින් තුම හෙ මෙ විසුරුවා ඇයි හහනේසි.' පොත්හි මෙසේ තිබෙයි. මෙහි දැක්වෙනුයේ '**විතන**' ශබ්දයාගේ අර්ථ භෙදය ය. භූමි ආදීන්ගේ විසිතුරු බව හෙතු කොට ගෙන '**විතන**' නම් වන පරිදි පොත්හි මැ විස්තර වෙයි. ආදි ග්‍රහණයෙන් ශෙෂ වැ සිටි විතන ලක්ෂණ ගත යුතු ය. එයින් 'අත්තනො චිත්තතාය වා චිත්තං' යන අර්ථ විකල්පය දැක්වූ සැටි ය මේ. පාඨය

දූෂිත වැ තිබෙයි. **තුම්හ මෙ චිත්තුරු තා ඇයි හඟනේ සි'** කියා ශුඛ කටයුතු ය. **තුම්හ මෙ** = තමාගේ මැ; **චිත්තුරු තා ඇයි** = විවිත්‍රතා ආදිය; **හඟනේසි** = දතයුතු.

171. 'හසින් හසාඬු වියෙහි' යන මෙහි 'වියෙහි' යනු යෙන් ගතයුතු අර්ථයෙක් නැත. 'සමයෙහි – හෙත්හි යනුවක් එනැන යෙදිය යුතු ය. මෙහි එබඳු නිශ්චිත ස්ථානයක් නො දක්වා සාමාන්‍ය නිදේශය කළ බැව් පෙනේ. එබැවින් **'හසින් හසාඬුවූයෙහි'** සී ශුඛ කටයුතු ය. 'හසඬු' යිත් පාඨ පැනේ. **හසින්**= ශෂ්‍යයෙන්; **හසාඬු වූයෙහි** = සම්බාධ වූයෙහි; (සමය හෝ යොත ගතයුතු.)

(ජෝ) සම්බාධය නම් පටුබව සි. **"සම්බාධා තු ච සඞ්කටං"** යනු නිඝණ්ඩු සි. සඞ්කට > සඟට්ට > සඟට්ට > හසට්ට > හසඬු > හසාඬු සී ආ බව පෙනේ. **"හඞ්වූ, අඞ්වූ, අඞ්පටුවූ"** සී 'සම්බාධ, යනුවට පුරාතනයන් කී අරුත් විසෙස් තන්හි තන්හි දක්නා ලැබෙයි.

සැප අරමුණෙක්හි = සප්පායාරම්මණයෙක්හි– හිතකර–වෘඩිකර අරමුණෙක්හි සී සේසි; **විසභාග අරමුණු** = අසමාන අරමුණු – විරුඬ භාග ඇති අරමුණු; **රූක් අළියෙහි** = රුක්කාළඝ යෙහි;

(සඳ) **'දඬුගයන් කළ අළියෙහි'** යනුයෙහි අළිය නම් දඬු අඬුව සි. කකුළු ගෝත්‍රසූ ආදීන්ගේ අඬුවලට ද 'අළ' නාමය පාළි යෙහි ප්‍රසිඬ ය. හී ඇද හැරීම පිණිස දඬුවෙන් කළ අඬුව රුක් අළිය නම් වේ. **'අළ'** මැ **'ආලඤ්ඣ'** යැයි ගන්නේ. ගසෙහ ගඳින් බෙදී ගිය සාඛාවන්ගේ මුලට **'රුක්කුළ'** සී **උතුරු මැදයෙහි** වහර වේ. එබඳු තන්හිදු හී ආදිය ඇදහරින් ම ය.

හී ඉදි කරන සිප් = විශිඛාවන් සෘජු කරන ශිල්පය; **දක්වය්** = පෙන්වා;

172. 'ඉදි කළ සිප් දැක්වූයේ වෙයි' යනු පොත්හි තිබෙයි. මේ **'හී ඉදිකරන සිප් දක්වය්'** යන පූර්ව වාක්‍යයෙහි නිදේශය සි. මෙහි සෘජුකරණය ශිල්පය හා නො යෙදෙයි. ශිල්පය අශරීර වන හෙයිනි. අනතුරුවැ දැක්වෙන සිප් ඵල හා ද නො යෙදෙයි. හී නැති හෙයිනි. එහෙයින් මේ වාක්‍යය මෙසේ ශුඛ කටයුතු ය. **'ඉදි කළ හි දක්වය් යූ සේසි'** සී. ඇද නැති කළ හී දක්වා යනු

භාව සි. ශිල්ප ඵලය නම් ශිල්ප බලයෙන් නිපදවන ලද නිහු ය. එ මේ කියත්;-- 'සිපින් නිපන් හි දක්වය් සේ සි' සී.

ද්‍රව්‍යාග්‍රිත = අන්නපාන වස්ත්‍රාභරණ මණිමුක්තාදි ද්‍රව්‍යයන් ඇසිරි කොට ඇති; **පිළි ලබහය්** = ප්‍රතිලාභයන් හා; **බුහුමන්** = බහුමානයන්; **අරණෙහි වස් විසින්** = අරණ්‍යයෙහි විසිම් වශයෙන්; **කස බූ බළාදි කෙලෙස් ඇති කොට** = පහ වැ ගිය දූඞිතර කෙලෙස් ඇති කොට; **බළාදි කෙලෙස් නම්** = බළාරික කිලෙසයෝ නම්; **පච්චයගෙඛ** = සිවු පසයෙහි ගිජුබව ය; **ගණ සංසගණ ඇසි** = ගණයා හා මුසු වැ විසීම ය යනාදිය සි; **පිළිවුවා හා** = ප්‍රතිපදුව හා; **පිළිවේ දෙසූ** = ප්‍රතිවෙධය දෙශනා කළ; **බුදුන් කෙරෙහි** = බුඩයන් වහන්සේ විෂයෙහි; **සැදුහැ නම් ඇති සෙනෙහෙන්** = ශ්‍රඩා යන නමක් ඇති ස්නෙහයෙන්; **ද්‍රවයෙනි සි සේ සි** = සිත්හි හටගත් මෘදු ගතියෙන් යනු භාව සි; **ආවරණීය ධැමින්** = පව නිවරණ ධම්යන් කෙරෙන්; **සිත් සොයන** = චිත්ත ශොධනය කරන්නා වූ; **විදියයෙන්** = විය්‍ය යෙන්; **සමථ විවසුන් අළියෙහි** = සමථ විපස්සනා නමැති ආළඹයෙහි; **නිපොපි** = කම්පිතයක් – චලිතයක්–විස්පන්දිතයක් නැති;

173. 'යන තෙ' යනු **'යන යෙවිජ'** සී ගන්නේ.

පුඛෙබනිවාස = පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ ය; **දිබබ චකඛු** = දිවැස් නුවණ ය; **ආසවක්ඛය ඤන** = අගිත්මාගී ඥන යයි කියන ලද; **තෙවිජ** = ත්‍රිවිද්‍යවෝ ය; **චෙතොපරිය ඤා** = සිත් පෙරැළි දන්නා ඥනය එව; **ආ සඅගිකඤ** = ආවා වූ ඡඩභිඥවෝ ය; **අග දකිණි බවු** = අග්‍ර දක්ෂිණීය භාවයට; **දක්කිණා වුච්චති දනං** = දකිණා යයි දානය කියනු ලැබේ; **තං අරහතිති**= එයට සුදුසු නු සි **'දක්කිණෙය්‍ය'** නම් වේ; **ආගම සෙය්** = ආගම පරිදි; **මාරස්ස** = මාරයා විසින්; **ඛෙය්‍යං** = යි සේ සි; **විඛෙය්‍යං** = සිය වසයෙහි පැවැත් විය යුත්ත; **'මාරඛෙය්‍ය'** නම් වේ. **උසා** = උත්සාහය;

24. මෙඝිය තෙරුන් වත්.

ඉසුරු = අධිපතිභාවය; **පවත්වන තැන්හි ය යූ සේ සි** = පවත්නා ස්ථානයෙහි ය යනු කී නියාසි.(මෙයින් 'විජිත' ශබ්දයාගේ අර්ථ විවරණය කෙරේ.) **පච්චයෙක්හි** = පච්ච පාදයෙක්හි; (පච්ච වාචී 'පච්-පවු' සි හලන්තසවරාන්ත ශබ්දයෝ දෙදෙනෙකි. 'පච්ච' යනු 'පවු ශබ්දයාගේ රූප සි.)

174. 'ගළවස් ගැමෙක්' යනු **'සනාචාසෝ ගාමෝ,** යනුවට අර්ථ කී සැටි ය. අඩොලිපිහි **'ගලවස්'** සී පැනේ. මෙහි **'ගල'** යනු **'සන'** ශබ්ද සම්භූත යැයි සැලකීම නයානුකූල සේ **පැනෙන** හෙයින් හේ ම මෑනැවි. 'මුහුද රළ ගලකොට' යනාදියෙහි ත් මෙසේ මැ සී. මූර්ධන්‍ය ළකාරය අනුචිත සී.

ගලවස් = සන වූ වාස ඇති; **ගැමෙක්හි** = ග්‍රාමයෙක්හි; **නන් කොටැසි රෙසෙන්** = නොයෙක් කොටස් ඇති රසයෙන්; **සප්ත සුව තැනකට** = පහසු පරිදි තැනකට; **භෙවෙන් කසව්මක්** = භවයෙන් පහ වැ යාමක්; **සිහි වුහුවූ** = සති වොස්සට්ඨ වූ-සිහියෙන් තුරන් වූ; **පයොව්** = කාය දුශ්චරිතාදී ප්‍රයොගයන්; **පියනු පිය වැ** = පළමු ගියහුගේ පියට අනුවැ (කැටි ව) ගිය පිය ඇති වැ; **සලක්හු විසින්** = කෙරාටිකයකු විසින්; **සෙළෙන්** = සප්තගුණ යෙන්; **මහළුවන් වටන කල්හි** = වැඩි ඔහලු තැන් වෙත උප ගමනය කරන කල්හි; **ගෙලසැඳ උපන්** = ගිලන් බැව් හටගත්; **කියවත්** = කතිකාවතක්; **වාක් පරිචය** = වචනයෙන් පුරුදු කිරීම; **කියවිය** = ඛය හා වය;

175. 'ඛය නම් හේ හෙනු' යනු **'ඛය නම් ක්‍රමයෙන් හෙනු'** සී ගන්නේ. ඛය නම් පිළිවෙළින් නැසී යාම සී' යනු අර්ථ සී. **පැනවමෝ** = පඤ්ඤපනය කරම්හ – පවන් ගතුම්හ;

176. විෂයොපචාරයෙන් විෂයෙහි මැ කී සේ සී' යනු පොත්හි තිබෙසි. මෙසින් ගතහැකි අර්ථයෙක් නැති. මේ තමාහි "කිමපන භන්තෙ ඵත්තිංසාකාරෙ සජ්ඣායිතුං අත්තභාවෙ ච ඛය වයං පඤ්ඤපෙතුං තුම්හාකමෙව වට්ටති" යන අට්ඨවා පාඨයෙහි අදහස හෙළි පෙහෙළි කළ සැටි ය. මෙහි ඵත්තිංසාකාරය විෂය සී. අත්තභාවය විෂයී නම් වේ. විෂයාගේ නාමයෙන් විෂයීහුගේ ග්‍රහණය විෂයොපචාර නම් වේ. අර්ථ වශයෙන් ඵත්තිංසාකාර සජ්ඣායනය නම් ආත්මභාවය කිය විය විසින් බැලීම සී. මෙසේ හෙයින් මෙහි 'ඵත්තිංසාකාර' යන වචනයෙන් ගැනෙනුයේ ආත්මභාවය සී. ඵත්තිංසාකාරය විෂය වන විට අත්තභාවය විෂයී වුව මැනව. එසේ හෙයින් මෙහි නිසැක ශුද්ධිය **"විෂයොපචාර යෙන් විෂයීහු මැ කී සේ සී"** සී ගන්නේ.

විෂයොපචාරයෙන් = ඵත්තිංසාකාර සඞ්ඛ්‍යාත විෂය හා නොවෙනස් කොට සැලකීමෙන්; **විෂයීහු මැ** = අත්තභාව සංඛ්‍යාත විෂයීහු මැ; **කී සේ සී** = කී පරිදි වේ. ("සතර පිළිසැඹියා සඳුණහු" ගැන ජිනාලඞ්කාර වණ්ණනාව හෝ ප්‍රාසාදිකාව බලනු

ලොඞ් අභිඤ්ඤාහු = ලෞකික චතුර්ධ්‍යාන සහගත අභිඥා ඥාන යෝ; **චෙතොපරිය ඤාණින්** = අනුන්ගේ සිත් පෙරළි දන්නට සමර්ථ වූ ඥානයෙන්; **පිරික්ඛන්නි** = පරීක්ෂණය කරන්නී; **උව නිස** = හෙතු සම්පත්තිය;

177. 'අයුහෙවෙහි සුරු උවනිසමෙ විවසුන් නම්' යනු **'අයු හෙවෙහි සුරු විවසුන් මෙ උවනිස නම්'** සි ගන්නේ. අතීත භවයෙහි චරිත විපස්සනා මැ උපනිස්සය නම් වේ යන අර්ථ සි.

178. 'පසුන ගමන්' යනු 'පසු ගමන්' සි ගන්නේ. **සිහිය හැකි ද** = ඉවසිය හැකි ද; **ඇසිය හැකි ද** = දිවි පැවැත්විය හැකි ද;

179. 'නො හළ කුළුවද' යනු **'නො හල කුළුව ද'** සි ගන්නේ. 'ගිලන් බවකට නො පැමිණියහු ද' යන අර්ථ සි.

නො හැඟවියවි වැ = දන්වනුවට නො කැමැති වැ; **විඩෙවු කරන්නට** = විසෙඹු කරණය පිණිස (විසෙඹු නම් ව්‍යාජ තෙපුලෙන් දූෂණ පරිහාරය සි.) **විසුවර** = විප්‍රකාරය – විකාරාකාරය; **දිකින්** = දුකයෙන්; **නිගන්නා ලැබෙසි** = පෙළනු ලැබෙසි.

25. අසැසැදතර මහණහු වත්.

සස්නෙහි රී නැති = ශාසනයෙහි අභිරතියක් නැති; (රතී > රහි > රිහි > රී) **මහණක්හු සි සේ සි** = ශ්‍රමණයකු යනු කිනියා සි; **කුලෙවු තෙර සෙනකුන්** = කුලූපග ස්ථවිර සෙනකුන්; **මුස්නා කරුණක්** = මිදීමට උපකාර වූ කරුණක්; **ලහ යෙහි** = හුණ පතුරු ආදි සලාකායෙහි; **අඩමස් බත්** = අඩමසක් පාසා දෙන බතය; **වසසාවාසික නො සොටැ** = වස් විසුවනට දෙනුවක් නො සොට; **දෙන සිවුරු ඇ පසඟන්** = දිය මාන චීවරාදි ප්‍රත්‍යයන්; **සපතිතො ආගතං** = සිය හිමියා කෙරෙන් පැමිණියේ; **'සාපතෙයය්‍යං'** යනු වේ; **ද්‍රව්‍ය** = ධනය; **තුම තුමා පිනින් ලද්දේ** = තම තමන්ගේ කුශල විපාකයෙන් ලදු යේ; **ලොඞ වාවහාරයෙන්** = ලෝ වහර විසින්; **සපතිහි සෙ රෙන්** = සවකිය සවාමියා සෙරෙන්; **අයසි කියේසි** = ආයේ යැ සි කී; **බිදම් තෙරුන් පැනයෙහි** = ආභිධම්මිකා තෙරුන්ගේ ප්‍රශ්නයෙහි; **නාමරූප වාවස්ථාන ඇසි** = නාම රූපයන් සොවස් සොට බැලීම ආදිය; **කියනු** = කියන්නේ ය; **වෙනසිඞ තෙරුන් පැනයෙහි** – විනය දූන හදරා තෙරුන්ගේ ප්‍රශ්නයෙහි;

අනොලොකනධම්මා ඔලොකන ඇ = නො බැලියයුතු තැන් බැලීමාදිය; **කියනු** = කිවයුතු; **මේ පැවැජ්ජයෙහි** = මේ පබ්බජ්ජායෙහි; **පැවැජ්ජ** = පබ්බජ්ජාව; **ඉත්ථා විහාරඝට** = කැමැති සේ වාසයට; **සම්බාධ සේ** = බාධන බව; **කියා** = කථනය කෙරෙයි; **වහළු** = කෘශ වූයේ; (සංස්කෘත ජරා වාචී 'විශ්‍රස්' ශබ්දයාගේ 'විසර' යන සවර විභක්තියෙන් **වහර** – වැහැරීමෙහි යන ධාතු ආයේ යැ සි ඇපි සලකමු. 'වහළු' යනු එහි අතීත කෘදන්තපද සි.) **රූළු** = රූක්ෂ වූයේ; **නහර පතුළු සිරුරු ඇතියේ සි** = නහර වැළින් පැතිරී ගිය ශරීර ඇත්තේ ය; **අවැඩ වසන්** = අනය ව්‍යසනයට; **අනයෝ ච සෝ** = අවැඩ වූයේ ත් හේ ම ය; **ඛ්‍යසනං**= වැසන් වූයේ ත් හේම නු සි; 'අනයඛ්‍යසනං' යනු වේ.

26. උක්ඛණ්ඩිත මහණු වත්.

නහ = කතිඳා නොමෝ; **ගමත් වෙහෙරෙක්හි** = ගම්හි මැ නොහොත් ගම සමීප විහාරයෙක්හි; **වස් විසි පිළි** = නිමි වස් ඇතියවුන් විසින් ලැබියයුතු වස්ත්‍රය;

180. 'දවය් ලියයුතු තැන්' යනු 'දවස් ගිළිය යුතු තැන්' සි ගන්නේ.

දහවල් දවස් = දිනය පිළිබැඳි දිවාකාලය; **ගිළිය යුතු තැන්** = ගළිත කවයුතු ස්ථානය; **කල් වැට** = විජිතිපත; **සැඟැරි යෙමි** = සඩ්විහාරිකා වෙමි; **දුසැවි විය හැකි** = දුස්සණ්ඨාපිය වෙයි – දුකසේ පිහිටුවාලිය හැකි වෙයි **වත් උපයනෙමි** = ධනොත්පාදනය කෙරෙමි; **සුළු ගැලෙක්හි** = චූළ යානයෙක්හි; **සක්පියෙහි** = චක්‍ර පාදයෙහි – චක්‍ර මාගියෙහි (පනොද ලඝියා) **කැහැවින්** = කෙවිටෙන්; (කැඟැට, කෙවිව, කොහොට්ටු, කෝටු යන ශබ්දරූපයෝ 'කාෂ්ඨ' යනු ප්‍රභව කොට ඇතියවුහු.) **කවර කරණෙන් ආව** = කුමන කරුණෙකින් ආවහු ද;

181. 'කියනුවට' යනු '**කියවනුවට**' සි ගන්නේ.

කියවනුවට = කියවීමට; **නො සඟිසිහි** = නො හැකිවූ යෙහි ය; (සහි + විහි) **දුරජ් වූ අරමුණු** = දුරවූ ද අරම්මණ; **සපිණ් සත සැහැවි** = සම්පටිච්ඡනය කරන සවභාව ඇතියේ ය; **තෙමේ දුරජ් වූයේ** = තෙමේ දුර වූයේ ද; **පිණ්සන සැහැවි** = පටිච්ඡනය කරන සවභාව ඇත්තේ ය; **කැන් කොටැ** = කැරලි කොට; **වණ් විභා** = වණ් භෙදය – නීලාදි ප්‍රකාර වණ් භෙදය; **සිත්හු**

වැසෙන හදවතම = සිත වාසය කැරෙන හෘදය වසකුවට; **නිසිවන බැවින්** = නිශ්‍රය වන හෙයින්; **මහා භූතෝ මෙ** = මහා භූතයෝ මැ;--

27. සඞ්ඝරක්ඛිත බැන තෙරුන් වත්.

ගෙරි මුළඟි = හොඳ සමුදායයෙහි; **වක්කාරපාහි** = අවක්කාර පාතියෙහි; (නොයිදුල් වැඩිපුර ආහාරයන් හැර තබන භාජනය අවක්කාර පාති නම්.) **බුන් ඉනිදි බන්** = භුත්තාතිරිත්තභත්තය-වළඳ ශෙෂ ව සිටි බත; **වක්කාරපෂැ** = අවක්කාර පාතියෙහි; **නොඉදුල් කොට** = අනුජ්ඣිත කොට; **හැරතුදු** = හැර තබන්නේ නමුදු; **යෙසු හල බැවින්** = යෙස්ස හැර තැබූ බැවින්; **සසින්**= ජාතකයෙන් – ක්ෂුධායෙන්; **අදන්ගු** = පිඩිතවූවහු; (අද – පෙළී මෙහි යන ධාතු සි. "අද්ද-අද්දනෙ" යනු පාළි සි.) **ඇමතු කැන්**= ආමන්ත්‍රිත සථානය; **සවනියරහි** = සම්ප්‍රකාරයෙහි වූ; **වන්පිළි වත්** = වත්ත පටිවත්තය; **වත් කදහි ආ වත්** = මහාවගග වත්තක්ඛන්ධකයෙහි ආගත වූ වත්තයන්; **නො ටිදි හෙළය්** = අඩු නො කොට; **ඉපිණි පසඉන්** = අතිප්‍රණීත ප්‍රත්‍යයයෙන්; **සබ්‍රම්සරනට** = සමාන බ්‍රහ්මචාරීනට; **උවහර වේ** = උපකාරී වේ; **සින් විසි වැ** = විඤ්ඤාණයාගේ වසයට – යටතට පැමිණ; **නහුල් සැජ** = කෘෂ්ණාණ්ඩයන්;

(සඤ) පාළි 'සඤ්ජා' ශබ්දය ප්‍රභව කොට ඇති මේ 'සැජ > සැද' ශබ්දය ආභරණ උපකරණාදියන්හි දක්නා ලැබේ. 'ඉන සැජ' යනාදි තන්හි ආභරණාදියෙහි වේ. මෙහි නහුල් කෙවිටි වියගස් ඔය බහන් ආදි හි උවාරණ ගන්නේ යි.

එක් වසැයෙක්හි = එක් සවභාව ධර්මයෙක්හි; **විපුවර පැමිණෙන බැවින්** = විකාරාකාරයට පැමිණෙන බැවින්; **විපරි ණාම දිකින්** = සුඛ වෙදනා සඞ්ඛ්‍යාත විපරිණාම දුක්ඛයෙන්; **දික්** = දුක් වේ; **හුස්** = නැඳි; **පිළිකුතු** = පටික්කනතවූයේ ය-ආපසු ගියේ ය; **පිළි ගියේ ය** = නැවත ගියේ ය; **විපිළි සැරි ඇති වැ** = විප්පටිසාරී වැ-පසු තැවිලි ඇති වැ; **විරූපං පවිසරණං**= විරූප ලෙස පසු පස්ව සිතීම; **විපසවිසාරො** = එනම් වේ; **සො එතසස අසථි** = හේ මොහට ඇත් නුසි; **විපසවිසාදී** = එනම් වේ; **කඨවන** = කාළ කණ්ණියෙක්; **එක්වන්** = නිළතුරු; **සර ගහන බැවින්** = ක්ෂුර සඤ්ඤය කරන බැවින් – බූ ගාන බැවින්; **සැන් නිහන** = සඤ්ඤා නිඝාදනය කරන – අවි මුවහත් කබන;

පහණක් බඳු = පාෂාණයක් වැන්න; **සසඟ ඇති කලෑ** = ඇලුම් ඇති කාලයෙහි; **ගියමින** = ගියෝ වෙමු; **සංසජති** = යි සේ සි; **එතෙන** = මේ කරණ නොට ගෙන; **එකිහවති ඉති** = එකතු වේ නු සි; **සංසඳනා** = එනම් වේ; '**අගමන ධම්මා**' = **අගමන සභාවා** = නො යන සවභාව ඇතියෝ; (අගමන පකතිසභාවා යනු යෙහි ත් අ ඒ හේ මැ සි.)**අසුසු වියාරා** = රහත් බව ප්‍රකාශ කෙරේ; **රහත් පිළිලබ** = අගඵල ප්‍රතිලාභය; **නො පිහිටි සිත් ඇති කල්හි** = එකාරම්මණයෙක් නි නො පිහිටි සිත් ඇති කාලයෙහි; **බෝ පැකි ධම් නො ජන්නා කල්හි** = බොධි පාක්ෂික ධම්යන් නො දන්නා කාලයෙහි; **නිරනුසය සතන්හි** = අනුසය රහිත සන්තානයෙහි; **පි වන බැවින්** = පහින වන හෙයින් - ගෙවී යන බැවින්; **පිනිජ්ජ පවුජ්ජ** = පින් ද පවු ද; **පහන ලද** = ප්‍රහීණ කරන ලද්දේ ය; **කොමොඩු පකක් සෙයින්** = ඉදි හිය කොමඹු වක් මෙන්; **කඵල් හිසෑ** = බලලාට හිමියෙහි-කෙස් නැති හිසෙහි; **කොලොඹ මලක් සෙයින්** = කදම්බ පුෂ්පයක් මෙන්;

182. 'බත් මලක් සෙසිනුජ්ජූ' යනු '**බක් මලක් සෙසිනුජ්ජූ**' සි ගන්නේ. **බක් මල්** නම් මහමිලි. 'බකිනි' සි ද නියරි වහරහි එසි. මෙහි 'බක්' ශබ්දය මහත් ශබ්දාර්ථයෙහි වේ. 'බහාමුහුණු' යනාදියෙහි මෙනි. '**බක්මි මලක් සෙසිනුජ්ජූ**' සි වත් හොත් ඉහා මැනැවි. **ආජීවක නම්** = බාහිර පැවිද්දේ ය - සන්‍යාසීහු ය. **නිම වුසි** = පූරණ කාශ්‍යපාදි නිගණ්ඨයෝ ය; **වල්හලා** = රුක්පොතු පට්ටාවන්; **ඉසිලෙන** = වරින් වර ඉල්පී පවත්නා වූ; **පහරන ලද** = ක්‍රොධයෙන් ගවන ලද; **සිත් ඝසළ** = චිත්තඝාවවරය;

183. 'කුණු ඇනියේ ය' යනු '**කණු ඇනියේ ය**' සි ගන්නේ. මේ 'ඛිලජාතො' යනුවට අ‍ඨ කි සැටි ය. වෙතොඛිල සූත්‍රත් අටුවාහි 'ඛාණු ඝාවවර ඵඩඝාවා' සි ඛිල ශබ්දය විවරණ කර තිබේ.

උපන් කෙලෙස් කණු ඇනියේ සි = උපන් කෙලෙස් නමැති කණු ඇත්තේ ය. **ජගුරු බැමින්** = සඬාදි පඤ්චවිධිය සඬ්ඝාත ජාගර ධම්යෙන්; **නො නිදනුවට කරුණු බැවින්** = කෙලශ නිද්‍රාවෙන් නො නිදීමට කරුණු වන හෙයින්; **ජගුරු ධම් නම් වූහු** = ජාගර ධම් නම් වූහ; (**ජගුරු** - නො නිදීමෙහි යන ධාතු සි.) **පැසුලු නො පවත්නා බැවින්** = ඒ ඒ මාගීයෙන් ප්‍රහීණ වැ හිය කෙලෙසුන් පසුව නො පවත්නා බැවින්; **සිරුරු ඇති සහු** = මූනීතිමත් වූවාහු; **ඉතා හැසුඛු** = අති සම්බාධ ය - ඉහා පටු ය;

(සිදී) 'දෙ අඩ මනාක්' යනුයෙහි **මනාක්** යනු **මානක** ශබ්දයෙන් භින්න ය. 'මානක' යනුයෙහි ආදි දීඝිය 'මනාක්' යනු යෙහි මධ්‍යදීඝියට හෙතු යි. 'චූළක' යනු 'සුළාක්' වූයේ ත් මෙලෙසිනි.

වරා සොරකු = වරක චොරකය යි. තම්පලා සි යෙත්; **වහරේ කල්හි** = මෙස සමයෙහි; ('ධාරා' යනු '**අවරේ**' විය. එමෙන් 'වාරිධාරා' යනු '**වහරේ**' වේ.) **සිසාරවා** = සංසාරණය කැරවා – වටා කරකවා; **ලමු තැනෙක්හි** – ලාමක තැනෙක්හි; ('**රජහොන**' නම් රජුන් විසින් වැළදියයුතු රට යි.) **බඹසරවස්**= බ්‍රහ්මචරිය වාසය; **බඹ විහර එව්** = බ්‍රහ්ම විහාරය හෝ (ගතයුතු.)

28. චිත්ත හත්ථ තෙරුන් වත්.

රැකුඵ වැඩ ඇති = පටන්ගත් ව්‍යායාම ඇති; **විවසුන්** = විදර්ශන භික්ෂූන්;--

184. 'ආරඛවීරිය විපස්සකො ආරබ්භවිපස්සකො' යනු '**ආරඛ විරියා විපස්සනා ආරඛ විපස්සනා**' යි ගන්නේ. 'පටන්ගත් වීර්‍ය ඇති විදර්ශන භික්ෂූහු' යන අර්ථ යි.

සමාධි විවසුන් = සමථ විදර්ශනා භාවනාවන්; **මහජනා වස් ඇති ගමක්** = මහත් ජනයාගේ වාසය නොහොත් මහත් ජනයාගෙන් පිරිගිය ගෙවල් ඇති ගමක්;—

185. 'පබොජ සදහය්' යනු '**පමොද සදහය්**' යි ගන්නේ.

සෙට දවස් වියයුතු = සෙට දවස්හි වනුවට සුදුසු; **ප මොජ සදහය්** = ප්‍රමොදය පිණිස; **හිස් සුන් කිලිබුරන්** = සිදී ගිය හිස් ඇති කලෙබරයන් – ශරීරයන්; **මුළුවැ හැරුම්** = සමුදින වැ සක්කායභය කිරීම – එක් රැස් වැ කිම; **පැයෙන සඳ** = ඉදෙන කල්හි; **හඬ විහිදු** = ශබ්ද පතුරුවා; **පස් සඳැ**= ඉදුණු කල්හි; **නිසන්වන** = නිශ්ශබ්දවන; **ඵුපනක් සෙසින්** = ධූපන නම් ව්‍යඤ්ජනය මෙන්; **කිණි මරණ හසි** = ක්ෂණික මරණය හා; **සනතති මරණ** = එක් භවයකට අයත් ජීවිතෙන්ද්‍රියයාගේ උපච්ඡේදයෙන් වන සන්තති මරණය ද, **පිරිගණත්** = පරිගණනය කොරෙත් – නුවණින් විමසා බලත්; **එළවස්** = (පළවස්?) චිත්තාභිමුඛ කොට නඟා ගෙන; **බල නැති බැවු නම් ඇති** = බල නැති බව ය යන නම් ඇති; **දුඛුල් අවින්** = දුර්ලාභයෙන්;--

186. 'අනඛිනි භාවකාලිකඛෙන' යනු **'අනඛනිය භාව කාලිකඛෙන'** යි ගන්නේ.

නො ඇඳිනිය බව් නම් ඇති = බොහෝ කලක් පැවැත්මට යොග්‍ය නැති බව යයන නම් ඇති; **තැවු කැලි අවින්** = භාවකාලිකාදියෙන්; **දෙර හා අටලු සුතු** = චාරයෙන් හා අට්ටාලයෙන් සුකත වූ; **දෙරටුයෙන්** = චාර කොටසකයෙන්; **ගොපුර** = වාසලය; **සිඟිංග පමුරු** = සුරුඛයෙන් (ගුස මාගී යන් ගෙන්) යුත් ප්‍රාකාරය යන මොවුන්ගේ; **සඬ්ග්‍රාම කඛා කළ** = යුද පිණිස කළා වූ; **අටලුයෙන් යුත්** = අට්ටාලයෙන් යුකත වූ; **වෙසියුළු හය** = විපි චතුෂ්ක හා; (විපි චතුකක > වෙහි තුකු > වෙසියුකු > වෙසියුළු යනු වේ.) **නිකොණ සඬින් සහිත** වූ = තුන්මුළු මාගී සඬින් සහිත වූ; **මහවෙහි** = මහා විපියෙහි; **කොට වෙහි** = හ්‍රස්ව විපියෙහි; **අතුරු අවුණු** = අන්තරාපණයට්-අතුරු අවුණු නම් අවුණු මැ සි. **එකත් පසැහි** = එක් පාශීව යෙක්හි; **මුවාන් ඇති අවියෙන්** = ධාරාන්විත ආයුධයෙන්; 'මුවාත' නම් ආයුධයෙක මුණත සි. (සත්මුඛ > සත්මුව් > මුවසත් > මුවහත් > මුවාත් යනු මේ.) **රණමුයෙහි** = යුඛමුඛයෙහි; **බල මැදැ** = සෙනා මධ්‍යයෙහි; **අවි නො හෙන සෙසින්** = ආයුධ පහනය නො වන පරිද්දෙන්; **කරන කොවිය යෙන්** = කරනු ලබන කොටුව යයි කියත්; **කවජී කඬු ඇසි** = කවච කඞ්ඩු නාදී වූ; **සන්නාහ** = යුඛ ඇදුම සි; **අවිගුළු කල්හි එව්** = ආවුධ යන් ගළිත වැ ගිය කල හෝ; **අරජ විවසු මහණු** = ආරබ්ධ විදර්‍ශන භික්‍ෂූහු ගේ; **වත්** = වසතුව සි;—

29. අරජ විවසු මුනණු වත්.

පුනි සුත ගානු ඇති = කුණු වැ ගිය සිරිරි ඇසි;—

187. 'සිද් හතු මතු පමණහු' යනු **'සිද් හතු පමණහු සී'** ගන්නේ. 'අබ ඇට පමණ වූවාහු' යන අර්ථ සි. **'කළායමත්තා'** යනුවට 'මැහැ අට පමණහු' සී. මෙහි පැහේ. 'වනකො ච කළා යොථ' යනු නිඝණ්ටු හෙයින් 'කඩල පමණහු' සී ද යෙත්.

ඩෙබර පක් පමණහු = පැසුණු මසන් ගෙඩි පමණ වූවාහු; (බදර > දබර > දෙබර > ඩෙබර සී සිඩ සි.) **ඇඹුළු පක් පමණහු**= ආමලකී ඵල පමණ වූවාහු; ඇඹුළු නම් නෙල්ලි ය; **බෙල් බොබොළු පමණහු** = තරුණ බෙලි පමණ වූවාහු; (මෙහි 'බොළු' යනු ද්‍රවිඩ

වචු ශබ්ද පසීාය ය. ගැබ් බොළු – ගොබොළු යනු වේ. **ගොබොළු** > බොබොළු යනු වේ. පොත්හි එන දිඝිය විපර්‍යය සි.) **පිලි ජැගිය නො හැකි** = පොෂණය කරනුවට නො හැකියෙක් විය; **දැල් පූ බඳු** = ජාල පූපයක් වැනි විය. (දැල්පූ නම් 'ආස්මිය' 'එඬිපූ' යනු ත් තත් පසීාය සි.) **සිවුරු අතුණු** = සිවුරු දෙවුනා ඔරුව; **හන් සිවුරු** = හැඳි චීවර ය. ('ඡාදෙ – අච්ඡාදනෙ' යනුයෙන් 'හද – හැඳීමෙහි යන ධාතු හෙළුවට ලැබේ. අදි වගීාන්ත සංයොගය කොෂඨාහත සි. දකාර ලොපයෙන් පසු මාත්‍රාංශ වෘඩිය ලැබ හඳ > හද් > හන් යනු වේ.) **කය මූ විසඳුණ ඇති සේ සි** = පහ වැ ගිය සිතැන්තේ වෙසි; **සියවි හෝමෙන්** = ප්‍රකෘති ශයනයෙන්; **හෙනිය** = ශයනය කරන්නියගේ; **හැම කල මැ හෙනිය සි සේ සි** = හැම කල්හි මැ ශයනය කරන්නියගේ යනු කි නියාසි. **ඉඡීවනින්** = ඍජු වණීයෙන් – ඍජු සංස්ථානයෙන්, ආකාරයෙන්; **බුහුරු ඇතියා** = ශුශිරාන්විත වූ –සිදුරු ඇත්තා වූ; (සුසිර > සුසුරු > සුහුරු > හුහුරු > වුහුරු > බුහුරු යනු වේ.) **ඝුන්මා (ඝුණුවා)** = ජීණ වූ; **එහි මැ සියනි** = ඒ ස්ථානයෙහි මැ හැරලති; **හැඳ පාසි අළු** = සන්ධි පාද ප්‍රතිපාදයක්;

(ඤ්) හැඳෙහ පාදයන්ට තබන අඩය මසඳාධාර – පට්පාද නාමයන්ගෙන් පාළියෙහි එසි. සංස්කෘතයෙහි 'සන්ධි' යනු ඇඳට නම්. 'අළු' යනු ද්‍රව්‍ය 'අඩෙ' යනු හා සම්බොව බලනු.

සාළින්දි (පාළිඳි) = පාද ඝර්ෂණාවක් – පා ගවා දෙවන **පුවරුඝඩ; පුවරු සිටු** = පදර පීඨය – බන්කුව; **ගෙනෙනවි නිසි යෙක් නම්** = ගන්නට සුදුස්සෙක් නම්; **ලිහිණි වැඩියෙක්** = සාකුණිකයෙක්; **කකුල් ඇමනුස්** = කොණ්ඩා ඇට ද;

(ඤු) සංස්කෘතයෙහි **'කකුද්මති'** යනුදු හින්දි ආදියෙහි **'කාඩකාලි'** යනුද ඝාටයට නම්. 'කකුද්' යනු **කකුල්** වීය හැකි. ආසන්නොපචාර නසින් ජඬඝා වාචක වේ.

රෙසෙහි (රෙසෙසි?) බත්පත් කල්හි = රසක හත්තය පිසූ කල්හි; මස් රස සහිත බත රෙසෙහි බත නම් වේ. **රෙසෙහි පත්** = රස සහිත බොට පිසනලද; **පිඬවාසි** = පිණ්ඩපාතය සි; **බුදුන් අර හන් ඵලය** = අවබොධ කරන ලද අහිත්ඵලය; **නො එක් මේ හැම සූහිහාව ඇඩි** = අනෙකවිධ වූ මේ සියලු ප්‍රනිහාවාදි ආදීනවය;

30. පූතිගත්ත තිස්ස මහ තෙරුන් වත්.

ගෙදිමුළු = ගොරුප සමූදය; **සගිරන්** = හිරණ්‍ය සහිත වූ; **බොහෝ ද්‍රව්‍ය ඇතියේ** = බොහෝ ධනය ඇත්තා වූ; **බොහෝ**

උවාරණ ඇතියේ = බොහෝ උපකරණ ඇතියා වූ; **වළඳ කරවා ලබන** = පරිභොග කරනු ලබන; **මහා සැපත් ඇතියේ සි** = මහා සම්පත්ති ඇත්තේ සි; **උපජන පැල** = උපදනා වූ පිඬාව; **දව්ය වොලොව සි සේ සි** = ධන විලෝපය යනු කී නියාය; (විලොප > විලොව් > වොලොව් යනු වේ.) **සැණමිකිරීම** = සැණ පරිපාකය; **පිරි පැසුණු බැවු** = පරිපක්ක භාවය – මෝරාගිය බව; **පිරිණම සූ සේ සි** = පරිණාමය – මිහිකිරීම යනු කී සේ සි; **වෙරි යෙක්** = වෛරියෙක් – සතුරෙක්;

188. 'වටෙක් නිසා' යනු මෙහි තිබෙයි. උදන් අටුවායෙහි "තස්ස ගාමස්ස අනන්තරගාමවාසිනෝ කිර එකං තළාකං නිස්සාය" යනු ආයේ ය. එහෙයින් "**වැවක් නිසා වෙර බඳ මිනිසෙක්**" යි ගත මැනව.

189. 'මිදිමි' යනු මෙහි පැනෙයි. මතු මහසුප් මහතෙරුන් වත්හි '**මින් දිබියහව්**' සි එයි. '**මිත්ත දුහි**' යනුයෙන් '**මින් දිබි**' යි බිඳ ගත් සැටි ය. 'මිදිමි' යනු අවපාඨ සි. **මින්දිබි** නම් මිත්‍ර ද්‍රොහියා ය.

වරජනහු = අපරාධකාරීහු; **බෙත්තාදි විසඟි** = බෙත්ත වඳු ආදිය විෂයෙහි; **නොසේ තබනලද බැවින්** = අයොග්‍ය ලෙස තබන ලද බැවින්;

190. උදානහි 'සුත්තනෙත්තන විත්ථාරාය කථානං' යනු උදානහි සුත්තනෙත්තන විත්ථාරාය කථනං' සි හෙළටුවා පාඨ ය ගන්නේ. '**උදාන සුත්තනෙත්තන විත්ථාරෙත්වා කථෙතබබං**' යනු ඒ වාක්‍යය පාළියට නැඟීම සි. සතරවන වග තුන්වන උදාන සූත්‍රාන්ත යෙන් විස්තර කොට කිවයුතු යනු අර්ථ සි.

31. නාදී ගොපාලයා වත්.

සොරෙය්‍ය නුවර උපනුවා = එනම් නගරයෙහි උපන්නී වූ (ධම් දෙශනාව);—

191. 'දුටුවෙනි' යනු '**දුටු ධම් වෙනි** සි ගන්නේ.

දුටු ධම් වෙනි පවු කැමින් = දිටඨ ධම්ම වෙදනීය පාපකම් යෙන්; (පුරිස නිමිත්තාදියෙහි විස්තර විභාවිනිටීකා රූප කාණ්ඩ යෙන් ගන්නේ සි.) **අවරවිරිවෙනි පවු කැමින්** = අපරාපරිය වෙදනීය පාප කම්යෙන්; **අනිසූචි චරති** = අසී සූචි වර ධාතු තොමෝ;

කරාල් කුලෙක්ගි = තුලාධර කුලයෙක්හි; **පරදුරෙසු භවං** = පර දූරියන් කෙරෙහි වූයේ; **පාරදුරියං** = එනම් වේ; **තං ච තං කම්මං චාති** = පරදූරිය වූයේ ත් හේ ම ය කර්මය වූයේ ත් හේ ම නු යි; **පාරදුරිය කම්මං** යනු වේ. **සහවාස පිණ්ඩිස** = එක්වැ විසීම් ප්‍රත්‍යය කොට ගෙන; **පිණ්ඩපස** = ප්‍රණීත ප්‍රත්‍යය; **පිළියෙල කරන ලදු** = සම්පාදනය කරන ලද්දේ ය; **සිපගැනැ** = ප්‍රූපනය කොට ගෙන –වැළඳ ගෙන; **සැකැවි** = සඤ්ඤා කොට; **අලලස්**= ආලොළ කොට – කැලඹීමක් කොට; **එකලාබවට** = ඒකලභාවයට නො මුසු බවට; **එකත් අරමුණට ගිය සිත් ඇතියේ එවි** = එකත්තාරම්මණයට ගිය සිත් ඇත්තේ හෝ;—

32. සොරෙය්‍ය සිටුපුත් වත්.

තුන්වන චින්තවග අටුවා සත්‍ය නිමි.

පොළොව කියෙගි ඇලුණවුන් = පොළොව පිළි බැඳි කථා යෙහි ඇලුණා වූ (භික්ෂූන්); **ඌවටන් හල්හි** = උපස්ථාන සාලායෙහි; **බුදුන් ඌවටනාව්** = බුඩොපසථානය පිණිස – බුදුන් වෙත එලඹ සිටිනුවට; **මහණුන් පිඬුවන** = භික්ෂූන් රැස්වන්නා වූ; **හල්හි ය සි සේ සි** = ශාලායෙහි ය යනු කි නියායි; **මඩ කිහිලි** = මඩ බහුල කොට ඇති; **හකුරු කිහිලි** = සකඛර (සැටගල්) බහුල කොට ඇති; **ඉන්ද්‍රිය බඩයෙන් බැහැරි වූ බැවින්** = චක්ෂුරාදි ඉඳුරන් හා බැඳී පවත්නා ආධ්‍යාත්මික පොළොවෙන් බැහැර වූ බැවින්;

192. 'නිජිය හැසෙයිහිවූ' යනු '**නිජිය හැසෙයිහි වූ**' සී ගන්නේ. නියසාඤ්ඣානයෙහි – සිය සතන්හි වූ යන අර්ථ යි.

අජකනෙන භවා = අදහැතියෙහි වූවා; '**අජකනතිකා**' යනු වේ; **සා ච සා** = අද හැති වූවා ත් ඕ තොමෝය; **පඨවි ච අති** = පොළෝ වූවා ත් ඕ තොමෝ නු යි; '**අජකන්තිකා පඨවි**' යනු වේ. **ගැටජාවන්** = හටගත් ගැට ඇති පුෂ්පයන්;

33. පන්සියක් මහණුන් වත්.

193. 'මිරිහු පැවැති කම්ඵන්' යනුවට වඩා '**මිරිහු පැනති කම් ඵන්**' යන අධොලිපි පාඨය මැනැවි. **මිරිහු පැනති කම් ඵන්** = මරීචි ප්‍රඥප්තිය මුල් කොට පැවැති කර්මස්ථාන ඇති; **සුලඟින්**

සඤ්ඤ දිට්ඨ රූප මෙ = සුළඟින් සම්පීතවන සූයඃ රශ්මිය මැ; **සිරුරු ඇති බඳු වැ** = මූර්තිමත් වූවක්හු වැනි වැ; **පරික්ඛ නැති බල්ලට** = පරීක්ෂා විරහිත බාලයාට; **කිසිවක් බඳු වැ** = ගත යුතු කිසි වස්තුවක් වැනි වැ; **වටහයි** = උපලබ්ධ වෙයි; **පරික්ඛ ඇතියනට** = පරීක්ෂාන්විතයාට; **ධම්මසමූ මිස** = නාමරූප ධර්ම සමූහය හැර; **කිසිවෙක් නො වෙයි** = ගතයුතු කිසි වස්තුවෙක් නො වෙයි; **සැඬ දිය සිඳ ඇති හෝ** තෙරෙක්හි = වණ්ඩ වූ ජල ස්‍රොතස් ඇති හොවැලයෙක්හි; **බැල නැති අවින්** = අබලාවී යෙන්; **දුඛුල් අවින්** = දුර්ලාවියෙන්; **නො ඇඬනි අවින්** = 'අනඩනිය' අවියෙන් – බෝකල් පැවැත්මට නුසුදුසු ය යන අවියෙන්; **උවකුම් නැති වැ** = උපක්‍රම රහිත වැ; **උවක්මෙන්** = උපක්‍රමයෙන්; **දික් කල්හි** = දිගි කාලයෙක්හි; **පැවතුන් නො සහනු** = පැවැත්මට අසමර්ථ බව සි; **මද කලෙක්හි** = අල්පකාල යෙක්හි; **පිරිසුනු** = පරිච්ඡින්න වූයේ ය – මද කලක් හිම් නොට ඇත්තේ ය; **ගැන්මට එළඹෙන බඳු** = ගතයුතු බවට පැමිණෙනුවක්හු වැනි; **ගහණං ගය්හං** = ගැනීම 'ගය්හ' නම්; **තං උපගච්ඡතීති** = ඒ ගැනුමට එළඹේ නු සි. **'ගය්හූපගා'** යනු වේ; **කිණි අවින්** = ක්ෂණිකාවියෙන්; **වටහන අවින්** = එළඹ සිටින අවියෙන්; **මිරිඟ හසි** = මරීචිය හා **සමසභාව ඇති** = සම ස්වභාවය ඇත්තේ යසි;—

194. 'පපුප්ඵක නම් වටු' යනු **'පුප්ඵක නම් වටු'** සි ගන්නේ. පුප්ඵක නම් වට්ටය සි.

හේ = ඒ වට්ටය; **තම් සෙලෙස් විවහ විසින්** = තම් සෙලස විපාක වශයෙන්; **නො එක් වන බැවින්** = අනෙකවිධ වන බැවින්; **පපුප්ඵකානි ච තානි** = අනෙක විධ වූ වට්ටයෝ ද ඔහු ම ය; **තථා පඤ්ඤත්තියා සඞ්ඛාතානි චානි** = 'පපුප්ඵක' යන ඒ ප්‍රකාර ප්‍රඥප්තියෙන් කියන ලද්දාහු ද ඔහු ම නු සි; **'පපුප්ඵක සඞ්ඛාතානි'** යනුවෙන්; **පපුප්ඵක යන නම් ලදුවන සූ සේ සි** = 'පපුප්ඵක' කියන් නාමය ලදුයේ වන්නේ ය යනු කී නියාසි; **කිඤ්චි මෙ** = කිවෝ ද වෙත් මැ සි; **ඡිජ්ජිඩානි** = සිඳය යනු; **පඤ්ච කාම ගුණ කොට්ඨාසෙ** = පස්කම් ගුණ කොටසෙහි; **තණ්හං ඡිජ්ජිඩා ඉති** = තෘෂ්ණාව සිඳැයැ යනු; **යූ සේ සි** = කී නියාසි;

34. එණ්ඩුපම වත්.

මහත් දිය සිළින් = මහත් දක සොතයෙන් – මහත් ප්‍රවාහයෙන්; **වැකිරී** = අවතිරණය කොට – යට කොට; **ඇල හසි** = අයො සලාකාවන්; **ලා** = ප්‍රක්ෂෙප කොට;

195. 'පමණුවට' යනු '**පනිතුවට**' යි ගන්නේ.

පනිතුඹට = පැනීම පිණිස; **වේ පුරා** = වෙග පූරණය කොට ගෙන;

196. 'පමණ නා තන්හි' යනු '**අසුරියන් පමණතන්හි**' යි ගන්නේ.

අසුරියන් පමණ තන්හි = අශීති රතන ප්‍රමාණස්ථාන යෙහි; **කොළින් සිවි හුණු කලබ** = කොටියෙන් සිටි වෙණු කලාපය; **අසින් කඩමින්** = කඩුවෙන් ඛණ්ඩනය කෙරෙමින්; **මෙසේ කියන්** = මේ ප්‍රකාරයෙන් කි කල්හි; **එක් වෙසින්** = එක වෙගයෙන්; **හැම කලබ** = සියලු කලාපයන්; **සුනු වේ** = ඡින්න වී යැයි කියන ලද්දේ වේ; **එක එකි** = එකක් එකක්; **සිඳි වෙයි** = ඡින්න යැයි කියන ලද්දේ වේ; **අසුරියනක් පෙමෙණි අහසට නැඟී** = අසූරියනක් පමණ ආකාශයට ලඬ්ඝනය කොට;

197. 'එක් කලබගින්' යනු '**එක් කලබ බැගින්**' යි ගන්නේ. පූර්ව වාක්‍යාර්ථය මෑ මෙසිනුදු කියැවේ. මෙසේ කියන් 'එක් වෙසින් හැම කලබ සුනු වේ. එක් කලබ බැගින් සෙද් වේ' යනු එක වාක්‍යයක් දෙපරිදි වැ ගිය බැව් හැඟේ. '**මෙසේ කියන් එක් වෙසින් එක් කලබ බැගින් සෙද් වේ**' යි ගුඩ කටයුතු බැව් පැනේ.

ලහායෙහි = සලාකායෙහි–යකඩ ඉන්නෙහි; **අනුකරණ**= සමාන වන ශබ්දයෙකි; **වේ පුරා අසින් නො පහළ බැවින්** = වේගය පුරා කඩුවෙන් පහර නුදුන් බැවින්; **හැම කලබ නිමියා දැනැසි** = සියලු කලාපයන් නිමියවුන් දැන; **උසා මද කළ බැවින්** = උත්සාහය අඩු කළ හෙයින්; **නො පිරිය යෙන්** = වේග පූරණය නො කෙළේ යයි කියත්; **නැයන් හා සුළවුන් අතුරෙහි** = ඥතීන් හා සුහෘදයන් අතුරෙහි; **නැ සුළවුන් අතුරෙහි එව්** = ඥති වූ සුහෘදයන් අතුරෙහි හෝ – යහපත් සිතැති නැයන් අතුරෙහි යි සේ යි; **පෙමෙණින්** (**පෙවෙණින්**) = ප්‍රවේණියෙන් – පරම්පරා වශයෙන්; **වැළඳියයුතු රජය** = ප්‍රයොජන ගතයුතු රාජ්‍යය යි; **සිඟහ දියයුතු** = සතත ඥතව්‍ය වූ; **වැවියවි වූයේ** = උපස්ථාන කරනු කැමැති වූයේ; **තොප තැන සිටැ** = තොපගේ ජේට්ඨ තන්හි සිට; **බිඤ සඟහු නියන** = භික්ෂු සඞ්ඝයා

(භික්ෂූන් නිසි තැනට) පමුණුවන; **මහණක්හු යූ සේ සි** = ශ්‍රමණයකු යනු කි නියායි; **විඩෙවූ පත්තේ** = අන් අරමුණකට මෙහෙයන ලද සිතැති බවට පැමිණියේ; **කිව්වනතර පසුත වැ** = වෙන කටයුතුවල යෙදී; **සහඟු සතප්න තැන්** = භික්ෂූන් වළඳන සථානයන්; **පවස් කෙළේ සි** = පපව කෙළේය; **සතපතුවට ගමන්** = වැළඳීම සඳහා යාම; **ලස් කෙළේය සි සේ සි** = පමා කෙළේය යනු කි නියායි; **ඉතිරිසින් ඇත්තඟු නම්** = අධික පුණ්‍ය වන්නතයෝ තමාහි; **කරුණ විසි මෙත්** = කාරණ වශිකවෙති; **සින් තුබූ සෙසින් නො ගොස්** = සිත පැවැති පරිදි නො ගොස්; **හේ තුබූ සෙසින්** ගෙහි = හෙතුව පැවැති පරිදි යන්නාහ සි; **සේ කළෝ** = ඡේද කළහ – විනාශ කළහ; **හුමයූහ**= හේම කළහ – පරික්ෂය කළහ (පාළියෙහි 'ඛෙම' ශබ්දය **ක්ෂයාර්ථ** යෙහි වැටේ. ඉන් 'හේම' යනු ආ යැයි හැඟේ. "ඒ හරබා මිරිස් පැළ පොළොවට හේම කරලා කැවා" යනාදි බැවහර උතුරු මැදයෙහි අදත් තිබේ. 'පොළවට ගෙවා හැරලා' යන තේරුම් සි. තවද සොයා බලනු.) **ගමන් සඤඤ** = ගමන ගැන හැඟීමක්; **එළඹනුවව්** = උපගමනයට; **නො යෙදේ** = යුතු නො වේ; **රියෙන සෙසින්** = රැව්වනය වන පරිද්දෙන්; **දකුත්** = දුටු කල්හි; **ඇදුරු ඇති වැ** = ආදරාන්විත වැ; **පිරික්ඛි පිරික්ඛි** = ආසනයෙන් උඩ නැඟ නැඟ – ඇඹරි ඇඹරි; ('පරක්කු' යන දුර්වච වචනය දෙස බලනු.) **ඇති වත්** = විද්‍යමාන වසතුව; **වල හත්** = සහවත්;—

198. 'අකිඤ් බොඤ් ඇසි' යනු '**කිඤ් බොඤ් ඇසි**' සී ගන්නේ.

කිඤ් බොඤ් ඇසි වත් ඇත ද = ඛඤ්ඤ භොඤ්ජාදි වසතු ඇත ද: (මේ '**කිඤ් බොඤ්**' යන පාඨය '**කඳු බොඳු, කිදි බිදි, කිදි විදි,** යන රූපාන්තරයන්ගෙන් ද ග්‍රන්ථාන්තරයෙහි දක්නා ලැබේ.) **බොහෝ වත් ඇතියෙහි** = බොහෝ වසතු ඇතිකල්හි; **පිණිවත්හි** (පිණි වත් ඇතියෙහි?) = ප්‍රණීත වසතු ඇතිකල්හි; **රුළක් දෙත්** = රූක්ෂ වූවක් දෙති; **බණ කියනුවා** = ධම් දේශනය කරන්නහුගේ; **කි පමණ** = කවිත ප්‍රමාණය; **නො විඳිත්**= විඳනය නො කෙරෙත්;

199. 'මරණ සිමිවිහි' යනු '**මරණ සිමිවහි**' සී ගන්නේ.

මරණ සිමිවහි වූ වෙසින් = මරණ සමීපයෙහි වූ වෙද නාව; **මරණතෙන භවං** = මරණයාගේ සමීපයෙහි වූයේ; '**මාර**

ණානනිභං' යනු වේ; **පහසින් කපු** = පසාධන භප්පහ තෙම් – අබරණ පලඳවන කපුතෙම්; **හිමන් හිමන් අටමස්** = හෙමින්ත හිමිහාන අවමඝ; **වහරේ හල්ගි** = මෙඝ කාලයෙහි; **මියුරු පල වැලයෙන්** = මධුර ඵලාඵලඝයන්; **උපජන රොව් වලක නුවට**= උපදනා රොග නිවාරණය පිණිස; **සවස් හය රැසිමේ** = සවස හා දින මුඛයෙහි – උදය වේලෙහි; **සිපෙදි** = (මේ 'ඉහිසි' යනුවට අර්ථ කි සැටි ය. 'නැවැතැයි සේ සි' යනුවෙන් එහි අර්ථය පැහැදිලි කොට නිබේ.) නැවතියේය; ('සිපෙරි' යනුයෙහි ආගති ගති සෙවියයුතු.) **පිරිසුණු වූ** = පරිපූර්ණ වූ; **කම්නියඝෙන** = කැමැති විය යුතු අර්ථයෙන්; **කාමා** = එ නම් වෙත්; **උපභොග පරිභොග භණ්ඩානි** = උවබෝ පිරිබෝ බඩු සි; **සබ්බ ච තෙ කාමාච ඉති** = සියල්ල වූවෝ ත් ඔහුමය කාම වූවෝ ත් ඔහු මේ නුයි. **'සබ්බකාමා'** යනු වේ; **සම්ඩා සබ්බකාමා සි** = සුමුදුවූ හැම් කාමයෝ කියා; **සම්ඩ ශබ්දඝහට** = සම්ඩ ශබ්දයාගේ; **පරනි පාත කොට** = පරකොට හෙළීම කොට; **තෙ** = ඒ සම්ඩ සබ්බ කාමයෝ; **ඝසස සනති** = යමක්හු හට ඇත් ද; **තං සබ්බකාම සම්ඩිනං** = ඒ සබ්බකාම සම්ඩියා; **අසපිඝයති** = ආශ්‍රම පදයෙහි– පසිලි පැල්හි; **පස් හය් මුසු පවිවෝ** = පස් හා මිශ්‍ර පවිතයෝ; **සුබාසිඝෝ** = සුභාෂිතයෝ, **ඔම්මූපසංහිත ඔස් සි ඝේ සි** = ධර්මය ඇසිරි කොට පැවැති වචනය යනු කි නියායි; **මොනොවට සිළි ඝයළ කළ වූ සි ඔස් සි** = මනා කොට සම්පාදනය කළා වූ යනු කි නියායි; **මස් අවුළෙන් යුතුවහු** = මාංස ව්‍යඤ්ජනයෙන් යුක්ත වූ; **උපසෙවන නම්** = බහට රස ඉසින ව්‍යඤ්ජනය සි; (මේ අර්ථයෙහි වැටෙන 'සංසඪ' ශබ්දය පරිකල්පිත කොට ගෙන 'ඔවුළු > අවුළු' සද නිපදවා ගත්හ.) **උපසිඤ්චනති එතෙනාති උපසෙචනං** = මේ කරණ කොට ගෙන රස නිසෙකය කොරෙන් නුයි; **උපසෙවනං** = එනම් වේ; **මංසෙහි සම්පාදිතං උපසෙචනං**= මසින් පිළියෙළ කළ උපසෙවනය; **'මංසූපසෙචනං'** යනු වේ; **රැසි උපයවති** = රුචිය උපදවද්ද; **වළඳසිඳ් නම්** = වළඳන් නේ ත් වේද; **විසන් වැ** = විසඳුන් වැ –විශ්වාසයට පැමිණ; **රසහු**= රසයෝ; **විස්වස් පරමකොට ඇතියහු නො** = විශ්වාසය තිම් කොට ඇත්තාහු මැයි; **විස්වසින්** = විශ්වාසය කරණ කොට ගෙන; **මියුරු වුනුවෝ නො සි ඝස් සි** = මධුර වන්නාහු නො වෙද්දැයි කි නියායි; **සැහැ රජ්ජුරුවන් අබියෙසව්** = ශාක්‍ය රජ දරුවන්ගේ අභ්‍යාසයට – සමීපයට; **සවර සැ රජ්ජුරුවහ** = සවර ශාක්‍ය රජදරුවන්හුගේ; **ඉතිදි නෑ කොටස් ඇතියා** = අධික සැතැකි කොටසක් ඇත්තෙහ; **ඉතිදි බල කොටැස් ඇතියා**=

අයිස සෙනා කොටස් ඇත්තෙක; **රිවින් උතුම් බැව් පැතියෑ**= රූපයෙන් උත්තමභාවයට පැමිණියාය; **සිළිපියා පුත්හු** =. චූළ ජනකයාගේ පුත්‍රයාගේ; **තෙමෙ බුජුමින් හිදැ** = තෙමේ අනුශව කරමින් හිඳ; **දුම කැඳවය්** = දුවට ආමන්ත්‍රණය කොට;—

200. 'එස තැවියෙහි බුජුනාව්' යනු '**එස තැවියෙහි බුජුනාර**' සි ගන්නේ.

ඇයි = ඇය හා; **එස තැවියෙහි බුජුනාරපැයි** = එස තව්ටසයෙහි වළඳන ආකාර දක්වා; **ඇය බුජුමින් හුන් සද** = ඇය වළඳමින් හුන් කල්හි; **තුමා පුරෙ අතින් ගත් පිඬ** = තමා විසින් පළමු අතින් ගත් පිණ්ඩය; **තමා මියෙහි තබා** = සවකිය මුඛයෙහි තබාගෙන; **බිසෙයි** = අභිසෙක කෙළේය; **බිසුරු සැහැවු ඇතියේයි** = බධිරසවභාව ඇත්තෙක; **ඉතා ප්‍රිය වැනි ඇ** = ඉතා ප්‍රිය තැනැත්තියක වන්නිය; **වරලබනුවට**= වර ලැබීම පිණිස; **ඉතා නුසිය** = අතිශයින් යොග්‍ය වූවා වන්නිය; **කුලසැනි නමෙක්** = කුල සන්තක නාමයෙක්; **ඇන් පොතලු අස් පොතලු ඇසින්** = හසති පුත්තලිකා අශ්ව ධුත්තලිකා ආදි යෙන්; (පුත්තලිකා නම් ගෙනැ කෙළනා වස්ත්‍ර දන්නාදින් නිර්මිත පෙතැලි රූය;) **දුස දුවයන අතුරක්** = දුසියගේ දුවය යන භෙදයක්; **මහත් කලහලි** = මහත් කල කලයක්; **සුන් ගෙලෙන්**= කපන ලද බෙල්ලෙන්; **බටලේ** = බැස්සා වූ ලෙය; **දුන් පෙර හැර** = දෙන ලද සත්කාර පූජා තනතුර; ("වජ්ජනෙ පරිහාරො ච සක්කාරෙ වෙව රක්ඛනෙ' යනු නිඝණ්ඩු සි.) **අසිදැ** = පැහැර ගෙන; **ජාති සොධනුවටපු** = කුලය ශුද්ධ කිරීම පිණිස ද; **සදටපු** = ශොධන කෙලසන දෙනට මැ; **දර ඇරනියකට** = කඩ හාරිකාවකට; **බිසෙස් දැ** = අභිසෙක දිනයෙහි; **ගිස් නහන** = ශිරී ශොධනය කරන; **පජනේ** = පාජනය කරන්නේ-පදින්නේ; **එළියේ** = එළකයෙහි – එළිපත්හි; **පොකුරුණී පවුරෙන්** = පුෂ්කරණී ප්‍රාකාරයෙන්; **ආරක්ඛාය නියුත්තා** = අරක්ෂා නියුතු වෝ; 'ආරක්ඛිකා' යනු වේ; **ලිහිණියන්ට ඔවස් දෙනු සදහා**= පක්ෂීන්ට අවකාශ දීම පිණිස;

201. 'පතිඨඨානං' යනු '**පවිඨඨානං**' සි ගන්නේ.

නැඹ පවා = රථ නාභිය තාක්; **හැලුණු තැන්** = පොලෝ තෙලෙහි ගිලී ගිය ස්ථානය; **රිය හිස්හි** = රථ මුඛයෙහි; **නුහු බදහු** = අනු බන්ධනය කළහ; **දුනුදිය පෙළි** = ධනුජ්‍යා පොය්නය කෙළේය. ('අළි' යනු දෘඝාමන්ත්‍රණ සි.) **වැදගිය සුතු තා** =

විධාන කළ යුතුතාක් දැය; **මෙසෙසින් වැටෙවසි අනුසැසැ** = මේ ප්‍රකාරයෙන් පවතුව සි අනුශාසනය කොට; **නිමුල් දරුවන්**= යමක පුත්‍රයන්;

(සිංහ) ප්‍රාකෘත 'ජමල' ශබ්දය හා සසඳ බලනු; ඉන් විකෘත වූ 'ජිමුල්, ජිමල්' යන රූප සමාන වැ 'නිමුල්, ඉමල්' යන රූප සිඹ යැයි ඇපි සලකමු. "ඉමල් හලමුනි ලෙසින් වදහළ මෙලෙස රකිනුව මෙත් සිතින්." (පැරකුම්බා සිරිත.)

දුහුඩු = වැදුවා ය; **කුඑ සටනින්** = කුට අවිටයෙන් – වඤ්චා සහිත අධිකරණයෙන් – හොර නඩුවෙන්; **පරයනු ලදුවෝ** = පරදනු ලැබුවාහු;--

(සිංහ) පාළියෙහි විහිංසාවියෙහි වැටෙන 'හෙඨන' ශබ්දයෙක් තිබෙයි. තදනුසාරී 'හඨානා' සදෙක් දඹදිව දෙශභාෂා යෙහි තිබෙයි. ඒ දෙකට මැ සමාන ලෙස 'හටන්' යනු හෙළයෙහි නිපැනැයි අපගේ සල්ලිතයෙකි. **හ** කාරයට **ස** කාර වැ 'සටන්' යනු වේ. 'සිරියෙල්' යනාදියෙහි මෙනි.

විනිච්ඡයෙ නියුත්තා විනිච්ඡයිකා = විනිශ්චයෙහි යෙදුණෝ විනිච්ඡයිකයෝ නම් වෙති; (නොහොත්) **විනිච්ඡයො යෙසං අත්ථි තෙ විනිච්ඡයිකා** = විනිස යම් කෙනක්හට ඇද්ද ඔවුහු විනිච්ඡයිකයෝ නම් වෙති; **අනත්ථමෙම චරියසති ඉති** = මට අනර්ථයක් කරන්නේ යයි; **උපන් අඟා සින්** = උප්පන්න ආඝාත චිත්තය – උපන් ක්‍රොධ සිත; **නිඟත** = මැඩ ලන්නට; **ඒනා හොසි** = නො හැකිවී; **එක් අජර කුලෙහි සිප් ගතුවා**= එකාචාර්‍යකුලයෙහි ශිල්ප ග්‍රහණය කළාවූ; **තුමා සෙනෙවියා** = තමාගේ සෙනාපතියා; **හිහ තබා** = ඉහ තබාගෙන;

(සිංහ) පාළි 'උච්ඡඛ' සංස්කෘත 'උත්සඛ' යන දෙ ශබ්දයන්ගෙන් එක්හරාවකට සමවන සේ ජඛ > සඛ > සිහ > හිහ > ඉහ සිද, මුළු ශබ්දයෙන් උසුහු > උනුළු > උකුළු > ඉකිළී සිද සිඹ යැයි සංකල්පිත සි.

දෙනිස් පුතුන් හස් සෙනෙවියා හස් = දෙනිස් පුත්‍රන්ගේ හා සෙනාපතියාගේ ද **ජීවිතින්ද්‍රිය පිළිබඳින්** = ජීවිතෙන්ද්‍රිය සම්බන්ධයෙන්; **දෙනිස්ණින්** = දෙනිස් පුණිසාවන්–යෙහෙළියන්; **අඟා** = ආඝාතය – වෙෂය; **මනං පදූසෙනිති** = සිත ප්‍රදූෂණයෙන් දූෂණය කෙරේ නු සි; 'මනො පදොසො' යනු වේ; **වැන්තා දන්න හවී** = වාතී දැන ගැනීම පිණිස; **වුහුවු සිදිමිනිහු** = හළ පුරුෂ

යෝ; **නහන ඔවසක්** = නහාලිමට අවකාශයක්; **උණ්හ** = නළුල් පවය; **පාදුකා** = රන් මරවැඩ් සහළ ය; **මෙහෙ කරනියන යුෂේ සි** = අනෝර පනෝර කරන්නියන යනු කි නියායි;--

202. 'විරසේ' යනු '**විරිලිසේ**' යි ගන්නේ. 'විරලච්ඡායා' යන අර්ථ යි.

තිරු දිලිහන කල්හි = සූයඩියා ජවලනය වන කල්හි; (දිලිස – දිලිහිමේහි යන ධාතු යි.) **මේ ගැන කිසු හොවැ මේ** = මේ සඳහා කියන ලද්දක් හොට මැ; **ශබ්දච්ඡලයෙන්** = ශබද ලෙශයෙන්; **අභිප්‍රාය වනාහි** = අදහස බළන්; **ශරීරච්ඡායා** = සිරිරි සෙවණ යි; **සතින් නො නහනුමෝ** = ආයුධයෙනින් නො නසන්නාහු; **සඤ්ඤන නහනහිති** = සැනින් නසත් නු යි; '**සඤ්ඤ ඝාතකා**' යනු වේ; **න සඤ්ඤ ඝාතකා අසඤ්ඤ ඝාතකා** = සඤ්ඤ ඝාතක නො වූවෝ අසඤ්ඤ ඝාතකයෝ නම් වෙති; **අභිඝාමිහි හික්ඛාමෝ** = ආයුධ ඝාම්යෙහි ශික්ෂිතයෝ වෙමු; **සඤ අත් ඇනියමෝ** = පරිවය සඤ අත්, ඇනියෝ වෙමු; **කුලෙහි මහලු මින්** = කුලයෙහි ජෙෂ්ඨයන්; **වැවියමෝ** = උපස්ථාන සඤෝ වෙමු; **මහන් දුනු වාවමෝ** = මහත් දුනුවායෝ වෙමු;

203. 'සවසුදර' යන මෙහි '**දර**' යනු අධික යැයි ගැනේ.

පොරළ = පාරුත වූ – පොරෝනා ලද; **සවසු ඇනියහයි සු සේ සි** = සවව ඇනියෝ වෙතැයි කි නියායි; **පලතුරු සන් සිදුරු ඇසින්** = ඵලඝානන්තර ඝණ්චිඡිද්‍රානන්තර ආදියෙන්;(පල නම් නි වළඝන පලිහයි;) **පලතුරෙන්** = සරවාරණ ඵලඝානන්තර යෙන්; **පලතුරෙන් නික්මෙමින්** = ඵලඝානන්තරයෙන් නිෂ්ක්‍රාන්ත වෙමින්;

204. 'දෙඝන ගත් එලෙයි සඤල නො දක්වය් මැදින් නික්මෙත්' යනු '**දෙඝනත් පළය් කැළල නො දක්වය් මැදින් නික්මෙන්**' යි ගන්නේ.

දෙඝනත් පළය් = උභය ඝණිණාන්තයන් පලාගෙන; **කැළල නො දක්වය්** = ඝාළඝයක් නො දක්වා; **මැදින් නික් මෙන්** = මධ්‍යයෙන් නික්ම යෙති; **පලපුවරු නො විදු** = ඵලඝ පදරයන් වෙධනය නො හොට; **වෙර නො හි** = ශරීරයෙහි නො වැටී; ('වෙර' යනු පාළි සංඝෘත දෙක්හි මැ සම 'වෙර' ශබද යෙන් භින්න වේ. '**කුවෙර**' යනු සලඝා බලනු.) **වොදනාපිහි=**

මෙහෙයිම් අර්ථයෙහි; **එකක්හට දු වනස්** = එකකු ගේ ද විනාශය; **එකක්හුගේ උනුවක්** = එකක්හුගේ ද අඳුවක්; **මා පියා** = මහ පියාණන්; **මුත්තායය සි සේ සි** = නායක (ශ්‍රේෂ්ඨ) මුත්තාණන්ගේ යනු කී නියාසි; **ගහණක්** = ගැන්මක්; **මුස්නට පසක්** = මිදීමට හෙතුවක්; ('කොළ නො වේ' යන මෙහි 'කොළ' යනු '**කුලෙ**' යන ද්‍රව්‍ය වචනය හා සසඳ බලනු.) **තුමහ මෙ මෙළෙසි** = ඉඛෙහෙම් මිය යාම්; **දෙ මහපට ඇඟිලියන්** = පාද ගත මහ ඇඟිලි දෙක;—

205. 'නිස්හි පිරිවතුදු' යනු '**නිස්සි පිරිවතුදු**' සි ගන්නේ. '**නිස්සි**' කියා හෝ. **නිස්සි පිරිවතුදු** = සිහි නැති වැ පෙරළෙත් නමුත්; **නො හැරිය හැකි සෙසින්** = හරනට නො හැකි වන පරිද්දෙන්; **ඉළිසැ** = සොයා;

206. 'කුමුදුවා කුමුදු' යනුයෙහි '**කුමුදුවා**' යනු අධික සි. **කුමුදු බැවු** = නිමග්නවූ බව; **දැල් ගහා** = දැල් ගා; **වැටැල් ලෙන්** = (වැට + අලු + එන්) වත්‍රිලොකයෙන්-පහන් එළියෙන්;

207. 'වත් අතුරෙන්' යනු '**වන් අතුරන්**' සි ගන්නේ. අන්‍ය වස්තූන් ද - අන්‍ය භූමි ප්‍රදෙශයන් ද යන අර්ථ සි.

208. 'අඛණ්ඩ භූමි වසු නම්' යනු '**අනෑ භූමි වසුනතර නම්**' සි ගන්නේ.

209. 'ගෙ අතුරෙන්' යනුදු 'ගෙ අතුරන්' සි ගන්නේ. ගෘහාන්තරයන් - වෙන ගෙවල් යන අර්ථ සි. **වැලි මඩහි** = (මේ වනාහි 'වාලිකා පුලිනෙ' යනුවට අර්ථ කී සැටිය. පාළියෙහි මේ දෙ ශබ්දය මැ සාමාන්‍ය වාචකාර්ථයෙහි වැටේ. 'පුලින' නම් ගඩොඇ සමුද්‍රාදියෙහි ජලයෙන් උපදවන ලද තීර යැයි සංස්කෘත කොෂ යන්හි දැක්වෙයි. පාළියෙහි දෙක එක්කොට දක්වන තන්හි විශෙෂාර්ථයක් ඇති බව සිතිය යුතු ය.) වැලිතලා මතුයෙහි; **සින් නෝ** = (සිනි + ඕ) කුහුඹුවෝ;—

210. 'ඇල් වැසි' යනු '**ගල් වැසි**' සි ගන්නේ. 'පාණ වස්ස' යන අර්ථ සි.

211. 'නො පිසියෙන්' යනු '**නොපිසිය සෙසින්**' සි ගන්නේ. **සුපඵාරාමයෙහි කාක්** = සකල පුෂ්පාරාමයෙහි; **නො පිසිය සෙසින්** = පවිත්‍රතය නො කළ ආකාරයෙන්-නො නෙළූ ලෙස; **සිත්ගිය සේ** = සිත් ගිය පරිදි; **ගස්කාගෙන්** = ගස් ඇති පරිදි දෙන්;

35. විඩූඩභයාගේ වත්.

උපැන් = නිෂ්පත්තිය – සිඹිය; **සස්වත කිරියැ** = සත්‍ය පත ක්‍රියාව යි – සැබෑ කෑරුවීම යි;

212. 'තුමා ඇවිකම් නිපයන කිරිය' යනු 'තුමා ඇවිවි කම් නිපයෙන කිරිය' යි ගන්නේ.

තුමා ඇවිවිකම් = සවකිය ප්‍රාර්ථනා කම්ය; **නිපයෙන කිරිය** = නිෂ්පාදනය වන ක්‍රියාව යි යනු; **ශූ සේ සි** = කී පරිදි වේ. (ආසිසි > ඇසිවි > ඇඟිවි > ඇඟවි > ඇවිවි යනු වේ. 'කොවිවි' යනු මෙනි.) **උච්හස්** = නැඟී සිට; සම්බුද්ධස්ය = මහා කොට නැඟී සිට; **අරජ් විදිය වැ සි සේ සි** = ආරබ්ධ විය්‍යී වැ යනු කී නියා යි; **සම්මජ්ජන** = ඇමදීමය; **පරිහණ්ඩකාරණ ඇ විසින්** = ගොම පිරිබඳ කිරීම් ආදි වශයෙන්; පිළිජ්ගිඤ්ඤි = පොඟණය කෙරේ; **ධම් සහුණෙහි** = ධර්ම සඞ්ඝණියෙහි; **සිතුපා සඞ්ඛෙහි** = චිත්තුප්පාද කණ්ඩයෙහි; **සම් වැජ්ජි කුසල චිත්තුද්දෙසයෙහි** = සාමාවවර කුසල චිත්තයන්ගේ උද්දෙසයෙහි; (උද්දෙස නම් ඒ ඒ ධර්මයන් නමින් මුළු කොට දැක්වීම යි.) **'එස්සො හොති වෙදනා හොති යන ඇ විසින්** = ඵස්සය නම් දැයෙක් වෙයි වෙදනා නම් දැයෙක් වෙයි යනාදි වශයෙන්; **නැඟි** = දෙශනාරූඪ වූ; **පරෝපනැස් කුසල් ධම්මුන් ගැනැ** = පරසබට අධික කුශල ධර්මයන් සඳහා; **කියන්** = කථනය කෙරෙත්; **මල් බිඳුන දෙවිදූන් හා** = මල් කඩන දෙවධිතාවන් හා; **බුන් මලින් සජන** = කැඩූ මලින් සදැලන; **නිදින්** = නිද්‍රායෙන්; **සංවේ** = සංවෙගය; **ඔත පුවන් සැණ** = ඔත්තප්පත සැණය – බියපත්වන සැණ; **සංවෙග නම්** = එනම් වේ; **සංවෙග උපන් ක්‍රම** = සංවෙගය උපන් පිළිවෙළ; **සියදිවින්** = සවරූපයෙන්–ඇති සැටියෙන්; **දැක්වියැවි වැ** = දක්වනුවට කැමැති වැ; **දෙවිපුත්** = දිව්‍ය පුත්‍ර තෙම; **බික් සිහියැ** = භික්ෂාටනයෙහි; **ගමවි ආ මහණුන්** = ගමට ආ භික්ෂූන් විසින්; **පතිපූජිකාව පවත් ජැනැ** = පතිපූජිකාවගේ ප්‍රවෘත්ති දැන; **නිවත් තැන් පුළුවුන් සේ** = උපන් තැන පුළුවන් පරිදි; **යන මෙතෙක් ගුණ** = මෙසේ දක්වන ලද මෙ පමණ පාඨයන්;† **පතිපූජි වැ** = පතිපූජිකාවැ; **මිනිස් පියෙහි උපන්නා දවස්හයි** = මනුෂ්‍යසථානයෙහි උපන් තාක් දවස් හා: **සංවේ උපන් සේ දක්වා** = සංවෙග උපන් පරිදි දක්වා; **උපතට කරුණු දැක් වියැවි වැ** = සංවෙගොත්පත්තියට හෙතු දක්වනු කැමැති වැ; **ධම්මුන් නො තහවුරු සේ** = සංසකාරධර්මයන්ගේ අසථිරබව;

† මේ අර්ථය තවද විමසිය යුතු යි.

213. 'හැඟියත්' යනු 'හැඟියන්' යි ගන්නේ. 'සලකන රහත්නට' යන අර්ථ යි.

උපජන සංවේ = උපදනා සංවේගය යි; **ජීවිපුරුතු කරුණෙන් මෙය යූ සේයි** = ජීවිතයාගේ පරිත්තබව-අල්පබව යැයි කියන ලද කාරණයෙන් මෑ යි යනු; **දිවිසිවි වනුවට** = ජීවිතයාගේ සථිතිය පිණිස; **ප්‍රියොව කරනුවන්** = ප්‍රයොග කරන්නහ්; **දිවි ගලනේ සිතයි** = ජීවිතය ගළිත වේ යැයි සිතා; **වලපිනවුන්** = විලාප කියන්නවුන්; **නහාපන සම්බාහනාදියට කරුණු** = නැහැවීම් අන්පා හැඹිම් ආදියට හෙතුවූ; **ඉත්ථිපුරිසාදි කාමගුණ**= සත්‍රී පුරුෂාදි කාමබන්ධනයන්; **හිරසැඳ සුවණණාදි කාමගුණ** = රන් සුවන් ආදි කාම බන්ධනයන්;

36. පනිපූජිකාව වත්.

විනයයුතු නැඟන් = භික්ම්වාලිම්ට සුදුසු ඥතීන්; **සා අන් ඇතියා** = සා දුකින් යුත් ආත්මය – සන්තානය ඇත්තහු; **සා සතන් ඇතියහු යයි සේයි** = සා දුකින් පෙළුණු ආත්මභාවය ඇත්තහු ය යනු කි නියායි; **නියර වැසි මිනියක්හු** = ප්‍රත්‍යන්ත වාසි මනුෂ්‍යයකු; (මිලිවස් – නියරි – පසල් දනවු – පිටිසර – පිටිනුවර–බිහිනුවර – පිටිපුර–බිහිපුර යනු පරියා.) **කොමු පිරුණු** = යව සුන්නෙන් පිරිගිය; **කබලු පුවක්** = කපලලඝ පූපයක් (රොටියක්); **නැරළු සුනුයෙන් කළ** = නාරිකෙළ චූණියෙන් කරන ලද; **කොමුය යෙත්** = කුම්මාසයෙකැයි කියත්; **පවස්** = පිපාසාව; **මසුරු බැලෙන්** = මාත්සය්‍ය බලයෙන්; **දැපිලි පැලි ඇතිසේයි** = හටගත් ඉදිගිය කොළබදු පඬුවන් සවභාව ඇත්තේය; **පඬු රෝ ඒය යූ සේයි** = පාණ්ඩු රොගය හටගත්තේය යනු කි නියායි; **නහර පතුළ සිරුරු ඇතියේ සි** = නහර ඇතිරියිය ශරීර ඇත්තේය; **මෙ බවට හියෙයිජ්** = මේ සවභාවයට පැමිණියේ නමුත්; **කිසිවෙක්හි** = කිසි වසතුවෙක්හි; **තණ්හා ඇතිවුව** = ආශා ඇතිවුවහොත්; **ද්‍රව්‍ය වියවන බියෙන්** = ධනක්ෂයවන භීතියෙන්; **විසිරවූ** = වාගෙඝාතය පවත්වා; **නො කිය හෙන බැවින්** = කියනුවට අසමර්ථවන හෙයින්; **තෙමුල් ගලන්නාක්හු වැනිය** = වචනය ගිලින්නකු වැනි යයි; **යූහු** = කිහු; **එක් මේ වාස ඇතියවුනට** = එක් මේ ජීවිතයෙහ වාසය ඇත්තවුන්හට; **බෙහෙවෙක්හි** = බොහොමයෙක්හි – බොහෝ වසතු විෂයෙහි; **අදහස් ඇති බැව්** = අධ්‍යාශය සම්පන්න බව; ('භූමන් – භූමා යන සංසකෘත වචනානුරූප ලෙස 'බොහොම' යනු සිඔය. 'බෙහෙව්–

බෙහෙවෙක්හි' යනු ඒ ඒ විහක්තීන් අනතවීමෙන් වන විකෘත රූප සි.) **ඉහු** = ඒ වීරි වාසී ජනයෝ; **කබලුකා** = කබලුපු කා; **තිට** = යුෂ්මතියට; **කම ගන කම්** = කුමන දෑයක් – කවර නම් වැඩක්; **කුම ගන තණ්හගක්** = කුමන තෘෂ්ණාවක්; **විනොය නොහු යූ සේසි** = විනොදනය කරන්නහු දැයි කී නියාසි; **මුළුළු සැඩොල්** = සම්පූර්ණ තණ්ඩුලයන්;—

(ට) '**මුළුළු සැඩොල්**' යනු 'සකල තණ්ඩුලෙ' යනුවට අවී කී සැටිය. පාළියෙහි සංසකෘත 'ශබල' ශබ්ද පසීය 'සකල' ශබ්දයෙකුත් තිබෙයි. 'සකල' යනු 'කැබෙලි' යන අර්ථ සි. දෙකට කැඩුණු සහලුත් තබා සුනුව ගිය සහල් ගෙනැ යයි ද අරුත් ගත හැකිය. සිතා බලනු මැනවි.

බුන් සැඩල = ඡින්න තණ්ඩුලය – සුන් සහල්; **උදුන් හා ඇතිලියනුන්** = එප් හා කබලුත්; (අතින් දූරිය හැකි තලි – ඇතිලි යයි සලකමු. අතළය මෙනි.) **හිදිහස් අඟුළු** = දෙර පොලු හා අඟුළයන්; (සූචි > සිදි > හිදි > ඉදි යනු වේ. ඉදි දෙර – ඉදිකඩ යනාදිය සසඳ බලනු;) **හිදි අඟුළු** = හිදි යයි කියනලද අඟුළු; **නිපොටි කොටැ** = කෙලඟ කම්පිත නැතියකු කොට; **මසුරු කෙලෙස් පිරිසුඬන්** = මච්ඡරිය යැයි කියනලද කිලෙස පරියුත්ථානයට; (පරියුත්ථාන නම් කුසල් සිත මැඩගෙන නැඟී සිටීම සි. 'වොරා මඥෙ පරිසුට්ඨිංසු' යනාදියෙහි මෙනි;) **ජැල් කවුළු දෙරෙහි** = ජාල කවාටසමීපයෙහි; **ළමස්** = හෘදය මාංසය; **වෙවුලි** = වෙපථුග්‍රහණය කෙළේය; **කැපිය යූ සේසි** = කම්පිත විය යනු කී නියාසි; **මෙබඳුවන් මෙ** = මෙවැනියන්ට මැ; **ඉලිය නුවන් මෙ** = ඉල්ලන්නවුන්ට මැ; **සැක්මෙනුයෙහිඳ්** = සක්මන් කරන්නෙහි ද; **සක්මි** = වඩකමනය කෙළේය; (**සක්ම** – සැක්මි මෙහි යන ධාතු සි.) **දුමනුයෙහිදු** = දුම් නහන්නෙහි ත්; **සමව පතුළ දුම් ඇතියේ** = එසසේ පැතිරිනිය දුම් ඇත්තේ; **පූ දෙවි කනින්** = පූජදබ්බිකණණයෙන් – කැවුම් හැඳි කොනින්; **කුඩ කුඩා කබලු පිසවන පියොව්හි** = කුඩා කුඩා කබලු පිසවාලන ප්‍රයොගයෙහි; **උකැවියේසි** = උකකණ්ඨිත වූයේ; **කෙළවර** = පරා කොටිය; **තණ්හා ඔහි** = තෘෂ්ණාව ජින්න වැ ගියාය; **ගම් සෙසින් පුලේ ද** = යම් පරිද්දෙකින් ඵුටිත (විකසිත) වැ ගියේ ද; **එසෙසින්නම පුළ කොටැ** = එපරිද්දෙන් මැ විකසිත කොටැ; **රැසි ඇති හොත්** = රැවිය ඇති කල්හි;

214. 'සිට දෙරණ' යනු '**සිට ගෙරෙණ**' සී ගන්නේ. **සිට ගෙරෙණ ලවා** = සෙටසි ඝරණිය යොදවා; 'ඝරණී භරියා පියා' යනු කී හෙයින් ඝරණී හෙවත් ගෙරෙණ නම් භාය්‍යාව සී ගන්නේ.

හිඟු හිස් = නිසොසණී සිසයෙහි – හිණි මූදුනත; **ඔතඟ** = හත්තඟයට – බත් කිස කරන තැනට; **හම්මන පලඟක්** = යෙහෙන (සෑහෙන) පමණක්; **යත්තෘකාන අත්ථෝ** = යම් පම් ණෙකින් ප්‍රයොජන වේද; **තත්තකං ඛාදි** = එපමණක් කෑයේය; **පෙරවින් හළුවා** = ඉදිරිපිට හරනා ලද්ද; **බැහිල් කැනෙක්හි** = පබ්භාරට්ඨානයෙක්හි; ('නතුවැ වළවැ නිබෙන තැනෙක්හි' යනු ජාතක ගැටපදයි. 'බැහිල' යනු 'පබ්භාර' ශබ්ද සම්භූත සිංහල ප්‍රාකෘත වචනයෙකැයි ගන්නේ. පජිතාගුහාගය ප්‍රාග්භාරනමැයි කොෂාගත යි.) **ඉඤ්ඡි** = සිඤ්ඡනය කෙළේය–විකිරණය කෙළේය යු සේයි; **නො කල කිරැවා** = වෙහෙසට පත් නො කොට; **මිසු මැසි ජැයෙක්** = මී මැසි ජාතියක්;

215. .'රස් රොන් හා මූසු රජ' යනු '**රජස් රොන් හා මූසු**'යි ගන්නේ. 'රජස් යයි කියන ලද රෙණුයෙන් මිශ්‍ර වූ' යන අර්ථ යි.

සුරු කරණෙන් = වරිතය කරණ කොට ගෙන; **ගෙ නැති මහණ** = ගෙයක් නැති ශ්‍රමණ තෙමේය; **අක්ඛික්** = අක්ඛරිකා වක්; (**අක්** – **අක්ඛික්** – **අකුරු** – **අකුරක්** යනු පරියා. **අක්ඛ** – **අක්ඛර** – **අක්ඛරිකා** යන පාළි වචන හා සසඳනු. අක්ඛික් නම් අළුත්ගුව යි.)

216. 'දෙවන බදු' යනු '**අදන බඳු**' යි ගන්නේ. **අදන බඳු** = අභ්‍යඤ්ජනයක් වැනිවූ; **වන පිළි සෙයන බෙහෙත් උවමි විසින්** = වණ පටිච්ඡාදන හෙසජ්ජොපමා වසයෙන්; **සතර තරන්නට** = සතාර තරණයට; **සෙස් ඇසි** = සෙසාදි වූ; **හද ඇති කම්ඨින්** = අජ්ඣත්තික භාවනානය; **පිරිමදුනේ** = විතර්කාහත කොට බලනුයේ; **දිටු ධම් සුව වැහැර** = දිට්ඨ ධම්මික සුඛ විහාරය – ඉහාත්මයෙහි සුවසේ විසීම; **දිව්‍ය බ්‍රහ්ම සුඛ විහාර යෙන්** = දිව්‍ය විහාර බ්‍රහ්ම විහාර යන සුඛ විහාරයන් අතුරෙන්; **එක් තරහය යූ සේ සි** = ඒකාතරයකට යනු කි නියායි; **දෙ ජෙන්** = දෙදෙන; **කොරඹු** = බඤ්ඣයෝය; ('ඛොර' යන සංස්කෘත වචනානුසාරයෙන් 'කොර' යනු සිඛ යි.) **බකත්ගු** = වක්වූ අත් ඇතියෝ ය – බකළයෝ ය; **වැහැජියෝ** = විසම ඇස් ඇත්තෝ ය; ('වි ඇසි' යනු මෙහි ප්‍රකෘති රූප යි. 'විසමච්ඡි' යනු සිංහල ප්‍රාකෘතයෙහි 'වැහැජි' විය හැක්ක) **ජා පිළඟ ඇති** = හටගත් පොළ ඇති;

37. මසුරු සිටුහු වත්.

තෙජා = තජිනය තෙරෙයි; බවයි යූ **සේයි** = බිය ගන්වයි යනු කී නියාය; **පැසුඵ හැබ්‍රහි** = පශ්චාද් ගහීයෙහි;

217. "පවිවිසඝ මනුසසානං' ඝාමීඵියෙහි සාමි වචන'' යනුවෙක් මෙහි පැනෙයි. එය '**මනුසෙස**' යි උපයොග බහුවචන ඝටයුතු බව ත් ඊට අනතුරුවැ '**පුවිඡිඝා**' යනුවක් අඛ්‍යාහාර ඝටයුතු බව ත් මේ නරනාථයෝ කියත්. මෙයින් එසල පාළි අට්ඨවාහි ආ මහත් උහනඵයක් පිරිමසා ලූ සැටි හැඟෙයි. මෙහි බුදුනට නිමනත්‍රණය කැරවූවා ගැහැවි දුවකි. එහෙයින් ගෙය දෙර පිරිසිදු ඝටයුතු වූයේ ඇය විසිනි. එහෙත් 'පවිවිසඝ මනුසසානං ගෙහං අලලූ ගොමයෙන උපලිම්පිඝා' යන අට්ඨවා පාඨයෙන් හැඟෙන්නේ අසල් වැසි මිනිසුන්ගේ ගෙයක් අමු ගොමින් පිරිබඳගත් බව යි. මේ අනුවිතාඵිය බැහැර කරනු පිණිස 'මනුසසානං' යනු '**මනුසෙස**' යි ගෙන එයට අනතුරුවැ 'පුවිඡිඝා' යනුවක් ඇර යොදනුවට කිහ. එසේ කළ 'අසල් වැසි මිනිසුන් පිළිවිස සිය ගෙය පිරිබඳ ගැන්වූ බව හැඟෙයි. මේ පාඨය මුද්‍රිත දම්පියා අට්ඨවාවෙහි එන්නේ 'පවිවිසඝා මනුසසා තං ගෙහං' යනාදි වශයෙනි. එවිට 'අසල් වැසි මිනිස්සු ගැහැවි දුවගේ ගෙය පිරිබඳ ගත්හ යි පෙරට ත් වඩා අනුවිතාඵියෙක් හැඟේ. එහෙයින් අට්ඨවා පාඨය '**මනුසසානං**' යි ශුඛ ඝටයුතු වැ තිබේ. පරණ පාළි අට්ඨවාහි එන යටකි උහනඵය පිරිමසා ලීමට මේ නරනාථයෝ මහත් ප්‍රයාසයක් යෙදූහ.

218. 'මෙසෙසින් ගත දුවෙක් ඝිත්තිය ගෙහෙ මනුසසානං පවිපුවිඡිඝා සඤාරාහඵි හිඳුන ආසන පැනවීහ' යනුදු පොත්හි එන ආකුලව්‍යාකුල පාඨයෙකි. '**මෙසෙසින් ගත එක්ඵිති ගෙයි මිනිසුන් පිළිවිසැ සඤාරහඵි හිඳුන ආසන පැනවීහ**'යි ශුඛ කොට ගත මැනවි. අර්ථ සුගම්‍ය යි.

හෙළටුවා හා සිමියෙයි = පුරාණ හෙළටුවා හා සම වෙයි; **මේ දෙසෙසින්** = මේ විප්‍රකාරයෙන්; **පරිචය නැති මිනිස්සු** = පුරුදුදක් නැති මනුෂ්‍යයෝ; (පරිචය > පුරුජු > පුරුදු යනු වේ.) **පස් පිහිවියෙන්** = පඤ්ච පතිට්ඨිතයෙන්–පසඟ පිහිටුවා ලීමෙන්;

219. 'සිත් නො ගැන්විය නොහේ' යනු '**සිත් ගැන්විය නො හි**' යි ගන්නේ. **සිත් ගැන්විය** = සිතට ගැන්වීම පිණිස; **නො හි** = අසමර්ථ වි;--

220. 'හැම්මිය නොහෙන්නේ' යනු '**හැම්මිය නො හිණි**' යි ගන්නේ.

හැම්මිය = සඤ්ඤාරණය කරනුවට; **නො ගිණි** = අසම්පී ය; **කළුවනැයි** = කාලඤ්ඤූ නොමෝ; **සිරි නැතිය යූ සේයි** = නිශ්ශ්‍රීක නැහැත්තිය යනු කී නියාසි; **ආජීවකයා වජන් අනු සැරැ** = ආජීවකයාගේ වචන සිහිකොට; **පුළුවූ සිතැයි සේ සි** = පුථුභූත වූ (නානාරම්මණයෙහි වෙන් වෙන් වැ ගිය) සිත ය යනු කී නියාසි; **විරැජ්ජනාගේ** = විරොධි ජනයාගේ; **නො සැමැරැ** = සුමරණය නො කොට – සිහි නො කොට; **මැරුමැ සිඳුන බඳු** = මම්මෙඡ්දනය කරන්නාක් වැනි;

221. 'තෙපුලින්' යනු '**තෙපුලන්**' සි ගන්නේ. ලපිතයන්–වචනයන් යන අර්ථ සි;

කෙණෙහි අහර = කවඵු භික්ඛාව – හැඳි බත; **වත් තෙරණට** = උපජ්ඣාය තෙරවරණට; (උපජ්ඣාය ථෙර > උවජ්තෙර වජ්තෙර > වද්තෙර > වත්තෙර යනු වේ.) **පොහොවරැ** = උපොසථාගාරයෙහි; **සමාධි විවසුන්** = සමථ විපස්සනාවන්; **කටැවි බැවුහි යැ යූ සේයි** = කරනු කැමැති බැවුහි ය යනු කී නියාසි; **කියැහැවියහට** = කෙබඳු සවභාවක් ඇතියාහට; **රැ දෙවෝ** = රතනත්තිවයෝ – රැ දහවල්හු;

222. 'රජ් රජ්' යනු පොත්හි එසි. 'රජු රජු' සි අඩොලිපිහි පැනේ. භාවි සිළුම්ණි – සියබස් ලකර ආදියෙහි සංසකෘත 'අජස්‍ර' ශබ්ද පසිාය වූ 'අරජ-අරද' යනු පැනෙසි. 'රජ් රජ්' 'රජු රජු' යනුත් පිළි ගතයුතු පාඨයෙක්ද? 'අරජ් අරජ්' කියා හෝ 'අරජු අරජු' කියා හෝ ශුබ්ධ වියයුතු යැයි ඇපි සලකමු. මෙහි අකාර ලොපය අසඛ්ඛත යැයි හැඟේ. නිතර නිතර යන අර්ථ සි. **විවස්නෙහි** = විපස්සනායෙහි;

38. මාතික (පාඨික) ආජීවකයා වන්.

වඳිනාවි = උපඨානයට; 223. 'අබ්‍රහ්මචරිය විරති හා විකාල භොජන පියවිඳින් අභිසෙස දක්වන්නට කියූ සේ ය' යනු පොත්හි තිබෙසි. ධම්මපදට්ඨකථායෙහි 'අනාගාමී අරිය සාවකානං හි සමාදානවසෙන උපොසථ කම්මං නාම නත්ථි, මඤ්ඤතෙව තෙසං බ්‍රහ්මචරියඤ්ච එක භත්තිකභත්තඤ්ච ආගතං' යනුයෙහි අදහස් ගෙන ගැළපූ වාක්‍යයෙකි මේ. පොත්හි එන වාක්‍යයෙන් කියැවෙනුයේ 'අබ්‍රහ්මචර්‍යායෙන් වැළකීම හා විකාල භෝජනය අනහැර දැමීමෙන් පැන් ඉසීම දක්වන්නට කී පරිදි යැ' යන අදහස සි. අබ්‍රහ්මචරිය විරතිය එසේ වේවා. විකාල

හොජනය හැර දැමීමෙන් පැන් ඉසෙන්නේ කා හටද? යට දැක්වූ අට්ඨකථා පාඨය ඔන්සේ මෙහි ශුඛිය අපට මෙසේ වැටහේ. **'අබ්‍රහ්මචරිය විරති හා විකාල භොජන විරති ඉයවින් මෙ ආලස දක්වන්නට කියූ සේ යැ'** යි. අබ්‍රහ්මචර්‍යාගෙන් වෙන් වීම හා විකාල් බොජුනෙන් වෙන්වීම (අනාගාමීනට) සවභාගෙන් මැ ආගත පරිදි දක්වාලීම පිණිස කී පරිදි වෙයි' යනු අර්ථ යි. අනාගාමීන්ට ශ්ලකි විරතිද්වය මාගීයෙන් මැ සිඛ යි. එහෙත් ගිහි ආයර්‍යයෝ පොහෝ දිනයන්හි චාරිත්‍රවිධි පාලනය පිණිස උපොසථඛ සමාදානය කෙරෙති යන අදහස මතු වාක්‍යයන්ගෙන් ගතයුතු.

දුලු සියුසස් ඇතියේයි = දක්නාලද චතුස්සත්‍යය ඇත් තෙක් වූයේ ය; **නොහොත් පසක් කල ලොවුතුරා ධම් ඇතියේයි**= නැතහොත් ප්‍රත්‍යක්ෂ කල මාගීඵල නිර්‍වාණ යන ලොකොත්තර ධර්‍මයන් ඇත්තේය. **හිතාහිතයෙහි** = වැඩ අවැඩ දෙක්හි; **සේ වූයේයි** = දක්ෂ වූයේ යි; **බරහු** = බර වූවාහු වෙත්.

224. 'ජනවත්' යනු 'ජනුවවත්' යි ගන්නේ. **කතයුතු නො කටයුතු ජනුවවත්** = කතීව්‍ය අකතීව්‍යයන් දැනගැනිමට ත්; **බැරැයිසේයි** = බරය යනු කී නියාසි.

රජගෙයි සරන තන් නම් = රජගෙයි හැසිරෙන තන තුරු වනාහි; **සදෙස්** = දෙව සහිත ය; **හඳුරම්හයි** = පරියාපුණනය කරම්හ යි – පුහුණු කරම්හ යි; **උදෙස්වව** = (මෙයට වඩා අඩොලිපිගත **'උදෙසව'** යනු මැනැවි.) පාළිය කියා දෙනු මැනව; **හැදුරියයුතු බණ** = පාඩම් කැරැ ගතයුතු ධර්‍මය;--

225. 'ඇජරා පුණුස්වා' යනු **'ඇජරා පුණුස්වූ'** යි ගන්නේ.

ඇජරා = ආචර්‍යයීවරයාව; **පුණුස්වූ** = පවිදුඡාපනය කලා ය – පාඩම් දුන්නිය; **හජාල තැන්** = සංධාරිතස්ථානයන්; **ඇජරාව** = ආචාර්‍යයා හට; **නියොදෙ යූ සේ යි** = නියාදනය කලාය – පාවා දුන්නිය යනු කී නියාසි; **පිරිහුන්** = පරිපූර්‍ණ වූ; **වන් හා සඨන් ඇතියේයි**; = වර්‍ණ හා සංස්ථාන ඇත්තාවූ; **ගිරිනිල්** = ගිනිතිල්ල; **සුතමුවා සඳුණ ගඳ** = ශ්‍රුතයෙන් උපන් ඥාන නමැති සුගන්ධය; **තැගමය** = ත්‍යාග ගුණයෙන් උපන්; **දන්ගඳ** = දාන සුගන්ධය;

(ටා) **'නිල් මහනෙල්'** යි මෙහි පැහේ. බොහෝ දෙනෙක් 'මිහනෙල්' යනු 'මහානීල' ශබ්ද පඨීාය යයි සලකති. එසේ හොත් 'නිල්මහනෙලැ' යි කී කල පුනරුක්තතා දෝෂයෙන් දූෂිත වැ යෙයි. එසේ හෙයින් මේ දුෂ්ප්‍රයොගයෙකැයි කියන්නෝද වෙත් මැයි. මෙහි නිසැක ශබ්ද ප්‍රයොගය මතු **කොසොල් රජහු වත්හි** එන්නේ ය. **"කුමුදුප්පලානිව, සියුම් මහනෙළුහු"** යනු ඒ පාඨ යි. මෙහි ලකාරය ළකාර වියයුතු. **'මහනෙළුන්'** යනු **'මහානළින'** ශබ්ද පඨීාය හෙයිනි. **මහනෙල්-මහනිල් යන** විකෘත රූපයන්ට පැමිණියේ **'මහනෙළුන්'** යන රූපය මැ බව දැන් කාහට ත් පෙනී යා යුතුය.

39. ජතාපාණී උපාසකයා වත්.

මෙතෙක් තැනැ = මෙ පමණ තන්හි; **යානයෙන් යනු වට කරුණු** = යානයෙන් යාමට කරුණු තිබෙයි; **පාදචාරී වැ මේ** = පයින් මැ යන්නියහ වැ; **සැර අනුරුවින්** = වාරිකානුරූප පරිද්දෙන්; **අහිරති ඇති තා දවස්හි** = ඇලුම් ඇති පමණ දවස්හි – කැමැතිතාක් දවස්හි; **අනන් මන** = ඔවුනොවුන්ගේ; **බුහුනන්** = භගිනීන්ගේ–නැහණියන්ගේ; **සැම්මයෝ** = වල්ලභයෝ වෙත්; **සැලිය නො හැකියෝ** = සොලවනුවට නො හැක්කාහ; **ඇලළිය නො හැකියහ යූ සේ සි** = ආලොළනය කරනුවට නො හැක්කාහ යනු කි නියාසි; **මඟ නිම ඇසි** = මාගී නිමානාදිය; **පිළියෙළ කොටැ** = සම්පාදනය කොට; **එබඳු පෙළෙන්** = ඔවැනි ජටායෙන්; **පස් සැලණින්** = පසඳව සාලාභණයෙන්; **සමන් වියසැ** = යුක්තවූ තැනැත්තියහ; **කෙහෙන් සලණ වියසැ** = කෙශයන් සරණ කොට ගෙන සුන්දර වූවක; **මොණොර පිල් සලඹ බඳුවෝ** = මයුර පිඤ්ඡ සලාපයක් වැනි වූහ; **ඔට මස්** = ඔඨමංසය – තොල්මස; **මැවිවැල්** = බිඹු වැලෙක්හි – නො වක්කා වැලෙක්හි; **වැල්බඳු** = පැසුණු ගෙඩියක් වැනි; **සුවුණු** = සම්ඵුසිත වූයේ වෙයි – මනාකොට පියවී ගියේ වෙයි; **නැඟි බැව් නැති වැ** = උද්ගතවූ බවක් නැති වැ; **සොමෝ** = සම්වූහ; **සම කොටැ සුන්** = සමසේ සිඳින ලද; **සක් පතක් සෙයින්** = සඞ්ඛ පත්‍රයක් මෙන්; **සැළිය** = සාලවණී වූ සත්‍රියගේ

(ටී) 'වණණසාදිහි අවිලිත්තෙතා එව ජිවිවණෙණා' 'විලවුන් ආදියකින් නොවර නො ගත්තාවූ මැ සිවි පැහැය' යනු දම්පියා අටුවායෙහි ආයේ ය. 'වණණාදිහි, සම්වන් ඇසින්'සි මෙහි පැහේ. මෙයට වඩා අටුවා පාඨය තැනවි හොබනේ ය – **පරිත්‍යාග** සි.

සම්වන් ඇයින් = නීලවණ්ණාදියෙන්; **හෙළලිය** = ඔවලවූ සත්‍රියගේ; **අටතුරාසියක්** ඔමණන් = අටක් අධික කොට ඇති සියක් බමුණන් – අෂ්ටත්තරසතයක් බ්‍රාහ්මණයන්; **පාළ වැ සැණ කෙළන දවස්** = ප්‍රකට වැ ඡණ ක්‍රීඩනය කැරෙන දිනයෙහි; **කෑහිත් නො දක්වන** = කොහිත් දෘශ්‍යමාන නො වන; **කුලදූන්**= කුලසම්පන්න දුහිතෘන්; **කාටත් හටපු** = කවරක්හු හටත්; **නොඹුවහ වැ** = අව්‍යවහිත වැ; (ව්‍යවහිත > වියවහ > වුවහ > ම්වහ යනු වේ.) **සැණ කෙළන දවසැ යි සේ යි** = උත්සව ක්‍රීඩනය කැරෙන දිනයෙහි ය යනු කී නියායි; **පිරිබෙවු කරම්හ** = පරික්ෂේප කරම්හ – වට කරම්හ යි; **සමජකුල දරුවන්** = සමාන ජාතික කුල කුමාරයන් විසින්; **මල්දමින් පිරිබෙවු කළතන්හි පටා** = මාලාදාමයෙන් පරික්ෂේප කළ ස්ථානයෙහි පටන්; **ඔවුන් අයන් වනු** = ඔවුන් සන්තකවීම; **සිරිත්ලු** = චාරිත්‍රයක් ලු; **උදෙසන වියෙහි**; කියනු ලබන – බැවහර කරනු ලබන වයස්හි; **අලස ජයි ඇතියි** = අලසස්වභාව ඇත්තියක; **කුසී සැහැවිය යි සේ යි**= කුසීත ස්වභාව ඇත්තියක යනු කී නියායි; **පස් ඇතක්හට** = ඇතුන් පස් දෙනකුන්ගේ; **බැල ඇතිසේ** = බල ඇති බව; **නො ජීවිය සුතුවට** = දුවනට අයොග්‍ය බවට; **කස ගලා** = කවඩ ඝටනය කොට – අමුඩු ගසා; **ණිකිය** = හෙම්හිට; **ඇන් ලෙළහෙයෙන්** = ඇතක්හුගේ ලීලායෙන්; **පමණ ගමණින්** = පමණින් යුත් ගමනින්; **නාති විලඹ ගමනින්** = ඉතා පමා නොවූ ගමනින්; **පච්චඞ්ගයන්** = අප්‍රධාන අවයවයන්; **විකබඩුවමෝ නම්** = විකපත් කටයුතු බඩු නම් වෙමු – විකිණියයුතු බඩු නම් වෙමු; (**'යොගඟසකට'** යනුයෙහි යොගඟ නමුත් සකට නමුත් රථය මැයි. මෙහි **'යොගඟ'** යනුයෙන් අඤ්චරථය ද **'සකට'** යනුයෙන් ගවයන් යෙදූ රථය ද ගන්නේ.) **කැණ තැන ඇතියා** = කාකණ්ණිකයක්හුගේ ස්ථානය ඇත්තාවූ –කාකණ්ණිකයක් සමාන වූ; (සංස්කෘතයෙහි **'කාකිණ්ණි'** යි එයි පණමෙන සතරෙන් කොටස කාකිණි නම් වේ.) **විදුරු කෙළ සේ** = වජ්‍ර කොටියක් බඳු; **මුල් පණ්ඩිතින්** = මුල් ප්‍රාඥයාවෙන්; **සමන් වී** = සමපන්න වූවා; **වජාල** = විධාන කළාය; **මෙහෙල පහසින් නම්** = මහාලතා පසාධන නම් (මහාලතා > මහලිය > මහෙල > මෙහෙල' යනුවේ); **නික් දහසෙක්** = නිකඛ සහස්‍රයෙක්; **නිකෙක් නම්** = නිෂ්ක යෙක් නම්; **පස් හුනෙඟ යෙත්** = පසුව සුවණ්ණියෙකැයි කියත්; ("කෙමෙ . පසුව සුවණ්ණෙණ ව නිකෙඛා නිත්ථි පසාධනෙ' යිද 'සුවණ්ණෙණා පසුව ධරණං' යිද නිඝණ්ඩු යි.) **සතරමස** = සාර මාස යක් හුගේ; **වියඵවක්** = ව්‍යතිශක්තයක් – මිලිතයක්–එකතුවක්;

චතුන්නං මාසානං = සාර මාසයක් හුගේ; **සමාහාරෝ** = සංහෘතිය –සංක්ෂේපය – එක් කොට සැලකීම; **චාතුමාසං** = එනම් වේ; **සිය හ ගෙහු** = සතත සොසිත වූ; **සැණ ඇති වන් වී** = උත්සව ඇතියකු මෙන් වූයේය; **සමන්ති නාවෝ** = සම්‍යන්න නාවකයෝ; **බත් බජන ඇයි සමන්ති** = බත් බෙදීම් ආදි කම්‍යන්තයන්හි; **යුත් සැමියහ යූ සේ සි.** = යෙදුණු සාර්මිකයෝ වෙත් යනු කියයි; **පිළි කොටාරන්** = වසන්‍ර කොෂ්ඨාගාරයන්; **පිළි වවිති යන්** = වත් වැටි; **ගැටවවුවෝ** = ගණ්ඨිකාවට්ටයෝ – ගණ්ඨි ගැටයෝ; **මළහු** = පාසයෝ;—

(වී) මේ වනාහි 'පාසකා' යනුවට අර්ථ කී සැටිය. සංස්කෘත යෙහි 'පාශ' යනු මෘග විහගාදීන් බඳන රැහැන් වෙසෙසෙහා පවත්නා බැව් කියති. 'පාශක' යනු පස ඇටට නමි. පාළියෙහි 'පාස – පාසක' දෙ ශබ්දයන්ගේ මෑ අර්ථ සම යි. දෙබස්හි මෑ බහ්‍වන්‍නාර්ථය එකසේ මැයි. කොඤපාශ – කණ්ඨිපාශ – පාශපාණි – පාශී යන හැම ප්‍රයොගයෝ මෑ බහ්‍වන්‍නාර්ථය මුල්කොට ගෙන නිපන්හ. මෙහි එන 'පාසක' ශබ්දය ද එසේ මැයි. 'පාශ' නාම යෙන් දැක්වෙන රජ්ජු විශෙෂයට 'මළපුඩුව' යනු දෙශභාෂා යෙහි වහර වේ. පූර්‍වයෙහි 'මළපස – මාරපාස' යි ව්‍යවහෘත බැව් අනුමාන කළ හැක්ක. උතුරු මැදයෙහි කෙවල 'මළ' යනු අදත් ඒ දැලට කියැවේ. මළය තබන භාණ්ඩයට 'මළ භාණ්ඩය' යිත් එසේ මෑ කියැවේ. බහ්‍වන්‍නාර්ථවාචී පරපදය ජරපත් වැ මරණවාචී පූර්‍ව පදය ශෙෂ විය. කල් යත් යත් හෙමැ පාශාර්ථයෙහි අධ්‍යාරොපිත විය. එහෙයින් 'මළ' යනු සාමාන්‍ය 'පුඩුව' යන අර්ථයෙහි හෙළි ණැයි ඇපි සලකමු.

එක් යතුරෙක් = එක් යන්‍ත්‍රයෙක්; **ගලවළුයෙහි** = ගල වාටනයෙහි – ගෙලවළෙහි; **දෙදන් හිසැ** = උරහිස් දෙක්හි; **දෙ වැලමිට** = වට්ටමුඛිවයෙහි; **දෙකිළි ඇලයෙහි** = උභයකට් අංසයන්හි; **දකුණු පියෙහි** = දකුණු පියාඹයහි; (මේ මෑ හෝ පාඨ යි.) **පඛළමුයේ** = ප්‍රවාලමය වෙයි.

226. 'පිඤ්ඤ නම් පිල්' යනු 'පිඤ්ඤ නම් පිල්' යි ගන්නේ.

පත් නලහු = පියාකුරු; **කකුල්හු** = කොණ්ඩයෝ; **අත් කම් මිල** = අතින් කළ කම්‍යන්තයට දියයුතු මිලය – කූලිය; **දියයුතු තා** = දෙනුවට නිසි සියල්ල; **පවපිළි හස් නිහිදි පිළි පිරුණුවන්** = පවිට වසන්‍රයෙන් හා කොෂ්ඨාශය වසන්‍රයන්ගෙන් පිරිහියා වූ;—

(වූ) **කෙතෙශෙය** නම් කෑම් කොෂාදියෙහි උපන් වියනු ය. එයට 'තිහිරි පිළි' යයි බොහෝ තැන යෙදී තිබේ. '**කොස නම් තිහිරිපකි**' යනු මූගලන් වියරණ සන්නයෙහි ආයේය. '**කොසානං, තිරිපතූන්ගේ**' යි පඤ්චිකා ප්‍රදීපයෙහි ආයේය. '**තිහිරි පිළි, කොසෙයෘං කිම්ඡං**' යනු පාළි නිඝණ්ඩුයෙහි ආයේය. පණුවන් විසින් සිය වාසයට සිය සිරිරින් මැ උපදවාගත් හුයින් නිපැයෙන කදල්ල 'කොෂ' නම්වේ. ඒ කොෂය ඵලවාචී 'පක්' යන නාම යෙන් කියැවේ. මෙසේ කැදලි සාදගෙන දෙවෙන පණුවන් ගෙන් 'විරි – විරිකා' යන නාමයන්ගෙන් හැඳින්වෙන රැහැයි වර්ගීය ප්‍රධාන තැනක් ගනී. තද්‍රූපවාරයෙන් එවැනි හැම පණුවන් කෙරේ මැ 'විරි – තිහිරි' යන නාමය ආරොපිත යි. එහෙයින් '**තිහිරින්ගේ පක්** (ගෙඬිය) = තිහිරිපක්, තිහිරිපකින් උපන් පිළි= **තිහිරි පිළි**' යයි දතයුතු. **විරි > ජිරි > ජිහිරි > දිහිරි > තිහිරි** යි සිංහල ප්‍රාකෘතානුගත ආගතප්‍රකාරය ගන්නේ යි.

පහසින් ගන්වන දසුන් = ප්‍රසාධනයන් ගන්වන දසින් – අබරණ වඩන දැස්සන්; **සුළු ගොවුදෙහි** = චූළ වජ යෙක්හි; **අනන්මන ගහටනුවෝ** = ඔවුනොවුන් සවිටතය කරන්නාහු; **හඬා** = සෑහේ; **වජාරන ලදු** = විධාන කරන ලද්දේ ය; **හැම සේණි කුලන්** = සියලු මෙහෙකරු කුලයන්; ('සේණිහි නම් ඒ ඒ කර්මයි යුත් කුලවැසියෝ;) **ඇපයන්** = ආවාපයන්; **විචාර කටයුතු** = තතු පිරික්සිය යුතු; **ණියන්ගේ** = යෙහෙළිණියන්ගේ; **පොෂස්** = පොථනය කොට – පළා; **ශක්ති අනුවිවින්** = බලානුරූපපරිද්දෙන්; **පොහොසත් බැවැ** = පහූසන්න භාවය යි – බොහෝ දෑය ඇති බව යි; **වත් ඇති බැවැ** = ධනවන්ත භාවය යි;

227. 'සබ්බත්ථ, හැසව ගියා කොටැ' යි පොත්හි තිබෙයි. අටුවායෙහි 'සබ්බත්ථා මෙව' යි තිබෙයි. 'සබ්බත්ථ' යනුවට වඩා 'සබ්බත්ථාං' යනු මැනැවි. **සබ්බත්ථකමෙව** = නිරන්තර කොටැ මැ යන අර්ථ යි. 'හැසවැ (හැසව්) ගියා කොටැ' යනුත් එ මැ අර්ථ යි. සුසංයුක්ත වැ සංහත වැ ඝන වැ ගියා කොට යි අරුත් ගන්නේ.

හිකුන් වෙළඹක් = සිකඛිත වළවාවක් – භික්ෂූණු අස් දෙනක්; **අසන් වෙහෙරැ** = ආසන්න විහාරයෙහි; **අජේලු මහණුන් කෙරෙහි** = අවලස ග්‍රාමණයන් විෂයෙහි; **හුදු කිරිබත්** = පැන් හුමුසු කිරිබතක්; **තුමා ගත සෙයින්** = සවකීය ලබ්ධිය පරිදි; **විළි බිඳින්** = නිරිඔතප්ප දෙකින්; **පියන ලදුවෝ** =

වර්ජනය කරන ලද්දහු; (කිරින් යන තන්හි **කිර්** යනු ප්‍රකෘති රූප සි.) **හුස්** = නැඳි තොමෝ; **ගරුහා කොටැ** = ගඟා කොට; **මහකළුවන** = මහා කාලකණ්ණියක්; **මි ඔන් කිදිබන්** = මී ඕනාලද කිරිබත්; **ඉක්ම පසස්ව** = මෙහෙය ඉක්මවා කැමැති වුව මැනැවැ යනු; **යූ මස් සි** = කී නියාසි; **පෙර කල කැමින් නිවන්** = පුරාණයෙහි කළ පින් කැමින් උපන් ('වරජ නිවරජ' යනු මෙන් මැ 'වරජ් නිවරජ්' යන පාඨ ද මැනැමිය.) **සසායවි** = ශොධනය කරව්; **ඉළියවසි සේ සි** = සොයව යනු කී නියාසි; **'වැළඳා විජාතා' සන සසඳ මතුවකුන්** = වෙළඹ වැදූ ය යන හැඟීම් පමණකුන්; **ඉක්බිති ඉඟහි** = අනන්තර ගෘහයෙහි; **වුවානම** = විද්‍යමානයනට; **පිරුණන් උවාරන්** = ආපසු දීම පිණිස ගත් උපකරණයක්;—

(වූ) මේ 'පිරු' යනු 'පිරුළු' සි ද යෙදෙයි. 'අනුසාසනු පාරිවච්චකා' යනාදි තන්හි එන පාළි 'පාදිවච්චක' යනු, මුල් හොට හෙන පිරුවට – පිරුළු – පිරු – පිර යන ශබ්දයන්ගේ සමුද්භවය සැලකිය යුතු.

ඔවුන් ඔබෝ = ඒ උන් වළඳවා; **දැනැ පහන් කුල** = ගුණ දැන ප්‍රසන්න වූ කුලය; **අසල් ප්‍රසාද ඇති කුලය, යූ මස් සි** = අවලප්‍රසාදය ඇති කුලය යනු කී නියාසි.

228. 'පරිපූජනාවි' යනු '**පරිභුඤ්ජනාවි**' සි විය යුතු.

සූජා සන්සාර පච්චයදානාදි විසින් = පිදීමය – සතසා කිරීමය – දීමය යනාදි වශයෙන්; **පිළි ජග්නට** = පොෂණය කිරීමට; **පිටකඩතුරෙහි** = සඬ්ගුරාදියන් පිටත්හි; **බිහි තින්හි** = බිත්තියෙන් පිටත්හි; **බිහි සෙල්හි** = දවිතයෙන් පිටත්හි; **පස ළොස් යොජනි වූ මහ ජඹරුක්** = පසළොස් යොදුනක් ඇති මහාජම්බුවෘක්ෂය; **විනිවටත් විනිවටත්** = කියත් කියත්;—

(වෙ) පාළියෙහි පරි පූර්වක වනු ධාතු භවාදියෙහි වැටෙන බව '**පරිවත්තෙසුං, පිරිදිං; පරිවත්තන්ති, පිරිවාසි**' යනාදි පුරාතනයන්ගේ යෙදුම් වලින් පෙනෙයි. **විනිවට්ටෙන්ත, විනිවටත්**; යන මෙසිදු වනු ධාතු භවාදියෙහි බැව් 'දෙසත් දෙසත්' යන මේ කරනාඛ්‍යාතයන්ගේ අර්ථයෙන් හැඟේ.

229. 'නිගම කත කතන සි සේසි වේමේ' යනු '**නිගමන් කරත් කරත් සි යූ සේ සි**' සි ගන්නේ. නිගමනය කරන කල්හි කරන කල්හි යන අර්ථ සි නිගමන නම් නිශ්චයට හෝ නිමාවට පැමිණීම සි.

නිසදනසින් සදනු ලදුයෙකි = නය සහසුයෙකින් ප්‍රති මණ්ඩිත වූ; **පා පිටු නඹනුසය්** = පිසී පාදයන් නොහොත් පාදයන් හා පිට සම්බාහනය කරන්නේ; **යම් කෙතෙක දුන්නේ** = යම් කෙහෙක් විෂයෙහි දෙනලද්ද; **හිතයට වස්** = හිත පිණිස හා අර්ථ පිණිස; **වලදෙසි** = විවටවාර ඇතියක් – හළ දෙර ඇතියක්; **පහන්සර** = ප්‍රසත්‍යාකාරයක්; **පරපුරු විසින්** = පරම්පරා වශයෙන්; **උළුළු වැ** = උක්කුවිත වැ; **හිණි** = පතිත විය; **සදනු ලදු වැ** = සංජිත කරන ලදු වැ; **පිළියෙළ වූවෝ** = පටියත්ත වූවෝ; **නො සිකිසළු** = සිහි නො කළාය; **හිණි ඇළයෙහි** = නිස්සෙණී අංසයෙහි; **මස් රසයෙන්** = මාංස රසයෙන්; **වෙහෙරැ උවසරැහි** = විහාරොපචාරයෙහි – විහාර සමීපයෙහි; **නො හැරිය සුතු** = වෙන තැනකට ගෙන යාමට නුසුදුසු වූ; **තලාරන්** = තුලාධරයන්; **ආමසිය වන බැවින්** = ආමශීනය කළ බැවින්; **කළ නො කළ නවාමි** = කළාවූ ද නො කළාවූ ද නවකර්මයන්; **ඥන් නක්ඛු** = දන්නකු; **ළඟල් කෙරෙන් නම්** = සිහට ප්‍රිය කෙරෙන් නම්; **අක්ඛිත්** = අකඛරිසා නොමේ – අළුවංහුව;

230 'වැනිකිළි' යනු 'වැණිකිළි' යි ගන්නේ. වෙණි කුටිය – නොත් කැරැල්ල යන අර්ථ යි.

සන්නිවෙස කළ = ඒ ඒ තැනට නියි සේ පිහිටුවනලද; **පහාමන** = ප්‍රාසාදපූජෝත්සවය; **පිටගැට හා** = සෝපානය හා; **පාදෙනි** = පාද ධොවනය යන; **දෙඇතුරෙහි** = දෙදෙනාගේ අතුරෙහි; **සොපානසඳ** = පියගැට ද; **පාද ධොවනසඳ** = පා දෙනිය ද; **සොපානපාදධොවනානි** = එනම් වෙත්: **තෙසං අනතරං** = ඒ උන්ගේ මැදය; 'සොපානපාදධොවනනතරං' යනු වේ; **පාසිස්නි කොටැ** = පාද පුඤ්ඡනයක් කොට; **ඉජී සඬ්ඛාතො අනතභාවො** = ඉඳී යයි කියන ලද අත්තභාවය; 'ඉඤ්ඡිතනතභාවො' යනු වේ. **පැහිවිලි ගෙනැ** = ප්‍රාර්තනාවන් ගැන; **මැවි හා සුනු ලෙවුන් කොට ඇතියේසි** = මෘත්තිකා හා චූර්ණය ලිම්පනය කොට ඇත්තා වූ; **පැහිවිලි නිසන් සේ** = ප්‍රාර්තනාවන් සිඳුණාව; **මසවුළු ඇතියා** = මාංස ව්‍යඤ්ජනයෙන් යුක්ත වූ; **උපසිසුවනහි එතෙනානි** = මේ කරණු කොට ගෙන රස සෙනෙහ කෙරෙන් නුසි; 'උපසෙවනං' යනු වේ; **මංසං උප සෙවනං එතසසාති** = මිස අවුළුවූයේ මොහට නුසි; **කොමු** = පොතු වලින් උපන් වස්ත්‍ර සි; **වැහිදි** = වාකචීර සි – පට්ටා වගී යන්ගෙන් නිපන් වස්ත්‍ර සි; **අතු වැ පිදිවැටෙසි** = පිළිවෙළින් වටා ඇවිද්දී; **වත් සින් ඉතිදිය** = වසතුගත (කොඅගත) සිත්තය උතුරා නියේය; **උමැනි වුව හෝ** = උම්මත්තිකාවක් හෝ වූ දු ද;

සවස් හය රැසිම්මෙ = සවස උදය දෙක්හි; **තුවටු ලා** = නැවි හරවා; **හැම සත්තට සාධාරණ හොතුම්** = මරණය සියලු සත්ත්වයන්ට සාධාරණ වුවත්; **රූල්හි** = එසේ ප්‍රසිද්ධිය හෙතු කොට ගෙන; **මනුෂ්‍ය ලොක පරියාපන්න සත්හුවම** = මිනිස් ලොවට ඇතුළත් සත්ත්වයන් මැ; **ගන්නේ සි** = ගතයුතු;—

40. විසාඛා උපාසිකා වත්.

හරඟද = සාරගන්‍ධය – අරටුගඳ; **මුන් පරිසා ඇතියේසි** = යාචකයන් විෂයෙහි මුදුහළ පරිත්‍යාග ඇත්තේ සි; **දුනුයෙහි ඇලුණේසි** = දැනයෙහි ඇලී හියේ සි; **අරයනුවට** = ආයාචනය කිරීමට; **නිසිවූයේ සි** = සුදුසු වූයේ සි; **දන් හා සංවිනාහි** = දැනය හා සිය කොටසින් බෙදා දීමෙහි; **යෙළ අහුලකුදු** = අඬාඹගුලයකුදු;

231. 'පැතිරි' යනු 'වැතිරි' සී ගන්නේ. වතුරුවා = අවත්‍ථරණය කොට – යට කොට යන අර්‍ථ සි.

41. අනඳ මහ තෙරුන් පැන පුළුවුන් වත්.

පන්සියක් සිඹුවසි = පන්සියක් පිණ්‍ඩපාතයන්; **තුප් පමණ්** = තොපගේ පමණ; **මා කළ පිළිවෙවූ** = මා විසින් කරන ලද ප්‍රතිසේ‍්‍රපය; **ඉක්මෙනුවට** = අතික්‍රමණය කිරීමට; **හැම් වි සිවිනාවි** = තද වැ ගෙන සිටීමට; **ජෙරෙන් දුණුයේසි** = ජරා යෙන් ජීර්‍ණවූ; **වගුල දන් ඇතියේසි** = විගළිතා දන්නාන්විත වූ; **පුදු කොහෙ ඇතියේසි** = පලිත කෙශාන්විත වූ; **පෙරවි නතු වැ** = ඉදිරියට නැමී ගොස්; **තන්වා වැ** = තන්‍තවාය වැ; **සිළි ඛියතු වැ යූ සේ සි** = රෙදි වියන්නක්හු වැ ය්තු කී නියායි; **තන්වාවන් වසන වෙයක්** = තන්‍තවායන් වසන ව්‍යියක්; **වසා**= වඤ්චනය කොට; **මදක් ලැසිගන්හු** = අල්පයක් ආලස්‍යග්‍රහණය කළෝ; **තතනුයේසි** නිඤ්ඡනය කරනුයේ – කෙදිරිගාන්නේ; **ඕ දුකු හා** = අහෝ දුකකයෙකි; **කොළෙහි ඔන් බැවින්** = ඔට යෙහි ප්‍රක්ෂිප්ත හෙයින්; **සිඹුවා සිණි** = පිණ්‍ඩපාතය ප්‍රණීත ය; **අතිදි තෙජ ඇතියේසි** = අධික තෙජස් ඇත්තේ ය; **පුලිල ගුහෙහි** = පුලිල ගසක් සමීපයෙහි වූ ගුහාවෙක්හි; **සිඹ පස් සිළි ලබවස්** = පිණ්‍ඩපාත ප්‍රත්‍යය ප්‍රතිලාභය ඊණිස; **පෙහෙර දරු වෙස්** = පෙශකාර දරුවක්හුගේ වෙශය; **නුමා පුස්නාවුහු** =

තමා පොෂණය කරන්නා වූ; ජනා නො පුස්නහු = අන්‍ය ජනයා පොෂණය නො කරන්නා වූ; **සුමු කෙලෙස් ඇනියවුහු** = සමිත කෙලෙසයන් ඇත්තා වූ; **පතර ඇනියේසි** = පැතිරීම ඇනියේ සි-පතළා වූ විපාක ඇනියේ ය යූ සේසි;

42. මහසුබ් මහතෙරුන් වත්.

ඉසිගිලී පව් මහවුළෙහි = ඉසිගිලි පර්‍වත පාශ්‍රියෙහි; ('මහවුල' යනු විපර්‍යය සි) **අතල හදුයෙහි** = පිසිපාෂාණයෙහි - ගල්පොත්තෙහි;

232. 'ලොකියජඞ්ඛානඤ - ලොකියජඞ්ගින් අප්පිතප්පිත තජඞ්ඛනුගේ සෙරෙහි' යනු **'ලෝකියජඞ්ගින් අප්පිතප්පිත කෙණෙහි'** සි ගත්තේ.

ලෝකියජඞ්ගින් = ලෞකිකධ්‍යානය තෙම; **අප්පිත අප්පිත කෙණෙහි** = වැඩූ වැඩූ ක්ෂණයෙහි; **කෙලෙසින් මුස්න බැවින්** = කෙලෙසයන් සෙරෙන් මුක්තවන බැවින්; **නො සුන් රොගයක් විසින්** = අනුපච්ඡින්න රොගයක්හුගේ වශයෙන්, **සස ලද සද** = ප්‍රත්‍යය ලැබූ කල්හි; **උපදනාව් නිසි** වැ = උපදනට යෝග්‍ය වැ; **යපි සිව් රොග** = යාපිත වැ සිව් රොගය; **අනුසාසික රොග නම්** = එනම් වේ; **ඛිනින් නො යුළුවහට** = ධ්‍යානයෙන් ගළිහා වැ නො යියකු හට; **බඹලොව නියත බැවින්** = බ්‍රහ්ම ලොකොත්පත්තිය නියත භාවයෙන්; **සැන් අරනෙම්** = ශස්ත්‍රයක් එළවාගනිම්; **පැහැරු සියෙම් යූ සේසි** = ප්‍රහාර දුනය සෙරෙම් යනු කි නියාසි; **කොස් බහන වැහැ** = කෙස් බහන වාසිය; **කර එව්** = ක්ෂුරය හෝ සි; **ගල නැල** = උගුරු දඹුව; **උගුරු වළලු යූ සස් සි** = උගුරු වළල්ල යනු කි නියාසි; **නො පාළ වෙසෙකින්** = අප්‍රතිව වෙශයෙනින්; **ලෝ පතුළ** = ලොකයෙහි පැතිරීගිය; **හැම වෙර හා** = හැම පව් හා; **ඉක්තව** = ඉක්මවූ තැනැත්තව; ('ඉතව' යන අඩොලිපි පාඨය මෙයට වඩා මැනැවැසි හැඟේ.) **වෙර** = පාපය; **හස මෙතුවන බැවින්** = ඕයට කරුණුවන බැවින්; 1 **මරණ අනුවුව** = මරණය මැඩ ලන්න; **මරණං පසංසති** = මරණ කැමැති වෙසි; **මියනුවට පියොව් මකරෙසි** = මැරීම් පිණිස ප්‍රයොග කෙරේ; **සුණ ප්‍රභා හා** = ඡාය ප්‍රභාවය හා **සිරිරු ප්‍රභා බැරැවිව** = ශරීරප්‍රභා දරන තැනැත්තව;

---

1. මරණ අගියුව් යනු වූව මැනැවැසි හැඟේ.

නො මිසි සිඟ ඇතියේසි = නො මිදි ත්‍රිවිධ ශික්ෂා ඇතියේ සි; **කිසෙසින් කලුසිය කරනුය** = කෙ පරිද්දෙකින් කාලක්‍රියා කරන්නේද; **මහජනා අතුරෙහි පාළවුව** = මහජනයා මැදයෙහි ප්‍රසිඩ වැ ගිය තැනැත්තව; **පැරැකුම් ඇතියෝ** = දැඩි වීර්‍ය ඇත්තෝ; **දිවි නො පසසිත්** = ජීවිතය නො කැමැති වෙත්; **සුමුලු තණ්හා උපුරා** = අවිද්‍යා මූලය සහිත තෘෂ්ණාව උද්වර්තනය කොට – උදුරා දමා; **තණ්හයට මුල් නම්** = තෘෂ්ණාවට මූල නම්; **ඇවිජ** = අවිද්‍යාව සි; **සමසිසි වැ** = රහත් බවට පැමිණීම ත් සමඟ ම් ජීවිතාවසානයට පැමිණීම යයි කියනලද ජීවිත සමසීසී වැ; ('සකක්‍ඛපරිනිබ්බාණය කියත් මැනැවු මෝ' සී යොදනු) **අදුරු මුලක් සෙසින්** = අදුරු රූසක් පරිද්දෙන්; **විලිකුන්** = වික්ලිත්තවූ; **බෙල්පක් පැහැ බඳු** = බෙලි ගෙඩියෙහ පැහැය වැනි; **පැහැ ඇති වෙණක්** = ප්‍රභාන්විත වීණාවක්; **ඉලියන් නෙම්** = එසනය කරන බම; **පිළි බවට** = පුනර්භවයට;

233. 'අනාගතඤා' යනු '**අනාගතනා**' සී ගන්නේ.

නො එනු ලැයේසි = නො පැමිණෙන්නෙක් වී; **කිළිලි යෙන්** = කක්ෂාංශයෙන් – කිසිල්ලෙන්; **ගිලිහි** = ගළින වී–ලිස්සා වැටිණි; **රූවාරූඛන්** = රූපාරූපඛ්‍යාන සි; **කම් වැඩිරිහවුන්** = කාමාවචර භාවනා සි; **මනඟ** = සතර මාර්ගය සි; **ඵල** = සතර ඵලය සි;

43. ගොඩික මහතෙරුන් වත්.

දෙ කොමළුන් = දෙ කොළවරින්; **වළ දෙ ඇලයෙහි** = ආවාටයාගේ උභයාංශයෙහි; **ඇතුළු වළ වට සිවි** = ඇතුළු වළෙහි වටා සිටියා වූ; **රොජ්ජයෙහි** = රජ්ජුයෙහි – රැහැන්හි; **මකතිත සැළ ගෙනැ** = පුපචූණාදි තැවරූ සැළි ගැන; **පොඟවනෙමි** = පොථය කරවන්නෙමි; **බෙලසුල් මඩුලු** = බලා පිච්ඡිල මණ්ඩල යන් – කැහැළිය සෙවෙල සහිත මැඩිලි; (බලාපිච්ඡිල > බල පිසුල් > බල ඉසුල් > බෙලෙසුල්) **හෙම දඩු** = ඒ දඩුවම් මැ; **නො ලොව් ඛිනවජ්** = කුලොපගයන්ට ද; **හසු පරාමාස ඇ සාලහජ්** = අභිනත ගැහැටීම් ආදී කොලහල ත්; **එයට සුනා** = ඊට සුදු කොටසෙහි වූ; **විරූජ් තෙපලුජ්** = විරූඩ ලපිතයෝ ද; **පොපි ඇති තන්හි** = පාණකාදීන් නලියන තන්හි – සැයිලි ඇති තන්හි; **පිළිවක් කිරීම** = ('**පිළිවක් කිරිය කිරීම්**' යනු වඩා මැනව·) ප්‍රතිපක්ෂ ක්‍රියා කිරීම; **සුම්වා** = සිඹවා; **විසුවරු** = විප්‍රකාරයෝ;

බුදුන් ඉසුරු = බුදුන්ගේ ඓශ්වර්යය – ඊශ්වර භාවය; **වත්ත කැන්** = පවත්නා කැන; **පැදුරු** = ශයනීය කටයන්; ('මහුරා' යන වඹා වචනය හා සම්බොව බලනු) **නොහුදින් කම්** = අසාධුන්ගේ ක්‍රියාවක්; **සපන් සුන්නට** = (හකතකාලයෙහි) සම්ප්‍රාප්ත සුදුස්සාට; **නොදි වළඳනු** = නොදී කෑම; **අනර්ථය කම් නම්** = අනාර්ය්‍ය කම් නම් වේ; **ව්‍යවසායාර්හි** = නිශ්චයාර්ථයෙහි නෝ විමාදාර්ථයෙහි;

44. ගරහදින්නයා වත්.

සතරවන පුප්ඵවග්ග අට්ඨවා සත්‍ය නිමි.

234. 'රජසරණ වත්ත කල්හි' යනු **'ජනසර නවත්ත කල්හි'** යි ගන්නේ.

ජනසර = ජන සඤ්චාරය; **නවත්ත කල්හි** = නිවතීනය කරන කල්හි; **සුංවත්** = සුඛ වසතුවක් – කරවුළක්; **රාජඤඤ**= රාජාඥව; **පියුම් මහනෙළුඳ්** = පද්මයන් හා මහා නළි නයන් ද; **අරුණු පැහැ ඇති මැවිදු** = මදක් රතු පැහැ ඇති මැවි ද; **අනෙනාජාත** = ගෙයි තුළ උපන්නේ යැ; **ඔනක්කිත** = මිල දී ගන්නා ලද්දේ යැ; **කරමරානිත** = බලාත්කාරයෙන් ගෙන එන ලද්දේ යැ; **සයමුපගත යන** = දාසව්‍යයට තෙමේ මැ පැමිණියේ යැ යන; **සතර දසුන් වරා** = සතර දාසයන්ට වඩා; **යටනි** = ලාමක වේ; **උදුනෙන්** = ළිපෙන්; **බහිදු** = බා තබා ද; **එවින්** = උළුකයෙන්; **බත්හිමි** = බත් අයත් තැනැත්තේ; **බොහෝ මනා ඇතියවුහු** = බොහෝ ගුප්තභාෂණ ඇතියෝ වෙත්; **සසැදිලි** = සංසන්දිතයන්; **ඇතියවිහු යූ සේසි** = ඇත්තෝ වෙති යනු කී නියාසි; **උඩ එළියෙහි** = ඉහළ එළිපත්හි – උඩළි පත්හි; **දුකින් සලකුළු කල්හි** = දුකින් පිඹින වැ හිය කල්හි; **සකියන දුකිළියෙහි** = ප්‍රක්වපින වන සැළෙහි; **බිය ජනන හඬහු** = බිය උපදවන ශබ්දයෝ; **නිපැන්** = නිෂ්පත්තිය-ඵලය; **සම්සිය උවාරණින් සටයුතු** = සියල්ලෙන් සියය බැහින් ගත් උපකරණයෙන් සටපුතු වූ; **නහඹු සියෝ** = නහඹුන් සිය දෙනකු; **සම් සනින්** = සම් විඛානයෙන්; **සඳුළු මුසු** = වාෂ්ප මිශ්‍ර වූ;

235. 'සැක ඉදුරෝ' යනු **'සක් ඇ ඉඳුරෝ'** යි ගන්නේ.

සක් ඇ ඉඳුරෝ = චක්ඛුරාදි ඉන්ද්‍රියයෝ; **පියවිහි නො සිවියවුහු** = ප්‍රකෘතියෙහි නො පිහිටියාහු; **කලත් සැහැවි ඇති බඳුවවු** = බාලාන්ත සවභාව ඇතියවුන් වැන්නෝ; **නිඹක් සාලෙහි බත්** = නිඹක් පමණ සාලෙහි බත්; (**නිඹ**' යනු '**තුම්බ මත්තා හි රෙණවෝ**' යනාදි තැන්හි එන '**තුම්බ**' ශබ්දය හා ද, 'සාල්' යනු හින්දී 'චාවල්' ශබ්දය හා ද සම කොට බලනු.) **වෙත් වෙහෙරැ** = සමීප විහාරයෙහි; **දෙවෙන් දවහල්** = දවාලෙන් දවාලෙහි – මහ මද්දහන්හි; **පිළිබහනුවට** = පටිබාහනයට – වළක්වනුවට; **කැකුළු රහ** = තියුණු සුරාවක්; **තෙවැසි ගඳ හැලින් නිපන්** = තුන් වසක් පරණ වැ ගිය සුවඳ හැල් සාලින් සිඹ වූ; **පිණ්ඩඡ්ජක ඇසි කජ්ජ** = පිටි කැවුම් ආදි ඛාද්‍යයන්; **ඉතිරි රූ ඇති** = විශිෂ්ට රූප ඇති; **මාගම්මනට** = මාතුගාමයනට; **ගරහන ලද දිවෙලින්** = නින්දිතවූ ජීවිතයෙන්; (ජීවිත > ජීවෙත් > දිවෙල් යනු වේ.) **වත් ඇතියෙහි** = වසතු ඇති කල්හි; **දික්කි අත් නැති** = දුකෙහි කෙළවරක් ඇත්තේ! නො වෙයි; **කවර හෙයින් අත් ඇතිවනුත්** = කවර හෙතුවෙකින් අන්තය ඇති වන්නේද; **අත් නො පැනෙනුයි** = අන්තයෙක් නො පැනෙන් නේය; **මා ඒ තොප ඒ විසින්** = මා විසින් ද තොප විසින් ද; **ලබනුයෙයිම්** = මතු ලබන්නෙම්; **දන්කලුවූයේයිම්** = දන් දීමෙහි දක්ෂයෙක් – ප්‍රිය වූවෙක් වන්නෙම්; **මකුණු මුඵහු** = මඩකුණ සමුදුයයා හට; **අනු වැ ගොස්නිජු** = කැටුව ගමන් කොට ද; **නො පිසුන් කෙළවර ඇතියේසි** = අපරිච්ඡින්න පරම කොටිය ඇත්තේය; **අනුගන්ඩා** = අනු වැ ගොස්; **අමතං අපරිච්ඡිනනං අඟඟං යසස** = නො පිරිසුන් කෙළවර ඇතියේ යම්කිහුගේ ද; **පුනප්පුන පෙකඛිඩා වා** = නැවැතැ නැවැතැ බලා හෝ; **අපරිච්ඡිනනං අඟඟං යසස සො** = නො පිරිසුන් අග ඇතියේ යම්කිහුගේ ද හෙතෙම; **අනමතඟනඟා**, යනු වේ; **පූ කෙළු** = පූජි කොටිය; **හෙන කල්හි** = පිරිහෙන කල්හි; ('**හෙ** – පිරිහි මෙහි' යන ධාතු සි.) **අමුතුවක්හු** = ආගන්තුකයකු;

236. 'පසුවනුවත් (වනු) හා' යනු '**පසුවනු වත් හා**' යි ගන්නේ

පසුවනු වත් හා = පච්චුප්පන්න වසතුව සමහ; **ජය උපත්**= ජාති සඞ්ඛ්‍යාත උත්පත්තිය, **ජැඟට කරැණ්** = ජාතියට හෙතුව; **නො නසනු** = නො නසන්නේ සි;

45. කොසොල් රජහු වත්.

පුලිල ගොහායි = පලඟ ගුහායෙහි; පුලිල ගසක් සමීප යෙහි වූ ලෙනෙක්හි යූ සේයි; **සඞ්ඝාරිඝෝ** = සඞ් විහාරිකයෝ; **බිහි කොටියෙහි** = කොටුවෙන් පිටත්හි; **ඒ** = උඑඛකයක්; **ඛමිතුං සක්කා** = සිහිය හැකි ද; (**මලවිල් ළිහිණි නම්** පිළිහුඹු පක්ෂිය යි යෙත්.) **කසලුවක්** = කදල්ලක්; (**'ඛෙවරාලය'** යනු යෙන් **'කජලු > කඳලු > කසලු'** යි ආ යැයි ඇපි සලකමු.) **දෙවුලා වස්නා කල්හි** = මෙඝයක් ජල සෙවනය කරන කල්හි; ('දෙවුලා' යනුවට දෙව ජලය – වැසි දිය යන අර්ථය දියහැකිය. විත්‍ය යි.) **එකෙක්හි** = එක් අරමුණෙක්හි; **නො සනිවිහන්** = අසන්නිසිත වූ – තරඟේ නො පිහිටි; **සල්හු සින් ඇතිය හට** = නො බර සිත් ඇත්තා හට; **මින් දිබ්බිය හට** = මිතත දුහියා හට – මිත්‍ර හෙදය කරන්නා හට; **නො තාවුරු පියවි ඇතිය හට** = අසථාවර ප්‍රකෘති ඇත්තා හට; **පැන අනුහැවු පියෝ** = ප්‍රඥානුභාව මූලත ප්‍රයොගයන්, **නො තහවුරු පියවි ඉක්මේ** = අසථාවර ප්‍රකෘතිය ඉක්මවා ලන්න; **සිහිල් සුළඟින් රක්නා කසලුවක්** = සීතල මාරුතයෙන් රක්නා කැදැල්ලක්;--

46. මහසුප් මහතෙරුන් වත්.

එක්දා = එක් දිනෙක; **එක් වේලේ** = එක් වෙලායෙක්හි; **ලහකෙළින්** = සලාකා කොටියෙන් – කුර අගින්; **ඇස ගහන**= ඇසේ ගාන්නා වූ; **අජනන් හිමි** = අඤ්ජනයාගේ විනාශය; **තුඩින් පස් කැවි කරන** = තුඩින් පස් එකතු කරන්නා වූ; **වේයන්** = වේයන්ගේ;

(වේ) වෙහෙ – වැහැ ශබ්දයන් වැහැය වැනිවූයේ යන අර්ථයෙන් 'වාසි' ශබ්දය දෙස බලා නිපදවා ගත්හ යි හැඟේ. 'කන් වැයා, දත්වැයා' යන තන්හි 'වැහැ' ශබ්දය පැනේ. ථූපයෙහා සටහන් ඇති හෙයින් තුඹ + අස් = තුඹස් යි සිඹ යයි සලකමු. **'තුඹ රොඹ'** යනාදීන් පුරාතනයෝ 'ථූප' ශබ්දය 'තුඹ' යි ගත්හ. 'ථූපක' ශබ්දයෙන් 'තුඹස්' සි කිඳිණැසිද යෙත්. එසේත් ශබ්ද ධර්ම පැනෙයි. දිවක් හුල = දිවස් හුල, වලාහක් අස් = වලාහස් අස්, පොලොක් = පොලොස් යනාදි වියහි.

රොන් උකහා = රෙණු උත්කාරය කොට–රොන් එකතු කොට; (**උකහ** – රැස් කිරීමෙහි යන ධාතු යි. 'උකා' යනු මූල රූපයි. සංස්කෘත 'උත්කාර' ශබ්දයට සමරුන් ඇතියේය.) **කැවි කළු මිසි** = එකතු කළ මිඩුව යි; **ඇපෙන මතුයෙන් ඉතිරි** =

යාපන මාත්‍රයෙන් අධික වූ – දිවි වැටීමට සුදුසු පමණින් මඳ තෙහි; **කළුවනක විසින්** = කාලඛණ්ඩියක විසින්; **අහවැල් බැවින්** = අඛණ්ඩ භාවයෙන්; **පිසඝක්ඛු සෙසින්** = පිසාචයකු මෙන්; **බිහෙන් සදිස** = භීතියෙන් සමපමාන වූ; **පුත්තා මෙ නඋසනති** = මා පුත්හු (දූන්) නැසෙත්; **නස්සිංසු** = (අපුතුයෙහි) නටඹ; **නස්සිඝසනති** = (මතු) නැසෙන්නාහ; **ධනමෙම නසසති** = මා ධනය (දූන්) නැසේ; **අනස්සි** = (පෙර) නැසිණි; **නස්සිසසති** = (මතු) නැසෙන්නේ ය; **ගි නිමිත් දක්න තැන් ගෙනැ** = ගති නිමිති දකින තැන් ගැන;

47. අනඳ සිටුහු වත්.

ගැටමුසුන් සොරැන් = ගැට ළිහන චෞරයන්; **පිසනු වට වවිවි** = පාසය පිණිස වැටුපක් – කැම වියදම; **ආගම බුහුසු** = ආගම බහුශ්‍රැතයෙක්; **පිළිවෙසි බුහුසු එවි** = ප්‍රති වෙධ බහුශ්‍රැතයා හෝ; **ධැම් කියා කරනුසේසි** = ධම් කථා කරන්නේ සි; **සෝවාන් මහ ලදුවා** = සෝවාන් මහ ලද්දහුගේ;

48. ගණ්ඨිභෙදක සොරුන් වත්.

පටික්කනෙනසු – ධම්මසභාය නික්ඛනෙනසු = 'පටික්ඛාතෙනසු' යනු දම් සෙබෙන් නික්මගිය බැල්හි යන අර්ථ සි. **මෙස් සිරියසුතු තැන** = මේ හැසිරිය යුතු සථානය සි; **මෙස් විසියසුතු තැන** = මේ වාසය කළ යුතු සථානය සි; **මේ ඇජර ගොජර** = මේ ආචාරය හා ගොචරය සි; **ඇජර නම්** = ආචාරය නම්; **කායසිකාදි අවිතික්කම** = කායචාරාදීන් කැරෙන සමාචාරයාගේ අවිපසථ්‍ය සි; **ගොජර නම්** = ගොචරය නම්; **සැදුහැ සපන් කුල** = සඩ්ධා සම්පන්න කුලය සි; **මෙ සාවජ්ජ ධැම්** = මේ වරද සහිත ධම් සි; **මෙ නිවජ්ජ ධැම්** = මේ අනවද්‍ය ධම් සි; **පණ්වා ඇසි** = පාණාතිපාතාදිය සි; **නෙඛම් විතක් ඇසි** = නෛෂ්ක්‍රම්‍ය විතර්කාදිය සි; **කම් විතක් ඇසි** = කාම විතර්කාදි යසි; **පිළිවෙසි කවසුතු** = ප්‍රතිවෙධ කරනුවට යොගය වූ; **මහ ඵල නිවන්** = මාගී ඵල නිර්වාණයෝ ය; **දවි** = දබ්බිය – සෑහැ; **හෙන තාක්** = ගෙවි නැසි යාම හිම් නොට; **මුග් හූ ඇසි විකාර යෙහි** = මූගහ සූපාදි විකාරයෙහි; (නොහොත්, මුග් හුදු ඇසි විකාරයෙහි' සි ගන්නේ. එහි 'හුදු' නම් උළුදු (උදඬ) නම් ධාන්‍යය සි. 'උදු' ශි ද යෙත් මෙ.) **නිතු** = තික්තය; **ඛර** = ක්ෂාර සි; **කුළු** = කටුක සි; **කිවුල්** = අනම්බිල සි. ('ඇදම්බිල' යනු 'කිවුල්' වී යයි හඟිමු.)

49. උදු තෙරුන් වත්.

මාගමක පිරිසෙස්නානට = සත්‍යය සොයන්නවුනට; **අසන්නේයි** = අවී අසනුයේ යි;

50. පාථෙය්‍යක මහණුන් වත්.

සුප්ප බුඩයා පවත් කි වත් = සුප්ප බුඩයාගේ ප්‍රවෘත්තිය කි වසතුව; **මිනිස කවණහි** = මනුසස කපණ වෙහි–දිළිඳු මිනි සෙක් වෙහි; **දරු සිරිවහු** = දරු විරියා; **නුවර හොඹවන ගිණියක්** = නගරය බබුළුවන ගණිකාවක්; **සැසැඳේ** = සම්මනත්‍රණය කළහ – එක්වැ බිණුහ; **එකල පියා** = සේළ දමා;

237. 'අපසාදං කත්වා, වහත් කොට්' යි මෙහි පැනේ. මුද්‍රිත ධම්මපදවණ්ණනා අඩොලිපිඹි **'අප්පඛ්‍යාය කම්මං'** යි පැනෙයි. **'වහත් – වසතව් – වහතව්'** යන නානා පාඨයන් ගෙන පිරික්සෙන කල **'අපසාදං'** යන පාඨය විසම සේ පැනේ. උදන පාළි යෙහි **"නිබ්බහිත්වා අපසව්‍යතො නමිත්වා"** යනු තිබෙයි. "පණ්ඩිතා තාදිසං පව්වෙඝ බුඩං දිසවා වන්දිත්වා පදක්ඛිණං කරොන්ති. අයං පන අවිඤ්ඤාතාය පරිහවෙන තං අපසව්‍යං කත්වා අත්ත නො අපසව්‍යං අපදක්ඛිණං කත්වා ගතො" යි උදන් අටුවාහි ආයේ ය. මේ පෙළ අටුවාවන්ගෙන් හැඟෙනුයේ 'අපසව්‍ය' යනු වාම කලෙබරය බව යි. **"වාමං කලෙබරං සව්‍යං අපසව්‍යං තු දක්ඛිණං"** යි අභිධාන ප්‍රදීපිකා පාඨය මේ අටුවා හා විරුඬ ය. එසේ වුවත් නිඝණ්ටු ශාසත්‍රයට වඩා අටුවාව මැ ආදරණීය හෙයින් පිළිගතයුතු ය. මෙසේ හෙයින් මුද්‍රිත අටුවාහි ද මෙහි ද එන 'අපසාදං' යනු අවපාඨ යැ. මෙහි එන 'අපසාමං' යන අඩොලිපි පාඨය ද 'අපසව්‍ය' ශබ්දය දෙසට බරගැසී තිබේ. පුළුයෙහි 'අපසාදං' නොව **'අපසව්‍යං'** යි ආ බවට ධම්මපදවණ්ණනා යෙහි අඩොලිපිගත 'අප්පඛ්‍යාය කම්මං' යනුදු දෙස් දෙයි. හේ වනාහි "නිබ්බහන අපසව්‍ය කරණ වසෙන පවත්තපාපකම්මස්ස" යන අර්ථ කථා පාඨානුසාරයෙන් **'අපසව්‍යකම්මං'** යි ශුඬ කටයුතු නැති. මෙසේ හෙයින් **'වහත් කොට්'** යනු 'අපසව්‍යං කත්වා' යනුවට ලියූ අඳියැ යි ගතයුතු මය. අපසව්‍යතො > අපසත් > අවහත් > වහත් යි නිෂ්පත්ති ගතයුතු. **වහත් කොට්** = අපසව්‍ය කොට; පැදකුණු නො කොට යැ යූ සේයි.

51. සුප්පබුඩ කුට්ඨියි වත්.

මොළෙන් = සුරැඹෙයෙන් – නිඩමනයෙන්, නගරග්‍රාමාදි යෙහි වැසිදිය ආදිය නික්ම යන කාන්‍රුවෙන්; ("**මෝරි පනාලා නාලා මක්කානඤා ජලනික්කාලනෙඤාමාහි**" යන පරිජාත පාඨ යන්ගෙන් මෙහි විසතරාර්ථය දතයුතු.) **ඒ සොරුන් නලා** = ඒ වෙඉරයන් වඤ්චා කොට; **දහස් බද පියලි ගැටක්** = මසුරන් දහසක් බහා බඳනාලද පිලොතිකා ගණ්ඩියක්; **එළියෙහි** = ඔවට්ටිකායෙහි – කටියෙහි; **විනසුන් පිරිහණන** = විනෙසයන් පරික්ෂණය කරන්නා වූ; **සැක්කෙක් නම්** = සාක්ෂ්‍යයක් නම් **බිලි කරුණේ** = බලවත් කරුණක්; **පියලි ගැට්ටු** = පිලොතික ගණ්ඩිය; **වනයට හේ වන තැන් ගෙනැ** = විනාශයට හෙතු වන බව ගැන; **හි කැඟිවූ යම්** = කසිතව්‍ය යටසිය–කැවිටිදවූව; **එසින් වන වසන්** = එසින් වත වසනයන්; **පිරිසිඳුනා කුමණ නැතිවන බැවින්** = පිරිසිඳ දන්නා කුණය නැතිවන හෙයින්; **පස් පීරා පියා** = පස් පිහිරා දමා; (පහර > **පිඟිර** = පිහිරිමෙහි යන ධාතු සි.) **වොලොා ගෙනැ** = විලොපය කොට; **දෙහො අත්**= උභය හස්තයන්; **පිටට් කොට් බැඳ** = පිටට කොට බැඳ; **මකි ගායෙන්** = කසායෙන්; (ද්‍රව්‍ය '**මත්තිකෙ**' යනු හා සම් කොට බලනු;) **දම් ගෙඩියට** = ධම්මගණ්ඩියට – ආඝාතනයට; **පැසුළු කැවියයුතු** = පඤ්චාත්තාපයට සුදුසු; '**නලඨඛං – න හද්දකං**= 'න ලට්ඨකං' යනු යහපත් නො වේ යන අර්ථ සි;

52. කාසීසකයා වත්.

හඹා = ප්‍රමාණ සි; **රූවන් ඇඟැ** = රහත අග්ගිය ය; **කසුන් ඇඟැ** = කඤ්චනග්ඝිඝ ය; (වෛත්‍යාකාරයෙන් කළ මල් කණු හා පහන් කණු අග්ගිය නම් වෙත්.) **සවනක් රස්මු සෙවින් බලන්** = ඡඩ්වණ්ණ රශ්මීන්ගේ ප්‍රකාරයෙන් බලන කල්හි; **චක්කඩ්කිත පාදතාදි** = සක් ලකුණෙන් සලකුණු කරන ලද පා ඇති බැව් ආදිවූ; **තම්බනඛ තුඩඝනාඝතාදි** = තඹවන් නිය හා උස් වූ නාසිකා ඇති බව ය යනාදිවූ; **අනුබ්‍යඤ්ජන ඇති** = සුළු ලකුණු ඇති; **අඩිකාවූ ක්‍රියාවක්** = උත්කෘෂ්ට ක්‍රියාවක්; **නො පිළි වැවේ ද** = නො හැකිළේද; '**වෙසෙසා උදගුරුපත්වූ**= විශෙෂයෙන් උදග්‍ර බවට පැමිණි; **මල් සිපිළි ආකාරයකින්** = මල්මුවා ඇති ඇති වස්ත්‍රාකාරයෙන්; **සතරහ නම් ඇති** = සතෙ රතා යන නාමය ඇති; **නහඹ තල් කඳ පමණ වැ** = නාඹුල් තල් කඳක් පමණ වැ; **සිලි** = වලිහ විය; **මතුයෙහි සිසාරන** = මසනකායෙහි සංසාරණය කරන; **මහ වෙසින් මෙ** = මහා විථි යෙන් මැ; **හිහුල් රෙයෙහි** = සිරියෙල් දියෙහි; **උකුටු සහසුන්**=

දහස් ගණන් ඔල්වරහඩ; **සුඹුවෑ පවත්නා** = සම්මුඛ වැ ප්‍රවෘත්ත වන; **රැස්වා ගත්** = කැමැති කරවා ගත්; **රසාතලගමන** = රහ සල් පිවිසයාම – නා ලොවින් යාම; **ආකාස ගමන** = අහසින් යාම; **ඒඤ්ඡ ගමන ඝන** = සවාභාවික ගමනය යන; **තුන් ගමන්** = ත්‍රිවිධ ගතීන් අතුරෙන්;

53. සුමන මාලාකාරයා වත්.

සිඟ පා තෙල් = සතපාක තෙලය, **ගබ් බෙහෙත්** = ගහී බෙහෙජ්‍යයන්; **එබෑ** = ප්‍රක්ෂෙප කොට; **පක් තෙල යෙත්**= පිසින ලද තෙල යයි කියත්; **මෙහෙණ්වර** = සමණී අගාරය; **කෙසිවර** = කුසුදවිකාවාරය – යතුරු මුරය; **එ මෙ ඤාන පාදඝ කොටැ** = ඒ ධ්‍යානය මැ පිහිට කොට ගෙන; **විවස්නව** = විපස්සනාවට; **පිහිට කොටැ සි සේ සි** = පිහිට කොට ගෙන ය යනු හාව සි; **අදවන පියන්ගල්** = අඞ්ගනයෙහි ප්‍රධාන ඝරයට; (සක්මන් මළු සහිත දිඝසාලාව පියන්ගල් නම් වේ.) **පිළිඛෙවු නො ඝරණ ලදු** = ප්‍රතික්ෂෙප නො කරන ලද්දේ ය; **ඇලුණේසි** = සංලීන වූයේ ය; **තෙරින් අහිහවස්** = උප්පලවණ්ණා ථෙරිය මැඬ ගන; **සුහුඅඝන සූ සේසි** = සාහසික භාවයෙන් යනු කි නියා සි; **චඅංඉය සමවත්** = මෙවුන්දම් සෙවනයට පැමිණීම; **බිණාසව තෙරින් අහිහවා** = රහත් මෙහෙණ මැඩ; **විසිකුම් කළ පව්** = ව්‍යතික්‍රම ණය කළ පාපය – සදුවාර මිසීදුව ඉක්මවා කළ පාපය; **තුඹු පහටු වැ** = තුවිඤ්ඤාණට වැ; **උදහුරු පත්වැ** = උදග්‍රභාවයට පැමිණ; **කම් කරන අනිඝක්ඛු සෙසින්** = ඒ ඒ කම්යන් කරන එකකු මෙන්; **දුඹු ඔැම්යෙහි එව්** = දිට්ඨ ධම්මයෙහි – ඉහාත්මභාවයෙහි හෝ; **හඤ්ඡෙජදන ඇයි කම් කඹුල්** = අත් සිදීම් ආදි කොරවධයන්; **වඩක් ජෙනේ** = සමහර ජනයෙක්; (උපඩ්ඪක > උවඩක් > වඩක් යනු වේ.) **බිණාස්වෝජ්** = රහත් හුද; **කම්සුව ඉවසති** = කාමසුඛය අධිවාසනය කරන්නාහ සි; **සෙවිති හහිම්** = සෙවනය කරන්නාහ සි හහිම් යයි ද;

238. 'නො හළ රැක්හු' යනු 'නො හොළ රැක්හු' සි ගන්නේ. මේ ශුඛ පාඨය යටදු ආයේය. හොළාප වෘක්ෂයෝ නො වන්නාහ යන අර්ථ සි. හොළාපයෝ නම් = මළ හොවුල්හු සි.

239. "තුඹස් සෙසින් නො බීජියහ" යනු 'තුඹස් සෙසින් නො අජීවියහ" සි ගන්නේ. **තුඹස් සෙසින්** = වල්ම්කයන් පරිද්දෙන්; **නො අජීවියහ** = ජීව රහිතයෝ නො වන්නාහ; **නො හොළ සේස් හස්** = හොළ නොවූ පරිදි හා; **සඋඩිය සේ** = ජීව සහිත පරිද්;

240. 'නො ඇලෙත්' යනු **'නො ඇළලසි'** යි ගන්නේ. **බාහිතපාප වන බැවින්** = බහා තබන ලද පව් ඇති හෙයින්;—

54. උපුල්වන් තෙරින් වත්.

බොජ්ඣ = වළඳවා; **නහියක්ඛු** = නහාපිතයකු – කරනැ වැමියකු; **නැමතුන් නො ඉල්වය්** = නිමන්ත්‍රණයක් නො රැස්වා – නො පිළි ගෙන; **අමුතු නිදු** = ආගන්තුක මහණ නිදයි; **ඔහු පොබයමි යන සඤ්ඤයෙන්** = ඔහු ප්‍රබොධකරවම් යන හැඟීමෙන්; **අමුතුනිදසි යන සඤ්ඤයෙන්** = ආගන්තුක තෙමේ නිදයි යන හැඟීමෙන්; **මුහුදරන් පහල** = මුද්ගරයෙන් පහර දුන් කල්හි; **ගෙඩි හඬින්** = ගණ්ඩිශබ්දයෙන්; **සුබුදුනෙසි** = ප්‍රබුද්ධ වන්නේ යයි; **සොඳුරතා විසින්** = සුන්දරාත්මයා විසින් – පින්වතුන් වහන්සේ විසින්; **පලුබො** = පුලුද්දේසි – අතිශයින් ලොල්වූයේ; **අකෙකාසන ඇසි** = ආක්‍රොශය ආදි කොට; **පිණඩ පාත ඡඩ්ඩනාවසාන කම ගැන** = පිඬුවා ඉවතලීම අවසන් කොට ඇති කර්මය සඳහා; **සිරුරු ජගමෙ** = සරීර ජඟඟනය මැ– සිරිරි මල මැ; **දෙ ජතුන් මතුයෙහි** = දෙ උරහිස් මත්තෙහි; **වස්කිළිය පියන්පුවරු** = වව්වකුටියෙහි පිධාන පදරයන් – පියන් ළැහැලි;—

241. 'වස්කිළින්' යනුවට වඩා අඩොලිපිගත **'වස්වළින්'** යනු මැනවි. වව්වාවාටයෙන් – අශුචි වළෙන් යන අර්ථ යි.

ඔදැ ඔදැ = කඩ කඩා; **පිරික්සනම්හ මොහුයසි** = මොහු පරීක්ෂාකරන්නෙමුයි; **වඩක් ජනා** = බාගයක් ජනයා; **නිල්ණ බව** = සැහවි සිටි බව; **ජම්බුඛයා හැඟි තැන් ගෙනැ** = ජම්බුඛයා සිතූ බව ගැන; **අතළ ගල්ලෙක්** = පෑතැලි වැ පැනිරි ගිය ගලෙක්; **කෙම් විට පහණක්** = ගල් වළක් සහිත ගල් පොත්තක්; ('කෙත්' යනු 'කෙම්' යි වේ. **'කනි'** යනු ද්‍රව්‍ය වචන යි. **ඔනා–කාන–කනි** යනු ගිණ්ඩි වචන යි.) **සිරුරුජගවස්** = සරීර වලඤ්ජනය පිණිස – මල ගරනා පිණිස; **වහල්වස්** = උපකාර පිණිස; **හිවි තව ඇතියෙමි** = උග්‍ර තපොගුණ ඇති වෙමි; **සහස් තව ඇතියෙමි** = සාහසික තපොගුණ ඇති වෙමි;

242. 'බලසකර' යනු **'ලබසකර'** යි ගන්නේ. **මහත් ලබසකර** = මහත්වූ ලාභ සත්කාරයක්; **එළවන්** = වෙත පමුණු වත්; **දුම්ලොසු** = දුම් සැන්ද; **සඤ්ඤහුසි** = යාගහුය – යඥ

පර්‍වතය; **අඹිබඹ** = ශ්‍රෙෂ්ඨ බ්‍රහ්මයෙකි; **හ්‍රීඅපත්‍රප සඤ්ඤ** = (හ්‍රී × අපත්‍රප්‍ය) හිරි ඔතප් සහගත හැඟීම; **ලජ්ජ කොවන** = හිරි කොපිනය කරවන – ලජ්ජා නසන; **අහ පිළිසෙයකු සඳහස්** = අඹ පටිඝාදනය පිණිස; **උළුඑයෙන් හිනි** = උක්කුටිකායෙන් හුන්නේය; **දිය සළු සිවුරු** = දකසාටිකා නම් චීවරය; **පසඳ වන්ගේ** = ප්‍රත්‍යය දායකයන්ගේ; **සම පිළි පන්** = සම සේ (විනයානුගත වැ) ප්‍රතිපන්න වූ; **පිරිසිඳ නො දන් ධම් ඇතියේ ය**= පරිච්ඡින්න කොට නො දත් සකඤ්ඤාදි ධම් ඇත්තේ ය;

55. ජම්බුක තෙරුන් වත්.

පේඝක්හු = ප්‍රේතයකු; **දෙමහවුළු පසුන්** = පර්ශුකා වන්ගේ උභය පාර්‍ශ්වයන්ට – දෙ මහ ඇළයට; **කල් කරනුවෝ**= ප්‍රිය කරන්නාහු; **පක් ඉතිරි විපාකයෙන්** = පැසී ශෙෂ වැ සිටි විපාකයෙන්; **සැකි වැ** = සාඤ්ඤ වැ;

243. 'සව සැණින් යනු' '**යවසැඤ්ඤණින්**' යි ගන්නේ.

පිරිබොජු බජනන් = පරිභොග භාජනයන්; **දෙවුන ලබනුයේ මෙ** = ධොවනය කරනු ලබන්නේ මෑ; **නො පෙර ළඟි** = දිහි බවට පෙරළෙන්නේ නො වේ.

(ටො) '**තත්තභාජනෙ ඛීරෙව**' යනුවෙක් මෙහි පැනේ. 'රත්තළ බදුනෙහ කිරි ඇති කල්හි ම මිදෙයි' යන අදහස එයින් ගත හැකිය. මෙය ධම්මපදට්ඨකථා පාඨයෙක් නොවේ. මෙයින් මෙහි ගතයුතු නිමාපත් අර්‍ථයෙක් නැති. 'තත්තභාජනෙ ඛීර මෙව පරිණමති'යි කී නම් මේ තරතාථයන් පෙළ බසින් අදහස දැක්වූ සැටි යැයි ගත හැකිය. චින්‍තය සි.

නො සහනු = අසම්‍ථ වන්නේ ය. **හළියෙන්** = අළුයෙන්;

244. "ඒතච්ඡිකඛාරානි" යනු '**චිතච්ඡිකඛාරෝ**' යි වනු මැනැවි. **ජල අඟුරු** = ජවලිතාඞ්ගාර ඇත්තේ වේ ද; **ඇකුන් හළු තවය්** = පාගන ලද අළු තවාගෙන;

245. 'ඇතුන් පත්ලෙහි' යනු '**ඇකුන් පත්ලෙහි**' යි ගන්නේ.

ඇකුන් පත්ලෙහි = ආක්‍රාන්තපාද තලයෙහි; **සම් ඇසින්**= වම්‍මිදින්; **හිස්මුල් පවා** = මස්‍තිස්කාය ව්‍යාප්ත කොට; ('මුලෙ'

යනු ද්‍රව්‍යවචන යි. **මෙයින්** = මේ දෙශනායෙන්; **අතුරු වෑළඟි කුණුවක්** = අඛාරාවාටයෙහි පතිතවූවකු; **දක්නා සෙයින්** = බලන පරිද්දෙනැසි; **යූ වෙත්** = කීවෝ වෙත්.

56. අහි පේතයා වත්.

ඝඤ්ඵ = අයොකූටයන් – යකඩ කුළුශෙඹි; **ඉඤ්ඡන** = අහසින් මසුනකයට බස්නා වූ; **ඇය පමා** = ආදියෙහි පවත්; **ජලවතුවන්** = ජවලවත්වූ – ගිනිදැල් ඇත්තාවූ; **හවිපසින් දිලියෙනුවන්** = හැම පසින් දිලිහී ගියාවූ; **පරිපුණ්ණානි** = **සඞ්ඛාය අනූනානි** = ගණනින් නො අඩුවූ; **ජාලාහි වා අනූනානි** = ගිනිදැලින් හෝ නො අඩුවූ;

246. 'පයත්හකුරු ලන' යනු '**අත් හකුරු ලන**' සි ගන්නේ. **අත් හකුරු ලන ශිල්හි** = අනින් කැටගල් විදින ශිල්පයෙහි – අතකුරු ගැසීමෙහි;

247. 'සාළින් තහක් කරන ලනඝ ඔප්හි' යනු '**සාළින් තහක් කරලන ඔප්හි**' සි ගන්නේ.

සාළින් = ශාරිකා සාමාන්‍යයෙන් ගත් පක්ෂීන්; **තහක් කර ලන** = ඵකිත කොටලන – පෙළන – නහන; **ඔප්හි** = ශිල්පයෙහි; ('**ඵකිත**' යනු 'තහක්' සි වෙයි. ඵකිත නම් ප්‍රතිඝාතය යි, ප්‍රතිඝාත නම් හිංසනය යි, මාරණය යි.) **සාළිඝාඝයා ඵෙනති පහරිත්වා පාඝෙනි නි** = පක්ෂීන් පැහැර හෙළානුයි; **සාළිඝාඝ ඔපපං** = එනම් වේ; **අරලු අනුරෙහි** = ශිරාලානන්තරයෙහි; ('අරලු' යනු 'ශිරාල' ශබ්දය ප්‍රභව කොට ඇති හෙයින් මූඩන්‍ය ලඝ්‍වය අනුචිත යි.) **පත් ඔදුරෙහි** = කොළ පිළිබැඳි සිදුරු විසයෙහි; **සේසි** = ඡායාව යි; **පිළි හබ්බන්හු** = පිඨ සප්පියක්හුගේ; ('**පිඨසප්පි**' ශබ්දයාගේ ආදිභාගයෙන් '**පිළා**' සිද මූළුල්ලෙන් '**පිළිහබ්**' සිද තද්භව වූ පරිදි සැලකියයුතු.) **ඉතා බොහෝබුණු** = අනිඝයින් බොහෝ කොට බෙණෙන්නේ සි – මුඛර ය, දෙඩමලු ය යූ සේයි.

248. 'එළු පක්' යනු '**එඵු සක්**' සි ගන්නේ. අඝොදීන්ගේ පුරිෂයට 'ඡකන' සි අභිධාන යි. **එඵු සක් නම්** එළඝ ඡඝනය යි.

කථා ඉතිදිය නො ඔහම් = කථාව උත්තරණය කිරීමට–නිමවීමට අසමර්ථ වන්නෙමි; **කොප පුන පුන බණනුයෙන්** = යුෂ්මත්හු ඔට ඔට කථාකරන හෙයින්; **බිණ්මි** = භණිතිය;

නිමවිය නොහෙම් යූ සේඩි = නිමවනුවට නො හැකිවෙමි යනු කි නියා යි; **නිතෙජ් බව්** = තෙද නැති බවට; **හව් අට නම්** = සබඛඨා නම් වූ දිමක්; **දෙන්නා දුවය** = දෙනු ලබන ධනය; **අට බැවින්** = අට බැගින්; (ඟකාරයට වකාර වනු හෙළයෙහි වණ්ඨමියට විරුඬ නො වේ; 'නහර > නුවර; තගර > තුවර, නිඟණ්ඨ > නිවට' යනාදිය මෙහි.) **රැස්වාගත්** = චිත්තාරාධනය කොට ගන්නා ලද; **යම් කවරයෙකුදු** = ප්‍රධානත්වයෙන් ගණන් ගත නො හැකියෙකුත්; **පිළිව්** = පීඨසප්පියෙක් තෙම; (යටකී පිළිහඬ් වූයේ 'පීඨසප්පි' ශබ්දයාගේ **ප**කාරයට වකාර හා එයට ඛකාර වීමෙනි. මෙහි **'පීඨප්'** යන වණී පිළිවෙළින් **'පිළිප් > පිළිව්** සි ආ සැටි දන්නේ සි.) **පුරෙවියහ කව්හි දුන්** = පුරොහිතයාගේ කටට දුන්; **එළු සක් පහරින්** = එළු බෙටි පාරින්; **මුදු කරුණු හා** = නුගපත්හි දුග් අකුරු පහර යයි කියන ලද; මූලකාරණයෙන් හා; **අසන් කරුණු තා ගෙන** = පුරෙවියහ කව්හි දුන් එළසක් පහරයි කියන ලද ආසන්න කාරණය යන සියල්ල ගෙන; **දෙජ් කියත්** = දෙක මැ කියුවත්; **යෙජේඩි** = සුදුසු වෙයි; **'ඛඤ්ජපහාරෙන'යත්** = 'ඛඤ්ජප්පහාරෙන' සි කිව හොත්; **පිළිනඛහු දුන් හකුරු පහරින්** = පිඨ සර්පි හා විසින් දෙනලද ඝකීරා ප්‍රහාරයෙන්; **උඛ්ඛාදන** = ඇඟ ඉළීමය; **පරි මද්දන** = හැඹිමය; **කිලිඤ්ඡ වජ්ජඩොවන ඇයි** = කිලිටිවත් දෙවිම් ආදිය;

249. 'මේ චාරොපචාරයයි ගෙනැ' යනාදිය 'චාර මෙ **චාරයයි ගැනැ තදනන්තරජ්ජ මාරොපචාරයෙන් ගන්නේඩි**' සි ශුඛ කටයුතු. අභිධෙයාර්ථ විසින් චාරය මැ චාර යයි ගෙන ඒ දෙර අතුර ද (සමීපය ද) චාර ශබ්දය හා නො වෙනස් කොට සැලකීමෙන් ගතයුතු ය යන අර්ථ සි. **සඬඳු** = පූර්‍වාපර වසතු සම්බන්ධය;

57. සට්ඨිකුට පෙතයා වත්.

අඛන් ගමනින් = දික් මඟ යාමෙන්; **කලත් සැහැවිය** = කලාන්න සවභාව ඇති; **පැනෙව් නො** = ප්‍රසිඬ වන්නාහු නො වෙද්ද; **අගසව්වන් විසාඛි** = අග්‍රශ්‍රාවකයන් විෂයෙහි; **ඉස යෙන්** = ඊර්ෂ්‍යායෙන්; **නැමතුණ්** = නිමන්ත්‍රණය;

250. 'පසපුණුවැ' යනු **'සපුණුත් වැ'** සි ගන්නේ. **නො සපුණුත් වැ** = සම්පටිච්ඡනය නො කොට; **ඒ ඉසයෙහි එල වළඳනාල්ඛි** = ඒ ඊර්ෂ්‍යායෙහි ඵලය වළඳන්නා කල්හි; **සිත් ගැහැ**

